

# මහා සමය
# සූත්‍ර සන්නය.

# සංඥාපනය.

සතරඹර ලෝකස්වාමීවූ අප භාග්‍යවත් සම්‍යක් සම්බුද්ධරජාණන් වහන්සේ කිඹුල්වත්පුරය සමීපයෙහිවූ මහාවනයෙහිදී කිඹුල්වත් කෝලිය යන දෙනුවරින් පැවිදිව එදවස රහත්වූ පන්සියයක් භික්ෂූන් පිරිවරා වැඩහිඳ මහාසමයසූත්‍රය දේශනා කළසේක.

මහතං බුද්ධ බුද්ධසාවකානං සමයො සමූහො වා-මහතං දෙවබ්‍රහ්මාදිනං සමයො වා මහාසමයො-යනු කීහෙයින් මහත් ගුණ සමූහයෙන් සමුපලක්ෂිත බුද්ධබුද්ධශ්‍රාවකයන්ගේ සමූහය හෝ මහත් ඍද්ධ්‍යාදී ආනුභාවසම්පන්න දිව්‍යබ්‍රහ්මාදීන්ගේ සමූහය හෝ මහාසමය නම්වේයි. දිව්‍යබ්‍රහ්මාදී මහාසමූහයකට දේශනා කළ ධර්මයද අභෙදෝපචාරයෙන් මහාසමයයි කියනුලැබේ.

භාග්‍යවතුන්වහන්සේ හිමාලය හා එකාබද්ධවූ මහාවන ලැහැබෙහි එදවස රහත්වූ පන්සියයක් භික්ෂූන් සමග වැඩහුන් කල්හි නිකෙලෙශීමහාරහතුන් සහිත පූර්ණචන්ද්‍රයාමෙන් බබලන බුදුන්දක විචිත්‍රධර්මයක් අසමුයි දසදහසක් සක්වළ වැසි දෙවිබඹහු කිඹුල්වත සමීපයෙහි මහාවනයට සන්ධ්‍යාසමයෙහි රැස්වූහ- එලෙස රැස්වූ නානාප්‍රකාර දෙවිබඹුන්ගේ නාමගෝත්‍රාදීන් පන්සියයක් පමණ එහිහුන් අභින් භික්ෂුසමූහයාට වෙන්වෙන් වශයෙන් ප්‍රකාශකොට තදනන්තරව ඒ දෙවසමූහයා භව්‍යාභව්‍ය විශයෙන් දෙකොටසක්කොට-අභව්‍යයන්හැර භව්‍යයන්ගෙණ රාගචරිතාදීන්ගේ වශයෙන් සකොටසක්කොට ඔවුන්ට සත්ප්‍රාය පරිද්දෙන් ධර්මය දේශනාකළසේක. දෙවිබඹුන්ගේ නම්ගෝත් ආදිය ප්‍රකාශවනහේසූත්‍රය මහාසමයසූත්‍රයයි කියනුලැබේ. මේ මහාසමය සූත්‍රාන්තයවනාහී දිව්‍යබ්‍රහ්මාදීහු නිතර අසන්නට සතුටුවෙති. එබැවින් අනුරාධපුර මහා විහාරවාසී මහතෙරහු මහාසමය සූත්‍රය පිරිවහනා පොතට ඇතුළත් කළෝය. අභිනව ස්ථානයන්හි මහාසමයසූත්‍රය මඞ්ගලවශයෙන් හා ඒ ඒ ග්‍රාමක්ෂෙත්‍රගෘහාදියට අරක්ගත් දෙවාදීන් සතුටුකිරීම සඳහාත් දෙශනාකිරීම පෙරපටන් අද දක්වාත් පැවතෙන සිරිතකි. දෙවාදීන් තුටුපහටකොට මෙලොව යසඉසුරු ලබාගැණීමටත් පරලොව සැප හා කෙළවර අමෘතමහා නිර්වාණය ලබාගැණීමටත් කැමැත්තඇත්තවුන් විසින් මහානුභාවසම්පන්න මෙම මහා

සමයසූත්‍රය අනවරතයෙන් පරිශීලනය කළයුතුයි. ඉහත සඳහන් පරිදි චරිතවශයෙන් වදාළ ධර්මයෝ නම්- රාගබහුලදෙවියන්ට සම්මාපරිබ්බාජනීයසූත්‍රයද, ද්වේෂබහුල දෙවියන්ට කලහවිවාද සූත්‍රයද, මෝහ බහුල දෙවියන්ට චූලබ්‍යූහසූත්‍රයද, විතර්ක බහුල දෙවියන්ට මහාබ්‍යූහසූත්‍රයද, ශ්‍රද්ධා බහුලකොටඇති දෙවියන්ට තුවටකසූත්‍රයද, බුද්ධිබහුලකොටඇති දෙවියන්ට පුරාභේදසූත්‍රයද, යනාදී වශයෙන් වදාළ සම්මාපරිබ්බාජනීයාදී ෂට් සූත්‍රයෝවෙති. මෙකී ෂට්සූත්‍රයෝ ධම්මසඞ්ගාහක මහරහතුන් විසින් කුදුගත්සඟියෙහි සූත්‍රනිපාතයට ඇතුළත්කරණලද්දේය. මහාසමයසූත්‍රය දික්සඟියට ඇතුළත් කරණලදී එහෙත් මහාසමයසූත්‍රය සූත්‍රසඞ්ග්‍රහාදියෙහිදීද දක්නට. ලැබේ. සුමඞ්ගලවිලාසිනී සූත්‍රනිපාත සූත්‍රසඞ්ග්‍රහ යනාදී අර්ථකථාවලදී මහාසමයසූත්‍රය පිළිබඳ විස්තරවිභාග එකිනෙකට වෙනස් වශයෙන්ද ඇතැම්තැන න්‍යූනාතිරිකභාවයෙන්ද දක්නට ලැබේ. එහෙත් හැකිතාක් වෙහෙසී ශුද්ධලෙස මහාසමය සූත්‍රයට සහ අනික් සූත්‍ර සයටත් අටුවාගතාර්ථ මුඛ්‍යස්ථානයෙහි තබාගෙණ පදාර්ථ භාවාර්ථ විස්තරාර්ථ ලිව්මු. මෙකී සූත්‍ර සියල්ලම පැරණි පදගත සන්න මුද්‍රණයකරා ඇතැම් නවතුන් ප්‍රචාරයට පමුණුවා ඇතත් චිරාගත ලිපිභ්‍රමාදීය නිසත් ශෝධක කර්තෘවරයන්ගේ අවිනිශ්චිත අපරීක්ෂාවන්නිසත් බොහෝතැන් අශුද්ධව තිබෙණවා පමණක් නොව මූලප්‍රකෘතිනු භාෂාප්‍රායෙවද තිබෙත්.

ශාක්‍ය කෝලිය දෙනුවරින් පැවිදිවූ පන්සියයක් භික්ෂූන් එහි භික්ෂුභාවයෙන් පැවිද්දලබා අහසට පැණනැගී අවුත් බුදුන් වැද එකත්පසෙක සිටිබැව් සූත්‍රනිපාතාර්ථකථාවෙහිදී මෙසේ කියා තිබේ. භගවා තෙසං පුබ්බභාගං දිස්වා එහිභික්ඛුභාවාති ආහ සබ්බෙ ඉද්ධියා නිබ්බත්ත අට්ඨපරික්ඛාරයුත්තා ගුරුවා ආකාසෙන අබ්භුග්ගන්ත්වා ආගම්ම භගවන්තං වන්දිත්වා අට්ඨංසු, මේ අටුවා පාඨයෙන් හැඟෙන්නේ ඒ භික්ෂූන්ට පැවිද්ද සමග ආකාශගාමී සෘද්ධිය ලැබුණුබවයි. ඉද්ධිමන්තානං භගවා ගමනට්ඨානං මජ්ඣං කථං ගච්ඡාමාති, මේ දික්සඟි අටුවා පාඨයෙන් හැඟෙන්නේ එවේලෙහි ඒ භික්ෂූන්ට ආකාශගාමී සෘද්ධියක් නොතිබුණුබවයි. පාඨයෙහි අදහස භාග්‍යවතුන් වහන්ස සෘද්ධිමතුන් විසින් යායුතුතැනකට සෘද්ධිරහිත අපි කෙසේ යන්නෙමුද යනුයි. කුණාලවිල සමීපයේදී කුණාලජාතකය වදාරා ඒ පන්සියයක් භික්ෂූන් සෝවාන්පෙලෙ පිහිටෙවූ බව

දෙසනාපරියොසානෙ සබ්බෙපි සොතාපත්ති ඵලෙ පතිට්ඨ හිංසු, යනමේ දික්සගි අටුවාපාඨයෙන් ප්‍රකාශවෙයි. මේ පාඨයෙහි අදහස කුණාලජාතක දෙශනාවගේ අවසානයෙහි ඒ සියලුම භික්ෂූහු සෝවාන්ඵලෙහි පිහිටියෝය යනුයි. මෙහි මෙලෙස කියා සුත්‍රනිපාතාඨ්ඨකථාවෙහිදී නානානයසංහනච්ච සච්චකථං කථෙසි කථාපරියොසානෙ සබ්බපච්ඡිමකො සොතාපන්නො සබ්බ උපරිමො අනාගාමී අහොසි එකොපි පුථුජ්ජනො වා අරහා වා නත්ථි, යනාදිය කියනලදී. ඉහතකී පාඨයේ අදහස ඉක්බිති භාග්‍යවතුන්වහන්සේ ඒ භික්ෂූන්ට චතුරාර්‍ය්‍යසත්‍ය කථාව වදාළසේක. කථාවසානයෙහි සියල්ලන්ට පශ්චිමයා ශ්‍රොතාපත්ති ඵලයෙහිද සියල්ලන්ට උපරිමයා අනාගාමි ඵලයෙහිද පිහිටියේය ඒ පිරිසෙහි පෘථග්ජනවූ හෝ රහත්වූ එකෙකුත් නැත යනුයි. භික්ෂූන්ගේ අනභිරතිය දුරුකරනු සඳහා හිමවතට ගෙණයන්නට අදහස් කළබව- දිට්ඨපුබ්බා භික්ඛවෙ හිමවා, යන සුත්‍රනිපාතාඨ්ඨකථා පාඨයෙන් හැගේ. එහි අදහස මහණෙනි තොප විසින් හිමාලය පෙර දක්නා ලද්දේද යනුයි. දික්සගි අටුවාවෙහිදී භගවා තෙසං කුණාලදහසවණ්ණනං කථෙන්තො අනභිරතිං විනොදෙමීති කුණාලදහසවණ්ණනං කථෙසි තෙසං දට්ඨුකාමා අහෙසුං යනාදිය කියනලදී. ඉහතකී පාඨයන්ගේ අදහස් කුණාලවිල මොවුන්ට වර්ණනාකොට එහි ගෙණගොස් කලකිරීම දුරුකෙරෙම් නම් යෙහෙකැයි සිතා කුණාලවිලේ වර්ණනාව කියේක, ඒ කුණාලවිල දක්නට කැමතිවූහ. යනාදීහුයි. එසේ කුණාලවිලකරා බුදුන් සෘද්ධ්‍යනුභාවයෙන් ගෙණගිය භික්ෂූන්ට භික්ඛවෙ ඉමස්මිං කුණාලදහෙ මච්ඡානං නාමං නජානාථමං පුච්ඡථාති තෙ පුච්ඡිංසු භගවා පුච්ඡිතං පුච්ඡිතං කථෙසි න කෙවලඤ්ච මච්ඡානංයෙව තස්මිං වනසණ්ඩෙ රුක්ඛානම්පි පබ්බතපාදෙ දිපදචතුප්පදසකුණානම්පි නාමානි පුච්ඡාපෙත්වා කථෙසි, යනාදී පාඨවලින් මෙසේ වදාළබව දික්සගි අටුවාවෙහි කියාතිබේ. මේ පාඨයන්ගේත් අදහස්, මහණෙනි මෙ කුණාලවිලෙහි යම් මත්ස්‍යයෙකුන්ගේ නම් නුඹලා නොදන්නාහු නම් මාවිචාරව්යයි වදාළකල්හි ඒ භික්ෂූහු විචාළාහුය භාග්‍යවතුන්වහන්සේ විචාරණ විචාරණ ලද්දකීසේක. හුදෙක් මසුන්ගේ පමණක් නොවෙයි ඒ වනලැහැබෙහි වෘක්ෂයන්ගේද පර්වතපාදයෙහි දෙපා සිව්පා සතුන්ගේද නම් විචාරවා කීසේක යනාදීහුයි. අථද්වීහි සකුණෙහි මුඛතුණ්ඩකෙනඩංසිත්වා ගහිතදණ්ඩකෙ නිසින්නො කුණාලසකුණරාජා පුරතො ච පච්ඡතො ච උභොසු

පෙසෙසු සකුණසඞ්ඝපරිවුතො ආගමෙස්සති, මේ පාඨයෙන් දීඝ සඟි අටුවාවෙහිදී කුණාලපක්ෂියා ආ පරිදි දක්වයි මෙහි අදහස කුණාල පක්ෂීන් දෙදෙනකුන් විසින් මුවතුඩින් ඩැහගත් දඬු කඩෙක්හි හුන්නේ කුණාලපක්ෂිරාජයතෙම ඉදිරිපසුපස දෙපසින් හා දෙඅංශයෙන්ද යන සිව්පසින් පක්ෂි සමූහයා විසින් පිරිවරණ ලදුව එයි යනුයි. දීඝසඟිඅටුවාවෙහිදී මෙසේ කීවුත් සූත්‍රනිපාත අටුවාවෙහිදී අයං සුවණ්ණපබ්බතො අයං රජතපබ්බතො අයං මණිපබ්බතොති නානප්පකාරෙ පබ්බතෙ දස්සෙත්වා කුණාලදහෙ මනොසිලාතලෙ පතිට්ඨාසි, යනාදී පාඨවලින් මහණෙනි මේ රන්පව්වය, මේ රිදීපව්වය, මේ මැණික්පව්වයයි නානාප්‍රකාර පර්වතයන් දක්වා කුණාලවිලෙහි රත්හිරියල් ගල් තෙලෙහි පහළවූසේක් යයි කියා එහිම කාකොළිම්බිණ්හාත සබ්බ චතුප්පද බහුප්පදාදි භෙදතිරච්ඡානගතා පාණා ආගමිස්සන්ති සබ්බසකුණපමුඛො කුණාලසකුණොති අධිට්ඨාසි, යන පාඨයෙන් ඉක්බිති හිමවතෙහි දෙපා සිව්පා ආදී ප්‍රභෙදඇති සියලු තිරිසන්ගත ප්‍රාණීහු එත්වා සියල්ලන්ට පසුව කුණාලපක්ෂීතෙම ඒවායි ඉටුසේක. යනු දක්වා සූත්‍රනිපාතඅටුවාවෙහිම කුණාල පක්ෂිරාජයා ආ ආකාරය වණ්ණනාකලතැන මිහිම්ජකසද්ද කිතුණ්ණනාද සිතාසභිතාකට්ඨෙව මජ්ඣිනිසින්නං සහස්සවිජ කසද්ද පරිවාරං කුණාල සකුණං දිස්වා, යනාදීපාඨය කියා තිබේ. මෙහි අදහස කුණාලපක්ෂිබෙනුන් දෙදෙනකුන් විසින් තුඩින් ඩැහැගත් දඬුකඩක්මැද දහසක් පක්ෂිබෙනුන් විසින් පිරිවරණලදුව හුන් කුණාලපක්ෂියාදුටු යනුයි. එකම අටුවාචාරීන් එකම සූත්‍රයකට කළ අටුවාව මෙලෙස දෙපොලක විසදෘශලෙස යෙදීම නවීනයන්ගේ මහත් මුලාවට කාරණයෙකි. දීඝසඟි සූත්‍රනිපාත යන අටුවා දෙකේ භික්ෂූන්ගේ මාගීඩිගමය හා කුණාල පක්ෂියාගේ ඊම පිළිබඳ විස්තර එකිනෙකට ඉදුරාම විරුඬලෙස පෙණේ. ඇතැම් කරුණු එකම කරුණ පිළිබඳවවූ අටුවාවලදී අඩුවැඩි වශයෙන් විස්තරකොට තිබෙත්. ඒ පුදුමයට හෙතුනොවෙත්. මේලෙස එකිනෙකට ඉදුරාම ප්‍රතිවිරුද්ධලෙස එකම අටුවාචාරීන්වහන්සේ එක සූත්‍රයකට දෙපොලකදී අටුවා දෙකක් ලිවායයි සිතීමපවා පුදුමයට කාරණයකි. මෙය අටුවාචාරීන්ගේ වරදනොව ග්‍රන්ථශොධකයන්ගේ අපරීක්ෂායෙන් සිදුවන බලවත්වරදෙකි.

මහාසමයසූත්‍රය පිළිබඳ ප්‍රවෘත්ති කථාවෙහි පෙණෙන කොලියරජුන්ගේ උත්පත්තිය කොලොම්ගස් බිලකයයි සියලුම සිංහල පොත්වල දක්නට ලැබේ. කොලරුක්ඛ කියා පෙළඅටුවා

ඊයල්ලෙහිම එකාකාරව පෙණේ. කොල යන්නෙන් කොලොම් කියා සිංහලව බිඳියහැකි නිරුක්ති ක්‍රමයක්ද නෙළුම්බරණෙහි නොපෙණේ. කොල නාමය මහ ඩොඹරුකට හා තිඹුල්රුකට ව්‍යවහාරයි. සොලොස් රියනක් රුක්බිලය ශුද්ධකොට පවත් නාච්චවක් සහ දෙරක්සාදගෙණ රුමරජ විසූවෙයයි කිය තිබෙණ හෙයින් සොලොස්රියනක් ඇතුළත බිලය තිබියයුතු කොලොම්රුක කොපමණ විශාල එකක් වියයුතුද, තිඹුල්රුණ් ඇසතුවගීයට අයත් වෘක්ෂවිශෙෂයක් බැවින් තුනරුක්ෂමින් සරසවගිය අතුවලින් මූල්ඇදී පොළොවට පිවිස ඇතුළත ගුහාමෙන් මහත් කුහර සෑදෙන වගීයකි. තවත් ක්‍රමයකින් තිවුල්ගස මහාවෘක්ෂයක් ආශ්‍රයකරගෙණ වැඩී කල්යාමකදී ඒ රුක යටකොට මූල්වලින් වසාගෙණ විනාශකර ඇතුළත මහත් කුහරයක් සාදයි. තිවුල්රුක මෙබඳුඑකක් බැවින් ඒ සඳහාද සිත් යොමුකළයුතුව තිබේ. කොල,යන්න කොලොම්'යයි සිහලබසෙහි ප්‍රමාදයකින් ව්‍යවහාරව එන්නේයයි සිතමි. කොලනාමය කොලොම් පරියායනාමයක් ලෙසද කොණාදියෙහ දක්නට නොලැබේ එබැවින් මෙය විශෙෂ පරීක්ෂණයකට භාජනය වියයුත්තෙකි.

සූත්‍රසයක් ගර්භකොටඇති ඉතා ගැඹුරුවූ විසිතුරු මෙම මහාසමයසූත්‍ර දෙශනාව භාග්‍යවතුන්වහන්සේ සිසින් අභිධර්ම පිටකයමෙන් නිර්මිත බුදුනෙණකුන්වහන්සේ සමග දෙශනා කරණලදහෙයින් අතිශ්‍රෙෂ්ඨවින්නේමය. දෙශනාවසානයෙහිදී එකඑක සූත්‍රයට කොටිලක්ෂය බැගින් සත්කෙලලක්ෂයක් දිව්‍ය බ්‍රහ්මයෝ අර්හත්ඵලයට පැමිණියෝය. ඉතිරිමාර්ගඵලයන්ට පැමිණියවුන්ගේ සඞ්ඛ්‍යාපථය ඉක්ම පැවැත්තේය. අටුවාවේ කියන ලද්දක් මෙහිදී පරීක්ෂණයට භාජනයවීතිබේ. මහාවනයේ රහතුන් දක්නාපිණිසත් බුදුන්දක උන්වහන්සේගෙන් විසිතුරු වැටහීම්ඇති ධර්මයක් අසනඅපේක්‍ෂාවෙනුත් පැමිණි දෙවාදීන් භව්‍යාභව්‍යවශයෙන් දෙකොටසක්කොට අභව්‍යයන් හැර භව්‍යයන් පමණක්ගෙණ ඔවුන් රාගචරිතාදීන්ගේ වශයෙන් සකොටසක් කොට චරිතවශයෙන් සම්මාපරිබ්බාජනීයාදී සූත්‍රසය වදරා ඒ සකොටස මාර්ගඵලවලට පැමිණවූබව කියා නැවත දෙවපරිස විභාග (දෙව්පිරිසගේ නම්ගොත් කී) මහාසමය සූත්‍රය වදරා කොටිලක්ෂයක් දෙවාදීන් අර්හත් ඵලයවත් පමුණුවාසඞ්ඛ්‍යා රහිත දෙව්බඹුන් සෙසුමාර්ගඵලයන්ට පත්කලබැව් කියාතිබේ. භව්‍යවූ සියලු දෙව්පිරිස සකොටසකට බෙද ඔවුන්ගේ චරිත වශයෙන් වෙනවෙන සූත්‍රසයක් වදාළාටපසු (දෙවපිරිස විභාග)

මහාසමයසූත්‍ර දේශනාවසානයෙහි මාර්ග ඵලාධිගමයට සිටි දෙවියෝ කවරහුදැයි අටුවාවෙහි නිශ්චයකර නොමැත්තාහ. දෙවියන්ගේ සිත්වල සතුට ඇතිකරවන්නට ඔවුන්ගේ නම්ගොත් කී පමණකින්ම කොටිගණන් දෙවියෝ මාර්ගඵලයන්ට පැමිණියෝය යන අටුවාවෙහි කීම පරීක්ෂාකටයුත්තකි. මේ එකම ධර්මසමයට අයත් නිදනසහිත මහාසමයසූත්‍රය 8 වෙනි අඞ්කය වශයෙන්ද, සම්මාපරිබ්බාජනීය-කලහවිවාද-චූලබ්‍යූහ යන සූත්‍රත්‍රය 9 වෙනි අඞ්කය වශයෙන්ද, මහාබ්‍යූහ-තුවටක-පුරාභෙද යන සූත්‍රත්‍රය 10 වෙනි අඞ්කය වශයෙන්දැයි මෙසේ වෙන්වෙන් වශයෙන් පොත්තුනකට කොටස්කොට එකවර මුද්‍රණය කරවීම සමිතියේඅදහසවිය එසේදවුවත් එකම ධර්මසමාගමයකට අයත් සූත්‍රසමූහයක් බැවින් අඞ්ක 8, 9, 10, දරණ පොත්තුන එකම පොතක් වශයෙන් මුද්‍රණයකරවනලදී මෙම මහාර්ඝ ධර්මය අනවරතයෙන් පුරුදු පුහුණුකිරීම ශ්‍රද්ධාබුද්ධිසම්පන්නයන්ට මහා ප්‍රයෝජනයකි. මෙහිදී අටුවාව භාරකරගෙන අඩිලිවෙමු. අපගේ ප්‍රමාදදියකින් හෝ වර්ණයෝජකයන්ගේ ප්‍රමාදයකින් යම් යම් වද්‍යස්ථානයෝ දක්නට ලැබෙත්නම් එබදු තැන් සුධීන් විසින් ශුද්ධකටයුතුවෙත්.

මහාසමයසූත්‍රයට අයත් සියලුම සූත්‍රයන් පිළිබඳ
සංක්ෂෙපනය සමාප්තයි.

---

Uve Pannananda Thero.

1933–5–8 දින
කාර්ගම්පිටියේදීය.

# මහාසමය සූත්‍රය පිළිබඳ
# ශුද්ධිපත්‍රයයි,

---

| පිට. | පෙල. | අශුද්ධ. | ශුද්ධ. |
|---|---|---|---|
| 1. | 14. | ෂන | යන |
| 7. | 16. | දෙවියෝහැර | දෙවියන්හැර |
| 15. | 22. | වේළේ | වේළ් |
| 16. | 8. | චතුත්තං | චතුත්ථං |
| 19. | 22. | චක්‍රවාට | චක්‍රවාල |
| 20. | 33. | එහෙයින | එහෙයින් |
| 21. | 17. | එකෙනෙහි | එකෙණෙහි |
| 30. | 17. | අභික්කාමිං | අභික්කාමුං |
| 32. | 17. | දස | දශ |
| 35. | 6. | පක්කාමිං | පක්කාමුං |
| 38. | 35. | යකුන | යකුන් |
| 43. | 37. | මහාවනායට | මහාවනයට |
| 40. | 32. | වසවතීති | වශවර්ත්ති |
| 42. | 17. | නිම්මාන | නිම්මාණ |

කපිල, ගෙන; කෙනෙක්, කෙනකු; බබලන, ගකුල; කසින; යනාදීවශයෙන් යෙදීතිබෙණ සියලුම්; තැන් කපිල, ගෙණ; කෙණෙක්, කෙණෙකු; බබලන, හකුළ; කසිණ; කියා වියයුත් කාහුය,

33 පිටේ 3 වෙනි ගාථාවෙහි 1, 2, 3, පාදයන්හි අර්ථ මෙසේත් වියහැකියි, සුබ්‍රහ්මා, සුබ්‍රහ්මය; පරමත්තනා, පරමත්තනය; සහ ඉද්ධිමන්තො, සෘද්ධිමත්වූ; බුදුන්ගේ පුත්තා, පුත්‍රවූ; ආබ්‍රහ්මයෝ දෙදෙනද; සනඞ්කුමාරො, සනත්කුමාර නම් බ්‍රහ්ම පුද්ද; තිස්සොච, තිස්ස; බ්‍රහ්මතෙමේද; සහ; එක්වම ආවෝය.

# මහාසමය සූත්‍රයෙහි නිදානකථාව

සහිත

# ශාක්‍යකෝලියරජුන්ගේ

# උත්පත්තිකථා.

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.

සතරමර ලොකස්වාමිවූ අපභාග්‍යවත් සම්‍යක් සම්බුද්ධ ඈඳිද රාජෝත්තමයාණන් වහන්සේ ලෝවිතුරු බුද්ධරාජ්‍යයට පැමිණ දම්සක් පවත්වමින් අනුක්‍රමයෙන් කිඹුල්වත් පුරයට වැඩමවා සුදෙවුන් මහරජාණන් ආදිකොට ඇති ශාක්‍ය ජනයන් බොහෝදෙනා මාර්ගඵලයන්හි පිහිටුවා දනව් සැරිසරා නැවතත් කිඹුල්වත්පුරයටම වැඩවදාරා එක්දහස් පන්සියයක් සඟුන් සමග නිග්‍රොධාරාමයෙහි වැසය කරණසේක.- එසමයෙහි ශාක්‍ය කෝලිය රජුන් අතර දිය කලහයෙක් විය- හේතුසේදයත්— කපිලවස්තු-කෝලිය-යන දෙනුවර අතරෙහි ගලාබස්නා රොහිණී නම් නදිය එකම අමුණකින් ආවරණකොට ශාක්‍ය කෝලිය දෙරට වැස්සෝ සස්‍යයන් කෙරෙති. එකල්හි පොසොන් මස මූලභාගයෙහි සස්‍යයන් මැරෙන්නට වූයෙන් ශාක්‍ය කෝලිය දෙනුවර රජදරුවන්ගේ කම්කරුවෝ රොහිණී ගඞ්ගාවෙහි අමුණ ලඟට රැස්වූහ. එහිදී කෝලිය රජුන්ගේ කම්කරුවෝ ගඟෙහි දිය සිඳී ගොස් තිබෙණ බැවින් මෙස්වල්ප ජලය දෙපස හට ගෙණගියහොත් තොපටවත් අපටවත් නොපෝහේය. අපගේ සස්‍යය වනාහි එක් දියවරකින්ම පැසෙයි. එමනිසා මේ ස්වල්ප ජලය අපට දෙව්යයි කීහ. එසේ කීකල්හි ශාක්‍ය රජුන්ගේ කම්කරුවෝ තොප අටු කොටු පුරවාගෙණ සිටිකල්හි අපි රත්රන්-නිල්මිණි-කහවණු සහ මළු පෙට්ටි ගත් අත් ඇත්තෝව තොපගේ ගෙදෙරවල හැසිරෙන්නට නොහැක්කෝ වන්නෙමු. අපගේ සස්‍යයත් එක් දියවරකින්ම පැසෙයි මේ ස්වල්ප ජලය අපට දෙව්යයි කීහ. එවිට දෙනුවර රජුන්ගේ කම්කරුවෝම අපි නොදෙන්නෙමු අපි නොදෙන්නෙමුයි මෙලෙස කථා වැඩිකොට ඔවුනොවුන් එකෙක් නැගිට එකාකුට පාරක් ගැසීය.

ඒ පාරලත් තැනැත්තේ අනිකට පාරක් ගැසීය. මෙසේ එකිනෙකාට ගුටිබැට දීමෙන් දෙනුවර රජදරුවන්ගේ ජාතිගෝත්‍රයෙන් සටා කලහ වැඩුහ— යම්කෙනෙක් ශ්වාන ශෘගාලයන් මෙන් තම නැගණියන් සමඟ එක්ව විසුවාහුද එබඳු කිඹුල්වත් පුර වාසීන්ගේ බලය ගෙණ තෙපි ගර්ජනා කරන්නාහුද — එබන්දන්ගේ ඇත් අස් රථ පාබල සේනාවෝත් ඵලනායුධයෝත් අපට කුමක්කරන්නාහුදැයි කොලිය රජුන්ගේ කම්කරුවෝ කීහ. යම්කෙනෙක් අනාථවූවාහු නතිරහිතවූවෝව තිරිසනුන්මෙන් ඹෙඩබර ගසබිලයෙක වාසය කලාහුද එබඳු කුෂ්ඨකොල්ලන්ගේ බලයගෙණ දුන් තෙපි ගර්ජනා කරන්නහුද— එබන්දන්ගේ ඇත් අස් රථ පාබල සේනාවෝත් ඵලනායුධයෝත් අපට කුමක් කරන්නාහුදැයි ශාක්‍යරජුන්ගේ කම්කරුවෝ කීහ. මෙසේ කලහ වඩා දෙපක්ෂයෙහි වූවෝම ගොස් ඒ ගොවිතැන් කමීයෙහි නියුක්ත ඇමතියන්ට දැන්නූහ. ඒ ඇමතියෝ රජදරුවන්ට දැන්නූහ. ඉක්බිත්තෙන් ශාක්‍ය රජදරුවෝ නැගණියන් සමඟ විසුවන්ගේ ශක්තියත් බලයත් දක්වන්නෙමුයි යුදයට සැරසී නික්මුනාහ. කොලිය රජදරුවෝද ඩෙබරරුක්බිලය වාසීන්ගේ ශක්තියත් බලයත් දක්වන්නෙමුයි යුදයට සැරසී නික්මුනාහ. භාග්‍යවතුන් වහන්සේ එද්න රෑ පිළිබඳ අලුයම් වේලෙහි මහකුළුණු සම්පතින් නැගී ලොව බලනසේක් යථොක්ත පරිදි යුද්ධයට සැරසී සිව්රඟසෙන් සමග නික්මෙන ශාක්‍යකොලිය දෙරට රජුන් දුටුසේක. දැක වනාහි මා ගියකල මෙඩබරය සන්සිඳෙන්නේද නොසන්සිඳෙන්නේදැයි සලකාබලා මම එහි ගොස් කලහය සන්සිඳවීම සඳහා ජාතකත්‍රයක් දෙශනා කරන්නෙමි. එවිට කලහය සන්සිඳෙයි. ඉක්බිති සමගියේ අනුසස් ප්‍රකාශකිරීම පිණිස ජාතකදෙකක් කියා "අත්තදණ්ඩසූත්‍රය" දෙශනා කරන්නෙමි. ඒ මාගේ ධම්දෙශනාව අසා දෙනුවරවාසීහු පැහැද කලහයද නවත්වා මා කෙරෙහි ගෞරවයෙන් දෙරටින් කුමාරයන් දෙසිය පණහ දෙසිය පණහ බැගින් පන්සියයක් කුමරුවන් මට බාරදෙන්නාහුය. මම ඔවුන් මහණකරන්නෙමි එකල්හි මහත් දිව්‍ය සමාගමයක් වන්නේයයි සනිටුහන් කොට ශාක්‍ය කොලියදෙරටවාසීන් යුදයටද සැරසී නික්මුණුකල්හි කිසිවකුටත් නොදන්වා තමන්වහන්සේම පාසිවුරු රැගෙණ වැඩමවා දෙසේනාග අතරෙහි ආකාශයේ පලක් බැදගෙණ ෂඩ්විධරශ්මීන් දසදෙස විහිදුවමින් වැඩ සිටිසේක— කිඹුල්වත්පුර වාසීහු බුදුන් දැක අපගේ ශ්‍රේෂ්ඨඥාතිවරයාවනභාග්‍යවතුන්වහන්සේ වැඩිසේක. අප කලහ කරණ බව උන්වහන්සේ විසින් දක්නාලද්දේම

යයි සිතා බුදුන් වැඩිකල්හි කොලිය නුවර වැස්සෝ අප හැසුවත් පිළිස්සුවත් අතිසාකුට සැත්පහරක් නොදෙම්හයි ආයුධයන් බිම් දමා බුදුන් වැඳ එකත් පසෙක හුන්නාහ. කොලිය නුවර වැස් සෝත් එලෙසම සිතා ආයුධයන් බිම හෙළා බුදුන් වැඳ එකත් පසෙක හුන්නාහ. එවේලෙහි භාග්‍යවතුන් වහන්සේ කාරණය දනිම්න්ම මහරජවරුනි සිව්රඟසෙන් ගෙණකුමක් සඳහා මෙහි අව්දූයි විචාළසේක" ස්වාමිනි තිත්ව ක්‍රීඩාවක් සඳහාවත් පව්ත ක්‍රීඩාවක් සඳහාවත් ගඞ්ගා ක්‍රීඩාවක් සඳහාවත් පම්නාදීයක් දශී නය සඳහාවත් නාම්හ. මෙහිදි යුධයක් කරණුසඳහා ආම්හ"යි කිහ. මහරජුනි. "නුඹලාගේ මේ යුධය කුමක් නිමිත්තකරගෙණදූයි" විචාළ කල්හි ස්වාමිනි "දිය නිමිත්තකර ගෙණයයි" සැලකළහ. මහරජවරුනි, "දිය කොතෙක් අගනේ ද"යි විචාළකල්හි ස්වාමිනි "ස්වල්පයක් අගනේ"යයිකිහ. මහරජ වරුනි, 'මහ පොළොව කොතෙක් අගනේද" ස්වාමිනි "බොහෝ අගනා දෙයක- රජවරු කොතෙක් අගනෝ වෙද්ද ස්වාමිනි රජවරු නම් මිලකළනොහැක්කෝ වෙත්"යයි සැල කළහ

මහරජවරුනි මදක් අගනාදියත්තක් නිසා අනඝිවූරජුන් කුමට නසන්නහුදූයි වදුරා ඛබරයෙහි ආසවාදයෙක් නම් නැත මහ රජුනි ඛබර වශයෙන් අසථානයෙහි වෛරකොට එක්රුක් දෙවියකු විසින් වලසකු සමග බදනා ලද ආඝාතය මේමහා භද්‍රකල්පය මුළුල්ලෙහි පවත්නේයයි වදුරා, "ඵන්දනජාතකය වදළසේක." මහරජවරුනි අනුන්ගේ කියුම් නොවිමසා නොපිළි ගතයුතුවෙත් එක් සාවකුගේකිම අසා තුන්යොදුන්හම වෙසෙතති සියලුසිව්පාවෝ මහමුහුදකරා දිවයන්නෝ වූහ. එහෙයින් අනුන්ගේ කියුම නොවිමසා පිටුවහල් නොකර ගත යුතුවෙත්යයි වදුරා "පඨවිඋද්‍රිශන ජාතකය" වදාළසේක. මහ රජුනි ඇතැම් කලෙක දුබ්ලයා මහත් බලඇත්තහුගේ සිදුරු දකි කිසිකලෙක මහත් බලඇත්තා දුබ්ලයාගේ සිදුරුදකී. කැටකිරිල්ල මහත් ඇතකු මැරවීයයි වදුරා 'ලටුකිකජාතකය" වදළසේක මෙසේ ඛබරය සංසිඳවීම පිණිස ජාතකත්‍රයක් වදුරා සමගි රසයෙහි අනුසස් දැක්වීම සඳහා ජාතකදෙකක් වදළ සේක මහරජුනි සමගිවූවන්ගේ ප්‍රමාදයක් කිසිවකුටත් දක්ක නොහැක්කේයයි වදුරා "වෘක්ෂධම්ජාතකය" වදළසේක යම් දිනෙක ඔවුනොවුන් විවාද කළෝද එදා ඒ වටු රැල වැදීපුත් තෙම දිවි තොරකොට රැගෙණ ගියේය. විවාදයෙහි ආසවාදයක් නම් නැතැයි වදුරා 'වට්ටකජාතකය" වදළසේක. මෙපරිද්දෙන් මේ ජාතකපඤ්චකය වදුරා අන්තයෙහි "අත්තදණ්ඩසූත්‍රය"

වදාළසේක. ශාක්‍ය කෝලිය දෙනුවර රජදරුවෝ පැහැද ඉදින් බුදුන් නොවැඩියේක් නම් අපි සියතින්ම ඔවුනොවුන් කපාකොටාගෙණ ලේගඟක් පවත්වන්නෙමු. ගෙදෙරෙහි අපගේ පුත්‍ර දරුවන් නොදකින්නෙමු. උත්තරප්‍රත්‍යුත්තරයක්පමණවත් අපට කෙණ එන්නෙක් නොවැති වන්නේය. බුදුන් නිසා අපි ජීවිතය ලදුමු. ඉදින් වනාහි බුදුහු ගිහිගේ විසූමාහුනම් දෙදහසක් කොමදෙව් පිරිවරණොවැති සතරමහාදිපය උන්වහන්සේගේ හස්තගතවූවක්වන්නේය උන්වහන්සේට දහසකටවැඩිගණනක් පුත්‍රයෝ ඇතිවන්නාහුය. එවිට ක්ෂත්‍රියයන්විසින් පිරිවරණ ලද්දෙක්වම හැසිරෙන්නේය මූන්වහන්සේ ඒසක්විති රජසැපත හැර මහණව සම්මාසම්බෝධයට පැමිණිසේක දූහුත් නැත් පිරිවරින් යුක්තවම හැසිරෙණසේක්වායි දෙනුවර වැස්සෝ දෙසියපණහ දෙසියපණහ බැගින් කුමරුවන් පන්සිය දෙනකුන් බුදුන්ට බාරදුන්හ සර්වඥයන්වහන්සේ ඔවුන් පැවිදි කරවාගෙණ මහාවනයට වැඩිසේක බුදුන්කෙරෙහි ගෞරවයෙන් විනා තමන්ගේ රුචියෙන් පැවිදි නොවූ ඒ භික්ෂූන් තුල ශාසන ප්‍රතිපත්ති පිරිමෙහි නොඇල්මක් නොබෝ කලක් ගතවෙන්නට පෙර ඇතිවිය ඔවුන්ගේ පෙරබිරිඳෙද ආයාසීපුත්‍රයෙති, "සිව්රුහැර එව් රාජපරම්පරාව නස්නේයයි" යනාදිය කියා පණිවුඩ යවති, ඒ අසා ඔව්හු වැඩියක් උකටලීවූහ. භාග්‍යවතුන් වහන්සේ දිවැසින් බලනසේක් ඒ නවක භික්ෂූන්ගේ කලකිරීම් සවභාවය දැක මේ භික්ෂූහු මාවැනි බුද්ධකෙනකුන්සමග වසන්නාහු සස්නෙහි කලකිරෙති මොවුන්ට හිමාලය වනය වර්ණනාකොට එහි ගෙනගොස් කුණාල විල දක්වා අනභිරතිය සිත්වලින් ඉවත්කරන්නෙමියි සිතා කුණාලවිලවර්ණනා කලසේක එසේ වර්ණනාකලකල්හි ඒ භික්ෂූහු කුණාලවිල දක්නට සතුටුවූහ භාග්‍යවතුන් වහන්සේ මහණෙනි තොපි හිමවතෙහි කුණාල විලදක්නට කැමැත්තෝදැයි විචාරා එසේය ස්වාමීනියි පිළිවදන් ඇස්සූ කල්හි එසේ නම් වරෙල්ලා යමුයයි වදාළසේක එවිට "ස්වාමීනි භාග්‍යවතුන්වහන්ස ඍද්ධිමතුන් විසින් යායුතු තැනකට ඍද්ධිරහිත අපි කෙලෙස යන්නමෝදැයි ඒ භික්ෂූහු භාග්‍යවතුන්වහන්සේට සැල කළහ මහණෙනි "තොපි යනු කැමැත්තහු නම් මම මාගේ ආනුභාවයෙන් ගෙණ යන්නෙමි"යි වදාල කල්හි යහපතැයි මුදුනෙන් පිළිගත් ඒ භික්ෂූන් පන්සියය තමන්වහන්සේගේ ආනුභාවයෙන් අහසින් ගෙණගොස් කුණාලවිල සමීපයෙහි වැඩහිඳ මහණෙනි, මේ කුණාල විලෙහි යම් යම් මසුන්ගේ නම් නොදන්නහු නම් මා

විචාරව්යයි වදාරා විවාල විවාල මිසුන්ගේ නම මෙසේ වෙයෙයි විසඳ වදාළසේක හුදෙක් මිසුන්ගේ පමණක්ෂනාව ඒ වන ලැහැබෙහි වෘක්ෂයන්ගේද පමින පාදයෙහි දෙපා සිව්පා සතුන් ගේද නාමයන් අස්වා විසඳ වදාළසේක එකල්හි පෙරපසින් හා පසුපසින්ද, දෙඅංශයෙන්දූහි සිව්පසින් දහසක් කුණාලපක්ෂි ධෙනුන් විසන් පිරිවරණ ලදුව කුණාල පක්ෂි ධෙනුන් දෙදෙන කුන් පිසින් දෙකෙලවර මුව තුඩින් බැහැගත් දණ්ඩ කඩක් මැද හිඳ එන්නාවූ කුණාලපක්ෂි රාජයා දැක සවාමිනි, "මොහු මේ පක්ෂීන්ගේ රජුයයිද, මේ පක්ෂීහු මොහුගේ පිරිවරණවන්න"යිද හගිම්හයි සැලකළහ මහණෙනි, තොපගේ ඒ හැඟිම එසේමය මේත් මගේවංශයෙක මේක්ෂමගේ ප්‍රවෙණියකැයිවදාරා ආරුඩිතවූ බුදුහු නාථා නුණ්සියයකින් අලඩකාර කොට කුණාල ජාතකය දෙශනාඛිරිමෙන් භික්ෂූන්ගේ අනභිරතිය දුරුකළසේක දෙශනාව කෙලවර ඒ පන්සියයක් භික්ෂුහු සෝවාන් ඵලයෙහි පිහිටියාහුය ආයඹීමාගීය සමගම ඒ පන්සියයක් භික්ෂූන්ට ආකාශගාමී සෘද්ධි යදපහලවිය එහිදී භාග්‍යවතුන් වහන්සේ දූනට මෙතෙකින් මේ භික්ෂූන්ට පමණ වේයයි සිතා වදාරා අහසට නැගී මහාවනයටම වැඩිසේක. ඒ භික්ෂූහුද කුණාල විල තරා යන කල්හි බුදුන්ගේ ආනුභාවයෙන් ගොස් එන කල්හි තමතමන්ගේ අනුභාවයෙන් බුදුන් පිරිවරා අහසින් අවුත් මහාවනයට බැස ගත්හ. භාග්‍යවතුන්වහන්සේ පණවනලද අස්නෙහි වැඩහිඳ ඒ භික්ෂූන් අමතා "එව් මහණෙනි, හිඳ ගණිව්, මතු මාගීත්‍රය වලනා සිටින කෙලෙසුන් නැසීම සඳහා කම් සථාන කියා දෙන්නෙමි"යි කමටහන් වදාළසේක. එකල ඒ භික්ෂූහු මෙසේ සිතූහ. "භාග්‍යවතුන් වහන්සේ අපගේ කලකිරීමදැන කුණාලවිලට ගෙණගොස් නොයෙක් අයුරෙන් දහම් දෙසා අපැතුළු පැවති අනභිරතිය දුරුකළසේක එහිදී ශ්‍රොතාපත්ති ඵලයට පැමිණි අපට මෙහිදි දූන් ඉතිරි මාගීත්‍රය ලබා ගැණිම සඳහා කමටහන් දුන්සේක. අප සෝවාන්වූම්හයි කල්යවන්නට නොවටියි. උත්තම පුරුෂයන් වියයුතුය"යි සිතා බුදුන් පා වැද නැගී සිට නිසිදනයන් පොළා වෙන් වෙන්ව ප්‍රාග්භාර වෘක්ෂ මූලයන්හි හිඳගත්හ. මේ භික්ෂූහු ප්‍රකෘතියෙන්ම නොහළ කම්ාන්තඇත්තෝය, ලබණලද උපාය ඇති භික්ෂූවකට කලානතවීමට කාරණයක් නම නැත. ගිය ගිය පරිද්දෙන් විදසුන් වඩා රහත්බවට පැමිණ තම තමන් විසින් ලබණලද අර්හත් ගුණය දන්වන්නෙමු'යි මාලකට එති. මොවුන් මාලකට ආ කල්හි දස දහසක් චක්‍රවාළයන්හි දෙවියෝ මෙම සක්වළට රැස්වෙති. එකල්හි මහත් දෙව

සමාගමයක් වන්නේයයි සිතා භාග්‍යවතුන් වහන්සේ විවෙක ස්ථානයක බුද්ධාසනයක් පණවාගෙණ වැඩහුන්සේක. සියල්ලන්වම පළමුව කණ්ඩනන් ගෙණ ගිය භික්ෂු තෙමේ සිව්පිළිසිඹියාව සමග රහත්බවට පැමිණියේය. තවත් කෙනෙක තවත් කෙනෙකැයි යනාදී වශයෙන් පියුම්විලෙක්හි පියුම් පිපෙන්නාක් මෙන් ඒ පන්සියක්දෙනා වහන්සේලා අග්‍රඵලයෙන් පුබුදුවූහ. සියල්ලන්ටම පළමු අග්‍රඵලයට පැමිණි භික්ෂුතෙමේ– තමා අග්‍රඵලයට පැමිණි බැව් බුදුන්ට දන්වන්නෙමි'යි පයඹිඩකාය සිඳ නිසිදනය පොළා හැගිට බුදුන්ට අභිමුඛයෙක් විය. මෙසේ අනිකෙක අනිකෙකැ'යි පන්සියක්දෙනා වහන්සේලාම දන්සැලටපිවිසෙන්නාක් මෙන් පිළිවෙළින්ම ආවාහුය. පලමුකොට ආ භික්ෂු තෙමේ බුදුන් වැද නිසිදනය පණවා එකත්පසෙකහිඳ ප්‍රතිලබ්ධ ගුණය බුදුන්ට දන්විනු කැමැත්තේ අන්කිසිවෙකු මෙහි ඇද්ද නැද්දැයි නැවත ආමගබලනුයේ අනිකකුත් අනිකකුත් දුටුසේක. මෙලෙස සියලුදෙනාවහන්සේලාම අවුත් එකත්පසෙක හිඳ එකිනෙකාට මිරිකෙමින් තමතමන් අග්‍රඵලයටපැමිණිබැව් බුදුන්ට සැලනොකොළෝය. "තමන් විසින් ලබණලද ගුණධර්මය දෙවියන් සහිත ලෝකයා වහාදනගන්නේනම් ඉතා යෙහෙකැ'යිද තමන් විසින් අවබෝධකරගන්නාලද ගුණධර්මය අනිකකු විසින් නොදනගන්නා ලද්දේ නම් ඉතා යෙහෙකැ'යිද යනමේ දෙයාකාරය ක්ෂිණාශ්‍රවයන්ගේ සවභාව ධර්මයකි. යටකී පරිදි රහතුන් පන්සියය බුදුන්කරා පැමිණි කල්හි පෙරදිග යුගන්දරැ පරික්ෂෙපයෙන් වලා– පිනි– දුම– ධූලි– රාහු යන උපකෙලශයන්ගෙන් මිදුනු බුද්ධොත්පාදයෙන් හෙබියාවූ– ලෝකයාට රම්‍ය බැව් දක්වනු පිණිස පෙරදිගින් ඔසවනලද රජතමය මහත්ආදශී මණ්ඩලයක්මෙන්ද, නිම්වලල්ලෙන් ගෙණ තරකාවන රිදීමුවා සකක්මෙන්ද ශොභාවත්වූ පුන්සඳමඩල නැගී අනිලපථයට පිළිපන්නේය. එවේලෙහි මේ මහා සමය සූත්‍රය දෙශනාකරන්නට පටන්ගත්සේක. මෙහි වැඩසිටි භාග්‍යවතුන් වහන්සේත් මහා සම්මත වංශයෙහි උපන්සේක. ඒ පන්සියයක් භික්ෂුහුද මහාසම්මතවංශයෙහි උපන්නෝය. භාග්‍යවතුන් වහන්සේත් ක්ෂත්‍රියගර්භයෙහි උපන්සේක. ඒ භික්ෂුහුද ක්ෂත්‍රිය ගර්භයන්හි උපන්නෝය. භාග්‍යවතුන් වහන්සේත් රජ පැවිද්දෙකි. ඒ භික්ෂුහුද රජපැවිද්දෝය. භාග්‍යවතුන් වහන්සේ සේසත හැර හස්තගතවූ සක්විතිරජය බැහැරකොට පැවිදිවූසේක. ඒ භික්ෂුහුද සේසත් හැර හස්තගතවූ රාජ්‍යයන් බැහැරකොට පැවිදිවූවෝය මෙසේ භාග්‍යවතුන් වහන්සේ පිරිසිදුවූ අවකාශ ස්ථානයෙක්හි

පිරිසිදු රාත්‍රිභාගයෙහි තෙමේ පිරිසිදුයේක් පිරිසිදු පිරිවර ඇත්තේ පහවූ රාග ඇතියේක් පහවූ රාග ඇතියන් විසින් පිරිවරණ ලද්දේ පහවූ ද්වේෂ ඇතියේක් පහවූ ද්වේෂ ඇතියන් විසින් පිරිවරණ ලද්දේ පහවූ මෝහ ඇතියේක් පහවූ මෝහ ඇතියන් විසින් පිරිවරණ ලද්දේ, තෘෂ්ණා රහිතයේක්, තෘෂ්ණා රහිතයන් විසින් පිරිවරණ ලද්දේ කෙලෙස් රහිතයේක් කෙලෙස් රහිතයන් විසින් පිරිවරණ ලද්දේ ශාන්තයේක් ශාන්තයන් විසින් පිරිවරණ ලද්දේ, දමුනුයේක් දමිතයන් විසින් පිරිවරණ ලද්දේ මිදුනුයේක් මුක්තයන් විසින් පිරිවරණ ලද්දේ මහාවනයෙහිවූ බුද්ධාසනමස්තකයෙහි කලියුග වර්‍ෂයෙන් දෙදහස්සාරසිය එකානූවන වර්‍ෂයෙහි පොසොන් මස පුර පසළොස්වක් පොහෝදින සන්ධ්‍යාකාලයෙහි බැබළුණුයේක. පන්සියයක් එදවස රහත්වූ භික්ෂූන් විසින් පිරිවරණලදුව යමකි පරිදි මහා සමය සූත්‍රය දේශනාකරන්නට ආරම්භකොට ප්‍රවරබුද්ධාසනාරූඪව වැඩහුන් භාග්‍යවතුන් වහන්සේ අසංඥතලවාසිවූද, අරූතලවාසිවූද, සමවතට සමවන්වූද දෙවියෝ හැර දසදහසක් සක්වළවැසි සියලු දෙව්බඹහු අවුත් පිරිවරාගත්හ. දෙව්බඹුන්ගේ එහි රැස්වීම මෙසේ සිදුවිය- මහාවනය හාත්පස දෙවියෝ වලනය වූහ පින්වත්නි, පළමුකොට බුදුන් දැක්ම මහත් උපකාරයෙක, යවු- දහම් ඇසීමද, බොහෝ උපකාරයෙක, භික්ෂුසඟන දැකීමද බොහෝ උපකාරයෙක, යවු, යවුයි, මහත් ශබ්ද කරමින් අවුත් බුදුන්ද, ඒ මොහොතෙහි රහත් බවට පැමිණි ක්ෂීණාශ්‍රයන්ද, වැඳ එකත්පසෙක සිටියාහුය- මේ උපායෙන්ම ඒ ඒ දෙවියන්ගේ ශබ්දය ශබ්දාන්තර, අඩගව් ගව්, අඩයොදුන්, යොදුන් යනාදීන්ගේ වශයෙන් යොදුන් තුන්දහසක් පුළුල්වූ හිමවතෙහි තෙවරක් පැතිර ගියේය හැටතුන්දහසක් නගරයන්හිද, ද්‍රෝණමුඛ අනූනව ලක්ෂයන්හිද, පටුන්කොටි අනූහයලක්ෂයන්හිද, සපණස්රත්නාකරයන්හිදැයි මෙසේ සියලු දඹදිවිහිද, පූර්වවිදේහය, අපරගෝයානය, උත්තරකුරු යන ද්වීපත්‍රයෙහිද, කොටදෙව් දෙදහසෙහිදැයි සියලු සක්වළෙහිද, ඉක්බිති දෙවන සක්වළෙහිද, තුන්වන සක්වළෙහිදැයි දසදහසක් සක්වළ ශබ්දය පැතිර ගියේය. ඒ අනුසාරයෙන් දසදහසක් සක්වළ දෙවියෝ මහාවනයට රැස්වූහ- මෙසේ රැස්වූ දෙවියන්ගෙන් බඹලොව දක්වා සියලු සක්වළ ගැබ ඉදිකටු ගුළාවෙක්හි අතරක් නැතිව බහාලනලද ඉදිකටු මෙන් පරිපූර්ණවනලද්දක් විය- ලෝහප්‍රාසාදයෙහි මතාහි සත්වෙනකුළුගෙය සමානවූ පාෂාණයක් බඹලොවෙහි සිට යැවීම හෙලන ලද්දේ සිව්මසකින් පොළොව කරා පැමිණෙයි පොළොවෙහි සිට බඹලොව දක්වා

අතර ඇති උස ප්‍රමාණය මේ උපමාවෙන් වැටහෙයි. මේ බඳු මහත් අවකාශය යම්සේ ඇට සිට දමතලද මල් හෝ යවතලද දූලක් හෝ උඩට යත්වත් උඩ සිට දමතලද අඩ ඇට පහතට වැටෙන්නවත් අතරක් නොලබයිද, එසේ අතරක් නැතිව දෙවතාවෝ දූන– යම්සේ වනාහි සක්විතිරජක්හුගේ සම්පය සම්බාධ රහිතවේද, ඇඳ ඇඳ මහෙශාක්‍ය ක්ෂත්‍රියයෝ අවකාශලබද්ද, ඇතින් ඇතින් සිටින්නන්ට දූතා ගැහැට ලැබේද, එපරිද්දෙන්ම බුදුන් ආසන්නයද ගැහැටුම් රහිතවෙයි, අං අං මහෙශාක්‍ය දෙවියෝද, බ්‍රහ්මයෝද, අවකාශ ලබත්මය– එකල්හිදු බුදුන්ගේ ආසන්නස්ථානයෙහි මහාපරිනිර්වාණසූත්‍රයෙහි කිපරිද්දෙන්ම හිදිඅගක් බහාලනපමණපෙදෙසෙහි දෙවතාවෝ දසදෙනෙක් වද, විසිදෙනෙක්වද, තිස්දෙනෙක්මද, සියුම්ආත්මභාවයන් මවාගෙණ සිටියාහුය–සියල්ලන්ට පසුපසින් සැටදෙනෙක් සැට දෙනෙක්ව දෙවතාවෝ සිටියාහුය. මෙසේ බඹලොවදක්වා සක්වළ ගැබ පුරා "අපි අද විචිත්‍ර ප්‍රතිභාණ ධර්මදෙශනාවක් අසම්හයි නිසොල්මන්ව බුදුන් දෙසට නාසිත්නමා සිටගත්හ. මෙසේ සියලුදෙවිබඹුන් රැස්වූකල සුද්ධවස්වැසි ආයශීබ්‍රහ්මයෝ සතරදෙනෙක් සමවතින් නැගීසිටියාහු, සෙසුබඹුන් නොදුත මහාසමාගම්යට ආ බැවි දූත "අපිත් එහි යම්හ"යි සිව්ගයක් ගොතාගෙණ අවුත් අවකාශනොලදින් සිව්දිගසක්වළ මුවවිටෙහි සිට එකී එකී ගයක් කියා රහත් පිරිසට සතුති කළාහ. සහම්පතී මහාබ්‍රහ්මතෙම සියලූ සක්වළ වසාසිටියේය–ඉක්බිති සර්වඥයන්වහන්සේ මෙසේ රැස්වූ දෙව්පිරිස්බලා "යෙපි තෙ භික්ඛවෙඅහෙසුංඅතීතමද්ධානං අරහන්තොසම්මාසම්බුද්ධා" යනාදිය භික්ෂූන්ට වදාළසේක. මෙසේ වදාරා නැවත භව්‍යාභව්‍ය වශයෙන් ඒ දෙව්පිරිස දෙකොටසක් කොට මෙ පමණ දෙනෙක් මාගීඵලාධිගම කළහැක්කෝය. මෙපමණ දෙනෙක් මාගීඵලාධිගම කළ නොහැක්කෝය'යි දූත බුදුවරයන් සියක්දෙනාවහන්සේටවත් අභව්‍යපුද්ගලයන්ව මාගීඵලාව බොධය නොකළ හැකි බැවින් අභව්‍යපුද්ගලයන් හැර නැවත භව්‍යපුද්ගලයන් ගෙණ මෙපමණ දෙනෙක් රාගබොහෝ කොට ඇත්තෝය· මෙපමණ දෙනෙක් ක්‍රොධ බොහෝකොට ඇත්තෝය, මේපමණ දෙනෙක් මෝඩකම බොහෝකොට ඇත්තෝය, මෙතෙක්දෙනා භා භා කල්පනා බොහෝකොට ඇත්තෝය, මේතෙක්දෙනා ඇදහිම බොහෝකොට ඇත්තෝය, මේතෙක්දෙනා නුවණ බොහෝකොට ඇත්තෝ'යයි සකොටස කට බෙද නැවත මේ සයාකාරවූ පිරිසට ප්‍රයොජනවත ධර්‍ම

දෙශනාවක් සලකාබලා වදාරණසේක්, “රාගචරිතදෙවියන්ට “සම්මාපරිබ්බාජනීය” සූත්‍රයද- ද්වේෂචරිතයන්ට- කලහවිවාද සූත්‍රයද- මොහචරිතයන්ට මහාව්‍යූහසූත්‍රයද- විතක්කචරිතයන්ට චූලව්‍යූහසූත්‍රයද-ශ්‍රද්ධාචරිතයන්ට තුවටකප්‍රතිපදාවද- බුද්ධිචරිතයන්ට පුරාභෙදසූත්‍රයද, කියන්නෙමි”යි දෙශනාව නිශ්චය කොට-“අත්තජ්ඣාසයවශයෙන් දෙශනාකරණ ධර්මය දැනගන්නේද? පරජ්ඣාසයවශයෙන් දෙශනාකරණ ධර්මය දැනගන්නේද, අට්ඨුප්පත්තිවශයෙන් දෙශනා කරණ ධර්මයදැනගන්නේද? පුච්ඡාවසිකවශයෙන් දෙශනාකරණධර්මය දැනගන්නේද”යි නැවතත් ඒ පිරිස මෙනෙහිකළ සේක- ඉක්බිති පුච්ඡාවශයෙන් දැනගන්නේය”යි දැන, දෙවතාවන්ගේඅදහසගෙනචරිත වශයෙන් ප්‍රශ්න විචාරන්නට සමර්ථවූ කිසිවෙක් මේ භික්ෂුපිරිස තුළ ඇද්දැයි බැලූසේක-ඒ පන්සියයක් භික්ෂූන් අතුරෙන් එක නමකටවත් නොහැකි බැව් දුටුසේක-ඉක්බිති අසූමහසව්වන්ද දෙඅගසව්වන්ද සිතින් සලකා බලා ඔව්හුද නොහැකිවෙත්යයි දැන ඉදින් පසේබුදු කෙනෙක් වන්නේනම් හැකිවන්නේදැයි සිතූසේක. ඒ පසේබුදුනුත් නොහැක්කෝයැයි දැන ශක්‍රසුයාමාදීන්අතුරෙහි යමෙක් හැකිවන්නේදැයි සිත මෙහෙයා බැලූසේක. ඉදින් ඒ ශක්‍රසුයාමාදීන් අතුරෙන් යමෙක් හැකිවන්නේ නම් ඔහුලවා විචාරවා තෙමේ විසඳන්නෙමියි සිතූසේක. ඔවුන් අතුරෙහිත් එකකුවත් නැතිබැව දුටුසේක- ඉක්බිති භාග්‍යවතුන් වහන්සේට මෙබඳු අදහසක් විය, මාවැනි බුදුකෙනෙක් සමර්ථ වන්නේය, අන්තැනෙක්හි මා වැනි අන්බුදුකෙනෙක් ඇද්දැයි, අනන්තවූලොකධාතුන්හි අනන්තවූඥානයපතුරුවාබලනසේක්, අනික් බුදුකෙනකුන් නුදුටුසේක. යම් හෙයකින් දුන් සම්බුදුකෙනකුන් නොදක්නේද එය ආශ්චර්‍ය්‍යයක් නොවෙයි, උපන් දිනයෙහිද ඒ සිද්ධාර්ථ කුමාරතෙමේ බ්‍රහ්මජාලසූත්‍රඅට්ඨවාවෙහි ක්‍රමයෙන් තමන්හා සමානයකු නොදක්නේ- අශෙෂා සමස්ත ලොකයා- යනාදී පෙර කිසිවකු විසින් නොපවත්වන ලද ශ්‍රෙෂ්ඨනාදය නාදකළ සේක. එමසේ තමා හා සම අන් බුදුකෙනකුන් නොදැක මෙසේ සිතූසේක. ඉදින් මමමප්‍රශනඅසා මමමවිසඳනනෙම් නම්. එසේ ඇති කල්හිත් මේ දෙවතාවෝ ධර්මාව බොධය කරන්නට නොහැකි වන්නාහුය අන්‍ය බුදුකෙනකුන්ම විචාරණ කල්හි මා විසඳන කල්හි ආශ්චර්‍ය්‍යවූලක් වන්නේය. දෙවතාවෝද ප්‍රතිවෙධකරගන්නට හැකිවන්නාහුය. එහෙයින් නිර්මිත බුදුකෙනකුන් මවන්නෙමි යි අභිඥපාදකධ්‍යානයට සමවැද නැගිට “පාසිවුරු ගැන්මද

ඉදිරිපසු බැල්මද, අත්පා දිගහැරීම හා හැකිලීමද, මා සමානම වේවා''යි කාමාවචර සිත් වලින් පිරිකම්කොට ප්‍රාචීන ඝනඳුර පරික්ෂේපයෙන් හඟිනු ලබන්නාවූ සඳමඩල බිඳගෙණ නික්මෙන බුදුකෙනකුන් මෙන් පෙණෙන ලෙස ඉටුසේක. දිව්‍ය සමූහය තෙම ඒ වඩනා නිර්මිත බුදුන් දැක, පින්වත්නි අන්‍ය චන්ද්‍රයෙක් අහසට නැංගේදැයි කීය. ඉක්බිති ඒ නිර්මිත බුදුන් සඳ අත්හැර ඉතා ලන්වූ කල්හි සඳු නොවෙයි, හිරු නැංගේයයිද, නැවත ඊටත් වඩා ලන්වූ කල්හි පින්වත්නි, මේ හිරු නැංගා නොවෙයි, එක් දෙව්විමනක- නැවත තවත් ලන්වූ කල්හි පින්වත්නි, දෙව්විමනෙක් නොවෙයි, එක් දෙව්පුතෙක, නැවත ලන්වූ කල්හි පින්වත්නි, දිව්‍යපුත්‍රයෙක් නොවෙයි, එක් බඹරජෙක, නැවත ලන්වූ කල්හි පින්වත්නි, මහාබ්‍රහ්මයා නොවෙයි, අතික් බුදුකෙනෙක් වැඩියේයයි කීහ. එහි පෘථග්ජන දෙවතාවෝ එක් බුදුකෙනකුන්ට මෙපමණ දෙවතා සන්නිපාතයක්විය. බුදුවරයන් දෙදෙනකුන්ට කොපමණමහත් වන්නේදැයි සිතූහ. එක් ලොකධාතුවක එකවර බුදුවරයෝ දෙදෙනෙක් නූපදිති, ඒකාන්තයෙන් බුදුන් විසින් තමා හා සමවූ අතික් බුදුවරයෙක් නිර්මිත කරණලද්දේයයි, ආර්‍ය්‍ය දෙවතාවෝ සිතූහ. එකල්හි ඒ දෙවසමූහයා බලා සිටියදීම නිර්මිත බුදුවරතෙම අවුත් බුදුන්ට නොවැදම අභිමුඛස්ථානයෙහි සම සම කොට මවනලද අස්නෙහි වැඩහුන්සේක. භාග්‍යවතුන් වහන්සේගේද දෙතිස් මහාපුරුෂලක්ෂණයෝ වූහ. නිර්මිත බුදුන්ගේද එසේම වූහ, බුදුන්ගේද සිරුරින් ෂඩ්වර්ණරශ්මිහු නික්මෙත්, නිර්මිත බුදුන්ගේ සිරුරින්ද ෂඩ්විධ රශ්මිහු නික්මෙත් බුදුන්ගේ ශරීර රශ්මිහු නිර්මිත බුදුන්ගේ සිරුරෙහි හැපෙති. නිර්මිත බුදුනගේ රශ්මිහු බුදුන්ගේ කයෙහි හැපෙත් ඒ ෂඩ්වර්ණ රශ්මිහු බුදුවරයන් දෙදෙනාගේ ශරීරවලින් උද්ගතව අකණිටා බඹලොව හැපී එයින් ආපිට හැරී අවුත් දෙවතාවන්ගේ මස්තක මස්තක පර්‍ය්‍යන්තයෙන් බැස සක්වළ මුවවිටෙහි පිහිටියාහුය. සියලු සක්වල ගැබ සැගෙයන් ස්වර්ණමය ගොණැස් වලින් ගොතන ලද්දක් මෙන් විශෙෂයෙන් බැබලිණි. දසදහස් සක්වළෙහි දෙවතාවෝ එක් සක්වළෙක්හි රැස්වූවෝ බුදුවරයන් දෙදෙනාගේ රැස්හැබතුළට පිවිස සිටියෝය. නිර්මිතබුදුන් හිඳගතිමින්ම බෝවැඩදී සර්වඥයන් වහන්සේගේ කෙලසප්‍රහාණය වර්ණනා කෙරෙමින් 'පුබ්බාභිමුඛිං බහුතාපසැඬං''– යනාදී ගය කීසේක- ශාස්තෲන් වහන්සේ පලමුකොට දෙවියන්ගේසිත් සාදුකාර ගැණිම පිණිස ආ ආ දෙවියන්ගේ නම්ගොත් කියන්

'නෙම්යි සිතා "ආවික්ඛිස්සාමි භික්ඛවෙ" යනාදිය වදළසේක- මේ දෙශනාවෙහි මහාසමය සූත්‍රය නිදාන කථා විස්තරය වන්නේය. ධර්මදෙශනාව නම් යටකී චරිත වශයෙන් වදළ සම්මා පරිබ්බාජනීයාදි සූත්‍රසයයි. භාග්‍යවතුන් වහන්සේ විසින් පවත්වනලද ධර්මසමයන් අතුරෙන් මේ මහාසමය ප්‍රධාන ධර්මසමයක් වන්නේය- අභිධර්ම දෙශනාව හැමත් මෙයද නිර්මිත බුද්ධනෙණකුන් සමග දෙශනා කළ හෙයින් ශ්‍රෙෂ්ඨ ආශ්චර්‍ය්‍ය දෙශනාවක් වය-මේ සූත්‍රදෙශනාවසානයෙහි කොටිලක්ෂයක් දෙවියෝ අර්හත් ඵලයට පැමිණියෝය. සෝවාන් ආදී සෙසු මාර්ගඵලයන්ට පැමිණියවුන්ගේ ගණනක් නොමැත.

### මහා සමය සූත්‍ර නිදානකථාව ලුහුඬින් මෙසේ නිමවනලදී.

---

ප්‍රථම කල්පිකවූ මහාසම්මතරජුගේ රෙජ නම් පුත්‍රයෙක් විය. රෙජ රජුගේ වරරෙජ නම්වූද, වරරෙජ රජුගේ කල්‍යාණ නම්වූද, කල්‍යාණරජුගේ වරකල්‍යාණ නම්වූද, වරකල්‍යාණ රජුගේ මන්ධාතු නම් වූද, මන්ධාතු රජුගේ වරමන්ධාතු නම්වූද, වරමන්ධාතු රජුගේ උපොසථ නම්වූද, උපොසථ රජුගේ චර නම් වූද, චර රජුගේ උපචර නම් වූද, උපචර රජුගේ මඛාදෙව නම්වූද, දෙපුතු පියරජහු පිළිවෙළින් වූහ. මඛාදෙව රජහුගේ පරපුරෙහි අසූහාර දහසක් රජවරු වූහ. ඔවුන්ට පසුව ඔක්කාක වංශිකයෝ තිදෙනෙක් වූහ. ඔවුනතුරෙන් තුන්වන ඔක්කාකරජුගේ එකි එකියට පන්සියයක් පන්සියයක් පිරිවර ඇති හත්‍ථා-චිත්තා-ජන්තු- ජාලිනී- විසාඛා යයි මෙහෙසියෝ පස්දෙනෙක් වූහ. සියල්ලනටදෙටු හත්‍ථා නම් අගමෙහෙසිය ඔක්කාමුඛ- කරකණ්ඩු- හත්ථිනීක- සිනීපූරය යි පුතුන් සිව් දෙනකුන් හා- පියා- සුප්පියා-ආනන්දා- විජිතා- විජිතසේනා යයි දූන් පස්දෙනකුන්ද, යන දරු නවදෙනකුන් වදා කළුරිය කළාය. ඉක්බිති රජතෙමේ මනා ස්වරූප ඇති ළදරු රාජකන්‍යාවක් ගෙණවුත් අගමෙහෙසි තනතුරෙහි තැබීය. ඕතොමෝ ජන්තු නම් පුතකු වදා පස්වන දිනයෙහි නහවා අලඞ්කාරකොට රජහට දැක්වීය. රජතෙමේ අතිශයින් ප්‍රීතියට පැමිණ ඇට වරයක් දුන්නේය. ඒ මෙහෙසී තොමෝ නෑයන් සමග කථාකොට තම පුත්‍ර ජන්තු කුමරුට රාජ්‍යය ඉල්ලීය. එවිට රජතෙමේ එම්බාල වසලිය? තෝ මගේ මැඩිමහලු පුතුන්ට අන්තරායක් කැමතිවන්නෙහියයි, ඇට තර්ජනය කෙළේය. ඕතොමෝ නැවත නැවත රහසිගතව රජු සතුටුකොට "මහරජ, බොරුකිම නම්

ඔබවැන්නන්ට නොවේ" යනාදිය කියමින් තම පුතුට රජය ඉල්ලන්නීමය- මෙලෙස ගැහැටට පත් රජතෙමේ ඉක්බිති පුතුන් සිව්දෙනා ලඟට කැඳවා දරුවෙනි, මම තොපගේ භින්නමාතෘකා සොහොවුරුවූ බාලජනනු කුමරුදක ඔහුගේමවට නොවිමසා වහා වරයක් දුනිමි. ඇ තම පුතුට රජය පවරන්නට කැමැති වන්නීය. මඟුලැතු- මඟුලසු- මඟුල්රිය යන මෙකී වස්තූන් තබා තොපි යම්පමණ කැමැත්තහු නම්, එපමණ ඇත්, අස්, රිය, පාබල සේනාවගෙණ තොපට රුචිතැනකට ගොස් මා ඇවෑමෙන් අවුත් රාජ්‍යය කරව් යයි, ඇමතියන් අටදෙනකුන් සමඟ පිටත් කර හැරියේය. ඒ කුමරුවෝ නානාපුරෙන් අඬා වැලපී. පියාණෙනි, අපගේ දෙස් කමාකළ මැනවයි, පියරජු කමාකරවා ගෙණ අපිත් සොහොවුරන් සමග යමුයි. පියරජු විචාරා නික්මුණු නැගණියන් රැගෙණ සිව්රඟසෙන් සමඟ නුවරින් නික්මුනාහුය. කුමරුවෝ පියරජු ඇවෑමෙන් අවුත් රජය කරන්නාහුය, යමු ඔවුන්ට උපස්ථාන කරන්නෙමුයි, බොහෝ මිනිස්සු පසුපස්සෙහි ආවාහුය. පළමු දිනෙහි යොදනක් තැන් සේනාව විය. දෙවන දිනෙහි දෙයොත්නක් තැන පිරීසිටි සේනාව විය- තුන්වන දිනෙහි තුන්යොත්නක් සේනාව පිරීසිටියේය. ඒ මහත් සේනාව දුක කුමරුවෝ මෙසේ කථාකරගත්හ, "මේ බලසේනාව ඉතා මහති, ඉදින් අපි කිසියම් ආසන්නරටක රජකු මැඩ ජනපදයක් ගත්තෙමු. නම්, එයද අපට නොපොහොනේය. අනුන් පෙළීමෙන් ප්‍රයෝජන කිම, ජම්බුද්වීපය ඉතා මහත වනයෙහි නුවරක් කරගණිමු"යයි කියා හිමවතට අභිමුඛව ගොස් නුවරක් ඉදිකිරීමට යොග්‍ය භූමිභාගයක් සෙවූහ. එසමයෙහි අපගේ මහ බෝසත්තෙම බ්‍රාහමණ මහාසාර කුලයෙහි ඉපිද කපිල නමින් ප්‍රකටවූයේක් ගිහිගෙයින් නික්ම ඍෂි ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව හිමවතෙහි පොකුණු ඉවුරක පන්සැලක්කොට වාසය කරයි. ඒ බෝසත් තවුස්තෙමේ අහසෙහි අසූරියනක්ද, පොළොවයට අසූරියනක්ද, ගුණදෙස් දන්නා භූමිචාල නම් විද්‍යාවක්දනී. ඒ කපිල තවීසා වසන පෙදෙසෙහි තෘණ ලතාදීහු දක්ෂිණාවෘතතව පෙර දිගට මුහුණලා හටගණිත්. සිංහව්‍යාඝ්‍රයෝ මෘගසූකරයන්ද විඩාලයෝ මූෂිකයන්ද පසුපස්සෙහි ලුහුබඳනාහු ඒ පෙදෙසට පැමිණ ලුහුබඳනට නොහැකි වෙති. ඒ මෘගාදීන් විසින් තර්ජනය කරණ ලදුව ව්‍යාඝ්‍රාදීහු නවතිති. ඒ දුක තවුස් තෙමේ මේ පොළොවෙහි අග්‍ර ප්‍රදේශයයි දුන එහි තමන්ට හිඳිනට පන්සැලක් කෙළේය. ඉක්බිති ඒ කුමාරවරු නුවර ඉදිකිරීමට භූමිභාගයක් සොයමින් තමන් වසනතැනට ආකල්හි ඔවුන් කෙරෙහි අනු

කමපා උපදවා කුමාරවරුනි, මේ පන්සැල තිබෙණතැන ඉදිකළ නුවර දඹදිව අගනුවර වන්නේය. මෙහිදී උපන් පුරුෂයෙක් පුරුෂයන් සියයක් දහසක් වුවත් මඩනට සමර්ථ වන්නේය. එබැවින් මෙහි නුවරක් ඉදිකරවී, පන්සැල තිබෙණ තැන රජුට මාලිගාවක් සාදවී, මේ පෙදෙසෙහි හිඳ සැඩොල් දරුවෙක්වුවත් ශක්තියෙන් සක්විති රජකු පරදවන්නේයයි කීකල්හි කුමාරයෝ කියන්නාහු "ස්වාමිනි, ඔබවහන්සේගේ පන්සැල තිබෙණ තන්හි කෙසේ නුවරක් ඉදිකරන්නමෝද" එවිට තවුස්තෙම කියනුයේ "මගේ පන්සැල තිබෙණ තැන යයි අඩුත්තක් නොසිතවී. මට එක් පසෙක පන්සැලක් කරවා නුවර ඉදිකොට "කපිලවස්තු" යයි, නමක් තබවී, කුමාරවරු එසේකොට එහි විසූහ. ඉක්බිති ඇමතියෝ මේ දරුවෝ වැඩිවිය පැමිණියෝය, ඉදින් මොව්හු පියාලඟ සිටියාහු නම්, මොවුන් පිළිබඳ ආවාහ විවාහයන් මෙතෙම කරවන්නේය. දූන් වනාහී ඒ කටයුතු අපට භාරයයි, සිතා කුමරුවන් සමඟ කථාකළහ. කුමාරවරු කියන්නාහු අපට සමගොත්‍ර ඇති කැත් කුමරියන්ද, නගුන්ට සමගොත්‍ර ඇති කැත් කුමරුන්ද, මෙහි නොදක්නෙමු. අසදෘශසංයෝගයෙන් උපන් අපගේ දරුවෝ මව්පසින් හා පියපසින් අපිරිසිදුවූවෝ ජාතිසම්භේදයට පැමිණෙන්නාහුය. එහෙයින් අපි නැගණියන් සමග සංවාසය රුචිකරන්නෙමු'යි ජාතිසම්භේද භයින් වැඩිමහල් නැගණිය මව්තනතුරෙහි තබාගෙණ සෙසු නගුන් සමග එක්ව විසූහ. මෙසේ කල්යත කල්හි එක්දිනක් ඔක්කාක රජතෙමේ තම පුතුන්ගේ පුවත් ඇමතියන් අතින් අසා– සක්‍යාවතභො කුමාරා පරමසක්‍යාවතභොකුමාරාති– කියා ප්‍රීතිවාක්‍යය, පහළ කෙළේය. එහි අදහස. "පින්වත්නි රටින් නෙරපන ලදුව මෙතෙහි වසන්නහුත් ජාතිසම්භේදය නොකොට කුලවංශය රකින්නට සමර්ථයෝය– අති ශයින්ම සමර්ථයෝය"යනුයි– ඔක්කාක රජහුගේ මේ ප්‍රීතිවාක්‍යය හෙතුකොට ගෙණ එතැන්පටන් ඔව්හු ශාක්‍යයෝයයනනාමින් ප්‍රකටවූහ. ශාක්‍යයන්ගේ ආදිපුරුෂතෙම– තුන්වෙනි ඔක්කාක මහරජතෙමේය–

**මෙතෙකින් ශාක්‍යයන්ගේ උත්පත්ති කථාව සමාප්තයි.**

---

දූපුතුන්ගෙන් යහපත්ලෙස වැඩෙන්නාවූ යම්කී ශාක්‍යයන්ගේ මාතෘස්ථානයෙහි තබාගත් වැඩිමහල් නැගණියට කල්යාමකදී කුෂ්ඨරොගයක් ඇතිවිය. සියලු ශරීරවයවයෝ කොබෝලීල මල්මෙන් සුදුවන් වූහ, ඒ දුක රජකුමරුවෝ මැසමග එකතැන

හිඳීම, කෑම, බීමාදිය කරන්නවුන්ට මෙම රොගය බෝවන්නේ,' යයි සිතා එක්දිනෙක උයන්කෙළියට යන්නාක්මෙන් රියකට ඇ නන්වාගෙණ වනයට පිවිස බිම්ගෙයක් සාරා කෑම්බීම් සහිත ඇ එහි බහා උඩින් පුවරුවකා ඊ මත පස් විසුරුවා ගියාහුය. ඒ කාලයෙහි බරණැස්නුවර රාම නම් රජ කුෂ්ඨරොගයෙන් පීඩිත වූයේ අන්තඃපුරවාසින් හා නළුවන් විසින් පිළිකුල් කරනු ලබන්නේ ජනාවාසයෙහි විසීමට නොකැමතිව දෙටුපුතුට රජයදී වනයට පිවිස වනයෙහි ඵලාඵලයන් අනුභව කරන්නේ නොබෝ කලකින් නිරොගීවූයේ රන්වන් සිරුරැ ඇත්තෙක්ව එතැන මෙතැන ඇවිදින්නේ මහත්වූ බිලඇති කොල[1] රුකක් දැක එහි තුළ සොළොස් රියනක් පමණතැන ශුද්ධකොට දොරක් සහ පවන් කව්ළුවක්කොට හිණක් බැඳ එහි වාසය කෙළේය. හෙතෙම අගුරුකබලක ගිනිදල්වා රාත්‍රියෙහි මෘගලිහිණි ආදීන්ගේ හඬ අසමින් නිදයි. අසවල් පෙදෙසෙහි සිංහයෙක් හැඬීය, අසවල් පෙදෙසෙහි ව්‍යාඝ්‍රයෙක් හැඬිය යි දැන අලුයම එහිගොස් සිංහාදීන් විසින් කනලදුව ඉතිරිව තුබූ මස් ගෙණවුත් පිස අනුභව කරයි, ඉක්බිති එක්දිනෙක අලුයම ගිනිදල්වා සතුන්ගේ හඬ අසමින් හුන්කල්හි රජදියනියගේ සිරුරැ ගඳින් අවුත් එක් ව්‍යාඝ්‍රයෙක් ඒ පෙදෙසෙහි පස් ඉවත්කොට පුවරුව විවෘතකෙළේය. ඒ සිදුරෙන් ඇ ව්‍යාඝ්‍රයා දැක බියපත්ව මහත්සේ හැඬුවාය. රාම රජතෙමේ ඒ හඬ අසා මේ ස්ත්‍රී ශබ්දයකැයි දැන උදෑසනම එහිගොස් මෙහිතුළ කවරෙක් වෙසේදැ'යි විචාළේය- හිමිය, මම ස්ත්‍රියක්මියි, කීකල්හි කිනම ජාති ඇත්තියක්දැයි, විචාළේය- ඔක්කාකමහරජහුගේ දියනිය, යයි කීකල්හි පිටතට නික්මෙවයි කීය. ස්වාමීනි, මගේ සම්ගත රොගයක් ඇති බැවින් නොහැක්කෙමි යි කීවාය. රජතෙම සියලුම පුවත අසා ක්ෂත්‍රිය මානය නිසා නොනික්මෙන බැව් දැන, මමත් ක්ෂත්‍රියයෙක්වෙමි, කියා තමන් ක්ෂත්‍රියයකු බැව් හඳුන්වා හිණනබා උඩට නන්වාගෙණ තමා වසන තැණට ගෙණගොස් තමන් අනුභවකළ බෙහෙත්ම සදා යාදී නොබෝකලකින්ම රොගය සුවකරවාගෙණ ඇ සමග වාසය කෙළේය. ඔහොමෝ පළමු සහවාසයෙන්ම ගැබ්ගෙණ පුතුන් දෙදෙනකුන් වැදීය- නැවත දෙදෙනක, යනාදිවශයෙන් දහසයවරෙක පුතුන් දෙතිස්දෙනකුන් වැදුවාය. ඒ පුතුන් සියල්ලන්වම වැඩිවියපැමිණි කල්හි පියරජතෙමේ සියලු ශිල්ප

---

1: කොල යනු මහඩෙබරගසට හා ගජ්ලගසට නමෙක. පැරණි සියලුම සිංහල පොත්වල කොලයනනට, කොලොම් යයි කියා තිබේ. විචයත්වා-

ලන් උගැන්වීය. ඉක්බිති රාමරජුගේ නුවරවාසී එක් වනචරයෙක් පර්වතාදයෙහි රුවන් සොයන්නේ රජුදුන හැඳිනගත්තේය ඔහු අතින් රජතෙම නුවර සියලුම පුවත් දැනගත්තේය, එවේලෙහි ඒ දෙතිස් කුමරුවෝද එතැනට පැමිණියෝය. එවිට මොව්හු කව්රුවෙද්දැයි, නුවර වැසියා විසින් විචාරණ ලද්දුව මගේ පුත්තුයයි, රජතෙම කීය දැන් මා පසින් පඬුරක් ලබණලදැයි, සිතා නුවරට ගොස් රාමරජුගේ පුත්රජෂව ඒ සියලුම තොරතුරු නත්වූ පරිද්දෙන් දැන්වීය, එපුවත් දත් රජතෙමේ පියාණන් ගෙණ එන්නෙමි'යි සිව්රඟසෙන් සමග එහිගොස් පියාණන් වැඳ, දෙවයන් වහන්ස, රාජ්‍යය පිළිගත මැනවැයි, යාච්ඤා කෙළේය, "දරුව, රජයෙන් කම්නැත, එහි නොයමි. මේ රුක ඉවත්කොට මට මෙහිම නුවරක් ඉදිකරවයි" කීය. හෙතෙම එසේ කොට කොල, හෙවත් ඩෙබර රුක ඉවත්කොට නිර්මාණය කළහෙයින් කොලීය, යසිද ව්‍යාඝ්‍රයන් යන මගෙහි කළහෙයින් ව්‍යාඝ්‍රපද්‍ය, යසිද නාමවයක් තබා පියාණන් වැඳ සමුගෙණ තම නුවරට ගියේය. පසුව වැඩිවිය පැමිණි පුත්‍රයන්ට මව කියන්නි, දරුවෙනි, කපිලවස්තු පුරවාසීශාක්‍යයෝ තොපගේ මයිලණුවෝය. තොපගේ මාතුලධීතෲන්ගේ හිස පීරීම මෙලෙසවෙයි. රෙදිහැඳීම මෙලෙසවෙයි. යම්දිනෙක ඔවුන් නානතොටට එද්ද, එදිනගොස් යමකුට යම් තැනැත්තියක් රුචිකෙරේද, හෙතෙම ඇ ගන්නාසේක්වායි කිවාය. ඒ කුමරුවෝ එලෙසම ගොස් ඇලා ස්නානයකොට ඉස්වියලනවේලේ යම්යම් තැනැත්තියක් යමකුට යමකුට කැමතිවීද, ඒ ඒ තැනැත්තියගෙණ තමතමන්ගේ නම් අස්වා ගියාහුය. එපවත් ශාක්‍යරජවරු අසා "පින්වත්නි, එලෙසවේවා ඔව්හු අපගේ ඥතීහුය"යි නිශ්ශබ්ද වූහ. මෙලෙස ශාක්‍යකොලිය රජුන්ගේ වංශ ඔවුනොවුන්ගේ ආවාහ විවාහ සම්බන්ධයෙන් සීහහනු රජුදක්වා පැවතාවෝය. සිංහහනු රජුගේ වනාගී-ශුද්ධෝදන-අමිතෝදන- ධෝතෝදන සක්කෝදන- ශුක්කෝදන යයි පුතුන් පස්දෙනෙක්වූහ. ඔවුනතුරෙන් සුද්ධෝදන රජහුගේ මහාමායා නම් බිසවකුස පුරණලද බෝධිසම්භාර ඇති අපමනබෝසතාණෝ තුසීපුරයෙන් සැවඅවුත් පිළිසිඳ ගෙණ දසමසක්හුගේ ඇවෑමෙන් මව්කුසින් බිහිව ක්‍රමයෙන් වැඩිවිය පැමිණ මහබිනික්මන් කොට සවසක් දුෂ්කර ක්‍රියා කිරීමෙන්පසු සපරිවාර මාරපරාජයකොට වෙසහපුණුපොහෝද සම්‍යක් සම්බෝධි සමධිගම කළසේක-

කොලියරජුන්ගේ උත්පත්තිකථාව සමාප්තයි.

# නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස.

---

1. එවං මෙ සුතං එකං සමයං භගවා සක්කෙසු විහරති කපිලවත්ථුස්මිං මහාවනෙ මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං පඤ්චමත්තෙහි භික්ඛු සතෙහි සබ්බෙහෙව අරහන්තෙහි දසහිච ලොකධාතූහි දෙවතා යෙභුය්‍යෙන සන්නිපතිතා හොන්ති භගවන්තං දස්සනාය භික්ඛු සඞ්ඝඤ්ච.–

2. අථ ඛො චතුන්නං සුද්ධාවාසකායිකානං දෙවානං එතදහොසි අයං ඛො භගවා සක්කෙසු විහරති කපිලවත්ථුස්මිං මහාවනෙ මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං පඤ්චමත්තෙහි භික්ඛුසතෙහි සබ්බෙහෙව අරහන්තෙහි දසහි ච ලොකධාතූහි දෙවතා යෙභු

---

1. මෙ, මාවිසින්; එවං සුතං, මෙසේ අසනලදී නොහොත්; මෙ, මාගේ; සුතං, ශ්‍රැති සඞ්ඛ්‍යාත ඇසීම; එවං, මෙසේය; එකං සමයං, එක්කලෙක; භගවා, භාග්‍යවතුන් වහන්සේ; සක්කෙසු, ශාක්‍යජනපදයෙහි; කපිලවත්ථුස්මිං, කිඹුල්වතට ආසන්න යෙහි වූ; මහාවනෙ, (හිමවතට එකාබද්ධව ස්වයංජාත) මහාවනයෙහි; සබ්බෙහි එව අරහන්තෙහි, සියල්ලන්ම (එදවස) රහත්වූ; පඤ්චමත්තෙහි භික්ඛුසතෙහි, පන්සියයක් පමණ භික්ෂූන්ගෙන් යුක්ත වූ; මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං, මහා භික්ෂු සමූහයක් සමග, විහරති, වාසය කරණසේක; දසහිලොකධාතූහිච, දසදහසක් ලොකධාතුවලින්; දෙවතා, දෙවතාවෝ; යෙභුය්‍යෙන, වැඩිවශයෙන් භගවන්තං, බුදුන්ද; භික්ඛුසඞ්ඝඤ්ච, (එදවස රහත්වූ) භික්ෂුසමූහයාද; දස්සනාය, දකිනුවස්; සන්නිපතිතා හොන්ති, රැස්වූවෝ වෙත්–

2. අථඛො, ඉක්බිත්තෙන්; සුද්ධාවාසකායිකානං, සුද්ධාවාස බඹලොව බවුන්ට අයත්වූ; චතුන්නං දෙවානං, (ආයති බ්‍රහ්මයන් සිව්දෙනකුන්ට; එතං අහොසි, මේ මතු පහලවන අදහස විය; අයං ඛො භගවා, මේ ගෞතම භාග්‍යවතුන් වහන්සේ වනාහී; සක්කෙසු, ශාක්‍යජනපදයෙහි; කපිලවත්ථුස්මිං, කිඹුල්වතට නුදුරෙහිවූ; මහාවනෙ, (හිමවතට එකාබද්ධව තෙමේ හටගත්) මහාවනයෙහි; සබ්බෙහි එවඅරහන්තෙහි; සියල්ලන්ම එදරහත් වූ; පඤ්චමත්තෙහි භික්ඛුසතෙහි, පන්සියයක් පමණ භික්ෂූන් ගෙන් යුක්තවූ; මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං, මහත් භික්ෂුසමූහ

යෙන සන්නිපතිතා හොන්ති භගවන්තං දස්සනාය භික්ඛුසඞ්ඝඤ්ච; යන්නූන මයම්පි යෙන භගවා තෙනුපසඞ්කමෙය්‍යාම උපසඞ්කමිත්වා භගවතො සන්තිකෙ පච්චෙකගාථං භාසෙය්‍යාමාති–

3 අථ ඛො තා දෙවතා සෙය්‍යථාපි නාම බලවා පුරිසො සම්මිඤ්ජිතං වා බාහං පසාරෙය්‍ය පසාරිතං වා බාහං සම්මිඤ්ජෙය්‍ය එවමෙව සුද්ධාවාසෙසු දෙවෙසු අන්තරහිතා භගවතො පුරතො පාතුරහංසු; අථ ඛො තා දෙවතා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨංසු; එකමන්තං ඨිතා ඛො එකා දෙවතා භගවතො සන්තිකෙ ඉමං ගාථං අභාසි.

මහාසමයො පවනස්මිං දෙවකායා සමාගතා
ආගතම්හ ඉමං ධම්මසමයං දක්ඛිතායෙ අපරාජිත සංඝන්ති.

---

යක් සමග; විහරති, වාසය කෙරෙයි; දසහි ලොකධාතූහි ච, දස දහසක් ලොකධාතුවලින්; දෙවතා, දෙවතාවෝ; භගවන්තං, බුදුන්ද; භික්ඛුසඞ්ඝඤ්ච, (එදවස රහත්වූ) භික්‍ෂුසමූහයාද; දස්සනාය, දක්නා පිණිස; යෙභුය්‍යෙන, බොහෝ සෙයින්; සන්නිපතිතා හොන්ති, රැස්වූවෝවෙත්; මයං අපි, අපිදු; යං, යම් හෙයකින්; භගවා, භාග්‍යවතුන් වහන්සේ; යෙන, යම්තැනෙක්හිද; තෙන, එතන්හි; උපසඞ්කමෙය්‍යාම, එළඹෙන්නෙමු නම්; උපසඞ්කමිත්වා, එළඹ; භගවතො සන්තිකෙ, බුදුන් ඉදිරියෙහි; පච්චෙකගාථං, එකිඑකි ගයක්; භාසෙය්‍යාම, කියන්නෙමු නම්; නූන ඉති, ඉතා යෙහෙක.

3. අථ ඛො, ඉක්බිත්තෙන්; තා දෙවතා, ඒ දෙවතාවෝ; බලවා පුරිසො, ශක්තිසම්පන්න පුරුෂයෙක්; සම්මිඤ්ජිතං, හකුළනලද; බාහං, අත; සෙය්‍යථාපි නාම, යම්සේ වනාහී; පසාරෙය්‍ය වා, දිගහරින්නේහෝ වේද; පසාරිතං, දිගහරිනලද; බාහං, අත; සෙය්‍යථාපි නාම; යම්සේ වනාහී; සම්මිඤ්ජෙය්‍ය වා, හකුලන්නේ හෝ වේද; එවං එව, එපරිද්දෙන්ම; සුද්ධාවාසෙසු, ශුද්ධාවාසවාසී; දෙවෙසු, දෙවියන් කෙරෙන්; අන්තරහිතා, අතුරුදන්වූවාහු; භගවතො, භාග්‍යවතුන් වහන්සේගේ; පුරතො, ඉදිරියෙහි; පාතුරහංසු, පහළවූහ; අථ ඛො, (මෙසේ බුදුන් ඉදිරියෙහි පහළවූ) ඉක්බිති; තා දෙවතා, ඒ දෙවතාවෝ; භගවන්තං, බුදුන්; අභිවාදෙත්වා, (භයලොභාදියෙන් විරහිතව) මනාකොට වැඳ; එකමන්තං, එකත්පසෙක; අට්ඨංසු, සිටියාහුය; එකමන්තං, එකත්පසෙක; ඨිතා ඛො; සිටියාවූ; එකා දෙවතා, (ඔවුනතුරෙන්) එක් දෙවතාවෙක්; භගවතො සන්තිකෙ, බුදුන් ඉදිරියෙහි; ඉමං ගාථං, (මහා

අථ ඛො අපරා දෙවතා භගවතො සන්තිකෙ ඉමං ගාථං අභාසි.

තත්‍ර භික්ඛවෝ සමාදහංසු චිත්තං අත්තනො උජුකමකංසු
සාරථීව නෙත්තානි ගහෙත්වා ඉන්ද්‍රියානි රක්ඛන්ති පණ්ඩිතාති.

අථ ඛො අපරා දෙවතා භගවතො සන්තිකෙ ඉමං ගාථං අභාසි,

ඡෙත්වා ඛීලං ඡෙත්වා පලිඝං ඉන්දඛීලං ඌහච්ච මනෙජා
තෙ චරන්ති සුද්ධා විමලා චක්ඛුමතා සුදන්තා සුසුනාගාති

---

සමයො යනාදී) මේගය; අභාසි, කීයේය; පවතසමිං, (මේ) වන ලැහැබෙහි; මහාසමයො, මහත් සමූහසන්නිපාතයක්විය; (එනම්) දෙවකායා, දිව්‍යසමූහයෝ සමාගතා, රැස්වූහ; අපරාජිතසඞ්ඝං, (අදමතුත් මරුන් මැඩ දිනනලද කෙලෙසසඞ්ග්‍රාම ඇති හෙයින් කෙලෙස් සතුරන් විසින් නොපරදවනලද) සඞ්ඝයා; දක්ඛිතායෙ, දකිනුවස්; ඉමං ධම්මසමයං මේ ධර්මසමාගමයට; ආගතා අම්හ; (අපිදු) ආවෝවමූ; අථ ඛො, ඉක්බිත්තෙන්; අපරදෙවතා, අනික්; දෙවතාවෙක්; භගවතො සන්තිකෙ, බුදුන් හමුවෙහි; ඉමං ගාථං, (තත්‍ර භික්ඛවො යනාදී) මේගය; අභාසි, කීය; තත්‍ර, ඒ රැස්වූතන්හි; භික්ඛවෝ, භික්ෂූහු; සමාදහංසු, සමාධියෙන් යෙදුනාහ; (සමාහිතවූ ලොකොත්තර සමාධිය මනාකොට අවිපරීත කලාහුය) අත්තනො, තමතමන්ගේ; චිත්තං, සිත; උජුකං අකංසු, (සියලු කුටිලවඞ්කයන් හැරපියා) ඇද නැතිකළාහුය; පණ්ඩිතා, (ෂඩඞ්ගොපෙක්ෂාවෙන් සමන්විත ගුප්තාචාර ඇති ඒ) පණ්ඩිතයෝ; නෙත්තානි, (සමපමණින් ගමන්ගත් අසුන් ඇතිකල්හි චොදන නිවාරණ රහිව) රැහැන්; ගහෙත්වා, ගෙණ සිටි; සාරථිව, රියැදුරන්මෙන්; ඉන්ද්‍රියානි, ඉඳුරන්; රක්ඛන්ති, රකිත්.

අථ ඛො, ඉක්බිත්තෙන්; අපරදෙවතා, අනික් දෙවතාවෙක් භගවතො සන්තිකෙ, බුදුන් ඉදිරියෙහි; ඉමංගාථං, මේ ගය; අභාසි, කීය; ඛීලං, (රාග ද්වෙෂ මොහ) ඛීලය; ඡෙත්වා, සිඳ; පලිඝං, (රාග ද්වෙෂ මොහ සඞ්ඛ්‍යාත) හණයම; ඡෙත්වා, සිඳ; ඉන්දඛීලං, (රාග ද්වෙෂ මොහ නමැති) ඉන්ද්‍රඛීලය; ඌහච්ච, උදුරා; අනෙජා, තෘෂ්ණෙජරහිතවූ; සුද්ධා, නිරුපක්ලෙශවූ; විමලා, (එහෙයින්ම) නිර්මලවූ; චක්ඛුමතා, (පසැස් ඇතිහෙයින්) චක්ෂුෂ්මත්වූ; සුදන්තා, (චක්ඛු-සොත-ඝාන-ජිව්හා-කාය-මන යන ෂඩ්ද්වාරයෙන්) මොනවට දමුනාවූ; සුසුනාගා, (ඡන්දාදියෙන් අගතියට නොයෙත්නුයි හෝ ඒ ඒ මගින් නසනලද කෙලෙසයන්ට නොපැමිණෙත් නුයි හෝ පව් නොකෙරෙත්නුයිහෝ නාගනම්වූ) ඒ තරුණ නාගයෝ වන; තෙ, ඒ භික්ෂූහු; චරන්ති, (චතුර්දිශාවෙහි අප්‍රතිහත චාරිකාවේ) හැසිරෙත්.

අථ ඛො අපරා දෙවතා භගවතො සන්තිකෙ ඉමං ගාථං අභාසි.

යෙකෙචි බුද්ධං සරණංගතාසෙ නතෙගමිස්සන්ති අපායං
පහාය මානුසං දෙහං දෙවකායං පරිපූරෙස්සන්තීති.

4. අථ ඛො භගවා භික්ඛූ ආමන්තෙසි, යෙභුය්‍යෙන භික්ඛවෙ දසසු ලොකධාතුසු දෙවතා සන්නිපතිතා හොන්ති, තථාගතං දස්සනාය භික්ඛුසඞ්ඝඤ්ච; යෙපි තෙ භික්ඛවෙ අහෙසුං අතීතමද්ධානං අරහන්තො සම්මා සම්බුද්ධා, තෙසම්පි භගවන්තානං, එතපරමායෙව දෙවතා සන්නිපතිතා අහෙසුං සෙය්‍යථාපි මය්හං එතරහි; යෙපිතෙ භික්ඛවෙ භවිස්සන්ති අනාගත මද්ධානං අරහන්තො සම්මා සම්බුද්ධා; තෙසම්පි භගවන්තානං එතපරමායෙව දෙවතා සන්නිපතිතා භවිස්සන්ති සෙය්‍යථාපි මය්හං එතරහි

---

අථඛො, ඉක්බිත්තෙන්; අපරදෙවතා, අනික් දෙවතාවෙක්; භගවතො සන්තිකෙ, බුදුන් හමුවෙහි; ඉමං ගාථං, මේ ගය; අභාසි, කීය; යෙකෙචි, යම්කිසි කෙනෙක්; බුද්ධං, බුදුන්; සරණංගතාසෙ, (නිශ්චිත ශරණාගමනයෙන්) සරණකොට ගියාහුවෙද්ද; තෙ, ඔව්හු තුමූ; අපායං, අපායට; නගමිස්සන්ති. නොයන්නාහුය; මානුසංදෙහං, මිනිස් සිරුර; පහාය, හැර; දෙවකායං, දිව්‍යකායය; පරිපූරෙස්සන්ති, සම්පූර්ණ කරන්නාහුය.

4. අථබො, ඉක්බිති; භගවා, භාග්‍යවතුන් වහන්සේ; භික්ඛු (ඒ තරුණ රහත්) භික්ෂූන්ට; ආමන්තෙසි, ආමන්ත්‍රණයකළසේක; භික්ඛවෙ, මහණෙනි; දසසුලොකධාතුසු, දසදහසක් චක්‍රවාටයන්හි; දෙවතා, දෙවතාවෝ; තථාගතං, තථාගතයන්ද; භික්ඛුසඞ්ඝඤ්ච, භික්ෂුසමූහයාද; දස්සනාය, දකිනුවස්; යෙභුය්‍යෙන, වැඩිවශයෙන්; සන්නිපතිතා හොන්ති, රැස්වූවෝ වෙත්; භික්ඛවෙ, මහණෙනි; අතීතමද්ධානං, ඉකුත්කාලයෙහි; අරහන්තො, අර්හත්වූ; යෙතෙ, යම් ඒ; සම්මාසම්බුද්ධා, සම්‍යක් සම්බුදුවරයෝ; අහෙසුං වූවාහුද; තෙසම්පි භගවන්තානං, ඒ බුදුවරයන් (දැකීම පිණිසත්) එතපරමාඑව, මෙපමණම; දෙවතා, දෙවතාවෝ; සන්නිපතිතා, රැස්වූවෝ; අහෙසුං, වූහ; (කෙසේතක්දයත්) එතරහි, දැන්; මය්හං, මා දැකීම පිණිස; සෙය්‍යථාපි, යම්පමණ රැස්වූවෝද; (එපමණමවූහ) භික්ඛවෙ, මහණෙනි; අනාගත මද්ධානං, අනාගතකාලයෙහි; අරහන්තො, අර්හත්වූ; යෙපිතෙ, යම් ඒ; සම්මාසම්බුද්ධා, සම්‍යක් සම්බුදුවරයෝ; භවිස්සන්ති, වන්නාහුද; තෙසම්පි භගවන්තානං, ඒ බුදුවරයන් (දැකීම පිණිසත්); එතපරමාඑව, මෙපමණම (දෙවතාවෝ); සන්නිපතිතා, රැස්වූවෝ; භවිස්සන්ති, වන්නාහ; (කොපමණ

ආචික්ඛිස්සාමි භික්ඛවෙ දෙවකායානං නාමානි; කිත්තයිස්සාමි, භික්ඛවෙ දෙවකායානං නාමානි; දෙසිස්සාමි භික්ඛවෙ දෙවකායානං නාමානි. තං සුණාථ සාධුකං මනසිකරොථ භාසිස්සාමීති, එවමහන්තෙති ඛො තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං භගවා එතදවොච.

5. සිලොකමනුකස්සාමි යත්ථ භුම්මා තදස්සිතා
යෙසිතාගිරි ගබ්භරං පහිතත්තා සමාහිතා,
පුථුසීහාව සල්ලීනා ලොමහංසාභිසම්භුනො
ඔදාත මනසා සුද්ධා විප්පසන්නමනාවිලා.
භියොපඤ්ච සතෙ ඤත්වා වනෙ කාපිලවත්ථවෙ
තතො ආමන්තයී සත්ථා සාවකෙ සාසනෙ රතෙ,
දෙවකායා අභික්කන්තා තෙ විජානාථ භික්ඛවො
තෙච ආතප්පමකරුං සුත්වා බුද්ධස්ස සාසනං.

---

දයත්) එතරහි, දැන්; මයහං, මා; (දැකිම පිණිස) සෙය්‍යථාපි, යම්පමණරුස්වූවෙද්ද; (එපමණම වන්නාහුය) භික්ඛවෙ, මහණෙනි; දෙවකායානං, (ආ ආ) දිව්‍යසමූහයන්ගේ; නාමානි, නාමයන්; ආචික්ඛිස්සාමි කියන්නෙමි; භික්ඛවෙ, මහණෙනි; දෙවකායානං, (ආ ආ) දිව්‍යසමූහයන්ගේ; නාමානි, නාමයන්; කිත්තයිස්සාමි, කීර්තනය කරන්නෙමි; භික්ඛවෙ, මහණෙනි; දෙවකායානං, (ආ ආ) දිව්‍ය සමූහයන්ගේ නාමානි, නාමයන්; දෙසිස්සාමි, දෙසනා කරන්නෙමි; තංසුණාථ; එය අසව්; සාධුකං, යහපත්කොට; මනසිකරොථ, සිත්හිකරව් භාසිස්සාමි ඉති, කියන්නෙමියි; (වදාළසේක) තෙ භික්ඛූ, ඒ භික්ෂූහු; භන්තෙ, ස්වාමීනි; එවං ඉති ඛො, එසේමයයි කියා; භගවතො භාග්‍යවතුන් වහන්සේට; පච්චස්සොසුං; පිළිවදන් ඇස්සූහ; භගවා, භාග්‍යවතුන් වහන්සේ; එතං, මේ වක්ෂ්‍යමාන පුවත; අවොච; වදාළසේක.

5. සිලොකං, (අක්ෂර පදනියාමිතවූ) වචනසමූහයක්; අනුකස්සාමි; පවත්වන්නෙමි (නොහොත්) ප්‍රකාශ කරන්නෙමි; යත්ථ, යම් යම් තන්හි; භුම්මා, බූමාටු දෙවියෝ වෙසෙද්ද; තදස්සිතා, ඒ ඒ තැන් ඇසුරු කොට වාසය කරන්නාවූ; පහිතත්තා, භාවනාවට යවනලද සිත් ඇති; සමාහිතා, එකඟවූ සිත් ඇති; ලොමහංසාභිසම්භුනො, මඩනලද ලොමුඩැහැගැනුම් ඇති; ඔදාතමනසා, පිරිසිදු සිත් ඇත්තාවූ; සුද්ධා, එහෙයිනම පිරිසිදුවූ; විප්පසන්නා, විශෙෂයෙන් ප්‍රසන්නවූ; අනාවිලා, නොකැළඹුනු සිත් ඇත්තාවූ; සීහා ඉව; කෙශරසිංහයන් මෙන්; සල්ලීනා, සැඟවුනාවූ; (එක් පාංශීවය

6. තෙසංපාතු රහු ඛණං අමනුස්සාන දස්සනං
අප්පෙකෙ සත්ත මද්දක්ඛුං සහස්සං අථ සත්තතිං
සතං එකෙ සහස්සානං අමනුස්සාන මද්දසුං
අප්පෙකෙනන්ත මද්දක්ඛුං දිසා සබ්බා ඵුටා අහු.
තඤ්ච සබ්බං අභිඤ්ඤාය වවක්ඛිත්වාන චක්ඛුමා
තතො ආමන්තයී සත්ථා සාවකෙ සාසනෙ රතෙ,

---

කට ගියාවූ) පුප්ඵු, බොහෝවූ; යෙ,යම් රහත්හුවෙද්ද; (ඔව්හු) ගිරි ගබ්භාරං, පර්වතකුක්ෂි; සිතා, ඇසුරු කළහ; තතො, ඉක්බිත්තෙන් සත්ථා, ශාස්තෲන් වහන්සේ; කාපිලවත්ථුවෙ, කිඹුල්වතට නුදුරෙ හිවූ; මහාවනෙ, (හිමවත හා එකාබද්ධව තෙමේෂ හටගත්) මහා වනයෙහි (සිටිනාවූ); සාසනෙ, අධිශීල-අධිචිත්ත-අධිප්‍රඥ-සඞ්ඛ්‍යාත ශික්ෂාත්‍රයෙහි; රතෙ, ඇලුනාවූ; භිය්‍යොපඤ්චසතෙ, සර්වඥයන් වහන්සේ අධිකකොට ඇති පන්සියයක් පමණවූ; සාවකෙ, සව්වන්; ඤත්වා, දැන; ආමන්තයී, ඇමතූසේක; භික්ඛවෙ, මහණෙනි දෙවකායා, දිව්‍යසමූහයෝ; අභික්කන්තා, රැස්වූහ; තෙ, ඒ දෙව සමූහයන්; විජානාථ, දනිව්; තෙච, ඒ රහත්හුද; බුද්ධස්ස, බුදුන්ගේ, සාසනං, වචනය; සුත්වා, අසා; ආතප්පං, (එකෙනෙහි) ඒ පිණිස වීර්‍යය; අකරුං, කළෝය.

6. තෙසං, ඒ රහතුන්ට; අමනුස්සානං, අමනුෂ්‍යයන්; දස්සනං, දක්නාවූ; ඤාණං, දිවැස්නැණ; පාතුරහු, පහළවිය; අප්පෙකෙ, ඇතැම් රහත්හු; සතං, (අමනුෂ්‍යයන් පිළිබඳ) සියයක්; අද්දක්ඛුං, දුටුවාහුය; සහස්සං, (ඇතැම් රහත්හු අමනුෂ්‍යයන්) දහසක්ද; අථ, නැවත; සත්තතිං, (ඇතැම් රහත්හු අමනුෂ්‍යයන් පිළිබඳ) හැත්තෑදහසක්ද; (දුටහ) එකෙ. ඇතැම් රහත්හු; අමනුස්සානං, අමනුෂ්‍යයන් පිළිබඳවූ; සහස්සානං සතං, ශතසහස්‍රයක් (ලක්ෂයක්); අද්දසුං, දුටහ; අප්පෙකෙ, ඇතැම් රහත්හු; අනන්තං, (සියගණන් වශයෙන් හෝ දහස්ගණන් වශයෙන් පිරිසිඳිය නොහැකි) අනන්ත අමනුෂ්‍යයන්; අද්දක්ඛුං, දුටහ; සබ්බා දිසා, සියලු දිශාවෝ; ඵුටා අහු, අමනුෂ්‍යයන්ගෙන් සම්පූර්ණව ස්පර්ශවූවෝවූහ; චක්ඛුමා, පසැස්ඇත්තාවූ; සත්ථා, ශාස්තෲන් වහන්සේ; තඤ්චසබ්බං, (ඒ භික්ෂූන් අතුරෙන් එකිනෙකා විසින් යමක් යමක් දක්නා ලදද) ඒ සියල්ල; අභිඤ්ඤාය, දැන; වවක්ඛිත්වාන, (අත්ලෙහි රේඛාවක් මෙන් ප්‍රත්‍යක්ෂ වශයෙන්) නිශ්චය කොට; තතො, නැවත; සාසනෙ රතෙ, (අධිශීලාදිවූ හෝ පර්‍ය්‍යාප්ත්‍යාදිවූ හෝ ත්‍රිවිධ (ශාසනයෙහි ඇලුනාවූ; සාවකෙ, සව්වන්ට; ආමන්තයී,

දෙවකායා අභික්කන්තා තෙ විජානාථ භික්ඛවො
යෙසාහං කිත්තයිස්සාමි ගිරාහි අනුපුබ්බසො.

7. සත්තසහස්සා යක්ඛා භුම්මා කාපිලවත්ථවා
ඉද්ධිමන්තො ජුතීමන්තො වණ්ණවන්තො යසස්සිනො,
මොදමානා අභික්කාමුං භික්ඛූනං සමිතිං වනං
ඡස්සහස්සා හෙමවතා යක්ඛා නානත්තවණ්ණිනො.
ඉද්ධිමන්තො ජුතිමන්තො වණ්ණවන්තො යසස්සිනො
මොදමානා අභික්කාමුං භික්ඛූනං සමිතිංවනං,
සාතාගිරාතිසහස්සා යක්ඛා නානත්තවණ්ණිනො
ඉද්ධිමන්තො ජුතිමන්තො වණ්ණවන්තො යසස්සිනො.
මොදමානා අභික්කාමුං භික්ඛූනං සමිතිංවනං
ඉච්චෙතෙ සොළසසහස්සා යක්ඛා නානත්තවණ්ණිනො,

---

අඩගා වදාලසේක; භික්ඛවෙ, මහණෙනි; දෙවකායා, දිව්‍යසමූහයෝ; අභික්කන්තා, පැමිණියාහුය; අහං, මම; වො, තොපට; යෙ, යම්; (දිව්‍යසමූහයන්) ගිරාහි, වචනවලින්; අනුපුබ්බසො, අනුපිළිවෙළින්; කිත්තයිස්සාමි, කීර්තනය කරන්නෙම්ද; තෙ, ඒ දිව්‍යසමූහයන්; විජානාථ, දැනගණිව්

7. කාපිලවත්ථවා, කිඹුල්වත්පුරය ඇසුරුකොට උපන්නාවූ; ඉද්ධිමන්තො, (දිව්‍ය)සෘද්ධිඇත්තාවූ, ජුතිමන්තො, ආනුභාවසම්පන්න වූ; වණ්ණවන්තො, (ශරීර)වර්ණ ඇත්තාවූ; යසස්සිනො, පරිවාරසම්පන්නාවූ; සත්තසහස්සා, සත්දහසක්; භුම්මා යක්ඛා, භූමිනිශ්‍රිත යක්ෂයෝ; භික්ඛූනං සමිතිං, (අභීත්) භික්ෂූන් සමූහය දක්නා පිණිස; වනං, (මේ) මහාවනයට; මොදමානා, සතුටුවෙමින්; අභික්කාමුං, පැමිණියාහ; හෙමවතා, හිමවත්පව්වෙහි උපන්නාවූ; නානත්ත වණ්ණිනො, (නීලාදිවර්ණවශයෙන්)නොයෙක් පැහැඇත්තාවූ; ඉද්ධිමන්තො, (දිව්‍ය) සෘද්ධිඇත්තාවූ; ජුතිමන්තො, ආනුභාවසම්පන්නවූ; වණ්ණවන්තො, (ශරීර) වර්ණ ඇත්තාවූ; යසස්සිනො, පරිවාරසම්පන්නවූ; ඡස්සහස්සා, සදහසක්; යක්ඛා, යක්ෂයෝ; මොදමානා, සතුටුවෙමින්; භික්ඛූනං, (අභීත්) භික්ෂූන් පිළිබඳ; සමිතිං, සමූහය; (දක්නා පිණිස) වනං, (මේ) මහාවනයට; අභික්කාමුං, පැමිණියෝය; සාතාගිරා, සාතාගිරි නම් පර්වතයෙහි උපන්නාවූ; නානත්තවණ්ණිනො, (නීලාදී වර්ණවශයෙන්) නොයෙක් පැහැඇත්තාවූ; ඉද්ධිමන්තො, (දිව්‍ය)සෘද්ධි ඇත්තාවූ; ජුතිමන්තො, ආනුභාව සම්පන්නවූ; වණ්ණවන්තො, (ශරීර)වර්ණ ඇත්තාවූ; යසස්සිනො, පරිවාරසම්පන්නාවූ; තිසහස්සා, තුන්දහසක්; යක්ඛා, යක්ෂයෝ; මොදමානා, සතුටුවෙමින්; භික්ඛූනං, (අභීත්) භික්ෂූන් පිළිබඳ; සමිතිං, සමූහය දක්

ඉද්ධිමන්තො ජුතිමන්තො වණ්ණවන්තො යසස්සිනො
මොදමානා අභික්කාමුං භික්ඛූනං සමිතිං වනං,

8. වෙස්සාමිත්තා පඤ්චසතා යක්ඛා නානත්තවණ්ණිනො
ඉද්ධිමන්තො ජුතිමන්තො වණ්ණවන්තො යසස්සිනො,
මොදමානා අභික්කාමුං භික්ඛූනං සමිතිං වනං
කුම්භීරො රාජගහිකො වෙපුල්ලස්ස නිවෙසනං.
භිය්‍යො නං සතසහස්සං යක්ඛානං පයිරුපාසති,
කුම්භීරො රාජගහිකො සොපාග සමිතිං වනං,

9. පුරිමඤ්ච දිසං රාජා ධතරට්ඨො පසාසති
ගන්ධබ්බානං ආධිපති මහාරාජා යසස්සිසො,

---

නාපිණිස; වනං, (මේ) මහාවනයට; අභික්කාමුං, පැමිණියෝය; ඉති, වුක්තප්‍රකාරයෙන්; නානත්තවණ්ණිනො, (නීලාදී වර්ණවශයෙන්) නොයෙක්වර්ණ ඇත්තාවූ; ඉද්ධිමන්තො (දිව්‍ය) සෘද්ධි ඇත්තාවූ; ජුතිමන්තො, ආනුභාව සම්පන්නවූ; වණ්ණවන්තො, (ශරීර) වර්ණ ඇත්තාවූ; යසස්සිනො, පරිවාර සම්පන්නවූ; සොළසසහස්සා, සොළොස් දහසක්; එතෙ යක්ඛා, මේ යක්ෂයෝ; භික්ඛූනං, (අභීත්) භික්ෂූන් පිළිබඳ; සමිතිං, සමූහය; (දක්නා පිණිස) මොදමානා, සතුටුවෙමින්; වනං, (මේ) මහාවනයට; අභික්කාමුං, පැමිණියෝය.

8. වෙස්සාමිත්තා, වෙස්සාමිත්ත නම් පර්වතයෙහි උපන්නාවූ; නානත්තවණ්ණිනො; (නීලාදිවර්ණවශයෙන්) නොයෙක් පැහැ ඇති; ඉද්ධිමන්තො, (දිව්‍ය) සෘද්ධි ඇති; ජුතිමන්තො, ආනුභාව ඇති; වණ්ණවන්තො, (ශරීර) වර්ණ ඇති; යසස්සිනො, පරිවාරසම්පන්නවූ පඤ්චසතා යක්ඛා, පන්සියයක් යක්ෂයෝ; මොදමානා, සතුටුවෙමින්; භික්ඛූනං (එදවස රහත්වූ) භික්ෂූන් පිළිබඳ; සමිතිං, සමූහය (දක්නා පිණිස); වනං, (මේ) මහාවනයට; අභික්කාමුං, පැමිණියෝය; රාජගහිකො, රජගහනුවර උපන්නාවූ; කුම්භීරො, කුම්භීර නම් යක්ෂයෙක් වෙයි; අස්ස, ඒ කුම්භීර නම් යක්ෂයාගේ; නිවෙසනං, වාසස්ථානය; වෙපුල්ලං, වෙපුල්ල නම් පර්වතයයි; නං, ඔහු; යක්ඛානං, යකුන් සම්බන්ධ; සතසහස්සං භිය්‍යො, වැඩියක් සහිත ලක්ෂයක්; (ලක්ෂයකට වැඩිගණනක්) පයිරුපාසති, පර්‍ය්‍යුපාසනය කරයි; (ඇසුරුකරයි) රාජගහිකො, රජගහනුවර උපන්නාවූ; සොකුම්භීරො අපි, (ඒ) කුම්භීර නම් යක්ෂතෙමේත්; සමිතිං, (රහතුන්) සමූහය; (දක්නා පිණිස); වනං, (මේ) මහාවනයට; ආගා, ආයේය.

පුත්තාපිතස්ස බහවො ඉන්දනාමා මහබ්බලා
ඉද්ධිමන්තො ජුතිමන්තො වණ්ණවන්තො යසස්සිනො.
මොදමානා අභික්කාමුං භික්ඛූනං සමිතිං වනං.
දක්ඛිණස්ස දිසංරාජා විරූළ්හො තං පසාසති
කුම්භණ්ඩානං ආධිපති මහාරාජා යසස්සිසො,
පුත්තාපිතස්ස බහවො ඉන්දනාමා මහබ්බලා
ඉද්ධිමන්තො ජුතිමන්තො වණ්ණවන්තො යසස්සිනො.
මොදමානා අභික්කාමුං භික්ඛූනං සමිතිං වනං
පච්ඡිමස්ස දිසංරාජා විරූපක්ඛානං පසාසති,
නාගානං ආධිපති මහාරාජා යසස්සිසො

---

9. පුරිමස්ස දිසං, පෙරදිගට; රාජා, රජවූ; ධතරට්ඨො, ධෘතරාෂ්ට්‍ර වරම් රජතෙමේ; තං, ඒ පෙරදිග; පසාසති, අනුශාසනා කෙරෙයි; ගන්ධබ්බානං, (සිව්දිගවැසි) ගඳඹුන්ට; ආධිපති, අධිපතිවූ; යසස්සි, පරිවාරසම්පන්නවූ; සො මහාරාජා, ඒ ධෘතරාෂ්ට්‍ර මහරජතෙමේද; තස්ස, ඔහුගේ; ඉන්දනාමා, (ශක්‍රදෙවේන්ද්‍රයාගේ නාමධාරිවූ) ඉන්ද්‍ර යන නම ඇත්තාවූ; මහබ්බලා, මහත් ශක්ති ඇත්තාවූ; ඉද්ධිමන්තො, (දිව්‍ය) සෘද්ධි ඇත්තාවූ; ජුතිමන්තො, ආනුභාව සම්පන්නවූ; වණ්ණවන්තො, (ශරීර) වර්ණ ඇත්තාවූ; යසස්සිනො, පරිවාර සම්පන්නවූ; බහවො, බොහෝවූ; පුත්තාපි, පුත්‍රයෝද; මොදමානා, සතුටුවෙමින්; භික්ඛූනං, (එදවස රහත්වූ) භික්ෂූන් පිළිබඳ; සමිතිං, සමූහය (දක්නා පිණිස); වනං, (මේ) මහාවනයට; අභික්කාමුං, පැමිණියෝය. දක්ඛිණස්ස දිසං, දකුණුදෙසට; රාජා, රජවූ; විරූළ්හො, විරූළ්හ වරම් රජතෙමේ; තං, එදෙස; පසාසති, අනුශාසනා කෙරෙයි; කුම්භණ්ඩානං, කුම්භාණ්ඩයන්ට; ආධිපති, අධිපතිවූ; යසස්සි, පරිවාරසම්පන්නවූ; සො මහාරාජා, ඒ විරූළ්හ නම් මහරජතෙමේද; තස්ස, ඔහුගේ; ඉන්දනාමා, ඉන්ද්‍ර යන නම්ඇති; මහබ්බලා, මහත් ශක්තිඇති; ඉද්ධිමන්තො, (දිව්‍ය) සෘද්ධිඇති; ජුතිමන්තො, ආනුභාව සම්පන්නවූ; වණ්ණවන්තො, (ශරීර) වර්ණ ඇති; යසස්සිනො, සමෘද්ධ පිරිවර ඇති; බහවො, බොහෝවූ; පුත්තාඅපි, පුත්‍රයෝද; මොදමානා, සතුටුවෙමින්; භික්ඛූනං, (එදවස රහත්වූ) භික්ෂූන් පිළිබඳ; සමිතිං, සමූහය දක්නා පිණිස; වනං, (මේ) මහාවනයට; අභික්කාමුං, පැමිණියෝය; පච්ඡිමස්ස දිසං, පැළදිගට; රාජා, රජවූ; විරූපක්ඛො, විරූපාක්ෂ නම් වරම් රජතෙමේ; තං, ඒ දිග; පසාසති, අනුශාසනා කෙරෙයි; නාගානං, නාගයන්ට; ආධිපති, අධිපතිවූ; යසස්සි, සමෘද්ධ පිරිස්ඇති;

පුත්තාපි තස්ස බහවො ඉන්දනාමා මහබ්බලා,
ඉද්ධිමන්තො ජුතිමන්තො වණ්ණවන්තො යසස්සිනො
මොදමානා අභික්කාමුං භික්ඛූනං සමිතිං වනං,
උත්තරඤ්ච දිසං රාජා කුවෙරො තං පසාසති
යක්ඛානං ආධිපති මහාරාජා යසස්සි සො.
පුත්තාපි තස්ස බහවො ඉන්දනාමා මහබ්බලා
ඉද්ධිමන්තො ජුතිමන්තො වණ්ණවන්තො යසස්සිනො,
මොදමානා අභික්කාමුං භික්ඛූනං සමිතිං වනං
පුරිමං දිසං ධතරට්ඨො දක්ඛිණෙන විරූළ්හකො.
පච්ඡිමෙන විරූපක්ඛො කුවෙරො උත්තරං දිසං
චත්තාරො තෙ මහාරාජා සමන්තා චතුරො දිසා
දද්දල්ලමානා අට්ඨංසු වනෙ කාපිල වත්ථවෙ.

---

සො මහාරාජා, ඒ විරූපාක්ෂ නම් මහරජතෙමේද; තස්ස, ඔහුගේ ඉන්ද නාමා, ඉන්ද්‍ර යන නම් ඇත්තාවූ; මහබ්බලා, මහත් ශක්ති ඇත්තාවූ; ඉද්ධිමන්තො, (දිව්‍ය) සෘද්ධි ඇත්තාවූ; ජුතිමන්තො, ආනුභාව සම්පන්නවූ; වණ්ණවන්තො, (ශරීර) වර්ණ ඇත්තාවූ; යසස්සිනො, පරිවාර සම්පන්නවූ; බහවො, බොහෝවූ; පුත්තා අපි, පුත්‍රයෝද; මොදමානා, සතුටුවෙමින්; භික්ඛූනං, (එදවස රහත්වූ) භික්ෂූන් පිළිබඳ; සමිතිං, සමූහය දක්නා පිණිස; වනං, (මේ) මහාවනයට; අභික්කාමුං, පැමිණියෝය; උත්තරඤ්ච දිසං, උතුර දිගට; රාජා, රජවූ; කුවෙරො, වෛශ්‍රවණතෙමේ; තං, ඒ දිසාව; පසාසති, අනුශාසනා කෙරෙති; යක්ඛානං, යක්ෂයන්ට; ආධිපති, අධිපතිවූ; යසස්සී, පරිවාර සම්පන්නවූ; සො මහාරාජා, ඒ වෛශ්‍රවණ නම් මහරජ තෙමේද; තස්ස, ඔහුගේ; ඉන්දනාමා, ඉන්ද්‍රයන නම් ඇති; මහබ්බලා, මහත් ශක්තිඇති; ඉද්ධිමන්තො, (දිව්‍ය) සෘද්ධිඇති ජුතිමන්තො, ආනුභාවසම්පන්නවූ; වණ්ණවන්තො, (ශරීර) වර්ණ ඇති; යසස්සිනො, පරිවාරසම්පන්නවූ; බහවො, බොහෝවූ; පුත්තා අපි, පුත්‍රයෝද; මොදමානා, සතුටුවෙමින්; භික්ඛූනං, (එදවස රහත්වූ) භික්ෂූන් පිළිබඳ; සමිතිං, සමූහය දක්නාපිණිස; වනං, (මේ) මහාවනයට; අභික්කාමුං, පැමිණියෝය; පුරිමං දිසං, පෙරදිගෙහි; ධතරට්ඨො, ධෘතරාෂ්ට්‍ර නම් වරම්රජද; දක්ඛිණෙන, දකුණුදිගෙහි; විරූළ්හකො, විරූළ්හ නම් වරම් රජද; පච්ඡිමෙන, පැලදිගෙහි; විරූපක්ඛො, විරූපාක්ෂ නම් වරම්රජද; උත්තරං දිසං, උතුරුදිගෙහි; කුවෙරො, වෛශ්‍රවණ නම් වරම් රජද යන; එතෙ චත්තාරො මහාරාජා, මෙකී සිව්වරම් මහරජදරුවෝ; කාපිලවත්ථවෙ, කිඹුල්වතට නුදුරෙහිවූ; වනෙ, (හිමවතහා එකාබද්ධව සවයං-

10. තෙසංමායා විනොදසා ආගුවඤ්චනිකාසඨා
මායාකුටෙණ්ඩු වෙටෙණ්ඩු විටූච්චවිටූඩො සහ,
චන්දනොකාම සෙට්ඨොච කින්නුඝණ්ඩු නිඝණ්ඩුච
පණාදෙඔපමඤ්ඤොච දෙවසූතොච මාතලි.
චිත්තසෙනොච ගන්ධබ්බො නළොරාජා ජනෙසභො
ආගුපඤ්චසිඛොචෙව තිම්බරූ සුරියවච්චසා
එතෙචඤ්ඤෙච රාජානො ගන්ධබ්බා සහරාජුභි
මොදමානා අභික්කාමුං භික්ඛූනං සමිතිං වනං.

---

ජන) මහාවනයෙහි;සමන්තා,හාත්පසින්;චතුරෙදිසා, සිව්දිගෙහි; දද්දල්ලමානා, (පජ්ජලමානකයන්හි ගිනිකඳන් මෙන්) දිලිසෙමින් අට්ඨංසු, සිටියාහුය.

10. තෙසං, ඒ සිව්වරම් මහරජදරුවන්ගේ; මායාවිනො, (කලපව් සැඟවීම් ලක්ෂණකොට ඇති) මායාවෙන් යුක්තවූ; වඤ්චනිකා, (සම්මුඛ පරම්මුඛ වඤ්චනාවලින් ලොවරවටන හෙයින්) වඤ්චනික නම්වූ; සඨා, (කෛරාටික සාඨෙය්‍යයෙන් යුක්තහෙයින්) සඨවූ; මායා, (සියල්ලෝම) මායාකාරයෝවූ; කුටෙණ්ඩු, කුටෙණ්ඩුය; වෙටෙණ්ඩු, වෙටෙණ්ඩුය; විටූච්ච, විටූච්චය සහ ඔවුන් සමඟ; විටූඩො, විටූඩ තෙමේද; චන්දනො, චන්දනය; කාම සෙට්ඨොච. කාමසෙට්ඨය; කින්නුඝණ්ඩු, කින්නුඝණ්ඩුය; නිඝණ්ඩු ච, නිඝණ්ඩුය යන; දසා, දසයෝ; ආගු, (මහාවනයට එදවස රහත්වූ භික්ෂූන් සමූහය දක්නා පිණිස) ආවෝය;පණාදෙ, පණාදය; ඔපමඤ්ඤොච, ඔපමඤ්ඤය; දෙවසූතොච, දිව්‍යරථාචාර්‍යවූ; මාතලි, මාතලි නම් දෙව්පුත්‍රය; ගන්ධබ්බො, ගන්ධර්වූ; චිත්ත සෙනොච, චිත්ත 1: සෙනය; නළොරාජා, නළකාර නම්වූ එක් දෙව්රජෙක්; ජනෙසභො, ජනවසභ නම් දෙවපුත්‍රය යන මොවුහු (ආවෝය); පඤ්චසිඛොචෙව, පඤ්චසිඛ නම් දෙව්පුද්ද; තිම්බරූ, තිම්බිරූනම්ගඳඹදෙව්රජද; සූර්‍යවච්චසා, (තිම්බරූ නම් ගඳඹ දෙව්රජුගේ දුහිතෘවූ) සූර්‍යවච්චසාවද (යන මොවුහුද); ආගු, ආවෝය; එතෙචඤ්ඤෙච රාජානො, මෙකී (නම්ගොත් වලින්යුත්)ගඳඹරජවරුද; රාජුභි සහ,(මෙකී) ගඳඹරජුන් සමඟ; අඤ්ඤෙචගන්ධබ්බා, අනික් (බොහෝ) ගන්ධර්වයෝද; මොදමානා, සතුටුවෙමින්; භික්ඛූනං,(එදවස රහත්වූ) භික්ෂූන් පිළිබඳ;සමිතිං සමූහය දක්නා පිණිස; වනං, මහාවනයට; අභික්කාමුං, පැමිණියෝය.

---

1: චිත්තොච සෙනොච, චිත්තසෙනොචාති, තයො දෙව පුත්තා, එකසෙසනයෙන එවං වුත්තා, යනු අටුවා බැවින් චිත්තය, සෙනය, චිත්තසෙනයයි ගන්ධර්වයෝ තිදෙනෙකි. එකශෙෂනයින් මෙසේ කියනලදී.

11. අථාගු නාගසා නාගා වෙසාලා සහතච්ඡකා
කම්බලස්සතරආගු පායාගා සහ ඤාතිභි,
යාමුනා ධතරට්ඨා ච ආගූ නාගා යසස්සිනො
එරාවණො මහානාගො සොපාගා සමිතිං වනං.

යෙ නාගරාජෙ සහසා හරන්ති
දිබ්බා දිජා පක්ඛී විසුද්ධ චක්ඛූ,
වෙහායසා තෙ වනමජ්ඣපත්තා
චිත්‍රා සුපණ්ණා ඉති තෙසං නාමං.

---

11. අථ, ඉක්බිත්තෙන්; නාගසානාගා, නාගසිනම් විලවැසි නාගයෝද; වෙසාලා, වෙසාලිවාසි නාගයෝද; තච්ඡකාසහ, තච්ඡක නම් නාගපිරිස සමග; ආගු, මහාවනයට ආවෝය; කම්බලස්සතරා, (මහමෙර පෙදෙසෙහි වසන ගුරුළන් විසින් පවා බලාත්කාරයෙන් උගුළුවාගත නොහැකි මහෙශාක්‍යවූ) කම්බලස්සතරයන දෙකුලයන්හි උපන් නාගයෝද; පායාගා, පයාග නම් තීර්ථවැසි නාගයෝද; ඤාතිභිසහ, නෑසමූහයා සමග; ආගූ, ආවෝය; යාමුනා, යමුනා නම් ගඟවැසි නාගයෝද; ධතරට්ඨා, ධෘතරාෂ්ට්‍ර කුලයෙහි උපන්නාවූ; යසස්සිනො, පරිවාර සම්පන්න වූ; නාගා, නාගයෝද; ආගු (එදවස රහත්වූ භික්ෂූන් සමූහය දක්නා පිණිස මහාවනයට) ආවෝය; එරාවණො, එරාවණ නම්; සොපිමහානාගො, ඒ මහානාග තෙමේද; සමිතිං, (එදවස රහත් වූ) භික්ෂූන් සමූහය දක්නා පිණිස; වනං, (හිමාල වනය හා එකාබද්ධව සවයංජාත) මහා වනයට; ආගා; ආයේය; දිබ්බා, (දිව්‍යානුභාව ඇති හෙයින්) දිබ්බනම්වූ; දිජා, (මව්කුසින් හා අණ්ඩකොෂයෙන්දූයි) දෙවරක් උපන්හෙයින් දිජනම්වූ; විසුද්ධචක්ඛු, (යොදුන් සියදහස්ගණන් දුරසථනාගයන් දක්නට සමර්ථ දෘෂ්ටි ඇති හෙයින්) විසුද්ධචක්ඛු නම්වූ; යෙපක්ඛී, යම් ගරුඩපක්ෂීහු; නාගරාජෙ, (කම්බලස්සතර දෙකුලයන්හි නාගයන් හැර සෙසු) නාගරාජයන්; සහසා, දරුණුකොට; හරන්ති, ගණීද්ද; තෙ, ඒ ගරුඩ පක්ෂීහු; වෙහායසා, අහසින්ම; වනං, යථොක්ත මහාවනයට; අජ්ඣපත්තා, පැමිණියෝය; චිත්‍රා විසිතුරු මනා පියාපත් ඇති හෙයින්; සුපණ්ණා ඉති, සුපණ්ණා යනුද; තෙසං, ඔවුන්ට; නාමං, නාමයකි; තදා, එකල්හි; නාගරාජානං, නාරජුන්ට; අභයං, නිර්භය; ආසි, විය; බුද්ධො, සර්වඥතෙමේ; සුපණ්ණතො, ගුරුළන් කෙරෙන්; ඛෙමං, නිර්භය; අකාසි, කළයේක; නාගා, නාගයෝද; සුපණ්ණා, සුපර්ණයෝද; සණ්හාභිවාචාහි, මෘදුවචන

අභයං තදා නාගරාජ නමාසි
සුපණ්ණතො ඛෙමමකාසි බුද්ධො,
සණ්හාහි වාචාහි උපව්හයන්තා
නාගා සුපණ්ණා සරණමගංසු බුද්ධං.

12. ජිතා වජිරහත්ථෙන සමුද්දං අසුරාසිතා
භාතරො වාසවස්සෙතෙ ඉද්ධිමන්තො යසස්සිනො,
කාලකඤ්ජා මහාභිංසා අසුරා දානවෙඝසා
වෙපචිත්ති සුචිත්තිච පහාරාදො නමුචී සහ.
සතඤ්ච බලිපුත්තානං සබ්බෙ වෙරොචනාමකා
සන්නය්හිත්වා බලිංසෙනං රාහුභද්දමුපාගමුං
සමයොදානි භද්දන්ත භික්ඛූනං සමිතිංවනං.

13. ආපොච දෙවා පඨවිච තෙජො වායො තදාගමුං,
වරුණාවාරුණා දෙවා සොමොච යසසාසහ.

---

යෙන්; උපව්හයන්තා, (ඔවුනොවුන් තමතමන් වෙතට) කැඳව මින්; බුද්ධං, බුදුන්; සරණං අගංසු, පිහිටකොට ගියාහුය.

12. වජිරහත්ථෙන, විදුරත් නම්ලද සක්දෙවිඳු විසින්; ජිතා (සුජාතා නම් අසුර කන්‍යාව නිමිතිකොට) දිනනලද; සමුද්දං, සමුද්‍රය; සිතා, ඇසුරු කළාවූ; වාසවස්ස, සක්දෙව්රජුගේ; භාතරො, සහොදරවූ; ඉද්ධිමන්තො, (දිව්‍ය) සෘද්ධි ඇත්තාවූ; යසස්සිනො, පරිවාරසම්පන්නවූ; එතෙ අසුරා, මෙකී අසුරයෝද (ආයෝය); කාලකඤ්ජා, (මේ අසුරයන් අතරෙහි); කාලකඤ්ජ නම් අසුරයෝ; මහාභිංසා, මහත් භයඞ්කර (ආත්මභාවයන් මවාගෙණ) ආයෝය; දානවෙඝසා, (අන්‍යවූ) ධනුග්‍රාහක දානවෙඝස නම් අසුරයෝද ආයෝය; වෙපචිත්ති, වෙපචිත්තිය; සුචිත්තිච, සුචිත්තිය; පහාරාදො, පහාරාදය; (යන මෙකී අසුරයෝද ආයෝය) නමුචී, මරදෙව්පුත් තෙමේද; සහ (එකී අසුරයන් සමග ආයේය) සබ්බෙ, සියල්ලෝම; වෙරොචනාමකා, වෙරොච යන නම් ඇත්තාවූ (නොහොත්) තමාගේ මයිලනුවූ රාහු අසුරෙන්ද්‍රයාගේ නාමධාරීවූ; බලිපුත්තානං, බලි නම් අසුරයාගේ පුත්‍රයන් පිළිබඳ; සතං, සියයක්; (ඔව්හු) බලිංසෙනං, අසුර සේනාව (ගෙණ); සන්නය්හිත්වා, සන්නාහසන්නද්ධයෙන් සැරසී; රාහුභද්දං, රාහුඅසුරිඳුකරා; උපාගමුං, එළඹියාහුය; (එසේ එළඹ) තෙ, ඔබට; භද්දං, යහපතක් වේවා; ඉදානි, දැන්; භික්ඛූනං, (රහත්) භික්ෂූන් පිළිබඳ; සමිතිං, සමූහය දක්නා පිණිස; වනං, මහාවනයට (යාමපිණිස); සමයො, සුදුසු කාලය වන්නේයයි කීහ.

13. තදා, එකල්හි; ආපොචදෙවා, ආපොකසිණ සමාපත්තියෙහි (ප්‍රතිකර්මකොට උපන්) දෙවියෝද; පඨවිච, පඨවිකසිණ

මෙත්තා කරුණා කායිකා ආගුදෙවා යසස්සිනො,
දසෙතෙ දසධා කායා සබ්බෙ නානත්තවණ්ණිනො.
ඉද්ධිමන්තො ජුතිමන්තො වණ්ණවන්තො යසස්සිනො,
මොදමානා අභික්කාමුං භික්ඛූනං සමිතිංවනං.

14. වෙණ්හුචදෙවා සහලීච අසමාච දුවෙයමා,
චන්දස්සූපනිසාදෙවා චන්දමාගු පුරක්ඛත්වා.
සූරියස්සූපනිසාදෙවා සූරියමාගු පුරක්ඛත්වා
නක්ඛත්තානි පුරක්ඛත්වා ආගුමන්දවලාහකා

---

සමාපත්තියෙහි (ප්‍රතිසන්ධිකොට උපන්) දෙවියෝද; තෙජොච, තෙජොකසිණ සමාපත්තියෙහි (ප්‍රතිසන්ධිකොට උපන්) දෙවියෝද වායො, වායොකසිණ සමාපත්තියෙහි (ප්‍රතිසන්ධිකොට උපන්) දෙවියෝද; වරුණා, වරුණ නම් දෙවියෝද; වාරුණා, වාරුණ නම් දෙවියෝද; සොමොච, සොම නම් දෙවිතෙමේද; යසසාසහ යස නම් දෙවියා සමග; ආගඤ්ඡුං, (මහාවනයට) ආවෝය; යසස්සිනො, පරිවාර සම්පන්නාවූ; මෙත්තා කරුණා කායිකා, මෙත් දැහැනින් හා කුළුණුදැහැනින් (ප්‍රතිසන්ධිකොට උපන්) දෙවනිකායට අයත්; දෙවා, දෙවියෝ; ආගු, ආවෝය; සබ්බෙ, සියල්ලෝම; නානත්තවණ්ණිනො, (නීලාදී වර්ණවශයෙන්) නොයෙක්වර්ණ ඇත්තාවූ; ඉද්ධිමන්තො, (දිව්‍ය) සෘද්ධි ඇත්තාවූ; ජුතිමන්තො, ආනුභාව සම්පන්නාවූ; වණ්ණවන්තො, (ශරීර)වර්ණ ඇත්තාවූ; යසස්සිනො, පරිවාරසම්පන්නාවූ; එතෙදසකායා, මෙකී දෙවසමූහයෝ දසදෙන; මොදමානා, සතුටුවෙමින්; භික්ඛූනං, (එදවසරහත්වූ) භික්ෂූන් (පිළිබඳ); සමිතිං, සමූහය දක්නා පිණිස; දසධා, දශප්‍රකාරයකින් වනං, මහාවනයට; අභික්කාමුං, පැමිණියෝය.

14. වෙණ්හුචදෙවා, වෙණ්හු නම් දෙවියෝද; සහලීච, සහලී නම් දෙවියෝද; අසමාච, අසම නම් දෙවියෝද; දුවෙයමා, යම නම් දෙදෙනය යන මොව්හුද; චන්දස්සූපනිසා, සඳ ඇසුරු කළ; දෙවා, දෙවියෝ; චන්දං, සඳ; පුරක්ඛත්වා, පෙරටුකොටද; ආගු, ආවෝය; සූරියස්සූපනිසා, හිරු ඇසුරුකළ; දෙවා, දෙවියෝ සූරියං, හිරු; පුරක්ඛත්වා, පෙරටුකොට; ආගු, ආවෝය; නක්ඛත්තානි, නැකැත්තරු ඇසුරුකරණ දෙවියෝ; පුරක්ඛත්වා, නැකැත්තරු පෙරටුකොට (ආවෝය); මන්දවලාහකා, (වාතවලාහක අබ්භවලාහක- උණ්හවලාහක සඞ්ඛ්‍යාත) මන්දවලාහක දෙවියෝ; ආගු, ආවෝය; වසූනං, දෙවියන්ට; සෙට්ඨො, ශ්‍රෙෂ්ඨවූ හෙයින්; වාසවො, වාසවනම්වූද; පුරින්දදෙ, පෙර දන්දුන්හෙයින් පුරින්දද

වසූනං වාසවො සෙට්ඨො සක්කොපාග පුරින්දදො.
දසෙතෙදසධාකායා සබ්බෙනානත්ත වණ්ණිනො
ඉද්ධිමන්තො ජුතීමන්තො වණ්ණවන්තො යසස්සිනො
මොදමානා අභික්කාමුං භික්ඛූනං සමිතිං වනං.

15. අථාගුසහභූදෙවා ජලමග්ගි සිඛාරිව
අරිට්ඨකාච රොජච උම්මාපුප්ඵනිභාසිනො
වරුණාසහ ධම්මාච අච්චුතාච අනෙජකා
සූලෙය්‍ය රුචිරා ආගු ආගුවාසවනෙසිනො.
දසෙතෙ දසධාකායා සබ්බෙනානත්ත වණ්ණිනො
ඉද්ධිමන්තො ජුතීමන්තො වණ්ණවන්තො යසස්සිනො
මොදමානා අභික්කාමුං භික්ඛූනං සමිතිංවනං.

---

නම්වූද; සක්කොපි, ශක්‍රතෙමේත්; ආග, ආයේය; සබ්බෙ, සියල්ලෝම; නානත්තවණ්ණිනො, (නීලාදිවර්ණ වශයෙන්) නොයෙක් වර්ණ ඇත්තාවූ; ඉද්ධිමන්තො, (දිව්‍ය) සෘද්ධි ඇත්තාවූ; ජුතීමන්තො, ආනුභාව සම්පන්නාවූ; වණ්ණවන්තො, (ශරීර) වර්ණ ඇත්තාවූ; යසස්සිනො, පරිවාරසම්පන්නාවූ; එතෙදසකායා, මෙකී දිව්‍යසමූහ යෝ දසදෙන; මොදමානා, සතුටුවෙමින්; භික්ඛූනං, (එදවස රහත්වූ) භික්ෂූන් පිළිබඳ; සමිතිං, සමූහය දක්නා පිණිස; දසධා, දසපරිද්දකින; වනං, මහාවනයට; අභික්කාමුං, ආවෝය.

15. අථ, ඉක්බිත්තෙන්; සහභූදෙවා, සහභූනම් දෙවියෝ; ජලමග්ගිසිඛා ඉව,[1] දිලියෙන ගිනිසිළුමෙන්; ආගු, ආවෝය; අරිට්ඨකාච, අරිට්ඨක නම් දෙවියෝද; රොජච, රොජ නම් දෙවියෝද; උම්මාපුප්ඵනිභාසිනො, දියබෙරලිය මල් පැහැයෙන් බබලන, උම්මාපුප්ඵ නම් දෙවියෝද; වරුණා, වරුණ නම් දෙවියෝද; සහධම්මාච, සහධම්ම නම් දෙවියෝද; අච්චුතාච, අච්චුතනම් දෙවියෝද; අනෙජකා, අනෙජක නම් දෙවියෝද; සූලෙය්‍ය රුචිරා, සූලෙය්‍යය රුචිරය යන දෙවියෝද; ආගු, ආවෝය; වාසවනෙසිනො, වාසවනවාසී දෙවියෝද; ආගු, ආවෝය; සබ්බෙ, සියල්ලෝම; නානත්තවණ්ණිනො, (නීලාදිවර්ණ වශයෙන්) නොයෙක් පැහැඇත්තාවූ; ඉද්ධිමන්තො, (දිව්‍ය) සෘද්ධි ඇත්තාවූ; ජුතීමන්තො, ආනුභාව ඇත්තාවූ; වණ්ණවන්තො, (ශරීර) වර්ණ ඇත්තාවූ; යසස්සිනො, පරිවාරසම්පන්නාවූ; එතෙදසකායා, මෙකී දිව්‍යසමූහයෝ දසදෙන; මොදමානා, සතුටුවෙමින් භික්ඛූනං, (එදවස රහත්වූ) භික්ෂූන් පිළිබඳ; සමිතිං, සමූහය දක්නා පිණිස; දසධා, දශප්‍රකාරය කින; වනං. මහාවනයට; අභික්කාමුං, පැමිණියෝය.

---

1: ජලමග්ගිව, සඛාරිවාති ඉමානි තෙසං නාමානි තිපි වුත්තං, යනු අටුවාපාඨබැවින් ජලමග්ගි යනුද, සිඛාරි යනුද, ඔවුන්ට නමයයිද කියනලදී.

16. සමානා මහාසමානා මානුසා මානුසුත්තමා
ඛිඩ්ඩාපදූසිකා ආගු ආගුම්මනොපදූසිකා,
අථාගු හරයො දෙවා යෙච ලොහිතවාසිනො
පාරගා මහාපාරගා ආගු දෙවා යසස්සිනො.
දසෙතෙ දසධා කායා සබ්බෙ නානත්තවණ්ණිනො
ඉද්ධිමන්තො ජුතීමන්තො වණ්ණවන්තො යසස්සිනො
මොදමානා අභික්කාමුං භික්ඛූනං සමිතිං වනං.

17. සුක්කා කරුම්හා අරුණා ආගු වෙඝනසා සහ
ඔදාතගය්හා පාමොක්ඛා ආගු දෙවා විචක්ඛණා
සදාමත්තා හාරගජා මිස්සකාච යසස්සිනො
ථනයං ආගු පජ්ජුන්නො යො දිසා අභිවස්සති

---

16. සමානා, සමානය;; මහාසමානා, මහාසමානය; මානුසා, මානුසය; මානුසුත්තමා, මානුසුත්තමය; ඛිඩ්ඩාපදූසිකා, ඛිඩ්ඩාපදූසිකය යන දෙවියෝ; ආගු, ආවෝය; මනොපදූසිකා, මනොපදූසික දෙවියෝද; ආගු, ආවෝය; අථ, ඉක්බිත්තෙන්; හරයො දෙවා, හරිනම් දෙවියෝද; ආගු, ආවෝය; ලොහිතවාසිනො, රත් තල්වාසීවූ; යෙච, යම්දෙවිකෙනෙක් වෙද්ද ඔව්හුද; පාරගා, පාරග නම්වූද; මහාපාරගා, මහාපාරග නම්වූද; යසස්සිනො, පරිවාරසම්පන්නවූ; දෙවා, දෙවියෝ; ආගු, ආවෝය; සබ්බෙ, සියල්ලෝම; නානත්තවණ්ණිනො, (නීලාදිවර්ණවශයෙන්) නොයෙක්වර්ණ ඇත්තාවූ; ඉද්ධිමන්තො, (දිව්‍ය) සෘද්ධි ඇත්තාවූ; ජුතිමන්තො, ආනුභාවසම්පන්නවූ; වණ්ණවන්තො, (ශරීර) වර්ණ ඇත්තාවූ; යසස්සිනො, පරිවාරසම්පන්නවූ; එතෙ දසකායා, මෙකී දිව්‍යසමූහයෝ දසදෙන; මොදමානා, සතුටුවෙමින්; භික්ඛූනං, (එදවස රහත්වූ) භික්ෂූන් පිළිබඳ; සමිතිං, සමූහය දක්නාපිණිස; දසධා, දශප්‍රකාරයකින්; වනං, (හිමාලය වනය හා එකාබද්ධව සවයංජාත) මහාවනයට; අභික්කාමුං, පැමිණියෝය.

17. සුක්කා, සුක්කනම්වූද; කරුම්හා, කරුම්හ නම්වූද; අරුණා, අරුණ නම්වූද; සහ, මෙකී දෙවියන් සමග; වෙඝනසා, වෙඝනස නම් දෙවියෝද; ආගු, ආවෝය; ඔදාතගය්හා, ඔදාතගය්හ නම්වූ පාමොක්ඛා, පාමොක්ඛ දෙවියෝද; විචක්ඛණාදෙවා, විචක්ඛණ නම් දෙවියෝද; ආගු, ආවෝය; සදාමත්තා, සදාමත්ත නම් දෙවියෝද; හාරගජා, හාරගජනම් දෙවියෝද; යසස්සිනො, පරිවාරසම්පන්නවූ; මිස්සකාච, මිස්සක දෙවියෝද(ආවෝය); යො, යමෙක් තෙම; දිසා අභිවස්සති (ගිය ගිය දිගුන්)වැසී වස්කෙරේද; පජ්ජු-

දසෙතෙ දසධා කායා සබ්බෙ නානත්තවණ්ණිනො
ඉද්ධිමන්තො ජුතිමන්තො වණ්ණවන්තො යසස්සිනො
මොදමානා අභික්කාමුං භික්ඛූනං සමිතිං වනං.

18. ඛෙමියා තුසිතා යාමා කට්ඨකා ච යසස්සිනො
ලම්බීතකා ලාමසෙට්ඨා ජොතිනාමා ච ආසවා
නිම්මානරතිනො ආගු අථාගු පරනිම්මිතා
දසෙතෙ දසධා කායා සබ්බෙ නානත්තවණ්ණිනො.
ඉද්ධිමන්තො ජුතිමන්තො වණ්ණවන්තො යසස්සිනො
මොදමානා අභික්කාමුං භික්ඛූනං සමිතිං වනං.

---

නො, (ඒ) පජ්ජුන්න නම් දෙවිතෙමේද; ථනයං, මෙඝනාද කෙරෙමින්; ආගු, ආයේය; සබ්බෙ, සියල්ලෝම; නානත්තවණ්ණිනො, (නීලාදී වර්ණවශයෙන්) නොයෙක් වර්ණ ඇත්තාවූ; ඉද්ධිමන්තො, (දිව්‍ය) සෘද්ධි ඇත්තාවූ; ජුතිමන්තො, ආනුභාව සම්පන්නාවූ; වණ්ණවන්තො, (ශරීර) වර්ණ ඇත්තාවූ; යසස්සිනො, පරිවාර සම්පන්නාවූ; එතෙ දසකායා, මෙකී දිව්‍යසමූහයෝ දසදෙන; මොදමානා, සතුටුවෙමින්; භික්ඛූනං, (එදවස රහත්වූ) භික්ෂූන් (පිළිබඳ); සමිතිං, සමූහය දක්නා පිණිස; දසධා, දශප්‍රකාරයකින්; වනං, මහාවනයට; අභික්කාමුං, පැමිණියෝය

18. ඛෙමියා, ඛෙමිය නම් දෙවියෝද; තුසිතා, තුසීපුරවැසි දෙවියෝද; යාමා, යාම නම් දෙව්ලොව්වැසි දෙවියෝද; යසස්සිනො, පරිවාර සම්පන්නාවූ; කට්ඨකා ච, කට්ඨක නම් දෙවියෝද; ලම්බීතකා, ලම්බීතක නම් දෙවියෝද; ලාමසෙට්ඨා, ලාමසෙට්ඨ නම් දෙවියෝද; ජොති නාමා ච, ජොතිනම් දෙවියෝද; ආසවා, ආසවනම් දෙවියෝද; නිම්මානරතිනො, නිම්මානරතී නම් දෙව්ලොව්වැසි දෙවියෝද; ආගු, ආවෝය; අථ, ඉක්බිත්තෙන්; පරනිම්මිතා, පරනිර්මිත දෙව්ලොව වැසි දෙවියෝද; ආගු, ආවෝය; සබ්බෙ, සියල්ලෝම; නානත්තවණ්ණිනො, (නීලාදිවර්ණවශයෙන් නොයෙක්) වර්ණ ඇත්තාවූ; ඉද්ධිමන්තො, (දිව්‍ය) සෘද්ධි ඇත්තාවූ; ජුතිමන්තො, ආනුභාවසම්පන්නාවූ; වණ්ණවන්තො, (ශරීර) වර්ණ ඇත්තාවූ; යසස්සිනො, පරිවාරසම්පන්නාවූ; එතෙ දසකායා, මෙකී දිව්‍යසමූහයෝ දසදෙන; මොදමානා, සතුටුවෙමින්; භික්ඛූනං, (එදවස රහත්වූ) භික්ෂූන්ගේ; සමිතිං, සමූහය දක්නා පිණිස; දසධා, දසපරිද්දකින්; වනං, මහාවනයට; අභික්කාමුං, ආවෝය; සබ්බෙ, සියල්ලෝම; නානත්තවණ්ණිනො, (නීලාදී වර්ණ වශයෙන්) නොයෙක් පැහැ ඇත්තාවූ; එතෙ

සට්ඨෙතෙ දෙවනිකායා සබ්බෙ නානත්තවණ්ණිනො
නාමන්වයෙන ආගඤ්ඡුං යෙ චඤ්ඤෙ සදිසා සහ,
පවුට්ඨජාතිං අඛිලං ඔඝතිණ්ණමනාසවං
දක්ඛෙමොඝතරං නාගං චන්දංව අසිතාතිගං.

19. සුබ්‍රහ්මා පරමත්තො ච පුත්තා ඉද්ධිමතො සහ
සනංකුමාරො තිස්සො ච සොපාග සමිතිං වනං,
සහස්සං බ්‍රහ්මලොකානං මහාබ්‍රහ්මාභිතිට්ඨති
උපපන්නො ජුතිමන්තො භිස්මාකායො යසස්සි සො.
දසෙත්ථ ඉස්සරා ආගූ පච්චෙකවසවත්තිනො
තෙසඤ්ච මජ්ඣතො ආග හාරිතො පරිවාරිතො.

---

සට්ඨී දෙවනිකායා, (මේ) දිව්‍යසමූහයෝ; හැටදෙන නාමන්වයෙන, නම් කොටස් වශයෙන්; ආගඤ්ඡුං, ආයෝය; අඤ්ඤෙ, මෙසින් අන්‍යවූ; සදිසා, (වර්ණයෙන් හා නාමයෙනුත් යටකී දෙවියන්ට) සමානවූ; යෙච. (අන්‍යචක්‍රවාලයන්හි) යම් දෙවිකෙනෙක් වෙද්ද ඔව්හුද; සහ; ඒ දිව්‍යසමූහයන් හැටදෙනා සමගම (ආයෝය;) පවුට්ඨජාතිං, පහවූ ජාතිඇති; අඛිලං. (රාගාදී) ඛිල්රහිතවූ; ඔඝතිණ්ණං, (කාමාදී) චතුරෞඝයන් තරණය කළාවූ; අනාසවං, (කාමාදී) ආශ්‍රව රහිතවූ; (සඩ්ඝයාද) ඔඝතරං, (කාමාදී) චතුරෞඝයන් තරණයකළාවූ; නාගං, (අපරාධ නොකරණහෙයින්) නාගනම්වූ; අසිතාතිගං, තෘෂ්ණාභාවය ඉක්මගියාවූ; චන්දං ඉව, චන්ද්‍රයාමෙන් (බබලන බුදුන්ද); දක්ඛෙම, දකින්නෙමුයි (මෙබඳු ප්‍රයෝජනයක් සඳහා යටකී දෙවාදීහු මහාවනයට ආයෝය);

19. සුබ්‍රහ්මා, සුබ්‍රහ්මය; පරමත්තොච, පරමත්තයයන මේ බ්‍රහ්මයෝ දෙදෙනද; සනඞ්කුමාරො, සනත්කුමාරද; තිස්සොච, තිස්ස නම් මහාබ්‍රහ්මයාද යන මොව්හු; ඉද්ධිමතො, සෘද්ධිමත්වූ; (බුදුන්ගේ); පුත්තාසහ, පුත්‍රවූ ආර්‍යබ්‍රහ්මයන් සමගම (ආයෝය); බ්‍රහ්මලොකානං, (එකැගිල්ලකින් එක්දහසක් සක්වළෙහිද දසැගිල්ලකින් දසදහසක් සක්වළෙහිද ආලෝකය පැතිරවීමට සමර්ථවූ) මහාබ්‍රහ්මයන් පිළිබඳ; සහස්සං, දහසක් (ආයෙය;) උපපන්නො, බඹලොව උපන්නාවූ; ජුතිමන්තො, ආනුභාව සම්පන්නවූ; භිස්මාකායො, (මගධරටෙහි ග්‍රාමක්ෂෙත්‍ර දෙකක් තුනක් පමණ) මහත් කයක් ඇති; යසස්සි සො, (ආත්මභාව සඞ්ඛ්‍යාත) යශස් ඇත්තාවූ; බ්‍රහ්මා, මහබඹෙක්; අභිතිට්ඨති, (බඹුන් දහසක් අතරෙහි එක එක මහබඹෙක් වර්ණයෙන් හා යශසින්ද අධිපතිභාවයෙන්ද අනබිඹුන ගේ එබිවැ(ඝ) සිටී; දසාපි, ඒ මහබඹුනතමෙත් සමිතිං, භික්ෂු යමූ

20. තෙච සබ්බෙ අභික්කන්තෙ සඉන්දෙ දෙවෙ සබ්‍රහ්මකෙ
මාරසෙනා අභික්කාමුං පස්සකණ්හස්ස මන්දියං,
එථ ගණ්හථ බන්ධථ රාගෙනබද්ධමත්ථුවො
සමන්තා පරිවාරෙථ මාවොමුඤ්චථ කොචිනං.
ඉතිතත්ථ මහාසෙනො කණ්හසෙනං අපෙසයි
පාණිනාතලමාහච්ච සරංකත්වාන භෙරවං
යථාපාවුස්සකො මෙඝො ථනයන්තො සවිජ්ජුකො
තදාසො පච්චුදාවත්ති සංකුද්ධො අසයංවසී.

---

හාර (දක්නා පිණිස;) වනං, මහාවනයට; ආග, ආයේය; එත්ථ, මේ බඹපිරිසෙහි; පච්චෙකවසවත්තිනො (එක් එක් බඹුන් දහසෙක්හි වෙන් වෙන් වශයෙන් තම්පිරිස්) වශයෙහි පවත්වන්නාවූ; ඉස්සර, අධිපතිවූ; දස; බඹහුදස දෙනෙක් ආහු; ආයේය; තෙසඤ්ච මජ්ඣෙනො, ඒ බඹුන්මැද; පරිවාරිතො, (ලක්ෂයක් බඹුන්විසින්) පිරිවරණලද; හාරිතො, හාරිත නම් මහාබ්‍රහ්මතෙම; ආග, ආයේය.

20. අභික්කන්තෙ, මහාවනයට පැමිණියාවූ; සඉන්දෙ, ශක්‍රයා ප්‍රධාන කොට ඇත්තාවූ; සබ්‍රහ්මකෙ, හාරිත නම් මහාබ්‍රහ්මරාජයා ප්‍රධානකොට ඇති; තෙසබ්බෙ දෙවෙ, ඒ සියලුම දෙවියන් කරා; මාරසෙනා, මාරසෙනාවෝ; අභික්කාමුං, පැමිණියාහුය; කණ්හස්ස, කෘෂ්ණාදිභාවයෙන් යුක්තවූ මාරයාගේ; මන්දියං, එබිය නොහොත් මූඪතාවය; පස්ස, බලව; එථ, එව්; ගණ්හථ, අල්වාගණිව්; රාගෙන, රාගයෙන්; වො, තොප විසින්; බද්ධංඅත්ථු, (මේ සියලුම දෙවමණ්ඩලය) බඳනාලද්දක් වේවා; සමන්තා, හාත් පසින්; පරිවාරෙථ, පිරිවරව් හෙවත් වටකරගණිව්; වො, තොප අතුරෙන්; කොචි, කිසිවෙක් (නොහොත්) එකෙකුත්; (මේ දෙව්පිරිසෙහි;) නං, කවරකුත් නොහොත් එකකුත්; මාමුඤ්චථ, නොමුදව්; ඉති, මෙසේ; තත්ථ, ඒ මහා සමාගමයෙහි; මහාසෙනො, මාරතෙම; පාණිනා, අත්ලෙන්; තලං, (පොළෝ) තලයට; ආහච්ච, ගසා; පාවුස්සකො, වර්ෂාකාලයෙහිවූ; සවිජ්ජුකො, විදුලි සහිතවූ; මෙඝො, මේඝයක්; ථනයන්තො, ශබ්දකරන්නේ; යථා, යම්සේද එමෙන්; භෙරවං, බිහිසුනු; සරංකත්වාන, ශබ්දයක් කොට; කණ්හසෙනං, මරසෙන්; අපෙසයි; (ඒ දෙව්පිරිස්මැද) යැවී; තදා, එකල්හි; සො, ඒ වසවත් මරතෙමේ; අසයංවසී, දෙව්පිරිස තමාවශඟකොටගත නොහැක්කේ; සංකුද්ධො, අතිශයින් කිපියේක්ව; පච්චුදාවත්ති, ආපසුහැරී ගියේය.

21. තඤ්ච සබ්බං අභිඤ්ඤාය වවක්ඛිත්වාන චක්ඛුමා
තතො ආමන්තයී සත්ථා සාවකෙ සාසනෙ රතෙ
මාරසෙනා අභික්කන්තා තෙ විජානාථ භික්ඛවො
තෙච ආතප්ප මකරුං සුත්වා බුද්ධස්සසාසනං,
වීතරාගෙහි පක්කාමුං නෙසං ලොමම්පි ඉඤ්ජයුං.
සබ්බෙ විජිත සඞ්ගාමා භයාතීතා යසස්සිනො
මොදන්ති සහභූතෙහි සාවකා තෙජනෙ සුතාති.

---

21. තතො, ඉක්බිත්තෙන්; චක්ඛුමා, පසැස් ඇත්තාවූ; සත්ථා, ශාස්තෲන් වහන්සේ තඤ්චසබ්බං, ඒ සියල්ල; අභිඤ්ඤාය, (මනාසේ) දැන; වවක්ඛිත්වාන, ප්‍රත්‍යක්ෂ වශයෙන් නිශ්චය කොට; සාසනෙ, (අධිශීලාදි ත්‍රිවිධ) ශාසනයෙහි; රතෙ, ඇලුනාවූ; සාවකෙ, සව්වන්; ආමන්තයී, ඇමතූසේක; භික්ඛවො, මහණෙනි; මාරසෙනා, මාරසෙනාවෝ; අභික්කන්තා, පැමිණියාහුය; තෙ, තෙපි; විජානාථ, (තමතමන්ට අනුරූප ඵලසමාධියට) සමවදිව්; තෙච, ඒ රහත් භික්ෂූහුද; බුද්ධස්ස, බුදුන්ගේ; සාසනං, වචනය; සුත්වා, අසා; ආතප්පං, (ඵලසමාපත්තියට පිවිසෙනුසඳහා) වීර්‍ය්‍යය අකරුං, කළෝය (පටන්ගත්හ); වීතරාගෙහි, පහවූ රාගඇති අර්‍ය්‍යයන්කෙරෙන්; අපක්කාමුං,(මාරයාසහ මාරසෙනාවෝ දුරිම්ම) පහවගියෝය; නෙසං, ඒ වීතරාගීන්ගේ; ලොමංඅපි, රෝමයකුදු; නඉඤ්ජයුං, කම්පානොකොළෝය; (ඉක්බිත්තෙන් මාරසෙනාව භික්ෂුසඞ්ඝයා අරබයා මතු පහළවනගය කීය) විජිතසඞ්ගාමා, ජය ගත් මරයුද ඇත්තාවූ; භයාතීතා, ඉක්මවනලද භය ඇත්තාවූ; යසස්සිනො, යසපරිවාර ඇත්තාවූ; ජනෙසුතා, ජනයන් අතර ප්‍රකටවූ; සබ්බෙ, සියලු; තෙසාවකා, ඒ බුදුසව්වෝ; භූතෙහි සහ, බුදුසස්නෙහි සඤ්ජාත ආර්‍ය්‍යයන් සමඟ; මොදන්ති, සතුටුවෙත්.

මේ දෙශනාව කෙළවරෙහි කොටිලක්ෂයක් දෙවියෝ රහත් වූහ. ශෙෂ මාර්ගඵලයන්ට පැමිණියවුන්ගේ ගණනක් නොමැති විය.

මහාසමය සූත්‍රයෙහි පදාර්ථ ව්‍යාඛ්‍යානය සමාප්තයි.

# භාවය.

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.

1. මා විසින් මේ සූත්‍රදෙශනාව මෙසේ අසනලදී. එක්කාල යෙක්හි භාග්‍යවතුන් වහන්සේ ශාක්‍යජනපදයෙහි කිඹුල්වත් පුරය සමීපයෙහිවූ හිමාලය වනය හා එකාබද්ධව තෙමේ හටගත් මහාවනයෙහි සියල්ලන්ම රහත්වූ පන්සියයක් භික්ෂූන්ගෙන් යුක්ත මහත් භික්ෂු සමූහයක් සමග වැඩවාසය කරණසේක. එකල්හි දසදහසක් ලොකධාතුවලින් දෙවියෝ භාග්‍යවතුන් වහන්සේද භික්ෂුසමූහයාද දකිනු පිණිස බොහෝසෙයින් රැස්වූ වෝවෙත්.

2. ඉක්බිත්තෙන් ශුද්ධාවාස බ්‍රහ්මනිකායට අයත් අනාගාමී බ්‍රහ්මරාජයන් සතරදෙනකුන්ට මේ ගෞතම භාග්‍යවතුන් වහන් සේ ශාක්‍යදනව්වට අයත් කිඹුල්වත්පුරසන්නයෙහිවූ මහාවන යෙහි සියල්ලන්ම එදවස රහත්වූ පන්සියයක් භික්ෂූන්ගෙන් යුක්ත මහත් භික්ෂුසමූහයක් සමග වාසයකරණසේක. දසදහ සක් ලොකධාතුවලින් දෙවියෝ භාග්‍යවතුන් වහන්සේ සහ භික්ෂු සමූහයා දැකීම පිණිස බොහෝ සෙයින් රැස්වූවෝ වෙත්. යම් හෙයකින අපිදු භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙක්හි නම් එත නට එලඹෙන්නෙමුනම් එලඹ භාග්‍යවතුන් වහන්සේ ඉදිරියෙහි එකි එකි ගාථාවක් කියන්නෙමු නම් ඉතා යෙහෙකැයි යන අද හසක් විය.

3. ඉක්බිත්තෙන් ඒ දෙවතාවෝ බලවත් පුරුෂයෙක් හකුළුවනලද අතක් දිගුකරන්නේ හෝ දිගුකළ අතක් හකුළු වන්නේ හෝ යම්සේද එපරිද්දෙන්ම ශුද්ධාවාසික දෙවියන් කෙරෙන් අතුරුදන්වූවෝ භාග්‍යවතුන් වහන්සේ ඉදිරියෙහිපහළ වූහ. ඉක්බිති ඒ දෙවතාවෝ භාග්‍යවතුන්වහන්සේට මනාකොට වැඳ එකත්පසෙක සිටියාහුය. එකත්පසෙක සිටියාමවූ එක් දෙව තාවෙක් භාග්‍යවතුන්වහන්සේ හමුවෙහි ගාථාවකින් මෙසේකීය. මහාවනයෙහි මහත් සමූහ සන්නිපාතයෙකි. දෙවසමූහයෝ එක රැශිවූහ. කෙලෙස් සතුරන් විසින් නොපරදවනලද අනාගාමීසඞ්ඝ යා දකිනු පිණිස මේ ධර්මසමාගමයට අපිත් ආවෝවමු. ඉක්බිති අනෙක් දෙවතාවෙක් භාග්‍යවතුන්වහන්සේ ඉදිරියෙහි ගාථාවකින් මෙසේකීය. ඒ ධර්ම සමාගමයෙහි භික්ෂූහු තමන්ගේ සිත සමාධියෙ හි පිහිටෙව්හ (හෙවත්) එකඟකළහ, ඍජුකළහ, [illegible]

වෙන් සමන්විත ගුප්තවාර ඇති ඒ පණ්ඩිතයෝ සමපමණින් ගමන්ගත් අසුන් ඇති කල්හි වොදන නිවාරණ රහිතව රැහැන් ගෙණසිටි රියැදුරන්මෙන් ඉදුරන් රකිත්; ඉක්බිත්තෙන් අතික් දෙවතාවෙක් භාග්‍යවතුන්වහන්සේ ඉදිරියෙහි ගාථාවකින්මෙසේ කීය. රාගාදීකෙලෙස්නැමැති උලසිද රාගාදීකෙලෙස්නැමැති කණුයම (අගුල) සිඳ රාගාදී කෙලෙස් නැමැති ඉන්ද්‍රඛීලය උදුරා එජයයි කියනලද තෘෂ්ණා රහිතවූ එහෙයින්ම පිරිසිදුවූ මල රහිතවූ පසැස් ඇත්තාවූ මනාකොට දමනයකරණ ලද්දවූ ඉදුරන් ඇති ඒ තරුණ නාගයෝ (රහත්හු) චතුර්දිශාවෙහි අප්‍රතිහත චාරිකාවේ හැසිරෙත්. ඉක්බිත්තෙන් අතික් දෙවතාවෙක් බුදුන් හමුවෙහි ගාථාවකින් මෙසේකීය. යම්කිසිකෙණකුන් බුදුන් සරණගියාහුද ඔව්හු අපායට නොයෙත් මනුෂ්‍යදෙහය හැර දිව්‍යකායය හෙවත් දෙවසමූහයා සම්පූර්ණකරන්නාහුය. (බුද්ධරත්නය ගත්බැවින් අතික් රත්නදෙකද ගැණේ.)

4. ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ භික්ෂුන්ට අඩගහ වදාලසේක. මහණෙනි, දසදහසක් ලොකධාතුන්හි දෙවියෝ තථාගතයන්ද භික්ෂුසඞ්ඝයාද දකිනුපිණිස වැඩිවශයෙන් රැස්වූහ. මහණෙනි, අතීතකාලයෙහි අභීත්වූ යම් ඒ සම්‍යක්සම්බුදුවරයෝ වූවාහුද, ඒ බුදුවරයන් වහන්සේලා දක්නටත් මෙපමණ දෙවතාවෝ රැස්වූහ, දැන් මා දකිම්ට යම්පමණ දෙවතාවෝ රැස්වූවෝද එපමණවූහ. මහණෙනි, අනාගතකාලයෙහි යම්ඒ සම්‍යක් සම්බුදුවරයෝ වන්නාහුද ඒ බුදුවරයන් දක්නටත් මෙපමණ දෙවතාවෝ රැස්වන්නාහ. දැන් මා දකිම්ට යම්පමණ දෙවතාවෝ රැස්වූවෝද එපමණම වන්නාහුය. මහණෙනි, දෙවසමූහයන්ගේ නම් කියන්නෙමි, මහණෙනි, දෙවසමූහයන්ගේ නම් පහලකරන්නෙමි. මහණෙනි, දෙවසමූහයන්ගේ නම් දෙශනා කරන්නෙමි, එය තෙපි අසව් මනාසේ මෙනෙහි කරව් කියන්නෙමියි වදාලසේක. එදවස රහත්වූ ඒ පන්සියයක් භික්ෂුහු ස්වාමින්වහන්ස එසේයයි භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්සූහ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාලසේක.

5. අක්ෂරපද නියාමිත වචන සමූහයක් පවත්වන්නෙමි (කියන්නෙමි) යම් යම් තන්හි බූඞාටූ දෙවියෝ වෙසෙද්ද ඒ ඒ තැන් ඇසුරුකලාවූ භාවනාවට යවනලද සිත් ඇත්තාවූ සමාධිගත සිත්ඇත්තාවූ අභිගවනයකල ලොමුඩැහැගැණුම් ඇත්තාවූ පිරිසිදු සිත් ඇත්තාවූ එහෙයින්ම පිරිසිදුවූ විශෙෂයෙන් ප්‍රසන්නවූ නොකැලඹුනු සිත්ඇත්තාවූ සිංහරජ

යන්මෙන් සැඟවුනාවූ (එක්පසකට ගියාවූ) බොහෝවූ යම් රහත්හුමෙද්ද ඔව්හු පර්වතකුක්ෂි ඇසුරුකළෝය. ඉක්බිත්තෙන් ශාස්තෲන් වහන්සේ කිඹුල්වත්පුරයට ආසන්නවූ මහාවනයෙහිදී අධිශීලාදී ත්‍රිශික්ෂාවෙහි ඇලුනාවූ සර්ඥයන් වහන්සේ අධිකකොට ඇති පන්සියයක් සව්වන්දන ආමන්ත්‍රණ කළසේක. මහණෙනි දෙවසමූහයෝ රැස්වූහ. ඒ දෙවසමූහයන් දනිව් ඒ භික්ෂූහුද බුදුන්ගේ වචනය අසා එකෙණෙහි ඒ පිණිස වීර්‍යය කළහ.

6. ඒ භික්ෂූන්ට දෙවාදී අමනුෂ්‍යයන් දක්නාවූ දිවැස්නැණ පහළවිය ඇතැම් රහත්හු අමනුෂ්‍යයන් සියයක් දුටහ, ඇතැම් රහත්හු අමනුෂ්‍යයන් දහසක්ද යළි හැත්තෑදහසක්ද දුටහ, ඇතැම් රහත්හු දෙවාදී අමනුෂ්‍යයන් ලක්ෂයක් දුටහ, ඇතැම් රහත්හු අපමණ දෙව්බඹුන් දුටහ, සියලු දිගුන් දෙව්බඹුන්ගෙන් අනතුරරහිතව සපශීවූහ. පසැස් ඇත්තාවූ ශාස්තෲන්වහන්සේ ඒ සියල්ලම විශෙෂයෙන් දුන ප්‍රත්‍යක්ෂ වශයෙන් නිශ්චයකොට නැවත සස්නෙහි ඇලුනාවූ ශ්‍රාවකයන්ට ආමන්ත්‍රණය කළසේක මහණෙනි, දිව්‍යසමූහයෝ පැමිණියෝය, තොපට මම යම් දෙව සමූහයන් වචනවලින් පරිපාටිය නොඉක්මවා ප්‍රකාශකරන්නෙම් ද ඒ දෙවියන් දනිව්.

7. කිඹුල්වත්පුර වාසීවූ සෘධිඇත්තාවූ අනුභාවසම්පන්නවූ ශරීරවර්ණ ඇත්තාවූ සම්බධ්පිරිස්ඇත්තාවූ සත්දහසක්භූමි නිශ්‍රිත යක්ෂයෝ සතුටුවෙමින් එදවස රහත්වූ භික්ෂුසමූහය දක්නා පිණිස මහාවනයට පැමිණියාහුය, හිමාලයවන වාසීවූ නානාවිධ ප්‍රභා ඇත්තාවූ දිව්‍යසෘධි ඇත්තාවූ ආනුභාව සම්පන්නවූ ශරීරවර්ණ ඇත්තාවූ පරිවාරසම්පන්නවූ සදහසක් යක්ෂයෝ සතුටුවෙමින් එදවස රහත්වූ භික්ෂුසමූහය දක්නාපිණිස මහාවනයට පැමිණියෝය. සාතාගිරි නම් පර්වතවාසි නොයෙක් පැහැඇති දිව්‍යසෘධි ඇති ආනුභාව සම්පන්නවූ ශරීරවර්ණඇති පරිවාරසම්පන්නවූ තුන් දහසක් යක්ෂයෝ සතුටුවෙමින් එදවස රහත්වූ භික්ෂූන් සමූහය දක්නා පිණිස මහාවනයට පැමිණියෝය

8. වෙස්සාමිත්තනම් පර්වතවාසීවූ නානාවිධ ප්‍රභාඇත්තාවූ දිව්‍යසෘධි ඇත්තාවූ ආනුභාවසම්පන්නවූ ශරීරවර්ණ ඇත්තාවූ පරිවාරසම්පන්නවූ පන්සියයක් යක්ෂයෝ සතුටුවෙමින් එදවසරහත්වූ භික්ෂුසමූහය දක්නාපිණිස මහාවනයට පැමිණියෝය. රජගහ නුවර උපන්නාවූ කුම්භීර නම් යක්ෂයෙක් වේයි. ඔහුගේ වාසස්ථානය වෙපුල්ල පර්වතයයි යකුන් පිළිබඳ ලක්ෂයකට වැඩිගණනක් ඔහු ඇසුරු කෙරෙයි. රජගහනුවර උපන් ඒ කුම්භීර නම් යක්ෂතෙමේද එදවස රහත්වූ භික්ෂුසමූහය දක්නා පිණිස මහාවනයට ආයේය.

9. පෙරදිග රජවූ ධෘතරෂ්ට්‍රවරම් මහරජතෙමේ ඒ දිග අනුශාසනා කෙරෙයි. ගන්ධර්වයන්ට අධිපතිවූ පරිවාරසම්පන්නවූ ඒ ධෘතරෂ්ට්‍රවරම් මහරජතෙමේද ඔහුගේ ඉන්ද්‍රයන නම් ඇත්තාවූ මහත් ශක්තිඇත්තාවූ දිව්‍යසෘද්ධි ඇත්තාවූ ආනුභාව සම්පන්නවූ ශරීරවර්ණ ඇත්තාවූ පරිවාර සම්පන්නවූ බොහෝ පුත්‍රයෝද සතුටුවෙමින් එදවස රහත්වූ භික්ෂූන් සමූහය දක්නා පිණිස මහාවනයට පැමිණියෝය. දකුණුදිග රජවූ විරූඪ නම් වරම් රජතෙමේද ඒ දිග අනුශාසනා කෙරෙයි. කුම්භාණ්ඩයන්ට අධිපතිවූ පරිවාරසම්පන්නවූ ඒ මහරජතෙමේද දිව්‍ය සෘද්ධිඇත්තාවූ ආනුභාවසම්පන්නවූ ශරීරවර්ණ ඇත්තාවූ පරිවාරසම්පන්නවූ ඉන්ද්‍රයන නම් ඇති මහත් ශක්තිසම්පන්නවූ ඔහුගේ බොහෝ පුත්‍රයෝද සතුටුවෙමින් එදවසරහත් වූ භික්ෂූන් සමූහය දක්නාපිණිස මහාවනයට පැමිණියෝය, පශ්චිම දිශාවට රජවූ විරූපාක්ෂ නම් වරම් මහරජතෙමේද ඒ දිග අනුශාසනා කෙරෙයි නාගයන්ට අධිපතිවූ පරිවාරසම්පන්නවූ ඒ විරූපාක්ෂ නම් වරම් මහරජතෙමේද ඒ වරම් මහරජහුගේ ඉන්ද්‍ර යන නම් ඇත්තාවූ මහත් ශක්ති ඇති දිව්‍යසෘද්ධි ඇත්තාවූ ආනුභාවසම්පන්නවූ ශරීරවර්ණඇත්තාවූ පරිවාරසම්පන්නවූ බොහෝ පුත්‍රයෝද සතුටුවෙමින් එදවසරහත් වූ භික්ෂූන් සමූහය දක්නා පිණිස මහාවනයට පැමිණියෝය. උතුරුදිග රජවූ වෛශ්‍රවණ වරම් මහරජතෙමේද ඒ දිග අනුශාසනා කෙරෙයි යක්ෂයන්ට අධිපතිවූ පරිවාරසම්පන්නවූ ඒ මහරජතෙමේද ඉන්ද්‍ර යන නම් ඇත්තාවූ මහත්බල ඇත්තාවූ දිව්‍යසෘද්ධි ඇත්තාවූ ආනුභාව සම්පන්නවූ ශරීරවර්ණ ඇත්තාවූ පරිවාර සම්පන්නවූ ඔහුගේ බොහෝ පුත්‍රයෝද සතුටුවෙමින් එදවසරහත්වූ භික්ෂූසමූහය දක්නා පිණිස මහාවනයට පැමිණියෝය. පෙරදිග ධෘතරෂ්ට්‍ර නම් වරම් මහරජද දකුණුදිග විරූඪ නම් වරම් මහරජද පැළදිග විරූපාක්ෂ නම් වරම් මහරජද උතුරුදිග වෛශ්‍රවණ නම් වරම් මහරජද යන මේ සිව්වරම් මහරජදරුවෝ කිඹුල්වත්පුරයට ආසන්නවූ මහාවනයෙහි හාත්පසින් සිව්දිග දිලිසෙමින් සිටියාහුය.

10. ඒ සිව්වරම් මහරජදරුවන්ගේ කළපව් සැහවීම් ලක්ෂණකොට ඇති මායාවෙන් යුක්තවූ හෙයින් මායාවී නම්වූ සම්මුඛ පරම්මුඛ වඤ්චනාවලින් ලොව රවටන හෙයින් වඤ්චනිකවූ කෛරාටික සාඨ්‍යයෙන් යුක්ත හෙයින් සඨවූ සිංහල්ලෝම මායාකාරයෝවූ කුටෙණ්ඩුය, වෙටෙණ්ඩුය, විටූච්චය, ඔවුන්සමග විටූඩතෙමේද චන්දනය, කාමසෙට්ඨය, කින්නුඝණ්ඩුය, නිඝණ්ඩුය යන දාසයෝද ආවාහුය. පනාදය, ඔපමඤ්ඤය, දිව්‍යරථාචාරයාවූ

මාතලි දෙව්පුත්‍රය, ගන්ධර්වවූ චිත්තය, සේනකයන දෙදෙනද නළකාර නම් දෙව්රජද ජනවසභ දෙවපුත්‍රයාද යන මොව්හුද ආවෝය, පඤ්චසිඛ නම් දෙව්පුත්ද තිම්බරු නම් ගඳබාද ඔහුගේ දුහිතෘවූ සූරියවච්චසාවද යන මොව්හුද ආවෝය මෙකී ගඳබ රජදරුවෝද මෙකී ගඳබරජුන් හා සමග අන්‍යවූ බොහෝ ගන්ධර්වයෝද සතුටුවෙමින් එදවස රහත්වූ භික්ෂූන් සමූහය දක්නා පිණිස මහාවනයට පැමිණියෝය.

11. ඉක්බිත්තෙන් නභසිනම් 1:විලවැසි නාගයෝද, වෙසාලිවැසි නාගයෝද තච්ඡකනම් නාපිරිස සමග ආවෝය. මහමෙර පෙදෙසෙහි වසන ගුරුළන් විසින් පවා බලාත්කාරයෙන් උදුරා ගත නොහැකි කම්බලස්සතරයන දෙකුලෙහි මහෙශාක්‍ය නාගයෝද, පයාගනම් තීර්ථවැසි නාගයෝද නැයන් සමග් ආවෝය. යමුනාගඟවැසි නාගයෝද ධෘතරාෂ්ට්‍ර නම් නාගකුලයෙහි උපන් නාගයෝද සමෘද්ධ පිරිස් ඇතිව ආවෝය. නාග ව්‍යවහාරයෙන් ව්‍යවහාර කරනු ලබන එරාවණනම් මහානාගතෙමේද (දෙවපුත්‍රයෙකි) එදවස රහත්වූ භික්ෂූන්සමූහය දක්නාපිණිස මහාවනයට ආයේය. දිව්‍යානුභාව ඇතිහෙයින් දිබ්බනම්වූ මව්කුසින් හා අණ්ඩකොෂයෙන්දූයි දෙවරක් උපත්හෙයින් දිජනම්වූ පියාපත් ඇතිහෙයින් පක්ඛිනම්වූ යොදුන්සියදහස්ගණන් දුරසිටි නාගයන් දක්නට සමර්ථ දෘෂ්ටිඇති හෙයින් විසුද්ධචක්ඛු නම්වූ යම් ගරුඩ පක්ෂීහු නාරදුන් වහාගෙණයද්ද ඒ ගරුඩ පක්ෂීහු අහසින්ම මහා වනයට පැමිණියෝය. විසිතුරු සුන්දර පියාපත් ඇති හෙයින් සුපණ්ණ යනුද ඔවුන්ට නාමයකි. එකල්හි නාරජුන්ම නිර්භයවිය. සර්වඥයන් වහන්සේ ගුරුළන් කෙරෙන් නිර්භය කළසේක. නාගයෝද ගුරුළෝද මෘදුවචනවලින් ඔවුනොවුන් කැඳවනු ලබන්නොව බුදුන්සරණ ගියෝය.

12. විදුරත් නම්ලද සක්දෙව්රජහු විසින් සුජානාම් අසුරකන්‍යාව නිමිත්තකොට ජයගන්නාලද මුහුද ඇසුරුකරන්නාවූ සක්දෙව්රජගේ සොහොවුරුවූ දිව්‍යසෘද්ධි ඇති පරිවාරසම්පන්නවූ මේ අසුරයෝද මහත් භයඞ්කර කාලකඤ්ජ නම් අසුරයෝද දානවෙඝසනාම් ධනුග්‍රාහක අසුරයෝද වෙපචිත්තිය සුචිත්තිය පහාරාදය යන අසුරයෝද වසවර්තිමාරයා සමග ආවෝය සියල්ලෝම වෛරොචන යන නම්ඇති බලි නම් අසුරයාගේ පුත්‍රයන් පිළිබඳ සියයක්ද අසුරසෙන්ගෙණ සන්නාහසන්නද්ධව රාහුඅසුරේන්ද්‍රයා කරා පැමිණියෝය. එසේපැමිණ ඔබට යහපතක්වේවා දැන් රහත්භික්ෂූන දක්නට මහාවනයට යාමසඳහා සුදුසුකාලයවේයයි කීහ.

---

1; නාගස; නාඝස; යනුදපාඨයි.

13. එකල්හි ආපො දෙවතාවෝද පඨවි දෙවතාවෝද තෙජො දෙවතාවෝද වායො දෙවතාවෝද වරුණය වාරුණය යන දෙවියෝද සොමනම් දෙවියාද යසනම් දෙවියන් සමග ආවෝය යස පරිවාරසම්පන්නවූ මෙත්තාකායිකය කරුණාකායිකය යන දෙවියෝද ආවෝය. සියල්ලෝම නිලාදී නොයෙක් වර්ණ ඇත්තාවූ දිව්‍යසෘද්ධි ඇත්තාවූ ආනුභාවසම්පන්නවූ ශරීරවර්ණඇත්තාවූ පරිවාරසම්පන්නවූ මේ දෙවසමූහයෝ දසදෙන සතුටුවෙමින් අභීත් භික්ෂු සමූහය දක්නාපිණිස දශප්‍රකාරයකින් මහාවනයට ආවෝය.

14. වෙණ්හුය සහලීය අසමය යමනම් දෙවියෝ දෙදෙනය යන ශමාවිහුද ආවෝය. සඳඇසුරුකරණ දෙවියෝ සඳපෙරටුකොට ආවෝය හිරු ඇසුරුකරණ දෙවියෝ හිරු පෙරටුකොට ආවෝය. නැකැත්තරු ඇසුරුකරණ දෙවියෝ නැකැත්තරු පෙරටුකොට ආවෝය. වාතවලාහක අබ්භවලාහක උණ්හවලාහක යන මඳවලාහක ගණයට අයත් දෙවියෝද ආවෝය. දෙවියන්ට ශ්‍රෙෂ්ඨවූ හෙයින් වාසවනම්වූද පෙරදන්දුන් හෙයින් පුරින්දද නම්වූද සක්දෙව්රජතෙමේත් ආයේය. සියල්ලෝම නානාප්‍රකාර නීලාදිවර්ණ ඇත්තාවූ දිව්‍යසෘද්ධිඇත්තාවූ ආනුභාවසම්පන්නවූ සමෘද්ධ පරිවාර ඇත්තාවූ ශරීරවර්ණඇත්තාවූ මේ දෙව සමූහයෝ දසදෙන සතුටුවෙමින් එදවස රහත්වූ භික්ෂූන් සමූහය දක්නාපිණිස දසපරිද්දකින් මහාවනයට ආවෝය.

15. නැවත සහභූනම් දෙවියෝ ගිනිසිළුමෙන් දිලිසෙමින් ආවෝය. අරිට්ඨක නම දෙවියෝද, රොජනම් දෙවියෝද, දියබෙරලිය මල්පැහැයෙන් බබලන උම්මාපුප්ඵ නම් දෙවියෝද, වරුණය, සහධම්මය, අච්චුතය, අනෙජකය, සූලෙය්‍යය, රුචිරය යන දෙවියෝද ආවෝය. වාසවනවාසී දෙවියෝද ආවෝය. සියල්ලෝම නීලාදී නොයෙක් ප්‍රභාඇති දිව්‍යසෘද්ධිඇත්තාවූ ආනුභාවසම්පන්නවූ ශරීරවර්ණඇත්තාවූ පරිවාර සම්පන්නවූ මේ දෙවසමූහයෝ දසදෙන සතුටුවෙමින් එදවසරහත්වූ භික්ෂූන් සමූහය දක්නාපිණිස දශප්‍රකාරයකින් මහාවනයට ආවෝය.

16. සමානය මහාසමානය මානුසය මානුසුත්තමය ඛිඩ්ඩාපදූසිකය යන දෙවියෝ ආවෝය. මනොපදූසික දෙවියෝද ආවෝය. යලි හරිනම් දෙවියෝද රත්තල්වැසි යම්දෙවිකෙනෙක් වෙත්නම් ඔව්හුද පරිවාරසම්පන්නවූ පාරග මහාපාරග යන දෙවියෝද ආවෝය. සියල්ලෝම නීලාදී නොයෙක් පැහැඇත්තාවූ දිව්‍යසෘද්ධි ඇත්තාවූ ආනුභාවසම්පන්නවූ ශරීරවර්ණ ඇත්තාවූ පරි

වාරසම්පන්නවූ මේ දිව්‍යසමූහයෝ දසදෙන සතුටුවෙමින් එදවස රහත්වූ භික්ෂූන් සමූහය දක්නා පිණිස දසපරිද්දකින් මහාවනයට ආවෝය.

17. පූතනය, කරුමහය, අරුණය යන දෙවියන් සමග වෙසනස නම් දෙවියෝද ආවෝය. ඔදතගය්‍ය නම්වූ පාමොක්ඛ දෙවියෝද, විචක්ඛණ දෙවියෝද, සදමත්ත නම් දෙවියෝද හාරගජ නම් දෙවියෝද පරිවාරසම්පන්නවූ මිස්සක නම් දෙවියෝද ආවෝය. යම් දෙවියෙක් දිසාවන්හි වැසීගොරෝද ඒ පජ්ජුන්න නම් දෙවිතෙමේද මෙඝනාද කරමින් ආයේය, සියල්ලෝම නීලාදී නොයෙක් ප්‍රභා ඇත්තාවූ දිව්‍යසෘද්ධි ඇත්තාවූ ආනුභාව සම්පන්නවූ ශරීරවර්ණ ඇත්තාවූ පරිවාරසම්පන්නවූ මේ දෙව සමූහයෝ දසදෙන සතුටුවෙමින් එදවස රහත්වූ භික්ෂූන් සමූහය දක්නා පිණිස දසපරිද්දකින් මහාවනයට ආවෝය.

18. ඛෙමිය නම් දෙවියෝය, තුසිත නම් දෙවියෝය, යාම නම් දෙව්ලොව වැසි දෙවියෝය. පරිවාරසම්පන්නවූ කටඨක නම් දෙවියෝය, ලම්බීතක නම් දෙවියෝය, ලාමසෙට්ඨ නම් දෙවියෝය, ජෝතිනම් දෙවියෝය, ආසවනම් දෙවියෝය; නිම්මාන රතීනම් දෙවියෝය යන මොව්හුද ආවෝය. නැවත පරනිම්මිත වසවත්ති දෙවියෝද ආවෝය. සියල්ලෝම නීලාදී නොයෙක් පැහැ ඇත්තාවූ දිව්‍යසෘද්ධි ඇත්තාවූ ආනුභාවසම්පන්නවූ ශරීරවර්ණ ඇත්තාවූ පරිවාරසම්පන්නවූ මේ දෙවසමූහයෝ දසදෙන සතුටු වෙමින් එදවසරහත්වූ භික්ෂූන් සමූහය දක්නාපිණිස දසපරිද්දකින් මහාවනයට ආවෝය. මේ දිව්‍යසමූහයෝ සැටදෙන සියල්ලෝම නීලාදී නොයෙක් ප්‍රභාඇත්තාහුම අනුගත නම වශයෙන් (හෙවත්) නම් කොටස් වශයෙන් ආවෝය. නම්ගොත්වලින් ඔවුන් හා සමානවූ සෙසු චක්‍රවාලයන්හි අන් දෙවියෝද වැස නිමවනලද ජාතිහෙවත් පහවගිය ජාති ඇති රාගාදී කෙලෙස් උල් රහිතවූ චතුරොඝයන් තරණයකළාවූ කාමාදී ආශ්‍රවරහිතවූ ආයසී සඩසයාද ඔඝයන් තරණයකළාවූ ඡන්දාදීයෙන් අගතියට නොයන හෙයින් නාග නම්වූ ඉක්මගිය කෘෂ්ණභාවය ඇති චන්ද්‍රයාවැනි බුදුන්ද දක්නෙමුයයි ඔවුන් සමග ආවෝය.

19. සෘද්ධිඇති බුදුන්ගේ ඖරසපුත්‍රවූ බඹුන් සමග සුබ්‍රහ්මය පරමත්තය සනත්කුමාරය තිස්සය යන බ්‍රහ්මයෝද ආවාහුය. එකැගිල්ලකින් දහසක් චක්‍රවාලයන්ද දසැගිල්ලෙන් දසදහසක් චක්‍රවාලයන්ද ආලෝක කිරීමට සමර්ථ මහාබ්‍රහ්මයන් පිළිබඳ දහසක් ආයේය. බඹලොව උපන්නාවූ ආනුභාවසම්පන්නවූ මාංශ

ධක්ෂේත්‍ර දෙකක්තුණක් හා සමවූ ආත්මභාවයෙන්යුක්තවූ ආත්මභාව ශ්‍රී සඞ්ඛ්‍යාත යශසින් යුක්තවූ එකී එකී මහබඹෙක් බඹුන් දහසෙක්හි වශීයෙන් හා යශසින්ද ආධිපත්‍යයෙන්ද අන්බඹුන් අභිභවනයකොට සිටී. ඒ බඹතෙමේත් එදවස රහත්වූ භික්ෂූන් සමූහය දක්නා පිණිස මහාවනයට ආයේය. යටකී ඒ බඹුන් දහසෙහිම වෙන්වෙන්ව පිරිස වසඟයෙහි පවත්වන්නෝවූ අධිපතිවූ මහබඹහු දසදෙනෙක් ආවෝය. ඔවුන් මැද ලක්ෂයක් බඹුන් විසින් පිරිවරණලද හාරිත නම් මහාබ්‍රහ්මරාජ තෙමේද ආයේය.

20. මහාවනයට රැස්වූ (පැමිණියාවූ) ශක්‍රයා පෙරටුකොට ඇති හෝ සහිතවූද හාරිත නම් මහබඹු ප්‍රධානකොට ඇති හෝ සහිතවූද ඒ සියලුදෙවියන් වෙතට මාරසේනාවෝ පැමිණියාහුය. මාරයාගේමූඪභාවය බලව, එව් අල්වාගණිව් මේ සියලු දෙව් මඬුල තොප විසින් රාගයෙන් බඳනා ලද්දේ වේවා හාත්පසින් වට කරව් තොප අතුරෙන් කිසිවෙක් මේ දෙව්පිරිස අතුරෙන් එකකුත් නොමුදාවා මෙලෙස ඒ මහාසමාගමයෙහි මාරතෙමේ අත්ලෙන් පොළෝතලයට ගසා වර්ෂාකාලයෙහි විදුලි සහිතවූ මේඝයක් යම්සේ ශබ්දකෙරේද එසේ බිහිසුනු මාරතර්ජනීය නම් ශබ්දය කොට මරසෙන් ඒ දෙව්පිරිස මැද යැවීය. එකල්හි ඒ මාරතෙමේ දෙව්පිරිස තමා වසඟයෙහි පවත්වාගත නොහැක්කේ අතිශයින් කිපියෙක්ව ආපසු ගියේය.

21. පැණැස් ඇත්තාවූ ශාස්තෲන් වහන්සේ ඒ සියල්ල මනාසේ දැන ප්‍රත්‍යක්ෂ වශයෙන් නිශ්චයකොට ඉක්බිත්තෙන් ත්‍රිවිධ ශාසනයෙහි ඇලුනාවූ සව්වන් ඇමතූසේක. මහණෙනි, මාරසේනාවෝ පැමිණියෝය. තෙපි තමතමන්ට අනුරූපවූ ඵලසමාපත්තියට සමවදිව්; ඒ රහත් භික්ෂූහුද බුද්ධන්ගේ වචනය අසා ඵලසමාපත්තියට පිවිසීම සඳහා වීර්‍ය්‍යකළෝය. පහවූ රාගඇති ආර්‍ය්‍යයන් කෙරෙන් මාරසේනාවෝ පහවගියෝය. ඒ වීතරාගීන්ගේ රෝමයකුදු කම්පා නොකොළෝය. ඉක්බිති මාරතෙමේ භික්ෂුසඞ්ඝයා අරබයා මේ මතුපහළවන ගය කීය. දිනනලද මර සුදඇති ඉක්මවනලද බියඇති යශස්ඇති ජනයන් අතුරෙහි ප්‍රකටවූ ඒ සියලු බුදුසව්වෝ සර්වඥශාසනයෙහි ජාත දිව්‍යබ්‍රහ්මාදී ආර්‍ය්‍යශ්‍රාවකයන් සමග සතුටුවෙත්.

**මෙතෙකින් මහාසමය සූත්‍රයෙහි භාවසන්නය සමාප්තයි.**

# විශෙෂවිභාග.

සුද්ධාවාසකායිකානං, ශුද්ධාවාසයෝනම්; සුද්ධානං අනාගාමි අරහන්තානඤ්ඤෙව ආවාසාති, සුද්ධාවාසා; යනු අටුවාවචන හෙයින් පිරිසිදුවූ අනාගාමින්ගේ සහ රහතුන්ගේ වාසස්ථාන නුයි ශුද්ධාවාස නම්වෙත්. අවිහ, අතප්ප, සුදස්සා, සුදස්සී, අකණිට්ඨක යන පසයි. තෙසුපන පඨමතලවාසිනො අප්පකෙන කාලෙන අත්තනො ඨානං නවිජහන්තීති අවිහා, ඒ පස්ව ශුද්ධාවාසිකයන් අතුරෙන් ප්‍රථමතලවාසීහු ස්වල්පකාලයකින් තමන්ගේ ස්ථානය නොහරිත්නුයි; අවිහනම්වෙත්- දුතියතලවාසිනො නකෙනචි තප්පන්තීති අතප්පා. දුතියතලවාසීහු කිසිවකු විසින් තපිණය නොකරණු ලැබෙත්නුයි; අතප්පනම්වෙත්. තතියතලවාසිනො පරමසුන්දර රූපත්තා සුන්දරං දිස්සන්තීති, සුදස්සා, තුන්වෙනිතල වාසීහු උතුම් සොඳුරු රූඇති බැවින් සැපසේ දක්නා ලැබෙත්නුයි-සුදස්සනම්වෙත්; චතුත්ථතලවාසිනො පරිසුද්ධදස්සනත්තා සුන්දරං පස්සන්තීති සුදස්සිනො, චතුර්ථතලවාසීහු අතිපිරිසිදු දැකුම්ඇති බැවින් සැපසේ දක්නාලැබෙත් නුයි; සුදස්සීනම්වෙත්; පඤ්චමතලවාසිනො උක්කට්ඨසම්පත්තිකත්තා නත්ථි එතෙසං කණිට්ඨභාවොති අකණිට්ඨා, පස්වම තලවාසීහු උත්කෘෂ්ටසම්පත්ති ඇතිහෙයින් ඔවුන්ගේ කණිටුබවෙක්නැත්නුයි; අකණිට්ඨක නම්වෙත් මෙලෙස ශුද්ධාවාසපස්වකයට එහි වසන්නන්ගේ වශයෙන් නම්ලැබීම දක්වා සූත්‍රසඞ්ග්‍රහ අටුවාවෙහි යථොක්තපරිදි විස්තරකොට තිබේ. සුද්ධා ඉධ ආවසිංසු ආවසන්ති ආවසිස්සන්තීවාති, සුද්ධාවාසා, ශුද්ධවූවෝ මෙහි වාසයකළෝය වාසයකෙරෙති වාසයකරන්නාහුයයි හෝ ශුද්ධාවාස නම්වෙත්; සුද්ධාති කිලෙසමලරහිතා අනාගාමි ඛීණාසවා; ශුද්ධයෝ නම් කෙලෙස්මල රහිතවූ අනාගාමී ක්ෂීණාශ්‍රවයෝයි. මෙහි අන්තරාපරිනිබ්බායි, උපහච්චපරිනිබ්බායි, අසඞ්ඛාරපරිනිබ්බායි, සසඞ්ඛාරපරිනිබ්බායි, උද්ධංසොතො අකණිට්ඨගාමීයයි අනාගාමීහු පස්දෙනෙකි. අනාගාමිපු ආයුනො මජ්ඣං අනතික්කමිත්වා අන්තරායෙව කිලෙස පරිනිබ්බානං අරහත්තං පත්තො, අන්තරා පරිනිබ්බායි නාම, ඉහතකී අනාගාමීන් අතුරෙන් යමෙක් ආයුෂයාගේ මධ්‍යය නොඉක්මවා අතරම කෙලෙස් පරිනිර්වාණයට (රහත්බවට) පැමිණීයේ නම් හෙතෙම අන්තරා පරිනිබ්බායි නම්වෙයි. අනාගාමීන් අතුරෙන් යමෙක් අවිහාදී තමින් උපන් ශුද්ධාවාසයකට නියමිත ආයුෂයාගේ මධ්‍යය ඉක්මවා රහත්වීනම් හෙතෙම උපහච්චපරිනිබ්බායි නම්වෙයි.

ඒ සඳහා අටුවාපාඨය; මජ්ඣං උපහච්ච අතික්කමිත්වා පත්තො උපහච්ච පරිනිබ්බායී නාම යනුයි. අසඞ්ඛාරෙන අප්පයොගෙන අකිලමන්තො සුඛෙන පත්තො අසඞ්ඛාර පරිනිබ්බායී නාම ප්‍රයොග රහිතව කලාන්ත නොවෙමින් සැපසේ රහත්බවට පැමිණියේ අසඞ්ඛාර පරිනිබ්බායී නම්වෙයි.

සසඞ්ඛාරෙන සප්පයොගෙන කිලමන්තො දුක්ඛෙන පත්තො, සසඞ්ඛාර පරිනිබ්බායී නාම, ප්‍රයොග සහිතව කලාන්ත වෙමින් දුකින් රහත්බවට පැමිණියේ සසඞ්ඛාර පරිනිබ්බායී නම් වෙයි. ඉමෙ චත්තාරො පඤ්චසු සුද්ධාවාසෙසු ලබ්භන්ති, මෙකී අන්තරාපරිනිබ්බායී, උපහච්චපරිනිබ්බායී, අසඞ්ඛාරපරිනිබ්බායී සසඞ්ඛාරපරිනිබ්බායී යන සතරදෙන අවිහ, අතප්ප, සුදස්ස, සුදස්සී, අකනිට්ඨකා යන ශුද්ධාවාස පස්හිදීම ලැබෙත්. යොහි අවිහතො පට්ඨාය චත්තාරො දෙවලොකෙ සොධෙත්වා අකනිට්ඨං ගන්ත්වා පරිනිබ්බායති අයං උද්ධංසොතො අකනිට්ඨගාමී නාම, යමෙක් වනාහි අවිහනම් බඹලොව පටන් බ්‍රහ්මලොකසතර පිරිසිදුකොට අකනිට්ඨා බඹලොවට ගොස් රහත්බව ලබයිද හෙතෙම උද්ධංසොතො අකනිට්ඨගාමී නම්වෙයි. යො අවිහතොපට්ඨාය දුතියංවා තතියංවා චතුත්ථංවා දෙවලොකං ගන්ත්වා පරිනිබ්බායති අයං උද්ධං සොතොනඅකනිට්ඨගාමී නාම, යමෙක් අවිහනම් බඹලොව පටන් දෙවන, තුන්වන, සතරවන අතප්ප, සුදස්ස, සුදස්සී යන බඹලොවකට ගොස් කෙලෙස් පරිනිර්වාණය කෙරේද හෙතෙම උද්ධංසො. තොනඅකනිට්ඨගාමී නම්වෙයි. යො කාමභවතො අකනිට්ඨෙසු නිබ්බත්තිත්වා පරිනිබ්බායති අයං න උද්ධං සොතො අකනිට්ඨගාමී නාම– යමෙක් කාමභවයෙන් නික්ම අකනිට්ඨා බඹලෝවැස්සන් කෙරෙහි ඉපිද කෙලෙස් පරිනිර්වාණය කෙරේද හෙතෙම න උද්ධංසොතො අකනිට්ඨගාමී නම්වෙයි. යො හෙට්ඨා චතූසු දෙවලොකෙසු තත්ථ තත්ථෙව නිබ්බත්තිත්වා පරිනිබ්බායති අයං න උද්ධංසොතො න අකනිට්ඨගාමී නාම, යමෙක්තෙම අවිහ, අතප්ප, සුදස්ස, සුදස්සී යන යැවසිව් බඹතලෙහි ඒ ඒ තන්හි ඉපිද එහිදීම කෙලෙස් පරිනිර්වාණය කෙරේද, හෙතෙමේ න උද්ධංසොතො න අකනිට්ඨගාමී නම්වෙයි. මෙසේ උද්ධංසොත අකනිට්ඨගාමී අනාගාමී පුද්ගලයා චතුර්විධවෙයි. ශුද්ධාවාස සහශුද්ධාවාසිකයන් පිළිබඳව මේ ලුහුඬු විස්තරයක් වන්නේය. විශෙෂවිභාග මහාපදනාදියෙන් දතයුතු.

එතදහොසි, කුමක්නිසා මෙබදු සිතක්විද; ඒ බ්‍රහ්මයෝ එනාග සමවතට සමවැද සිට යථාකාලපරිච්ඡේදයෙන් නැගී සිටි

යාහු බ්‍රහ්ම භවනයබලන්නාහු බතින්පසු බත්ගෙයක්මෙන් හිස්වූ
චක්ව දුටහ. ඉක්බිති බ්‍රහ්මයෝ කොතැන්හි ගියෝදැයි ආවර්ජනා
කරන්නාහු මහා සමාගමයට ගියෝයයි දැන මේ දෙවසමාගමය
මහත් එකකි, අපි පසුවීමු පසුවූවන්ට එතාහි අවකාශයක් ලැබීම
අපහසුවෙයි. එබැවින් හිස්අතින් නොගොස් එකි එකී ගයක්
ගොතාගෙණ යමු. ඒ මහා සමාගමයෙහිදීද තමන් ආබව දන්
වන්නෙමු. බුදුන්ගේ ගුණද වර්ණනා කරන්නෙමුයි මෙසේ සම
වතින් නැගිට ආවර්ජනය කලතිසා ඔවුන්ට (ඒ ශුද්ධාවාසික බ්‍රහ්ම
රජයන් සතරදෙනාට) එබදු සිතක්විය.

භගවන්තො පුරතො පාතුරහංසු- පෙළෙහි බුදුන් අභිමුඛ
ස්ථානයෙහිම බැස්සවුන්මෙන් කොට කියනලදී. මෙහිලා ඒ
අර්ථය එසේ නොදතයුතුයි ඒ ශුද්ධාවාසවාසී බ්‍රහ්මරජයෝ සතර
දෙනා එතාහි බඹලොවෙහි සිටියෝම ගාථාභිසංස්කරණයකොට
ගෙණ එකෙක් නැගෙණහිර සක්වල මුවවිටෙහි බැස්සේය. එක්
බඹෙක් දකුණුසක්වල මුවවිටෙහි බැස්සේය. එක්බඹෙක් පශ්
චිම සක්වල මුවවිටෙහි බැස්සේය. එක්බඹෙක් උතුරැ සක්වල
මුවවිටෙහි බැස්සේය. ඔවුනතුරෙන් නැගෙණහිර සක්වල මුවවි
ටෙහි වැසි බඹතෙමේ නීලකසිණයට සමවැද නීල්රැස් විහිදුවා
දසදහසක් සක්වල දෙවියන්ට මණිවම්යක් මුදන්නාක්මෙන්
තමන් ආබව දන්වා මහත් බුඩවීපියෙන් අවුත් බුදුන් අභිවාදන
යකොට එකත්පසෙක සිට තමන් විසින් පිළියෙලකරගෙණ
ගාථාව කිය; දකුණුසක්වල මුවවිටෙහිබැසි බඹතෙමේ පීතකසි
ණයට සමවැද රන්වන් ප්‍රභාව පතුරුවා දසදහසක් සක්වල දෙ
වතාවන්ට රන්පටක් පොරවන්නාක්මෙන් තමන් ආබව දන්වා
එකත්පසෙකසිට බුදුන්වැද තමන් විසින් පිළියෙල කරගෙණ
ගාථාව කිය. පශ්චිම සක්වල මුවවිටෙහි බැසි බ්‍රහ්මතෙම ලෝහි
තකසිණයට සමවැද ලෝහිත රශ්මීන් විහිදුවා දසදහසක් සක්
වල දෙවතාවන් රත්කම්බිලියකින් වටකරන්නාක්මෙන් තමන්
ආබව දන්වා භාග්‍යවතුන් වහන්සේට මනාකොටවැද තමන්
විසින් සකස්කරගෙණ ගාථාව කියා එකත්පසෙක සිටියේය.
උතුරුසක්වලමුවවිටෙහි බැසි බඹතෙමේ ඔදාතකසිණයට සමවැද
අවදාත රශ්මීන් විහිදුවා දසදහසක් සක්වල දෙවියන්ට සුමන්
පටක් පොරවන්නාක්මෙන් තමන් ආබව දන්වා සකස්කොට
බුදුන්වැද එකත්පසෙක සිට තමන් ගොතාගෙණ ගාථාව කිය.
පෙළෙහි භගවන්තො පුරතො පාතුරහංසු, අථඛො තාදෙවතා
භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨංසු, මෙසේ මේ පාඨ
වලින් එකක්ෂණයෙහිමෙන් බුදුන් ඉදිරියෙහි දෙවියන් සතරදෙ

නාගේ පහළවීමද බුදුන්වැද එකත්පසෙක සිටිබවද කියනලදී. එය යටකී ක්‍රමයෙන් වෙන් වෙන් වශයෙන් සිදුවිය. මෙසේ අනුක්‍රමයෙන් වියයි එක්කොට දක්වනලදී. ගාථාකීම වෙන් වෙන් වශයෙන් පෙළෙහිත් පෙණේ. එබැවින් බ්‍රහ්මරාජයන් සතර දෙනාගේ බුදුන්කරා පැමිණීමත් ගාථාකීමත් එකවිටම නොව වෙන් වෙන් වශයෙන්ම බව දතයුතු. ශුද්ධාවාසවාසී බ්‍රහ්මරාජයෝ සිව්දෙනා (මහාසමයො) යනාදී සිව්ගය බුදුන් හමුයෙහිදී කියා හිඳිනට අවකාශ නොමැති වූයෙන් බුදුන්වැද සක්වළ මුව විට සතරෙහිමගොස් සිටගත්හ.

ඛීලං– පලිඝං– ඉන්දඛීලං– යථාගිනතිශාදිසු ආහතාපිතං ඛීලං දුන්නීහරං–යම්සේ හිතති ආදියෙහි වද්දනලද ඌලබැහැර කිරීම අපහසුවේද, යථා පලිඝං නගරපපවෙස නිවාරණං– යම් සේ අගුළ නුවරට ඇතුල්වීම වලකාද, යථාච ඉන්දඛීලං ගම්භීර නෙමිසුනිඛාතං දුන්නීහරං–යම්සේගැඹුරැ නිම්වළලුවල සිටුවනලද ඉන්ද්‍රඛීලය බැහැරකිරීමට අපහසුවේද– එවමෙව රාගදෝසමොහා සත්තසන්තානගතා දුන්නීහරණනොව නිබ්බාණ නගරපපවෙසන නිවාරණනොව– ඛීලං– පලිඝං– ඉන්දඛීලනති වුත්තා, එපරිද්දෙන්ම රාග ද්වේෂ මොහයෝ සත්ත්වසන්තානගත වූවාහු බැහැර කිරීමට අපහසු බැවින්ද නිර්වාණ නගරප්‍රවෙශය වලක්වනහෙයින්ද ඛීලය පලිඝය ඉන්දඛීල යයි කියනලද්දහ.

අථඛො භගවා– ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ පොළොතලෙහි පටන් උසින් බඹලොව දක්වාද පුළුලින් සක්වළ මුවවිට දක්වාද දෙවතාසන්නිපාතය දැක මේ දෙවසමාගමය ඉතා මහත් එහෙත මෙහි සිටින භික්ෂූහු වහාම එය නොදනිති. ඔවුන්ට එය කියන්නෙම් නම් යෙහෙකැයි සිතා භික්ෂූන්ට ආමන්ත්‍රණයකොට (ආමන්තෙසි) යනාදිය වදාළසේක.

(ආචික්ඛිස්සාමි භික්ඛවෙ) මෙය කුමක් සඳහා වදාරණලදද, දෙවියන්ගේ සිත්වල මොලොක්බව ඇතිකරවීම පිණිසයි. දෙවතාවෝ වනාහි භාග්‍යවත් තෙමේ මෙසේ මහත්වූ දෙවසමාගමයෙහිදී මහෙශාක්‍ය දෙවතාවන්ගේ නම්ගොත් කියන්නේය, අල්පෙශාක්‍ය දෙවතාවන්ගේ නම්ගොත් කුමට කියන්නේදැයි සිතූහ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ දෙවතාවෝ කුමක් සිතත්දැයි සලකාබලනසේක් මුඛයෙන් හස්තය ප්‍රවෙශකොට හෘදය මාංසය මඩින්නාක්මෙන්ද බඩුසහිත සොරකු අල්වාගන්නාක්මෙන්ද ඒ දෙවතාවන්ගේ ඒ චිත්තාචාරය දැන දසදහසක්

සක්වළින් ආ ආ සියලු 1: අලෝපනාත්‍ය මහෙනාත්‍ය දෙවතාවන්ගේ නම්ගොත් කියන්නෙම්යි සිතූයේක. එසේසිනා (ආවිනාබියනාමි තිකබ්බෙව) යනාදිය පටන්ගත්යේක.

පුරිමංදිසං ධතරට්ඨො- මේ ගාථාවවනාහි සම්බන්ධග්‍රන්ථිත වශයෙන් කියනලද්දකි. මෙහි අදහස මෙසේයි. දසදහසක් සක් වලෙහිම දසදහසක් ධෘතරාෂ්ට්‍ර මහරජවරු සිටිති. ඒ සියල්ලෝම කොටිලක්ෂය කොටිලක්ෂය බැගින් ගන්ධර්වයන් විසින් පිරිවරණ ලද්දේව අවුත් පෙරදික් කිඹුල්වත්මහාවනය පටන් සක්වලගැබපුර සිටියෝය. දසදහසක් සක්වලෙහි දසදහසක් විරූළ්හනම් මහරජවරු සිටිති. ඒ සියල්ලෝම කොටිලක්ෂය කොටිලක්ෂය බැගින් කුම්භාණ්ඩයන් විසින් පිරිවරණ ලද්දේව අවුත් දකුණුදික් කිඹුල්වත් මහාවනය පටන් සක්වලගැබපුර සිටියෝය. දස දහසක් සක්වලෙහි දසදහසක් විරූපාක්ෂ නම් මහරජවරු සිටිති. ඒ සියල්ලෝම කොටිලක්ෂය කොටිලක්ෂයබැගින් නාගයන්විසින් පිරිවරණ ලද්දේව අවුත් පශ්චිම කිඹුල්වත් මහාවනය පටන් සක්වලගැබපුර සිටියෝය. දසදහසක් සක්වලෙහි දසදහසක් කුවේර නම් මහරජවරු සිටිති. ඒ සියල්ලෝම කොටිලක්ෂය කොටිලක්ෂය බැගින් යක්ෂයන් විසින් පිරිවරණ ලද්දේව අවුත් උතුරු කිඹුල්වත් මහාවනය පටන් සක්වලගැබපුර සිටියෝය.

එරාවණො මහානාගො- මෙතෙම නාගයෙක් නොවෙයි. එරාවණො දෙවපුත්තො ජිනිෂා නාගොනාමහොති නාගවොහාරෙන පනෙස වොහරීයති යතු දිස්සහි අට්ටුවාපාඨයයි. එරාවණ නම් එක් දෙවපුත්‍රයෙකි. උත්පත්තියෙන් නාගයෙක් නොවෙයි. හෙතෙමේ වනාහි නාගවොහාරයෙන් ව්‍යවහාර කරනු ලැබේ. මේ එරාවණ නම් දෙවපුත්‍රතෙමේ වනාහි කාමරූපීවූ දෙවවිමාන යෙක්හි වසයි. යම්දිනයෙක්හි ශක්‍රතෙම උයනකෙළියටයෙයිද එකල්හි ඒ එරාවණ දෙවපුත්‍රතෙම එක්සියපණස්යොදුනක් උස ඇති කයක් නිර්මිතකොට තෙතිසක්කුඹු මවාගෙණ එරාවණ නම් ඇතෙක් වෙයි. ඔහුගේ එකිඑකී කුඹුතලෙහි දත්තයෝ දෙදෙනෙක් දෙදෙනෙක් වෙති එකි එකී දත්තයෙහි පොකුණු සතක් සතක් වෙයි. එකි එකී පොකුණෙහි පියුම්පඳුරු සතක් සතක් වෙයි. එකි එකී පියුම පඳුරෙහි මල් සතක් සතක් වෙයි. එකි එකී මලෙහි පෙති සතක් සතක් වෙයි. එකි එකී පෙත්තෙහි

---

1: අලොපනාත්‍ය මහෙනාත්‍ය ක්‍රම සංස්කෘතවචන නොමැත් තාහ. ඩොංහෝයේ පැරණි පොතපතෙහි දක්නට ලැබෙණ හෙයින් මෙහිද යෙදීමු.

සත් සත් දෙනක් අප්සරාවෝ නටති. මොවුහු පද්මාප්සරාවෝ යයි ප්‍රකට ශක්‍රයාගේ නාටක ස්ත්‍රීහු වෙති. ඒ තෙතිස් කුම්භයන්ගේ මධ්‍යයෙහි තිස්යොදුනක් පමණවූ සුදස්සන නම් කුම්භයක් වෙති. එහි යොදුනක් පමණවූ මිණිපලඟෙක් වෙයි. ඊමත තුන් යොදුන් පමණ උස ඇති මල් මණ්ඩපයක් අතුරනු ලැබෙයි. එහි ශක්‍රතෙම දිව්‍යස්ත්‍රීසමූහයා විසින් පිරිවරණලද්දුව දිව්‍යසැප අනුභව කෙරෙයි. දෙවියන්ට ඉෂ්ටවූ ශක්‍රයා උයන්කෙළියෙන් ආපසු හැරිආකල්හි නැවත ඒ ඇත්රුව ඉවත්කොට එරාවණ දෙව්පුත් මවෙයි. දෙව්ලොව තිරශ්චීනයන්ට ආත්මභවයක් නොවන හෙයින් එරාවණතෙම නිතර ඇත්වෙසින් නොසිටී. මෙකී විස්තරය සුත්‍රනිපාතයේ ධම්මික සූත්‍රාර්ථකථාවේ පලකොට තිබේ.

සණ්හාංහි වාවාහි උපව්හයන්තා-ගුරුළන්ගේ ප්‍රධාන ආහාරය නාගයෝ වෙති. ගුරුළන් දුටුවිට නාගයෝ මරණභයින් තැතිගෙණ වෙව්ලති. එබඳු නාගයෝ බුඩ්ධානුභාවයෙන් ගුරුළන් කරා එළඹ මිත්‍රයන්මෙන්ද නෑයන්මෙන්ද සමගිව කථාකරන්නාහු සතුටුවෙමින් වැලඳගණිමින් අතින් අල්වාගණිමින් උරහිසෙහි අත්තබමින් තුටුපහටුසිත් ඇත්තෝවූහ.

නමුචිසහ- නමුචිනම් මාරදෙවපුත්‍රතෙමේයි. හෙතෙමේත් ඒ වෙපචිත්ති ආදී අසුරයන් සමගව ආයේය. මෙකී අසුරයෝ සමුද්‍රවාසීහුවෙත් මේ මාරදෙවපුත්‍රතෙම පරනිර්මිත වශවර්ති දිව්‍යලෝකයෙහි වසන්නෙකි කුමක්නිසා මොවුන් සමග ආයේද යත් ඒ අසුරයෝ මාර්ගඵලාධිගමයට අභව්‍යයෝය. මාරදෙවපුත්‍රතෙමේත් එසේම අභව්‍යයෙකි. එහෙයින් ධාතුවශයෙන් සංසන්දය වෙමින් ආයේය.

සට්ඨෙතෙ දෙවනිකායා- මෙහි කියනලද දෙවනිකායයෝ නම්, ආපො, පඨවි, තෙජො, වායො, වරුණ, වාරුණ, සොම, යස, මෙත්තාකායික, කරුණාකායික යන 10 ද, වෙණ්හු, සහලී, අසම, යමදෙපිරිස, චන්දස්සූපනිස, සූරියස්සූපනිස, නක්ඛත්තූපනිස, මන්දවලාහක, වාසව යන 10 ද, සහභූ, අරිට්ඨක, රොජ, උම්මාපුප්ඵනිභාසී, වරුණ, සහධම්ම, අච්චුත, අනෙජක, සූලෙය්‍යරුචිර, වාසවනෙසි, යන 10 ද, සමාන, මහාසමාන, මානුස, මානුසුත්තම, ඛිඩ්ඩාපදූසික, මනොපදූසික, හරි, ලොහිතවාසී, පාරග, මහාපාරග, යන 10 ද, සුක්ක, කරුම්හ, මිරුණ, වෙඝනස, ඔදාතගය්හ, විචක්ඛණ, සදාමත්ත, හාරගජ, අයසක, පජ්ජුන්න, යන 10 ද, ඛෙමිය, තුසිත, යාම, කට්ඨක,

ලම්බිතක, ලාමසෙට්ඨ, ජෝති, ආසව, නිම්මාණරති පරනිම්මිත, යන 10 දැයි දශකවශයෙන් සයක් කොට වදාළ දෙවනිකායයෝ සැටදෙන වෙත්.

ඉදං පන මහාසමයසුත්තං නාම දෙවතානං පියං මනාපං:– මේ මහාසමය සූත්‍රය වනාහි දෙවිතාවන්ටඇසීමට ප්‍රිය මනාප එකකි. එහෙයින් අභිනව ස්ථානයන්හි මඞ්ගල කියන්නන් විසින් මෙම මහාසමය සූත්‍රයම කියයුතු. මේ සූත්‍රය ඇසීමට දෙවතාවන්තුල ඇති ප්‍රිය මනාප භාවය දක්වනුවස් මතුපහළ වන කථාවස්තුව දක්වනු ලැබේ.

මෙම ලඞ්කාද්වීපයෙහි කෙළපව්වෙහෙරෙහි වනාහි නාලෙන් දෙරෙහි නාරුකේ එක් දෙව්දුවක් වෙසෙසි. එක් ළදරුහෙරණ නමක් ලෙනතුළෙහි මේ සූත්‍රය හදාරයි. දෙව්දුව අසාගෙණසිට සූත්‍රය හදරා කෙළවරෙහි මහහඬින් සාධුකාර දුන්නීය. එකල්හි හෙරණනෙම මේ කවරෙක්දැයි ඇසීය. ස්වාමීනි මම දෙව්දුවක්මියි කීකල්හි කුමක්නිසා සාධුකාර දුන්නීදැයි විචාළේය. ස්වාමීනි සර්වඥයන්වහන්සේ විසින් මහාවනයෙහිවැඩහිඳවදාළ දිනයෙහි මෙ සූත්‍රය අසා අදඇසීමි. භාග්‍යවතුන් වහන්සේ විසින් කියන ලද් දෙන් එකකුරකුත් නොනසා නුඹවහන්සේ විසින් මේධර්මය මොනවට උගෙණගන්නා ලද්දේයයිකිවාය. භාග්‍යවතුන් වහන්සේ විසින් වදරණ කල්හි තීවිසින් අසනලද්දේදැයි හෙරණුන් විචාළ කල්හි එසේයස්වාමිනියි පිළිතුරුදුන්නීය. ඉතාමහත් දෙවතාසන්නිපාතයක්විය. තෝ වනාහි කොතැන්සිට ඇසුවාද ස්වාමීනි මම වනාහි මහාවනවාසී දෙවතාදුවක දෙවතාවන් සමග මහාවන යෙහි සිටියෙමි. මහෙශාක්‍ය දෙවතාවන් එනකල්හි දඹදිවසිටින් තට ඉඩක් නොලදිමි. ඉක්බිති මේ තාම්‍රපර්ණී දිවයිනට අවුත් දඹකොළපටුනෙහි සිට අසන්නට ආරම්භකෙළෙමි. එහිදීද මහෙශාක්‍ය දෙවතාවන් එනකල්හි පිළිවෙළින් හුන් හුන් තැනින් පිටත්වෙමි රුහුණු දනව්වෙහි මහගම්ට පිටිපසෙහි ගොළු මුහුදේ ගෙලපමණ දියටබැස එහි සිට ඇසීමි. ශී සිටිතැන පටන් ඉතා දූරෙහි සිටි බුදුන දුටුවාද, ස්වාමීනි කුමක්කියනසේක්ද ශාස්තෘන් වහන්සේ මහාවනයෙහි ධර්මදේශනාකරමින් නිතර මාම බලනසේකැයි හඟිමින් ලජ්ජාවෙමින් හිරිකෙමින් රැලෙහි සැඟවුනෙමියි කිවාය. එදවසෙහි කොටිලක්ෂයක් දෙවතාවෝ රහත්බවට පැමිණියෝය. නුඹත් එදා රහත්බවට පැමිණියාදැයි සාමණේරයන් වහන්සේ දෙවතාදුවගෙන් ඇසූසේක. ස්වාමීනි රහත්ඵලයට නොපැමිණියෙමියි පිළිතුරුදුන්නීය. එසේනම් අනා

ගාමිඵලයට පැමිණියායයි සිතමි. නැත ස්වාමීනි එසේනම් සකෘද ගාමිඵලයට පැමිණියායයි සිතමි. නැත ස්වාමිනි, සකෘදගාමි, අනාගාමි, අර්හත් යන මාර්ගත්‍රයට පැමිණි දෙවතාවෝ වනාහි ගණනපථය ඉක්මවූහ. එබැවින් නුඹ සෝවාන්වූවායයි හඟිමි. දෙව්දුව එදා සෝවාන් ඵලයට පත්වූ බැවින් මිරිකෙනු ලබමින් ආර්යයන් වහන්සේ නොවිචාළප්‍රශ්නයක් විචාළසේකැයි කීවාය. ඉක්බිති ඒ භික්ෂුතෙම ඇට මෙසේ කීය. දෙව්දුවෙනි නුඹගේ කය අපට දක්වන්නට හැකිද ස්වාමීනි සියලුකය දක්වන්නට නොහැකියි. ආර්යයන් වහන්සේට ඇඟිලි පුරුකක් පමණ දක් වමියි. කෙසිසිදුරෙන් ඇඟිල්ල ලෙනඇතුළට අභිමුඛ කළාය. සඳ දහසක් හිරු දහසක් නැගෙණකලක්මෙන් ආලෝකයවිය. දෙව්දූ තොමෝ ස්වාමීනි අප්‍රමාදව භාවනා කරව්යයි කියා ළඳරු භික්ෂුවට වැඳ ගියාය. මෙවගේ මේසූත්‍රය ඇසීමට දෙවතාවෝ ප්‍රියමනාපයෝදවෙත්. දෙවතාවෝ මේ සූත්‍රයට විශෙෂ වර්ණයෙන් බුහුමන්ද කෙරෙත්.

විශෙෂවිභාග සම්පජානයි.

ශිවමස්තු.

# රාගචරිත දෙවියන් සඳහා වදාළ
# සම්මාපරිබ්බාජනීය සූත්‍රය.

**නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.**

1. පුච්ඡාමි මුනිං පහූතපඤ්ඤං
   තිණ්ණං පාරගතං පරිනිබ්බුතං ඨිතත්තං
   නික්ඛම්ම ඝරා පනුජ්ජ කාමෙ
   කථං භික්ඛු සම්මා සො ලොකෙ පරිබ්බජෙය්‍ය.

---

1. පහූතපඤ්ඤං, මහපැණැත්තාවූ; තිණ්ණං, (කාමාදී චතුරොඝයන්) තරණයකළාවූ; පාරගතං, නිර්වාණයට පැමිණියාවූ; (හෙවත්) සසර කෙළවරට ගියාවූ; පරිනිබ්බුතං, සොපධිශෙෂ පරිනිර්වාණයෙන්, පිරිනිවියාවූ; ඨිතත්තං, (අෂ්ටලොකධර්මයෙන් අකම්පනීය සිත් ඇත්තාවූ; මුනිං, තථාගතයන්; පුච්ඡාමි, විචාරමි; කාමෙ, වස්තුකාමයන්; පනුජ්ජ, හැර; ඝරා, ගෘහවාසයෙන්; නික්ඛම්ම, නික්ම; භික්ඛු, භික්ෂුභාවයට පැමිණි; සො, ඒ පුද්ගලතෙමේ; ලොකෙ, ලොකයෙහි; සම්මා, මනාකොට; කථං, කෙසේ; පරිබ්බජෙය්‍ය, (ලොකයා හා නොඇලුනෙක්ව) වාසයකරන්නේද;

මහා ප්‍රාඥවූ කාමෞඝ භවෞඝ දිට්ඨෞඝ අවිජ්ජෞඝ යන චතුරොඝයන් තරණය කළාවූ නිර්වාණයට, හෙවත්, සංසාරයෙහි කෙළවරට පැමිණියාවූ සොපධිශෙෂ පරිනිර්වාණයෙන් පිරිනිවියාවූ අෂ්ටලොකධර්මයෙන් අකම්පනීය සිත් ඇත්තාවූ බුද්ධමුනිවූ ඔබ අතින් කරුණක් විචාරමි; වස්තුකාමයන් හැර ගිහිගෙයින් නික්මුණු මහණතෙම ලොකයා සමග නොඇලුනෙක්ව යහපත්ලෙස කෙසේ වාසයකරන්නේද? මෙසේ සතුතිමුඛයෙන් නිර්මිත බුදුන් විසින් විචාරණලද සර්වඥයන් වහන්සේ කෙලෙසුන් නොතසා ලෙව්හි යහපත් විසීමක් නැති හෙයින් ඒ මහා සමාගමයට පැමිණි රාගචරිත දෙවියන්තුළ පවත්නා රාගදොෂයන් දුරුකරනු සඳහා–යස්සමඞ්ගලාසමූහතා–යනාදී පසළොස් ගයකින් රහත්මගින් කුළුගන්වමින් ක්ෂීණාශ්‍රව ප්‍රතිපත්තිය ප්‍රකාශවන මේ සම්මාපරිබ්බාජනීය සූත්‍රය දෙශනාවට පටන්ගත්සේක.

2. යස්ස මඞ්ගලා සමූහතා (ඉති භගවා)
උප්පාතා සුපිනා ච ලක්ඛණා ච
මඞ්ගලදෝසවිප්පහීනො (භික්ඛු)
සම්මා සො ලොකෙ පරිබ්බජෙය්‍ය-

---

2. යස්ස, යම් භික්ෂුවක් විසින්; මඞ්ගලා, දිට්ඨ ශ්‍රුත මුතාදී මඞ්ගලයෝද; උප්පාතා. උල්කාපාත, දිශාඩාහාදිහු මෙනම් මෙනම් විපාක ඇත්තෝවෙත්යයි ප්‍රකාශිත උත්පාතාභිනිවේශ සංඛ්‍යාත (තිරශ්චීන විද්‍යාවෝද)-සුපිනා ච-උදෑසන දුටු සීනයෙන් මෙනම් විපාකයක් වන්නේයයි යනාදියෙන් ප්‍රකාශිත) ස්වප්න විද්‍යාවෝද; ලක්ඛණා ච, දණ්ඩලක්ෂණ (වස්ත්‍රලක්ෂණාදී පාඨයන් කියා මෙයින් මෙබන්දක් සිදුවෙයි යනාදී) ලක්ෂණාභිනිවේශ සංඛ්‍යාත (තිරශ්චීන විද්‍යාවෝද) යන මොවුහු සමූහතා, මනාකොට නසන ලද්දාහුද; මඞ්ගලදෝසවිප්පහීනො, (අටතිස් මහා) මඞ්ගලයන් හැර, දිට්ඨමඞ්ගලාදී දෝසයන් විශේෂයෙන් ප්‍රහීණකළාවූ හෙවත් දිට්ඨාදී මඞ්ගලයන් හා උත්පාතවිද්‍යාදී දෝෂයන් විශේෂයෙන් ප්‍රහාණයකළාවූ; සො භික්ඛු, (ඒ ක්ෂීණාශ්‍රව) භික්ෂුතෙමේ; ලොකෙ, ලෝකයෙහි; සම්මා, (ලෝකයා හා නොඇලී) මනාකොට; පරිබ්බජෙය්‍ය, වාසය කරන්නේය.

මඞ්ගල සූත්‍රයෙහි කී පරිදි දිට්ඨ, ශ්‍රුත, මුතාදි මඞ්ගලදෝෂයෝද උල්කාපාත දිශාඩාහාදීහු මෙනම් මෙනම් විපාක ඇත්තාහුයයි ප්‍රකාශිත උත්පාතාභිනිවේශ සංඛ්‍යාත තිරශ්චීන විද්‍යාවෝද පෙරවරු වේලෙහි දුටු සීනයෙන් මෙබන්දක් සිදුවෙයි මැදුම්යම් ආදියෙහි දුටු සීනවලින් මෙනම් මෙනම් දෙය සිදුවෙයි; වම් පසින් නිදන වේලෙහි දුටු සීනයෙන් මෙබන්දක් සිදුවෙයි, දක්ෂිණපාර්ශ්වාදියෙන් නිදන කල්හි දුටු සීනවලින් මෙනම් මෙනම් විපාක සිදුවෙයි; සඳසීනයෙන් දුටු කල්හි මෙබන්දක් සිදුවෙයි; හිරු සීනෙන් දුටු කල්හි මෙබඳු විපාකයක් සිදුවේයයි යනාදීන් ප්‍රකාශිත සුපින විද්‍යාවෝද; බ්‍රහ්මජාල සූත්‍රයෙහි කීපරිදි දණ්ඩලක්ෂණ වස්ත්‍රලක්ෂණාදී පාඨයන් කියා මෙයින් මෙය සිදුවේයයි ප්‍රකාශිත ලක්ෂණාභිනිවේශ සංඛ්‍යාත තිරශ්චීනවිද්‍යාවෝද; යම් භික්ෂුවක් විසින් මනාකොට නසනලද්දාහුද; අටතිස් මහා මඞ්ගලයන් හැර සෙසු දිට්ඨමඞ්ගලාදීන් හා උත්පාතවිද්‍යාදී දෝෂයන් විශේෂයෙන් ප්‍රහාණයකළාවූ ඒ ක්ෂීණාශ්‍රව භික්ෂුතෙමේ ලෝකයා හා නොඇලුනෙක්ව ලෝකයෙහි මනාකොට වාසයකරන්නේය.

3. රාගං විනයෙථ මානුසෙසු
දිබ්බෙසු කාමෙසු චාපි භික්ඛු
අතික්කම්ම භවං සමෙච්ච ධම්මං
සම්මා සො ලොකෙ පරිබ්බජෙය්‍ය.

4. විපිට්ඨිකත්වා පෙසුණානි කොධං
කදරියං ජහෙය්‍ය භික්ඛු
අනුරොධ විරොධ විප්පහීනො
සම්මා සො ලොකෙ පරිබ්බජෙය්‍ය.

---

3. භික්ඛු, යම් මහණෙක්; මානුසෙසු, මානුෂිකවූද; අපි, යලි; දිබ්බෙසුච, දිව්‍යමයවූද; කාමෙසු කාමගුණයන්හි; රාගං, ඇල්ම; විනයෙථ, (අනාගාමි මාර්ගයෙන් අනුත්පත්ති ස්වභාවයට පමුණුවමින්) දුරුකරන්නේද; සො, ඒ භික්ෂුතෙම; ධම්මං, (අර්හත්මාර්ගයෙන් සම්‍යප්‍රකාරයෙන් ප්‍රඥාභිසමයාදීහු සිද්ධකෙරෙමින්) චතුස්සත්‍ය ධර්මය; සමෙච්ච, දැන; භවං, ත්‍රිවිධ භවය; අතික්කම්ම, (මේ ප්‍රතිපත්තියෙන්) ඉක්මවා; ලොකෙ, ලොකයෙහි; සම්මා, මනාකොට; පරිබ්බජෙය්‍ය (ලොකයා හා නොඇලී තෙක්ව) වාසයකරන්නේය.

යම් මහණෙක් මානුෂිකවූද යලි දිව්‍යමයවූද පඤ්චකාම ගුණයන්හි ඇල්ම අනාගාමී මාර්ගයෙන් නැවත නූපදනා ස්වභාවයට පමුණුවන්නේද; ඒ මහණතෙම මෙසේ රාගය දුරුකොට ඉන් ඔබ්බෙහි අර්හත්මාර්ගයෙන් සම්‍යප්‍රකාරයෙන් අභිසමයාදීන් විශෙෂයෙන් දැන සිද්ධකෙරෙමින් චතුර්භෙදවූ හෙවත් චතුරාර්‍ය්‍ය සත්‍ය ධර්මය දැන මෙම පිළිවෙතින් කාම, රූප, අරූප යන භවත්‍රය ඉක්මවා ලොකයා හා නොඇලුනෙක්ව මනාකොට ලොකයෙහි වාසයකරන්නේය.

4. භික්ඛු, යම් මහණෙක්; පෙසුණානි, පෛශුන්‍යයන්ද; කොධං, ක්‍රොධයද විපිට්ඨිකත්වා, විශෙෂයෙන් පිටුවහල්කොට; කදරියං, තදමසුරුබව; ජහෙය්‍ය, හරණේද; අනුරොධ විරොධ විප්පහීණො, සියලු වස්තූන් පිළිබඳ ප්‍රහීණකරණලද රාග ද්වෙෂ ඇත්තාවූ; සො, ඒ මහණතෙම; ලොකෙ, ලොකයෙහි; සම්මා, මනාකොට; පරිබ්බජෙය්‍ය, (ලොකයා හා නොඇලුනෙක්ව) වාසයකරන්නේය.

යම් මහණෙක්තෙමේ කේලාම්කීම හා ක්‍රොධය විශෙෂයෙන් දුරුකොට දැඩිමසුරුබව හරණේද සියලු වස්තූන්කෙරෙහි ප්‍රහාණයකළ රාග ද්වෙෂ ඇත්තාවූ ඒ මහණතෙම ලොකයෙහි ලොකයා හා නොඇලුනෙක්ව යහපත්ලෙස වාසයකරන්නේය.

5 හිත්වා පියඤ්ච අප්පියඤ්ච
අනුපාදාය අනිස්සිතො කුහිඤ්චි
සංයොජනියෙහි විප්පමුත්තො
සම්මා සො ලොකෙ පරිබ්බජෙය්‍ය.

6. න සො උපධීසු සාරමෙති
ආදානෙසු විනෙය්‍ය ඡන්දරාගං
සො අනිස්සිතො අනඤ්ඤනෙය්‍යො
සම්මා සො ලොකෙ පරිබ්බජෙය්‍ය.

---

5. පියඤ්ච, ප්‍රියවූද; අප්පියඤ්ච, අප්‍රියවූද; (සත්ත්ව සංස්කාරය) හිත්වා, (ඡන්දරාග ප්‍රතිඝ ප්‍රහාණයෙන්) හැර; අනුපාදාය, (චතුර්විධ උපාදානයෙන් කිසි ධර්මයක්) නොගෙණ; කුහිඤ්චි, රූපාදී කිසි ධර්මයෙක්හි හෝ භවයෙහි; අනිස්සිතො, (අෂ්ටාධික ශත ප්‍රභෙද තෘෂ්ණානිශ්‍රයෙන් හා වාෂෂ්ටි ප්‍රභෙද දෘෂ්ටිනිශ්‍රයෙන්ද) අනාශ්‍රිත වූයේ; සංයොජනියෙහි, දසවිධ සංයොජනයන්ට විෂයවූ (සියලු ත්‍රෛභූමික ධර්මයන්) කෙරෙන්; විප්පමුත්තො, (මාර්ගභාවනායෙන් පරිඥාත හෙයින්) සර්වප්‍රකාරයෙන් මිදුනේද; සො, එබඳු භික්ෂු තෙමේ; ලොකෙ, ලොකයෙහි; සම්මා පරිබ්බජෙය්‍ය, (ලොකයා හා නොඇලුනෙක්ව) මොනවට වාසයකරන්නේය.

ප්‍රියවූද අප්‍රියවූද සත්ත්වසංස්කාරය ඡන්දරාගප්‍රතිඝ ප්‍රහාණයෙන් හැර සිව් උපාදානයෙන් කිසි ධර්මයක් නොගෙණ එකසිය අටක් ප්‍රභෙද ඇති තෘෂ්ණානිශ්‍රයෙන් හා දෙසැටක් ප්‍රභෙද ඇති දෘෂ්ටිනිශ්‍රයෙන් කිසි රූපාදී ධර්මයෙක්හි හෝ භවයෙහි නොඇලුනේ දශසංයොජයන්ට විෂයවූ සියලු ත්‍රෛභූමික ධර්මයන් කෙරෙන් මාර්ගභාවනාවෙන් පරිඥාත හෙයින් සර්වප්‍රකාරයෙන් මිදුනේද එබඳු මහණතෙමේ ලොකයෙහි ලොකයා හා නොඇලුනෙක්ව මනාලෙස වාසයකරන්නේය. මෙහි ප්‍රථම පාදයෙන් රාගද්වෙෂ ප්‍රහාණය කියනලදී. දෙවනි පාදයෙන් උපාදාන නිශ්‍රයා භාවය කියනලදී. තුන්වෙනි පාදයෙන් සෙසු අකුශලයන් කෙරෙන් හා අකුශල වස්තූන් කෙරෙන් විශෙෂයෙන් මිදීම කියනලදී. (නොහොත්) පළමුවෙනි පාදයෙන් රාගද්වෙෂ ප්‍රහාණයද දෙවෙනි පාදයෙන් ඊට උපායද; තුන්වෙනි පාදයෙන් ඔවුන් ප්‍රහීණවූ බැවින් දශසංයොජනයන් කෙරෙන් විශෙෂයෙන් මිදීමද කියනලදී.

6. සො, ඒ මහණතෙම; උපධීසු, ස්කන්ධොපධීන් කෙරෙහි; සාරං, සාරයට; නඑති, නොඑද; ආදානෙසු, උපාදාන

7. වචසා මනසා ච කම්මුනා ච
අවිරුද්ධො සම්මා විදිත්වා ධම්මං
නිබ්බාණපදාභිපත්ථයානො
සම්මා සො ලොකෙ පරිබ්බජෙය්‍ය.

---

යත් විසින් ගන්නාලද හෙයින් ආදානසඞ්ඛ්‍යාත එම උපධීන් කෙරෙහි; ඡන්දරාගං; ඡන්දරාගය; විනෙය්‍ය, (චතුර්ථ මාර්ගයෙන් සර්ව ප්‍රකාරයෙන්) දුරුකොට; සො, ඒ මහණතෙම; අනිස්සිතො, (එකී උපධීන් තෘෂ්ණාදෘෂ්ටි නිශ්‍රයෙන්) ඇසුරු නොකරන්නේද; අනඤ්ඤනෙය්‍යො, (අනිත්‍යාදිය තමා විසින්ම මොනවට දක්නාලද හෙයින්) අනිකකු විසින් මෙය උතුම්යයි නොපැමිණවියයුතු වේද; සො, ඒ භික්ෂුතෙම; ලොකෙ, ලොකයෙහි; සම්මා, මනා කොට; පරිබ්බජෙය්‍ය, (ලොකයා හා නොඇලුනෙක්ව) වාසය කරන්නේය.

එකී මහණතෙම සකන්ධොපධීන්හි සාරබවට නොපැමිණේද උපාදානයන් විසින් ගන්නාලද හෙයින් ආදානසඞ්ඛ්‍යාත ඒ උපධීන් කෙරෙහි ඡන්දරාගය දුරුකොට ඒ මහණතෙමේ යථොක්ත උපධීන් තෘෂ්ණාදෘෂ්ටි නිශ්‍රයෙන් ඇසුරු නොකරන්නේද අනිත්‍යාදිය තමන් විසින්ම මනාකොට දක්නාලද හෙයින් අනිකකු විසින් අවබොධ නොකරවිය යුත්තෙක්වේද ඒ ක්ෂීණාශ්‍රව භික්ෂු තෙම ලොකයෙහි මනාකොට (ලොකයා හා නොඇලුනෙක්ව) වාසය කරන්නේය,

7. වචසා, වාක්කර්මයෙන්ද; මනසා ච, මනඃ කර්මයෙන්ද; කම්මුනා ච, කායකර්මයෙන්ද; අවිරුද්ධො, (මෙකී තෙවැදෑරුම් දුශ්චරිතයන් ප්‍රහීණකළ හෙයින් සුචරිතයන් හා) අවිරුද්ධවූ; සම්මා, මනාකොට; ධම්මං, (මාර්ගඥානයෙන් චතුස්සත්‍ය) ධර්මය; විදිත්වා, දැන; නිබ්බාණපදං, (අනුපධිශෙෂවූ) නිර්වාණපදය; අභිපත්ථයානො, පතන්නාවූ; සො, ඒ භික්ෂුතෙමේ; ලොකෙ, ලොකයෙහි; සම්මා, මනාකොට; පරිබ්බජෙය්‍ය, (ලොකයා හා නොඇලුනෙක්ව) වාසය කරන්නේය.

වාක්කර්මසඞ්ඛ්‍යාත මුසා පෙසුඤ්ඤ ඵරුස සම්ඵප්පලාප යන කර්ම චතුෂ්කයද, මනඃකර්මසඞ්ඛ්‍යාත අභිජ්ඣා ව්‍යාපාද මිථ්‍යාදෘෂ්ටි යන කර්මත්‍රයද කායකර්මසඞ්ඛ්‍යාත පාණඝාත පරදබ්බ පරදාර යන කර්මත්‍රයද යන දුශ්චරිත තුන්කොටස ප්‍රහීණකළ හෙයින් සුචරිතයන් සමග විරුද්ධනුවූයේ මනාකොට මාර්ගඥානයෙන් චතුරාර්‍ය්‍යසත්‍ය ධර්මයන් දැන අනුපධිශෙෂවූ නිර්වාණපදය මොනවට පතන්නාවූ ඒ මහණතෙම ලොකයෙහි (ලොකයා සමග නොඇලුනෙක්ව) වාසයකරන්නේය.

8. යො වන්‍දති මන්‍ති න උණ්ණමෙය්‍ය
අක්කුට්ඨොපි න සන්‍ධියෙථ භික්ඛු
ලද්ධා පරභොජනං න මජ්ජෙ
සම්මා සො ලොකෙ පරිබ්බජෙය්‍ය.

9. ලොභඤ්ච භවඤ්ච විප්පහාය
විරතො ඡෙදන බන්‍ධනාතො භික්ඛු
සො තිණ්ණ කථං කථො විසල්ලො
සම්මා සො ලොකෙ පරිබ්බජෙය්‍ය.

---

8. යො භික්ඛු, යම් මහණෙක් තෙම; මං, මට; වන්‍දතිඉති, ලොකයා වදියයි; න උණ්ණමෙය්‍ය, තමා උසස් නොකරන්නේද; අක්කුට්ඨොඅපි, (දශවිධ ආක්‍රොශ වස්තුවෙන්) ආක්‍රොශ කරණ ලද්දේ නමුදු; න සන්‍ධියෙථ, බද්ධවෛර නොකරන්නේද (නොකිපෙන්නේද;) පරභොජනං, අනුන් විසින් දෙනලද ශ්‍රද්ධාදෙය්‍ය භොජනය; ලද්ධා, ලැබ; න මජ්ජෙ, (මම ප්‍රකටවූයෙක්මි යශස් ඇත්තෙමි, ලාභ ඇත්තෙමියි,) මත් නොවන්නේද; සො, ඒ මහණතෙම; ලොකෙ, ලොකයෙහි; සම්මා, මනාකොට; පරිබ්බජෙය්‍ය, (ලොකයා හා නොඇලුනෙක්ව) වාසය කරන්නේය.

යම් භික්‍ෂුවක් ලොකයා මට වදියයි කියා තමා උසස් නොකරන්නේද උඩගුනොවන්නේද සොරෙක් වෙහිය, අන්‍ධයෙක් වෙහිය, මුලාවූයෙක් වෙහිය, ඔටුවෙක් වෙහිය, ගොණෙක් වෙහිය, ගද්‍රභයෙක් වෙහිය, නිරිසතෙක් වෙහිය, තිරශ්චීන ගතිකයෙක් වෙහිය, තට සුගතියක් නැත, තා විසින් දුගතියම කැමතිවියයුතුයි යනාදී දශවිධ ආක්‍රොශ වස්තුවෙන් ආක්‍රොශ කරණලද්දේ නමුදු බද්ධවෛර නොකරන්නේද නොකිපෙන්නේද අනුන් විසින් ශ්‍රද්ධායෙන් දෙනලද භොජනය ලැබ මම ප්‍රකටවූයෙක්මි, යශස ඇත්තෙමි, ලාභඇත්තෙමියි මත්නොවන්නේද ඒ භික්‍ෂුතෙම (ලොකයා හා නොඇලුනෙක්ව) ලොකයෙහි යහපත්ලෙස වාසයකරන්නේය.

9. භික්ඛු, මහණතෙම; ලොභඤ්ච, විසමලොභයද; භවඤ්ච, (කාම, රූප, අරූප, යන) භවත්‍රයද; විප්පහාය, විශෙෂයෙන් හැර; ඡෙදනබන්‍ධනාතො, (මෙසේ මේ කාමිකෙලශයන් ප්‍රහීණ බැවින් මෙරමාසතුන්) ඡෙදනබන්‍ධනයෙන්; විරතො, වෙන්වූයේද; සො, ඒ මහණතෙම; තිණ්ණකථංකථො, එතරකරණලද සැක ඇත්තේද; විසල්ලො, පහවූ රාගාදී උල්ඇත්තේද වෙයි; සො, ඒ මහණතෙම; ලොකෙ, ලොකයෙහි; සම්මා, මනාකොට; පරිබ්බජෙය්‍ය, (ලොකයා හා නොඇලුනෙක්ව) වාසයකරන්නේය.

10. සාරුප්පමත්තනො විදිත්වා
නචභික්ඛුහිංසෙය්‍ය කඤ්චිලොකෙ
යථාතථියං විදිත්වා ධම්මං
සම්මා සො ලොකෙ පරිබ්බජෙය්‍ය.

11. යස්සානුසයානසන්තිකෙචි
මූලා අකුසලා සමූහතාසෙ
සොනිරාසයො අනාසයානො
සම්මා සො ලොකෙ පරිබ්බජෙය්‍ය.

---

යම් මහණෙක් විසම ලොභයද කාම, රූප, අරූප යන භව ත්‍රයද විශෙෂයෙන් හැර මෙසේ මේ කර්මකෙලශයන් ප්‍රහීණ බැවින් ඕමෙරමාජේදන බන්ධනයෙන් වෙන්වූයේද ඒ මහණ තෙම දුරුකරණලද සැක ඇත්තේද පහවූ රාගදී හුල් ඇත්තේද වන්නේය. එබඳු මහණතෙම ලොකයෙහි මනාකොට (ලොකයා සමග නොඇලුනෙක්ව) වාසයකරන්නේය. මෙලෙස මේගයෙහි ප්‍රථම ද්විතීය පාදදෙකින් භවභොග තෘෂ්ණාවෝ කියනලද්දහ. නොහොත් ප්‍රථම පාදයෙන් සියලුම තෘෂ්ණාවෝ කියනලදහ. පසුපාදයෙන් කාමභවය කියනලදී.

10. භික්ඛු, මහණතෙමේ; අත්තනො, තමාගේ භික්ඛුභාවයට; සාරුප්පං, (නොසරුප්වූ අනෙසනාදිය හැර) යහපත් එසනාදීවූ ආජීව සුද්ධිය දඅන්‍යවූ මනා පිළිවෙතද එහි පිහිටමින්; විදිත්වා, දැන ලොකෙ, ලොකයෙහි; කඤ්චි, කිසිවකුට; නචහිංසෙය්‍ය, පීඩානොකරන්නේද; ධම්මං, සකන්ධායතනාදීන්ගේ භෙදය හා චතුරාර්‍ය්‍යසත්‍ය ධර්මය; යථාතථියං, යථාභූතඥානයෙන් හා මාර්ගඥානයෙන්; විදිත්වා, දැන; සො, ඒ මහණතෙම; ලොකෙ, ලොකයෙහි; සම්මා, මනාකොට; පරිබ්බජෙය්‍ය, (ලොකයා හා නොඇලුනෙක්ව) වාසය කරන්නේය.

යම් භික්ෂුවක් තමාගේ භික්ෂුභාවයට නොසරුප්වූ අනෙසනාදිය හැර යහපත් එසනාදීවූ ආජීව සුද්ධියද අන්‍යවූ මනා පිළිවෙතද එහි පිහිටමින් දැන ලොකයෙහි කිසිවක්හට හිංසානොකරන්නේද, සකන්ධායතනාදීන්ගේ භෙදය හා චතුරාර්‍ය්‍යසත්‍ය ධර්මය යථාභූතඥානයෙන් හා මාර්ගඥානයෙන් දැන ඒ මහණතෙම ලොකයෙහි ලොකයා හා නොඇලුනෙක්ව මනාකොට වාසය කරන්නේය.

11. යස්ස, යම් මහණකුගේ; කෙචිඅනුසයා, කාමාදී කිසි අනුසයකෙනෙක්; නසන්ති, නොමැත්තාහුද; අකුසලාමූලා,

12. ආසවඛීණො පහීණමානො
සබ්බං රාගපථං උපාතිවත්තො
දන්තො පරිනිබ්බුතො ඨිතත්තො
සම්මා සො ලොකෙ පරිබ්බජෙය්‍ය,

---

අකුසලමූල්; සමූහතාසෙ, සහමුලින් නසනලද්දාහුද; සො, ඒ මහණතෙම; නිරාසයො, තෘෂ්ණාරහිතවූයෙක්වීද; අනාසයානො, ආසයාභාවයෙන් (කිසි රූපාදී ධර්මයක් බලාපොරොත්තු නොවන්නේද; සො, එබඳු මහණතෙම; ලොකෙ, ලොකයෙහි; සම්මා, මනාකොට; පරිබ්බජෙය්‍ය, (ලොකයා හා සමග නොඇලුනෙක්ව) වාසය කරන්නේය.

යම් භික්ෂුවකගේ කාමාදී අනුසයකෙනෙක් නැත්තාහුද ලොභ ද්වෙෂ මොහ යන අකුසල් මූල් සහමුලින් නසනලද්දාහුද ඒ භික්ෂුතෙම තෘෂ්ණා රහිතව ආසයාභාවයෙන් රූපාදී කිසි ධර්මයක් බලාපොරොත්තු නොවන්නෙක් වන්නේය එබඳු මහණතෙම ලොකයෙහි ලොකයා හා නොඇලුනෙක්ව මනාකොට වාසය කරන්නේය.

12. ආසවඛීණො, ක්ෂයකරනලද කාමාදී චතුරාශ්‍රවයන් ඇත්තාවූ; පහීණමානො, ප්‍රහීණකරනලද; නවවිධ මාන ඇති; සබ්බං, සියලු; රාගපථං, රාගවිෂයභූතවූ ඒ ත්‍රෛභූමික ධර්ම සමූහය; උපාතිවත්තො, පරිඥප්‍රහාණයෙන් ඉක්මෙව්වාවූ; දන්තො. (සජ්ඣාරව්සෙවනය හැර ආශ්‍රී) දමථයෙන් දමිත භූමියට පැමිණියාවූ; පරිනිබ්බුතො, (කෙලශාග්නිව්‍යුපශමයෙන්) සීතිභූත වූ; ඨිතත්තො, ලාභාදී අෂ්ට ලොක ධර්මයෙන් අකම්පනීය සිත් ඇත්තාවූ; සො, එබඳු මහණතෙම; ලොකෙ, ලොකයෙහි; සම්මා, මනාකොට; පරිබ්බජෙය්‍ය, (ලොකයා සමග නොඇලුනෙක්ව) වාසය කරන්නේය.

ක්ෂයකරනලද කාමාදී චතුරාශ්‍රවයන් ඇත්තාවූ උත්කෘෂ්ටයාට උත්කෘෂ්ටයෙමි; උත්කෘෂ්ටයාට සදෘශයෙමි. උත්කෘෂ්ටයාට හීනයෙමි. සදෘශයාට උත්කෘෂ්ටයෙමි. සදෘශයාට සදෘශයෙමි. සදෘශයාට හීනයෙමි. හීනයාට උත්කෘෂ්ටයෙමි. හීනයාට සමානයෙමි. හීනයාට හීනයෙමි. යනාදී වශයෙන් නවප්‍රකාරවූ මානය ප්‍රහීණකළාවූ රාගවිෂයවූ සියලු ත්‍රෛභූමික ධර්මසමූහය පරිඥාත ප්‍රහාණයෙන් ඉක්මෙව්වාවූ සජ්ඣාරව්සෙවනය හැර ආශ්‍රී දමථයෙන් දමිතභූමියට පැමිණියාවූ කෙලශාග්නිව්‍යුපශමයෙන් සීතිභූතවූ ලාභය, අලාභය, අයසස, යසස, නින්දාවය, ප්‍රශංසාවය, සැපය, දුකය,යන අෂ්ටලොකධර්මයෙන් කම්පාකළනොහැකි සිත් ඇත්තාවූ, ඒ භික්ෂුතෙම ලොකයෙහි ලොකයා සමග නොඇලුනෙක්ව මනාකොට වාසයකරන්නේය.

13. සද්ධෝ සුතවා නියාමදස්සී
වග්ගගතේසු නවග්ගසාරී ධීරෝ
ලෝභං දෝසං විනෙය්‍ය පටිඝං
සම්මා සෝ ලෝකෙ පරිබ්බජෙය්‍ය.

14. සංසුද්ධජිනෝ විවත්තච්ඡද්දෝ
ධම්මෙසු වසී පාරගූ අනේජෝ
සඞ්ඛාරනිරෝධඤාණකුසලෝ
සම්මා සෝ ලෝකෙ පරිබ්බජෙය්‍ය.

---

13. සද්ධෝ, (බුද්ධාදී ගුණයන්හි පරප්‍රත්‍යය විරහිත බැවින් යථාප්‍රකාරයෙන් සමන්විත) අවෙත්‍යප්‍රසාදයෙන් සමන්නාගතවූ, සුතවා, ශ්‍රැතියෙන් සමන්විතවූ; නියාමදස්සී, (සසරකාන්තාරයෙහි මූලාවූ ලෝකයෙහි අමාපුරයට යන සම්මත්තනියාම සඞ්ඛ්‍යාතවූ) මාර්ගය දක්නාසුළුවූ; වග්ගගතේසු, දෙසැට මිසදිටුවන් අතුරෙහි; නවග්ගසාරී, (මෙය විනාස වන්නේය මෙය මෙසේම වන්නේයයි මෙසේ දෘෂ්ටිවශයෙන්) නොපැමිණෙන සුළුවූ; ධීරෝ, ඒ ප්‍රාඥ මහණතෙම; ලෝභං, ලෝභයද; පටිඝං, සිතකටන්තාවූ; දෝසං, ද්වේෂයද; විනෙය්‍ය, දුරුකොට; ලෝකෙ, ලෝකයෙහි; සම්මා, මනාකොට; පරිබ්බජෙය්‍ය, (ලෝකයා හා නොඇලුනෙක්ව) වාසයකරන්නේය.

බුද්ධාදී ගුණයන්හි පරප්‍රත්‍යය විරහිත බැවින් යථාප්‍රකාරයෙන් සමන්විත අවෙත්‍යප්‍රසාදයෙන් සමන්නාගතවූ ශ්‍රැතියෙන් යුක්තවූ සංසාර කාන්තාරයෙහි මූලාවූ ලෝකයෙහි අමාපුරයට යන සම්මත්ත නියාමසඞ්ඛ්‍යාත මාර්ගය දක්නාසුලුවූ දෙසැට මිස දිටුගත්තවුන් අතුරෙහි මෙය විනාසවන්නේය මෙය මෙසේම වන්නේයයි මෙසේ දෘෂ්ටිවශයෙන් නොපැමිණෙනසුලුවූ ඒ පැණැති භික්ෂුතෙමේ ලෝභයද සිතකටන්තාවූ ද්වේෂයද දුරුකොට ලෝකයෙහි ලෝකයා හා නොඇලුනෙක්ව මනාකොට වාසයකරන්නේය.

14 සංසුද්ධජිනෝ, පරිශුද්ධ අර්හත්මාර්ගයෙන් දිනනලද කෙලෙසුන් ඇත්තාවූ; විවත්තච්ඡද්දෝ, විවෘතකරනලද රාග ද්වේෂ මෝහසඞ්ඛ්‍යාත ක්ලේශච්ඡදන ඇත්තාවූ, ධම්මෙසු, චතුරාර්‍ය්‍ය සත්‍ය ධර්මයන්හි; වසී, වශීප්‍රාප්තවූ, පාරගූ, (සෝපධිශේෂ වශයෙන්) නිර්වාණයට පැමිණියාවූ; අනේජෝ, පහවූ තෘෂ්ණාචලන ඇත්තාවූ; සංඛාරනිරෝධ ඤාණකුසලෝ, සංස්කාර නිරුද්ධකාරණ ආර්‍ය්‍යමාර්ගඥානයෙහි දක්ෂවූ; සෝ, ඒ භික්ෂුතෙම; ලෝකෙ, ලෝකයෙහි; සම්මා, මනාකොට; පරිබ්බජෙය්‍ය, (ලෝකයා හා නොඇලුනෙක්ව) වාසයකරන්නේය.

15. අතීතෙසු අනාගතෙසු චාපි
කප්පාතීතො අතිච්චසුද්ධිපඤ්ඤො
සබ්බායතනෙහි විප්පමුත්තො
සම්මා සො ලොකෙ පරිබ්බජෙය්‍ය.

---

පිරිසිදු රහත්මගින් දිනකලද කෙලෙසුන් ඇති විවෘත කරණලද රාග ද්වේෂ මෝහ නැමැති කෙලෙස් ඡදන ඇති චතුරාර්‍ය්‍ය සත්‍ය ධර්මයන්හි වශිප්‍රාප්තවූ; චතුරාර්‍ය්‍යසත්‍ය ධර්මයන් තත්වූ පරිද්දෙන් දත්තකු අඥානභාවයකට පමුණුවන්ට කිසිවකුටත් නොහැකි බැවින් ක්ෂීණාශ්‍රවතෙමේ සත්‍යධර්ම චතුෂ්කයෙහි වශිප්‍රාප්තයයි කියනුලැබේ. උපධිශේෂ වශයෙන් නිර්වාණයට පැමිණියාවූ පහවූ තෘෂ්ණාවලත ඇත්තාවූ සංස්කාර නිරුද්ධකරණ ආර්‍ය්‍යමාර්ගඥානයෙහි දක්ෂවූ ඒ භික්ෂුතෙම ලොකයෙහි ලොකයා හා නොඇලුනෙක්ව මනාකොට වාසයකරන්නේය.

15. අතීතෙසු, පැවත (ඉක්මගිය පඤ්චස්කන්ධයන් කෙරෙහිද;) අපි, යළි; අනාගතෙසු, පැවැත්මට නොපැමිණි පඤ්චස්කන්ධයන් කෙරෙහිද පැවති; කප්පාතීතො, (මමය මාගේය යනාදී) සියලු තෘෂ්ණාදෘෂ්ටි කල්පය ඉක්මෙව්වාවූ; අතිච්ච, (ප්‍රත්‍යයොත්පන්නධර්ම සම්බන්ධීභූත භවිෂ්‍යද් වර්තමාන සඞ්ඛ්‍යාත අද්ධවත්‍රය) ඉක්මවා; සුද්ධිපඤ්ඤො, අතිවිශුද්ධ ප්‍රඥා ඇත්තාවූ; සබ්බායතනෙහි, (චක්ඛාදි) සියලු ද්වාදසායතනයන් කෙරෙන්; විප්පමුත්තො, විශෙෂයෙන් මිදුනාවූ; සො, (ඒ ක්ෂීණාශ්‍රව මහණ තෙම; ලොකෙ, ලොකයෙහි; සම්මා, මනාකොට; පරිබ්බජෙය්‍ය, (ලොකයා හා නොඇලුනෙක්ව) වාසයකරන්නේ.

පැවත ඉක්මගියාවූ රූප, වෙදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ, යන පඤ්චස්කන්ධයන් කෙරෙහිද, නැවත පැවැත්මට නොපැමිණි එකී පඤ්චස්කන්ධයන් කෙරෙහිද පැවති මමය මාගේය යනාදීවූ සියලු තෘෂ්ණාදෘෂ්ටි කල්පය ඉක්මෙව්වාවූ ප්‍රත්‍යයොත්පන්න ධර්මසම්බන්ධිවූ භූතභවිෂ්‍යද් වර්තමාන සඞ්ඛ්‍යාත අද්ධවත්‍රය ඉක්මවා අතිවිශුද්ධ ප්‍රඥා ඇත්තාවූ (අභිත්තෙමේ වනාහි) ඒ මේ අවිජ්ජා සඞ්ඛාර සඞ්ඛ්‍යාත අතීතාද්ධවයද ජාති ජරා මරණ සඞ්ඛ්‍යාත අනාගතාද්ධවයද, විඤ්ඤාණංශ ආදිකොට ඇති භවපරියන්ත ප්‍රත්‍යුත්පන්න අද්ධවයද යන ඒ සියල්ල ඉක්මවා සැකය දුරුකොට අතිශයින් පිරිසිදුබවට පැමිණි පැණැත්තෙක්ව සිටිතෙක) චක්ඛායතන, සොතායතන, ඝාණායතන, ජිව්හායතන, කායායතන, මනායතන, රූපායතන,

16. අඤ්ඤාය පදං සමෙච්ච ධම්මං
විවටං දිස්වාන පහාණමාසවානං
සබ්බූපධීනං පරික්ඛයානො
සම්මා සො ලොකෙ පරිබ්බජෙය්‍ය.

17. අද්ධා හි භගවා තථෙව එතං
යො සො එවං විහාරී දන්තො භික්ඛු
සබ්බසංයොජනීයෙව වීතිවත්තො
සම්මා සො ලොකෙ පරිබ්බජෙය්‍යාති.

---

සද්දායතන, ගන්ධායතන, රසායතන, ඵොට්ඨබ්බායතන, ධම්මායතන යන මේ දශායතනයන් කෙරෙන් විශෙෂයෙන් මිදුනාවූ ඒ ක්ෂීණාශ්‍රව මහණතෙම ලොකයෙහි මනාකොට ලොකයා හා නොඇලුනෙක්ව වාසයකරන්නේය.

16. පදං, නිර්වාණපදය; අඤ්ඤාය, (පූර්වභාගසත්‍ය ව්‍යවස්ථාපන ප්‍රඥාවෙන් දැන; ධම්මං. (ඉක්බිත්තෙන් සිව් අරිමගනැණින් සිව්සස්; සමෙච්ච. දැන; ආසවානං පහාණං, (නැවත ප්‍රත්‍යවෙක්ෂාඥානයෙන්) ආශ්‍රවක්ෂය සංඛ්‍යාත නිර්වාණය; විවටං, ප්‍රකටකොට; දිස්වාන, දැන; සබ්බූපධීනං, (ස්කන්ධකාම ක්ලෙශාභිසංස්කාර යන සර්වෝපධීන්; පරික්ඛයානො, ක්ෂයකළාවූ; සො, (ඒ රහත් මහණතෙමේ; ලොකෙ, ලොකයෙහි; සම්මා, මනාකොට පරිබ්බජෙය්‍ය, (ලොකයා හා නොඇලුනෙක්ව) වාසයකරන්නේය.

නිර්වාණපදය පූර්වභාග ව්‍යවස්ථාපන ප්‍රඥාවෙන් දැන ඉක්බිති සිව්අරිමගනැණින් සිව්සසට පැමිණ නැවත ප්‍රත්‍යවෙක්ෂාඥානයෙන් ආශ්‍රවක්ෂයසංඛ්‍යාත නිර්වාණය ප්‍රකටකොට දැන ස්කන්ධකාම ක්ලෙශාභිසංස්කාර යන සර්වෝපධීන් ක්ෂයකළාවූ ඒ මහණතෙමේ මේ ලොකයෙහි මනාකොට ලොකයා හා නොඇලුනෙක්ව වාසයකරන්නේය. මෙසේ පසළොස්ගයකින් දෙශනාව නිමකොට වදාළකල්හි නිර්මිත සර්වඥතෙමේ දෙශනාවට පසසමින්, (අද්ධා හි භගවා) යනාදී අවසාන ගාථාව වදාළසේක.

17. භගවා, භාග්‍යවතුන්වහන්ස; එතං, යස්ස මඞ්ගලා සමූහතා, (යනාදී ඒ ඒ ගාථාවකින් යමක් යමක් වදාරණ ලදද) ඒ ඒ කාරණය; අද්ධා, ඒකාන්තයෙන්; තථෙව, එසේමය; එවංවිහාරී, එසේ වාසයකරණසුලුවූ; යො සො භික්ඛු, යම් ඒ භික්ෂුවක් තෙමේ; දන්තො, (උතුම් දමථයෙන්) දැමූයේද; සබ්බසංයොජනීයෙව, සියලු දශසංයොජනයන් හා (සිව්යොගයන්;) වීති

වනෙතා, ඉක්මවූයේද; සො, ඒ මහණතෙම; ලොකෙ, ලොකයෙහි; සම්මා, මනාකොට; පරිබ්බජෙය්‍ය, (ලොකයා හා නොඇලුනෙක්ව) වාසයකරන්නේය.

භාග්‍යවත්නි, යසාමඩශලාසමූහතා යනාදී ඒ ඒ ගයකින් යමක් යමක් වදරණලදද ඒ ඒ කාරණය එයේමය එසේමය එප රිද්දෙන් වාසයකරණසුලුවූ යම් භික්ෂුවක් උතුම් දම්ඵයෙන් දැමූනේද සියලු දශසංයොජනයන් හා බලවත්වූ තන්හි ඛශ නාමයෙන්ද, දුර්වලවූතන්හි යොග නාමයෙන්ද, ව්‍යවහාරවන කාම, භව, දිට්ඨි, අවිජ්ජා යන සිව්යොගයන් ඉක්මවීද ඒ මහණතෙම ලොකයෙහි මනාකොට ලොකයා හා නොඇලුනෙක්ව වාසයකරන්නේය.

මෙසේ නිම්තබුද්ධතෙමේ දෙසනාවට පසසා රහත් මගින් කුළුගන්වමින් අවසන් ගය වදරා දෙශනාව නිමවූසේක. සම්මාපරිබ්බාජනිය සූත්‍රදෙශනාවෙහි කෙළවර කොටිලක්ෂයක් දෙවියන්ට අර්හත්ඵලය අත්පත්විය. සෙසු මාර්ගඵලයන්ට පැමිණියෝ සඞ්ඛ්‍යාරහිතවූහ.

සම්මාපරිබ්බාජනිය සූත්‍රව්‍යාඛ්‍යානය සමාප්තයි.

වෛෂචරිතදෙව්යන්ගේ ප්‍රයොජනය සඳහා

වදල

# කලහවිවාද සූත්‍රය.

නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස.

1, කුතොපහූතා කලහාවිවාද
පරිදෙවසොකා සහමච්ඡරාච
මානාතිමානා සහපෙසුණාච
කුතොපහූතා තෙ තදිඞ්ඝ බ්‍රෑහි.

---

1. පහූතා, බොහෝවූ; කලහා, කලහයෝද; විවාද, (කලහයට පූර්වභාගවූ) විවාදයෝද; කුතො, කොතැනින් (කොහොත්) කුමක්කාරණකොට උපදිද්ද; සහමච්ඡරාච, මාත්සර්‍යයෝද; පරිදෙවසොකා, පරිදෙවසොකයෝද; කුතො, කොතැනින්(කොහොත්) කුමක්කාරණකොට උපදිද්ද; සහපෙසුණාච, පෛශුන්‍යයෝද; පහූතා, බොහෝවූ; මානාතිමානා, මානාතිමානයෝද; කුතො, කොතැනින් (හෝ) කුමක්කාරණකොට උපදිද්ද; තෙ,ඒ (කලහාදී සියලුම අෂ්ටකෙලශ)ධර්මයෝ;කුතො,කොතැනින් (හෝ) කුමක්හේතුකොට උපදිද්ද; තං,(ඒ අර්ථය හෙවත් මා විසින් විචාරණලද) ඒ අර්ථය; ඉඞ්ඝබ්‍රෑහි, වදාලමැනාත් යෙහෙකි.

බොහෝවූ කලහයෝද කලහයට පූර්වභාගයෙහිවූ විවාදයෝද කුමක් හෙතුකොටගෙණ උපදිද්ද, පරිදෙව සොක මාත්සර්‍යයන මොවුහු කුමක්කාරණකොටගෙණ උපදිද්ද, පෛශුන්‍යයෝද මාන අතිමානයෝද කුමක් හෙතුකොටගෙණ උපදිද්ද, කලහාදී සියලුම අෂ්ටකෙලශ ධර්මයෝ කුමක්හෙතුකොටගෙණ උපදිද්ද, මාවිසින් විචාරණලද ඒ කාරණය විස්තරකොට වදාලොත් ඉතා මැනවි. බොහෝවූ කලහ විවාද පරිදෙව සොක මච්ඡරියමාන අතිමානපෛශුන්‍යයන කෙලෙසිලි ධර්මඅට කුමක් හෙතුකොටගෙණ උපදීදැයි නිර්මිත බුදුන් විසින් විචාරණලදුව සර්වඥයන්වහන්සේ විසින්( පියාපහූතා කලහා විවාද,) යනාදියෙන් පවත්නෙණ විස්තරකර වදාරණලදී.

2. පියාපහූතා කලහාවිවාද
පරිදෙවසොකා සහමච්ඡරාච
මානාතිමානා සහපෙසුණාච
මච්ඡරියයුත්තා කලහාවිවාද
විවාදජාතෙසුචපෙසුණානි.
3. පියාසුලොකස්මිං කුතොනිදානා
යෙචාපිලොභා විචරන්තිලොකෙ
ආසාචනිට්ඨාචකුතොනිදානා
යෙසම්පරායායනරස්සහොන්ති

---

2. පියා, ප්‍රිය වස්තූන් කාරණකොටගෙණ; පහූතා, බොහෝ වූ; කලහා, කලහයෝද; විවාද, (කලහයට පූර්වභාගවූ විවාද යෝද; පරිදෙවසොකා, පරිදෙවශෝකයෝද; සහමච්ඡරාච, මාත්සර්‍ය්‍යයෝද; මානාතිමානා, මානඅතිමානයෝද; සහපෙසුණාච, පෛශුන්‍යයෝද (උපදනාහුය;) මච්ඡරියයුත්තා මාත්සර්‍ය්‍යයෙන් යුක්තවූවෝ; කලහා, කලහඇත්තෝද; විවාද, විවාද ඇත්තෝද වෙත්; විවාදජාතෙසු, හටගත් විවාද ඇත්තවුන් විෂයෙහි; පෙසුණානි, පෛශුන්‍යයෝද (උපදිති).

ප්‍රිය වස්තූන්නිසා බොහෝවූ කලහයෝද කලහයට පූර්වභාගවූ විවාදයෝද පරිදෙවශොක මාත්සර්‍ය්‍යයෝද මානාතිමාන යෝද පෛශුන්‍යයෝද උපදිති. මාත්සර්‍ය්‍යයෙන් යුක්තවූවෝ කලහඇත්තෝද විවාදඇත්තෝදවෙත්. හටගත් විවාද ඇත්ත වුන් අතුරෙහි කේලාම්කියන්නෝද ඇතිවෙති මෙහිගහිත් එකී කලහාදී අටකෙලෙස්හුම ප්‍රියස්වභාවය නිසා උපදිත්යයිද විවාද පත්තයන්අතර පෛශුන්‍යයෝ උපදනාහුයයිද වදාළසේක.

3. ලොකස්මිං, ලොකයෙහි; කුතොනිදානා, කවර කාරණක් කාරණකොටගෙණ; පියාසු, ප්‍රියයෝවෙද්ද; අපි, යලි; ලොකෙ, ලොකයෙහි; ලොභා, ලොභයෙන් යුක්තවූ; යෙච, (ක්ෂත්‍රියාදී) යම් කෙනෙක්; විචරන්ති, හැසිරෙද්ද; (ඔවුන්ගේ එකී ලොභය කවරහෙතුවකින් උපදනේද;) ආසාච, ආසාවද; නිට්ඨා ච, ඇගේසමෘද්ධියද; කුතොනිදානා, කවරහෙතුවකින් වන්නේද: යෙ යම්ධර්මයෝ; නරස්ස,සත්වයාට; සම්පරායාය, පරලොවවිපාක පිණිස; හොන්ති, වෙද්ද; (ඒ ධර්මයෝ කවරක් හෙතුකොට වෙද්ද.)

ලොකයෙහි කවරකාරණක් කාරණකොටගෙණ ප්‍රියයෝ වෙද්ද. නැවත ලොකයෙහි ලොභයෙන් යුක්තවූ ක්ෂත්‍රිය

4. ඡන්‍දනිදානානි පියානි ලොකෙ
යෙවාපි ලොභා විචරන්ති ලොකෙ
ආසාච නිට්ඨාච ඉතො නිදානා
යෙසම්පරායාය නරස්ස හොන්ති.

5. ඡන්‍දනුලොකස්මිං කුතො නිදානං
විනිච්ඡයාචාපි කුතොපහූතා
කොධොමොසවජ්ජඤ්ච කථංකථාච
යෙවාපිධම්මා සමණෙනවුත්තා

---

බ්‍රාහමණාදී. යම්කෙනෙක් හැසිරෙද්ද. ඔවුන්ගේ එකී ලොභය කවරහෙතුවකින් උපදනේද. ආසාවද ඒ ආසාවගේ සමෘධියද කවරහෙතුවකින් වන්නේද සත්‍වයාට යම් සවභාවයෝ පරලොව විපාකපිණිසවෙද්ද. ඒ සවභාවයෝ කවරක්හෙතුකොට ගෙණවෙද්ද. මේගයින් ප්‍රියසවභාවද, ලොභයද, ආසාවද ඒ ආසාවේ සමෘධියද සත්‍වයාට පරලොව විපාකපිණිස ඇතිවන සවභාවයන්ද විචාලසේක.

4. ලොකෙ, ලොකයෙහි; පියානි, ප්‍රියවසතුහු; ඡන්‍දනිදානානි කාමඡන්‍දදීහු මුල්කාරණකොට ඇත්තාහුය; අපි, යලිදු; ලොකෙ, ලොකයෙහි; යෙච, ක්‍ෂත්‍රියාදී යම්කෙනෙක්; ලොභා, ලොභාභිභූතයෝව; විචරන්ති, හැසිරෙද්ද (ඒ ලොභයද ඡන්‍දයම මුල්කාරණයකොට ඇත්තෝය;) ආසාච, තණ්හාවද; නිට්ඨාච, ඒ තණ්හාවගේ සමෘධියද, ඉතොනිදානා මේ ඡන්‍දය මුල්කාරණයවීමෙන් වන්නීය; යෙ, යම් සවභාවයෝ; නරස්ස, සත්‍වයාට; සම්පරායාය පරලොව විපාකපිණිස; හොන්ති, වෙද්ද; (ඒ සවභාවයෝත් මේ ඡන්‍දය මුල්කාරණය වීමෙන්ම වන්නාහුය.)

ලොකයෙහි ප්‍රියවසතුහු කාමඡන්‍දදීහු මුල්කාරණකොට ඇත්තාහුය. නැවත ලොකයෙහි ක්‍ෂත්‍රියාදී යම්කිසිකෙනෙක් ලොභයෙන් මැඩනාලද්දෝව හැසිරෙද්ද ඒ ලොභයද ඡන්‍දයම මුල්කාරණකොට ඇත්තේය. තණ්හාවද ඒ තණ්හාවගේ සමෘධියද මේ ඡන්‍දය මුල්කාරණයවීමෙන්මවන්නීය. යම් සවභාවයෝ සත්‍වයාට පරලොව විපාකපිණිසවෙද්ද. ඒ ධර්මයෝත් මේ ඡන්‍දය මුල්කාරණයවීමෙන්ම වන්නාහුය. මේගයින් ඒ සියලුම අකුශලධර්මයෝ කාමඡන්‍දදීන් නිසාම උපදින්නයයි වදාලසේක.

5. ලොකස්මිං, සත්‍වලොකයෙහි; ඡන්‍දො, කාමාදිඡන්‍දය; කුතොනිදානං, කවරක් මුලකාරණයකොට ඇත්තේද; අපි, යලිදු; පහූතා, බොහෝවූ; විනිච්ඡයාච, තෘෂ්ණාදෘෂ්ටි විනිශ්චයෝ; කු

6. සාතං අසාතන්ති යමාහු ලොකෙ
තමූපනිස්සාය පහොති ඡන්දො
රූපෙසු දිස්වා විභවං භවඤ්ච
විනිච්ඡයං කුරුතෙ ජන්තු ලොකෙ.

---

තො, කවරහෙතුවකින් වන්නෝද; කොධො, ක්‍රොධයද; මොසවජ්ජඤ්ච, මුසවා කියනබවද; කථංකථා ච, (බුද්ධධර්මයනාදී අවතන්හි උපදවන) සැකයද; අපි, යලි; යෙ වා ධම්මා, යම්බඳුඅතිකුදුඅකුශල ධර්මයෝ හෝ; සමණෙන, ශ්‍රමණවූබුදුන් විසින්; වුත්තා, කියන ලද්දේද. (ඒ ධර්මයෝත් කවරහෙතුවක් කරණකොටගෙණ උපදිද්ද.)

ලොකයෙහි කාමච්ඡන්දව්‍යාපාදදිය කවරහෙතුවක් කරණ කොටගෙණ වන්නේද, තැවත බොහෝවූ තෘෂ්ණාදෘෂ්ටි විනිශ්චයෝද කුමක් හෙතුකොටගෙණ වන්නෝද, ක්‍රොධය හා බොරුකීමද බුද්ධ ධර්ම සඞ්ඝ යනාදී අවතැන උපදවන ශංකාවද නැවත යම්බඳු අතිකුත් අකුශලයෝ හෝ බුද්ධශ්‍රමණයන් වහන්සේ විසින් වදාරණලද්දාහුද ඒ ධර්මයෝත් කවරහෙතුවක් කරණ කොටගෙණ ඇතිවේද්ද, මේගයින් ඡන්ද තෘෂ්ණා දෘෂ්ටිවිනිශ්චයෝද, ක්‍රොධයද, බොරුවද, විචිකිච්ඡාවද එයින් අන්‍යධර්මයෝද කුමක් කරණකොටගෙණ ඇතිවේද්දැයි පුළුවුත්හේක.

6. ලොකෙ, සත්වලොකයෙහි; යං, යමක්; සාතං, සැපයයිද; අසාතංඉති, දුකයයිද; ආහු, කිවෝද; තං උපනිස්සාය ඒ සුඛ දුඃඛ වෙදනාව නිසා; ඡන්දො, ඡන්දයතෙම (සංයොගවියොගපත්ථනා වශයෙන් හටගණී;) ලොකෙ, (අපායාදී) ලොකයෙහි; ජන්තු, මේ සත්වතෙම; රූපෙසු, රූපයන්හි; විභවං, විනාශයද; භවඤ්ච, උත්පත්තියද; දිස්වා, දැක; විනිච්ඡයං, භොගාධිගමය සඳහා තෘෂ්ණා විනිශ්චයද මට ආත්මයක් උපනැයි යනාදීනයින් දෘෂ්ටිවිනිශ්චයද; කුරුතෙ, කෙරෙයි.

ලොකයෙහි යමක් සැපයයිද යමක්දුකයයිද කියත්නම් ඒ සුව දුක් විඳිම් නිසා ඡන්දයතෙම සංයොග වියොගපත්ථනා වශයෙන් උපදී. අපායාදී ලොකයෙහි මේ සත්ව තෙමේ රූප ධර්මයන්හි විනාශය හා ඉපදීමදැක භොගාධිගමය සඳහා තෘෂ්ණාවිනිශ්චයද මටආත්මයක් උපනැයි යනාදීනයින් දෘෂ්ටි විනිශ්චයද කෙරෙයි. මේගාථාවෙන් සුඛ දුඃඛ වෙදනා හෙතුවෙන් ඡන්දයද භොගාධිගමය හා රූපයන්ගේ විනාශයද ඉපැද්මද දැක ඒ හෙතුවෙන් තෘෂ්ණාදෘෂ්ටි විනිශ්චයද උපදනා බැව් නිර්මිත බුදුන්ට පිළිවදන් වශයෙන් වදාළහේක.

7. කොධො මොසවජ්ජඤ්ච කථංකථා ච
එතෙපි ධම්මා ද්වයමෙව සන්තෙ
කථංකථී ඤාණපථාය සික්ඛෙ
ඤත්වා පවුත්තා සමණෙන ධම්මා

8. සාතං අසාතඤ්ච කුතොනිදානා
කිස්මිං අසන්තෙ න භවන්ති හෙතෙ
විභවං භවඤ්චාපි යමෙතමත්ථං
එතං මෙ පබ්‍රෑහි යතොනිදානං.

---

7. කොධො, ක්‍රොධයද; මොසවජ්ජඤ්ච, බොරුකීමද; කථංකථා ච, (බුද්ධාදී අටතැන) සැකයද යන; එතෙ ධම්මා, අපි මේකී ධර්මයෝද; ද්වයෙ එව සන්තෙ, යටකී සැප දුක් දෙක ඇතිකල්හිම (උපදිත්); කථංකථී, ශංකාවෙන් යුත් පුගුල්තෙම; ඤාණපථාය, ඤාණදර්ශනාධිගමය පිණිස; සික්ඛෙ, (ත්‍රිශික්ෂායෙහි) හික්මෙන්නේය (කුමකටදයත්); සමණෙන, බුද්ධශ්‍රමණයන් වහන්සේ විසින්; ඤත්වා, (සර්වඥතාඥානයෙන්) දැන; ධම්මා, චතුරාර්ය සත්‍යධර්මයෝ හෝ චාතුර්භූමික ධර්මයෝ; වුත්තා, වදාරණලදහ එහෙයිනි,

ක්‍රොධයද, බොරුකීමද, බුද්ධාදී අටතැන සැකයද යන මේකී ධර්මයෝද යටකී සැපදුක් දෙක ඇතිකල්හිම උපදිති, සැකයෙන් යුත් පුගුල්තෙම ඥානදර්ශනාධිගමය පිණිස අධිශීල අධිචිත්ත අධිප්‍රඥා යන ත්‍රිශික්ෂායෙහි හික්මෙන්නේය, කුමකටදයත් බුද්ධ ශ්‍රමණයන්වහන්සේ විසින් සියලු ධර්මයන් සර්වඥතාඥානයෙන් දැනවදාළහෙයිනි. මෙයින් සැපදුක්දෙකනිසාම ක්‍රොධය බොරුකීම, විචිකිච්ඡාව යන අකුශලධර්මයෝ උපදින්නයිද සැකය වටපත් තැනැත්තේ සැකය දුරැකරගැණීම පිණිස අධිශීලාදී ත්‍රිශික්ෂායෙහි හික්මෙන්නේයයිද කුමක්නිසාදයත් සර්වඥතාඥානයෙන් බුදුන් විසින්ම දැන ධර්මය මනාකොට වදාරණලදී. ඒ ධර්මය ඥානදර්ශනාධිගමයට පමණයයිද වදාළසේක.

8 සාතං, සැපවූ වෙදනාවද; අසාතඤ්ච, දුක්වූ වෙදනාවද, කුතොනිදානා. කුමක් හෙතුකොටගෙණ උපදනේද; කිස්මිං, කුමක්; අසන්තෙ, නැතිකල්හි; එතෙ, ඒ සැප දුක් දෙදෙන නභවන්ති, ඇති නොවේද්ද; අපි, යලි; විභවං, (ඒ සැප දුක් වෙදනාවන්ගේ) විනාශයද; භවඤ්ච, ඉපැද්මද; යන යං එතං අත්ථං, යම්මේ කාරණක්; යතොනිදානං, යම්මුල්කාරණයක් හෙතුකොටවේද; එතං, එය; මෙ, මට; බ්‍රෑහි, වදාළමැනව.

9. ඵස්සනිදානං සාතං අසාතං
ඵස්සෙඅසන්තෙ නභවන්තිහෙතෙ
විභවංභවඤ්චාපි යමෙතමත්ථං
එතංතෙපබ්‍රෑමි ඉතොනිදානං.
10. ඵස්සොනුලොකස්මිං කුතොනිදානං
පරිග්ගහාචාපි කුතොපහූතා
කිස්මිං අසන්තෙනමමත්ත මත්ථි
කිස්මිං විභූතෙනඵුසන්තිඵස්සා

---

සැපවූද දුක්වූද විඳීම කුමක් හෙතුකොටගෙණ උපදනේද; කුමක්නැතිකල්හි ඒ සැපවූදදුක්වූද වෙදනාවෝ ඇතිනොවේද්ද නැවත ඒ සැපවූද දුක්වූද වෙදනාවන්ගේ විනාසයද ඉපැද්මද යන යම් මේ කාරණයක් යම් මූල්හෙතුවකින්වේද එය මට වදාළ මැනව, මේ ගාථාවෙන් නිර්මිත බුදුන් විසින් සැපදුක්වේදනාවයද ඔවුන්ගේ හානිය වැඩීමය යන කරුණු පිළිබඳ හෙතුන් විචාළසේක.

9. සාතං, සැපයද; අසාතං, දුකද; ඵස්සනිදානං, චක්ෂුරාදී ස්පර්ශය මූල්කාරණයකොටඇත්තේය; ඵස්සෙ,ස්පර්ශය; අසන්තෙ, නැතිකල්හි;එතෙ, ඒ සැපදුක් දෙදෙන; නභවන්ති, නොවෙත්; අපි, යලි; විභවං, සැපදුක් දෙවෙදනාගේ විනාසයද; භවඤ්ච, සැපදුක්දෙවෙදනාගේ ඉපැද්මද; යන; යං එතං අත්ථං, යම් ඒ කාරණයක්වේද; එතං, එය; ඉතොනිදානං, මේ චක්ෂුඃස්පර්ශයන් මූලකාරණයකොට ඇත්තේයයි; තෙ, ඔබවහන්සේට; පබ්‍රෑමි, මම කියමි

සැපයදදුකද චක්ඛු, සොත, ඝාණ, ජිව්හා, කාය යන පස් පහස හෙතුකොට ඇත්තේය. චක්ෂුරාදී ස්පර්ශය අවිද්‍යමානකල්හි එකී සැපදුක්වෙදනාවෝ ඇතිනොවෙත් නැවත සැපදුක් වෙදනාවන්ගේ විනාසයද ඉපැද්මද යන යම් ඒ කාරණයක්වේද එය මේචක්ෂුඃස්පර්ශාදී පඤ්චස්පර්ශයන් මූල්කරුණකොට ඇත්තේයයි ඔබට මම කියමි, ඒ සුඛදුඃඛවෙදනා චක්ෂුරාදීස්පර්ශයන් මූලකාරණකොට ඇත්තේයයිද පහස නැතිකල්හි සැපදුක්වෙදනාවෝ ඇතිනොවෙත්යයිද ඒ සැපදුක් වෙදනාවන්ගේ විනාසය හා ඉපැද්මද මේ ස්පර්ශහෙතුවෙන්ම වේයයිද සර්වඥයන්වහන්සේ විසින් නිර්මිත බුදුන්ට මේගාථාවෙන් පිළිතුරුවශයෙන් වදාරණ ලදී.

10. ලොකස්මිං, ලොකයෙහි; ඵස්සො, (චක්ෂුඃස්පර්ශාදී පස්වැදෑරුම්) පහස; කුතොනිදානං, කුමක් මූලකාරණයකොට ඇත්

11. නාමඤ්ච රූපඤ්ච පටිච්චඵස්සා
ඉච්ඡානිදානානි පරිග්ගහානි
ඉච්ඡානසන්ත්‍යාන මමත්තමත්ථි
රූපෙවිභූතෙනඵුසන්තිඵස්සා

---

තේද; අපි, යලි; පහුතා, බොහෝවූ; පරිග්ගහාච, අයිතිකම්ද; කුතො, කුමක් හෙතුකොටගෙණ උපදීද්ද; කිස්මිං, කුමක්; අසන්තෙ, අවිද්‍යමානකල්හි; මමත්තං, මමය මාගේය යන අස්මි මානය; නඅත්ථි, නොමැත්තේද; කිස්මිං, කුමක්; විභූතෙ, ඉක්මගියකල්හි;ඵස්සා, චක්ෂුඃස්පර්ශාදිපඤ්චස්පර්ශයෝ; නඵුසන්ති, ස්පර්ශනොකෙරද්ද.

ලොකයෙහි චක්ඛුශ්‍රොත, ඝ්‍රාණ, ජිහ්වා, කාය යන පඤ්ච ස්පර්ශය කුමක්කාරණකොටගෙණ උපදනේද, යලි බොහෝවූ අයිතිකම්ද කුමක් කාරණකොටගෙණ උපදිද්ද; කුමක් නැති කල්හි මමය මාගේය යන අස්මි මානය නොමැත්තේද කුමක් ඉක්මගියකල්හි චක්ෂුඃස්පර්ශාදි පඤ්චස්පර්ශයෝ ස්පර්ශනොකෙරෙද්දැයි නිර්මිත සමිඳුනෙම විචාළේය.

11, නාමඤ්ච, සම්ප්‍රයුක්තනාමයද; රූපඤ්ච, වස්තුආරම්මණ රූපයද; පටිච්ච; නිසා, ඵස්සා, චක්ෂුරාදිස්පර්ශයෝ (පස්දෙන උපදිත්;) පරිග්ගහානි. පරිග්‍රහයෝ; ඉච්ඡා නිදානානි, කැමැත්ත මූලකාරණකොට ඇත්තෝය; ඉච්ඡා, කැමැත්ත; නස න්ත්‍යා,නැතිකල්හි; මමත්තං, මමයමාගේය යන මමත්වය; නඅත්ථි නොමැත්තේය; රූපෙ, රූපය; විභූතෙ, ඉක්මගියකල්හි; ඵස්සා, පඤ්චස්පර්ශයෝ; නඵුසන්ති, ස්පර්ශනොකෙරෙත්.

සම්ප්‍රයුක්ත නාමයද, වස්තු ආරම්මණරූපයද, හෙතුකොට ගෙණ චක්ෂුරාදිපඤ්චස්පර්ශයෝ උපදිත්, පරිග්‍රහයෝ කැමැත්ත මූලකාරණකොට ඇත්තෝය, කැමැත්ත නැතිකල්හි මමය මාගේය යන අස්මිමානය නොමැත්තේය. රූපය ඉක්මගිය කල්හි චක්ෂුරාදි පඤ්චස්පර්ශයෝ ස්පර්ශනොකෙරෙති,නාමරූපයන් නිසා පහසද කැමැත්ත මූලකාරණයකොට අයිතියද යන මොවුහු ඇතිවෙත්, කැමැත්ත නැතිකල මමත්වය නැත්තේය, රූපයනැතිකල පහස්හු තමකිසනොකෙරෙතැයි සමිඳුයන් වහන්සේ මේ ගාථාවෙන් නිර්මිත බුදුන්ට පිළිතුරු දුන්සේක.

12. කථංසමෙතස්ස විභොතිරූපං
සුඛං දුඛංචාපි කථංවිභොති
එතං මෙපබ්‍රෑහි යථාවිභොති
තංජානිස්සාමීති මෙමනොඅහු.

13. නසඤ්ඤසඤ්ඤීන විසඤ්ඤසඤ්ඤී
නොපිඅසඤ්ඤීන විභූතසඤ්ඤී
එවංසමෙතස්ස විභොතිරූපං
සඤ්ඤානිදානාහිපපඤ්චසඞ්ඛා

---

12. කථංසමෙතස්ස, කෙසේපිළිපන්නාහට; රූපං, රූපාරම්මණය; විභොති, නොවේද; අපි, යලිදු; සුඛංදුඛංචා, සැපදුක් දෙකහෝ; කථංවිභොති, කෙසේ නොවේද; එතං, රූපාරම්මණය සහ සුවදුක්යනමෙය; යථා, යම්පරිද්දකින්; විභොති, නොවේද එලෙස; මෙ, මට; බ්‍රෑහි, වදාළමැනව; තං, එය; ජාතිස්සාමි ඉති, දැනගණිම්මැයි; මෙ, මට, මනොඅහු, සිතක්විය.

කෙසේ පිළිපන්නාහට රූපයපිළිබඳ අරමුණනොවන්නේද: සැපදුක්විඳුම්හෝ කෙසේ නොවන්නේද රූපාරම්මණය හා සැප දුක් යනමෙය යම් පරිද්දකින් නොවන්නේද එපරිදි මට වදාළ මැනව එය දනුම්හයි මට සිතක්විය. කෙලෙස පිළිපන්නාට රූපාරම්මණය හා සැපදුක්වෙදනාවෝ පහවයද්ද,යම් අයුරකින් එයවේද, ඒ ආකාර දැනගණිම්මැයි යන සිතක් මට ඇතිව තිබෙණබැවින් එය විස්තරකොට වදාළ මැනවැයිමේ ගාථා වෙන් නිර්මිත බුදුන් සර්වඥයන් වහන්සේට ආරාධනා කළ සේක.

13. නසඤ්ඤසඤ්ඤී, (යම්සේ පිළිපන්නකුට රූපසංඥව නැතිවේද හෙතෙම) ප්‍රකෘතිසංඥවෙන් සංඥ ඇත්තෙක්නො වේ; නවිසඤ්ඤසඤ්ඤී, විරූප සංඥවෙන් සංඥ ඇත්තෙක්ද (උම්තුවූවෙක් හෝ වික්ෂිප්ත සිත් ඇත්තෙක්ද) නොවෙයි; නොපිඅසඤ්ඤී, සංඥවිරහිතයෙක් හෝ (නිරොධසමාපත්තියට පිළිපන්නෙක් හෝ) අසඤ්ඤසත්ත බඹලොවවැසියෙක් හෝ නොවෙයි; නවිභූතසඤ්ඤී, (සබ්බසො රූපසඤ්ඤානං) යනාදී වශයෙන් ඉක්මවනලද රූපසඤ්ඤා ඇත්තෙක්ද (අරූපධ්‍යාන ලාභියෙක්ද) නොවෙයි; එවංසමෙතස්ස, මේ සංඥ අසඤ්ඤිතාදී භාවයෙහි නොසිට සො එවංසමාහිතෙ චිත්තෙ-පෙ-ආකාසානඤ්චායතන සමාපත්ති පටිලාභත්ථාය චිත්තං අභිනීහරතීති, යනාදී ක්‍රමයෙන් අරූපමාර්ගයෙන් සමන්විතවූවාහට; රූපං,

14. යන්තං අපුච්ඡිම්හ අකිත්තයී නො
අඤ්ඤං තං පුච්ඡාම තදිඞ්ඝ බ්‍රෑහි
එත්තාවතග්ගං නො වදන්ති හෙකෙ
යක්ඛස්ස සුද්ධිං ඉධ පණ්ඩිතාසෙ
උදාහු අඤ්ඤම්පි වදන්ති එත්තො

---

රූපය පිළිබඳ සංඥාව; විභොති, නොවෙයි; පහවේ, හි එලෙස පිළිපන්නාහටත්; පපඤ්චසඞ්ඛා, තෘෂ්ණා දෘෂ්ටි ප්‍රපඤ්චයෝ; සඤ්ඤනිදානා, රූපසංඥාව මූලකාරණය කොට ඇත්තාහුය.

යම්සේ පිළිපන්නකුට රූපසංඥාව නැතිවේද හෙතෙම ප්‍රකෘතිසංඥාවෙන් සංඥාඇත්තෙක්ද නොවේ; විරූපසංඥාවෙන සංඥාඇත්තෙක්ද උමතුවූවෙක් හෝ වික්ෂිප්තසිත් ඇත්තෙක්ද නොවෙයි, සංඥාවිරහිතයෙක් හෝ නිරොධසමාපත්තියට පිළිපන්නෙක් හෝ අසඤ්ඤසත්ත බඹලොවවැසියෙක් නොවෙයි, (සබ්බසො රූපසඤ්ඤානං) යනාදී වශයෙන් ඉක්මවනලද රූප සංඥා ඇත්තෙක්ද අරූපධ්‍යානලාභියෙක්ද නොවෙයි, මේ සංඥා අසංඥිතාදී භාවයෙහි නොසිට සො එවං සමාහිතෙ චිත්තෙ-පෙ- ආනඤ්ජප්පත්තෙ ආකාසානඤ්චායතන සමාපත්ති පටිලාභත්ථාය චිත්තං අභිනීහරතීති- යනාදීක්‍රමයෙන් අරූපමාර්ගයෙන් සමන්විතවූවාහට රූපය පිළිබඳ සංඥාව නොවෙයි, හෙවත් පහවෙයි, එලෙස පිළිපන්නාහටත් යම් සංඥාවක් වන්නිද, එය මූලකාරණය කොට ඇති තෘෂ්ණාදෘෂ්ටි ප්‍රපඤ්චයෝ ප්‍රහීණ නොවූවෝම වෙති, මේ ගාථාවෙන් අරූපාවචර සමාපත්තියට සම්වැදීමෙන් රූපසංඥාවගේ දුරුකිරීම වදාළසේක.

14. යංතං, ඒ යමක්; අපුච්ඡිම්හ, විචාළෙමුද; නො, අපට; අකිත්තයී, එය ප්‍රකාශකළසේක; තං, ඔබවහන්සේඅතින්; අඤ්ඤං, අනික්කාරණයක්; පුච්ඡාම, විචාරමු; තං, එකරුණ; ඉඞ්ඝ බ්‍රෑහි, වදාළමැනවී; ඉධ, මේ ලොකයෙහි; එකෙපණ්ඩිතාසෙ, ඇතැම් පණ්ඩිත මහණබමුණෝ; එත්තාවතා, මේ අරූප සමාපත්තිය පමණෙකින්; යක්ඛස්ස, සත්වයාගේ; අග්ගංසුද්ධිං, අග්‍රවූශුද්ධිය; නොවදන්ති, නොකියද්ද; උදාහු, නොහොත්; එත්තො, මේ අරූප සමාපත්තියෙන් මත්තෙහිදු; අඤ්ඤම්පි, අනිකකුත්; වදන්ති, කියද්ද.

ඒ යමක් ඔබවහන්සේ විචාළෙමුද අපට එය ප්‍රකාශකළසේක, ඔබවහන්සේඅතින් අනික්කාරණයක්ද විචාරම්හ, එයද වදාළහොත් යෙහෙකි, මේ ලොකයෙහි ඇතැම් පණ්ඩිතමහණ

15. එතාවතග්ගම්පි වදන්ති හෙකෙ
යක්ඛස්සසුද්ධිං ඉධපණ්ඩිතාසෙ
තෙසංපනෙකෙසමයංවදන්ති
අනුපාදිසෙසෙ කුසලාවදානා.

16, එතෙච ඤත්වා උපනිස්සිතාති
ඤත්වාමුනී නිස්සයෙසොවිමංසී
ඤත්වා විමුත්තො න විවාදමෙති
භවාභවායනසමෙතී ධීරොති.

---

බමුණෝ මෙ අරූපසමාපත්තිය පමණකින් සත්ත්වයාගේ ශුද්ධිය නොකියද්ද නොහොත් මේ අරූපසමාපත්තියෙන් මත් තෙහිත් සත්ත්වයාගේ අග්‍රශුද්ධිය පිණිස අන්තරූණකුත් කියද්ද, මේ ගාථාවෙන් අරූපසමාපත්තියෙන් මත්තෙහිත් 'සත්ත්වයාගේ ශුද්ධිය පිණිස යමක් ඇද්දැයි නිර්මිත බුදුන්විසින් විචාරණලදී.

15. ඉධ, මේලොකයෙහි; එකෙපණ්ඩිතාසෙ; ශාස්වතවාදී පණ්ඩිත මානී ඇතැම් මහණබමුණෝ; එතාවතාපි, මෙතෙකිනුත්; යක්ඛස්ස, සත්ත්වයාගේ; අග්ගංසුද්ධිං, අග්‍රවූශුද්ධිය; වදන්ති කියත්; තෙසං පන, ඒ පණ්ඩිතමානී මහණබමුණන් අතුරෙන් වනාහි; එකෙ, උච්ඡේදවාදී, ඇතැම් පණ්ඩිතමානී ශ්‍රමණබ්‍රාහමණයෝ; සමයං, උච්ඡේදවාදය; වදන්ති, සත්ත්වයාගේ අග්‍රශුද්ධියයයි කියත්; අනුපාදිසෙසෙ, අනුපාදා පරිනිර්වාණයෙහි; කුසලා, දක්ෂවූ; වදනා, වාදඇති බුද්ධාදීහු; (අනුපාදා පරිනිර්වාණයම සත්ත්වයාගේ අග්‍රශුද්ධියයයි කියත්.)

මේ ලෝකයෙහි ශාස්වතවාදී පණ්ඩිතමානී ඇතැම් මහණ බමුණෝ මෙතෙකිනුත් සත්ත්වයාගේ අග්‍රවූශුද්ධියකියත්, ඒ පණ්ඩිතමානී මහණබමුණන් අතුරෙන් උච්ඡේදවාදී ඇතැම් පණ්ඩිතමානී මහණබමුණෝද උච්ඡේදවාදය සත්ත්වයාගේ අග්‍රශුද්ධිය යයි කියත්, අනුපාදාපරිනිර්වාණ වාදයෙහි දක්ෂවූ බුද්ධාදීහු අනුපාදාපරිනිර්වාණයම සත්ත්වයාගේ අග්‍රවූ ශුද්ධිය යයි කියත්, මේ ගාථාවෙන් සර්වඥයන්වහන්සේ ශාස්වතවාදීහු අරූපසමාපත්තියෙන්ද උච්ඡේදවාදීහු උච්ඡේදවාදයෙන්ද බුද්ධාදීහු අනුපාදා පරිනිර්වාණයෙන්ද සත්ත්වයාගේ අග්‍රශුද්ධිය කියත්යයි නිර්මිත බුදුනට වදාළසේක.

16. එතෙ, මේ දෘෂ්ටිගතිකපුද්ගලයෝ; උපනිස්සිතාඉති, (ශාස්වතඋච්ඡේද දෘෂ්ටින්) ඇසුරුකළෝයයි; ඤත්වා, දැන; නිස්සයෙච, තෘෂ්ණාදෘෂ්ටිනිශ්‍රයන්ද; ඤත්වා, දැන; විමංසී, පණ්ඩිතවූ;

නොවූනී, ඒ මුනිතෙමේ; සඞ්ඛා, (සැපදුක්ඛාදි ධර්මයන් අනිත්‍යාදිවශයෙන්)දැන; විමුත්තො, කුදුමහත්භවයෙන් මිදුනේ; විවාදං, විවාදයකට; නඑති, නොයෙයි; ධීරො, ඒ පණ්ඩිත තෙමේ; භවාභවාය, නැවත නැවත උපත්තියට; නසමෙති, නොයන්නේයයි වදාළසේක.

මේ දෘෂ්ටිගතිකයෝ ශාස්වතඋච්ඡේද දෘෂ්ටින් ඇසුරුකළෝයයි දැන දෘෂ්ටිනිශ්‍රයන්ද දැන පණ්ඩිතවූ ඒ මුනිතෙම සුඛ දුඃඛාදි ධර්මයන් අනිත්‍යාදිවශයෙන්දැන කුදු මහත් භවයෙන් මිදුනේ විවාදයකට නොඑයි, ඒ පණ්ඩිතතෙමේ නැවත නැවත උත්පත්තියට නොඑන්නේයයි වදාළසේක, මේ ගාථාවෙන් ශාස්වතඋච්ඡේදවාදීන් තෘෂ්ණාදෘෂ්ටීන් ආශ්‍රයකරන්නන්බව දැන නුවණැති ආර්‍ය්‍යශ්‍රාවකතෙමේ සුඛදුඃඛාදි ධර්මයන් අනිත්‍යාදි වශයෙන් දැන තෘෂ්ණාදෘෂ්ටියෙන් මිදුනෙක්ව විවාදයකට නොපැමිණෙන්නේයයිද නැවත නැවත උත්පත්තියකට නොපැමිණෙන්නේයයිද නිර්මිත බුදුන්ට වදාළසේක. මේ සූත්‍රදෙශනාවනේ කෙළවරෙහිද කෙළලක්‍ෂයක් දෙවියෝ රහත්වූහ, සෝවාන් ආදී මාර්ගඵලවලට පැමිණියවුන්ගේ සඞ්ඛ්‍යාවක්නැත.

කලහවිවාද සූත්‍ර ව්‍යාඛ්‍යානය සමාප්තයි.

# මොහචරිත දෙවියන් සඳහා වදාළ චූලබ්‍යූහසූත්‍රය.

---

**නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස.**

---

1. සකංසකං දිට්ඨිපරිබ්බසා නා
විග්ගය්හනානා කුසලාවදන්ති
යොඑවංජානාතිස වෙදි ධම්මං
ඉදංපටික්කොසමකෙවලීසො

2. එවම්පිවිග්ගය්හ විවාදියන්ති
බාලොපරොඅකුසලොතිවාහු
සච්චොනුවාදො කතමොඉමෙසං
සබ්බෙවහීමෙකුසලාවදානා

---

1. සකංසකං, සවකීය සවකීයවූ; දිට්ඨිපරිබ්බසානා, දෘෂ්ටි යෙහි ගැළිවසන්නාහු; විග්ගය්හ,(ඒ ලබ්ධිය, බලවත්කොටගෙණ; කුසලා, එහි දක්‍ෂයෝ වමුයි හඳුන්වමින්; නානා, බොහෝ බොහෝකොට; වදන්ති, කියත්; යො, යමෙක්; එවං, මෙලෙස ජානාති,ඒ දෘෂ්ටිපිළිවෙත් මගදනීද; සො, හෙතෙම; ධම්මං, ධර්මය; වෙදී, දන්නා සුල්ලෙක්වෙයි; ඉදං, මේ දෘෂ්ටිප්‍රතිපදා මාර්ගයට; පටික්කොසං, ප්‍රත්‍යාක්‍රොශ කරන්නාවූ; සො, ඒ පුහුල්තෙමේ; අකෙවලී,හීනයෙක් වන්නේය.

තමතමන් පිළිබඳවූ ලබ්ධියෙහි ගැලීවසන්නාහු ඒ ලබ්ධිය බලවත් කොටගෙණ ඒ ලබ්ධියෙහි දක්‍ෂයෝ වම්හයි හඳුන්ව වමින් බොහෝකොට කියත් යමෙක් මෙලෙස ඒ දෘෂ්ටි පිළි වෙත්මගදනීද හෙතෙම ධර්මය දන්නා සුල්ලෙක් වෙයි. මේ දෘෂ්ටිප්‍රතිපදාමාර්ගයට ආක්‍රොශ කරන්නාවූ ඒ පුහුල්තෙමේ හීන යෙක් වන්නේය.

2. එවම්පි, මෙසේත්; විග්ගය්හ, ලබ්ධිය දැඩිකොටගෙණ; විවාදියන්ති, විශෙෂයෙන් වාදකෙරෙති; පරො, සායනයෙන් පිටත්හිවූ වාදකාරකතෙමේ; බාලො, හීනයෙක් යයිද; අකුස ලො ඉතිච, අපණ්ඩිතයෙක්යයිද; ආහු, කියත්; ඉමෙසං, මේ වාද අතුරෙන්; සච්චො, සත්‍යවූ; වාදො, වාදය; කතමො, කව රක්ද; සබ්බෙ එවඉමෙ,සියලුම මේ වාදකාරයෝ; කුසලා, ස්වකීය ස්වකීයවාදයෙහි දක්‍ෂයෝමය; වදානා, ලබ්ධි පිහිටවීමෙන් වාද කරන්නෝමය.

3. පරස්සචෙධම්ම මනානුජානං
බාලොමගොහොතිනිහීනපඤ්ඤො
සබ්බෙවබාලාසුනිහීනපඤ්ඤා
සබ්බෙවිමෙදිට්ඨිපරිබ්බසානා

4. සන්දිට්ඨියාචෙපනවොදාතා
සංසුද්ධපඤ්ඤාකුසලාමුතීමා
නතෙසංකොචිපරිහීනපඤ්ඤො
දිට්ඨීහිතෙසම්පිතථාසමත්තා

---

මෙසේත් ලබ්ධිදෘෂ්ටිකොටගෙණ විශෙෂයෙන් වාදකෙරෙති ශාස්ත්‍රයෙන් පිටත්හිවූ වාදකාරක තෙමේ ගුණයෙන් හීනයෙක් යයිද අපණ්ඩිතයෙක්යයිද කියත් මේවාද අතුරෙන් සත්‍යවූ වාදය කවරක්ද සියලුම මේ වාදකාරයෝ ස්වකීය ස්වකීයවාද යන්හි දක්ෂයෝමය ලබ්ධි පිහිටවීමෙන් වාදකෙරෙත්මය. මේ ගාථාවයෙන් නිර්මිතබුද්ධන් විසින් අසනලද ප්‍රශ්නයන්ට සර්වඥයන්වහන්සේ (පරස්සචෙ;) යනාදී ගාථාත්‍රයකින් පිළිතුරු දීවදාළසේක.

3. චෙ, ඉදින්; පරස්සධම්මං, මෙරමාලබ්ධිය; මනානුජානං, මෙනෙහිකරන්නේ; බාලො, බාලයෙක්වෙයි; මගො, මෘගයෙක්වෙයි; නිහීනපඤ්ඤො, හීනප්‍රඥ ඇත්තෙක් වෙයි; සුනිහීනපඤ්ඤා, අතිශයින් හීනප්‍රඥ ඇත්තාවූ; සබ්බෙව බාලා, සියල්ලෝම හීනයෝය;ඉමෙසබ්බෙව, මේ සියලුම බාලයෝ; දිට්ඨිපරිබ්බසානා, ස්වකීය ස්වකීය ලබ්ධියෙහි බැසගෙණවාසය කරන්නෝය.

ඉදින් අනුන්ගේ ලබ්ධිය මෙනෙහි කරණ තැනැත්තා හීනයෙක් වෙයි. මෘගයෙක්වෙයි. අතිශයින් ලාමක ප්‍රඥ ඇත්තෙක්වෙයි, අතිශයින් හීන ප්‍රඥඇත්තාවූ සියල්ලෝම ලාමකයෝය. මේ සියලුමහීනයෝ තම්තමන්ගේ ලබ්ධියම බැසගෙණ වාසයකරන්නෝය.

4. සන්දිට්ඨියාපන, ස්වකීය දෘෂ්ටියෙන් වනාහි; වොදාතාචෙ, ඉදින් පිරිසිදුවූවෝ වෙත්නම්; සංසුද්ධපඤ්ඤා, අතිශයින් පිරිසිදු පැණැත්තෝවෙත්නම්; කුසලා, දක්ෂයෝවෙත්නම්; මුතිමා නුවණැත්තෝ වෙත්නම්; තෙසං, ඔවුන් අතුරෙන්; කොචි, කිසිවෙක්; පරිහීනපඤ්ඤො, පිරිහුණුනුවණ ඇත්තෙක්; න, නොවන්නේය; (කුමක් නිසාදයත්) තෙසං අපි, ඔවුන් විසින්ද; දිට්ඨිහි, ස්වකීයදෘෂ්ටියවනාහී; තථාසමත්තා, අන්‍යයන් විසින් යම්සේ සමාදන්වනලද්දීද එසේ සමාදන්වන ලදබැව්නි.

5. නවාහමෙතං තථියන්තිබ්‍රෑමි
යමාහුබාලා මිථුඅඤ්ඤමඤ්ඤං
සකං සකංදිට්ඨිමකංසුසච්චං
තස්මාහිබාලොතිපරංදහන්ති,

6. යමාහුසච්චංතථියන්තිඑකෙ
තමාහු අඤ්ඤෙතුච්ඡංමුසාති
එවම්පිවිග්ගය්හවිවාදියන්ති
කස්මාන එකං සමණාවදන්ති

---

ස්වකීය ලබ්ධියෙන් වනාහි ඉදින් පිරිසිදුවූවෝවෙත්නම් අතිශයින් පිරිසිදු පැණැත්තෝ වෙත්නම් දක්ෂයෝ වෙත්නම් නුවණැත්තෝවෙත්නම් ඔවුන් අතුරෙන් එකෙකුදු පිරිහුණු නුවණැත්තෙක් නොවන්නේය. කුමක්හෙයින්ද යත් අන්‍ය යන් විසින් තමතමන්ගේ ලබ්ධිය යම්සේ සමාදන්වනලද්දීද ඔවුන් විසිනුත් තමතමන්ගේ ලබ්ධිය එසේම සමාදන්වන ලද බැවිනි. යම්කෙනෙක් තමතමන්ගේ ලබ්ධිසත්‍යවෙත් අන්‍යයන්ගේ ලබ්ධිහිස්වෙත්යයි වාදනොකොළත් ඔවුන් දෘෂ්ටි සමාදානයෙන් අනුන් හා සමබැවින් පිරිසිදුවූවෝ නොවෙත්යයි වදාළසේක.

5. අහං, මම; එතං, දෘෂ්ටිගතිකයන්ගේ ඒ කීම; තථියං ඉති, සත්‍යයයි; නවබ්‍රෑමි, නොකියමි; කුමක්නිසාද යත්, බාලා අඥයෝ; අඤ්ඤමඤ්ඤං, ඔවුනොවුන්; මිථු. දෙදෙනෙක් දෙදෙනෙක්ව; යං, යම්හෙයකින්; සකං සකං දිට්ඨිං, ස්වකීය ස්වකීය ලබ්ධිය; සච්චං අකංසු, මෙයම සත්‍යයයි. සෙස්සහිස්යයි ප්‍රකාශ කළාහුද; තස්මාහි, එහෙයින්වනාහි; පරං, වාදකාරණ අන්‍යයා; බාලොති, අඥයායයි; දහන්ති, අදහත්.

මම දෘෂ්ටිගතිකයන්ගේ ඒ කීම ඇත්තයයි නොකියමි කුමක් හෙයින්ද යත් අඥනයෝ ඔවුනොවුන් දෙදෙනෙක් දෙදෙනෙක්ව යම් හෙයකින් ස්වකීය ස්වකීය ලබ්ධියමෙයම සත්‍යයයි සෙස්ස හිස්යයි ප්‍රකාශකළාහුද එහෙයින් වනාහි වාදකාරණ අන්‍යයා අඥානයායයි පණ්ඩිතයෝ අදහත්මය.

6. එකෙ, ඇතැම් මහණබමුණෝ; යංසච්චං, යම් දෘෂ්ටි සත්‍යයක්; තථියං ඉති, ඇත්තයයි; ආහු, කීවෝද; තං, ඒ දෘෂ්ටි මාර්ගීය; අඤ්ඤෙ, අනික් මහණ බමුණෝ; තුච්ඡං, හිස්වූ; මුසා

7. එකංහි සච්චං නදුතිය මත්ථි
යස්මිං පජානො විවදෙ පජානං
නානා තෙ සච්චානි සයං ථුනන්ති
තස්මා න එකං සමණා වදන්ති

8. කස්මා නු සච්චානි වදන්ති නානා
පවාදියාසෙ කුසලා වදානා
සච්චානි සුතානි බහූනි නානා
උදාහු තෙ තක්ක මනුස්සරන්ති

---

ඉති, බොරුවකැයි; ආහු, කියත්; එවං අපි, මෙසේද; විග්ගය්හ, දෘෂ්ටිපරාමර්ශයෙන් දැඩිකොටගෙණ; විවාදියන්ති, විවාදකෙරෙත්; කස්මා, කුමක්හෙයින්; සමණා, ශ්‍රමණයෝ; එකං, ඇත්තවූ; එකක් නවදන්ති, නොකියද්ද;

ඇතැම් මහණ බමුණෝ යම් දෘෂ්ටිසත්‍යමාර්ගයක් ඇත්තයයි කිහුද ඒ දෘෂ්ටිසත්‍යමාර්ගය අනික් මහණ බමුණෝ හිස්වූ බොරුවකැයි කියත් මෙසේම දෘෂ්ටිමාර්ගපරාමර්ශයෙන් දැඩිකොටගෙණ වාදකෙරෙති කුමක්හෙයින් ශ්‍රමණයෝ සත්‍යවූ එකක් නොකියද්දැයි පිළිවිසිසේක

7. එකංහි, (නිරොධය හෝ මාර්ගය හෝ) එකක්ම; සච්චං, සත්‍යවන්නේය; දුතියං, දෙවැනිවූ සත්‍යයක්; නඅත්ථි, නොමැත්තේය; යස්මිං, යම්සත්‍යයක්, පජානං, දනිමින්; පජා, ප්‍රජාතොමෝ; නොවිවදෙ, වාදනොකරන්නේය; තෙ, ඒ මිථ්‍යාලබ්ධික මහණ බමුණෝ; නානාසච්චානි, නොයෙක් සත්‍යයන්; සයං, තමා පිළිබඳව; ථුනන්ති, කියත්; තස්මා, ඒහෙතුවෙන්; සමණා, මිථ්‍යාවාදී ශ්‍රමණයෝ; එකං, එකම සත්‍යයක්; නවදන්ති නොකියත්;

නිරොධයහෝ මාර්ගය හෝ එකක්ම සත්‍යයවන්නේය දෙවෙනිවූසත්‍යයක් නැත. යම් සත්‍යයක් දනිමින් ප්‍රජාතොමෝ විවාද නොකරන්නේය, ඒ මිථ්‍යාලබ්ධික මහණහු නොයෙක් සත්‍යයන් තමතමන් පිළිබඳව කියත්. ඒ හෙතුවෙන් මිථ්‍යාවාදී ශ්‍රමණයෝ එකම සත්‍යයක් නොකියත්යයි පිළිතුරු දුන්සේක.

8. පාවාදියාසෙ ප්‍රකාරයෙන් වාදකරන්නාවූ; කුසලා (මිථ්‍යාවාදයන්හි) දක්ෂවූ; වදනා සියලබ්ධියම්ගෙණ කාරුණු කියන්නාවූ; (මිථ්‍යාවාදී ශ්‍රමණයෝ) නානාසච්චානි නොයෙක් සත්‍යයන්; කස්මානු කුමක්හෙයින්; වදන්ති කියද්ද; නානා,

9. නහෙවසච්චානි බහූනිනානා
අඤ්ඤත්‍රසඤ්ඤාය නිච්චානිලොකෙ
තක්කඤ්චදිට්ඨීසුපකප්පයිත්වා
සච්චංමුසාතිද්වයධම්මමාහු

10. දිට්ඨෙසුතෙසීලවතෙමුතෙවා
එතෙචනිස්සායවිමානදස්සී
විනිච්ඡයෙඨත්වා පහස්සමානො
බාලොපරොඅකුසලොතිචාහ.

---

නානාප්‍රකාරවූ; බහූනි, බොහෝවූ; සච්චානි, සත්‍යයෝ; සුතානි, ඒ ශ්‍රමණයන් විසින්, අසනලද්දාහුද; උදාහු, නොහොත්; තෙ, ඒ ශ්‍රමණයෝ; තක්කං, තමන්ගේ තර්කමාත්‍රය; අනුස්සරන්ති, අනුව යෙද්දූසි; පිළිවිසියේක.

ප්‍රකාරයෙන් වාදකරන්නාවූ මිථ්‍යාවාදයන්හි දක්‍ෂවූ තම තමන්ගේම ලබ්ධියගෙණ කරුණු කියන්නාවූ මිථ්‍යාවාදී ශ්‍රමණයෝ නොයෙක් සත්‍යයන් කුමක්නිසා කියද්ද නානාප්‍රකාරවූ බොහෝවූ සත්‍යයෝ ඒකී ශ්‍රමණයන් විසින් අසනලද්දාහුද නොහොත් ඒ ශ්‍රමණයෝ තමතමන්ගේ තර්කමාත්‍රය අනුව යද්දූයි; නිර්මිත බුදුන් විසින් පුළුවුත්නාලදී.

9. ලොකෙ, ලොකයෙහි; සඤ්ඤාය, සංඥාමාත්‍රයෙන්; නිච්චානි, නිත්‍යයයි ගන්නාලද ගැණුම්; අඤ්ඤත්‍ර, හැර; නානා, නානාප්‍රකාරවූ; බහූනි, බොහෝවූ; සච්චානි, සත්‍යයෝ; නහි එව, නැත්තාහුමය; තක්කඤ්ච, ස්වකීය මිථ්‍යා තර්කයද; දිට්ඨීසු දෘෂ්ටීන්හිලා (උපදවා); පකප්පයිත්වා, කල්පනයකොට; සච්චං, මෙය සත්‍යය; මුසාඉති, මෙය අසත්‍යය යන; ද්වයධම්මං, කරුණු දෙකක්; ආහු, කියත ;

ලොකයෙහි සංඥාමාත්‍රයෙන් නිත්‍යයයි ගන්නාලද ගැණුම් ඇර නානා ප්‍රකාරවූ බොහෝවූ සත්‍යයෝ නැත්තාහ. ස්වකීය මිථ්‍යතර්කයද දෘෂ්ටීන්හිලා උපදවා කල්පනාකොට මෙය සත්‍යය මෙය අසත්‍යයයි යන කරුණු දෙකක් කියත්. දන් මෙසේ නොයෙක් සත්‍යයන් නැතිකල්හි තර්කය පමණක් අනුස්මරණය කරන්නාවූ දෘෂ්ටිගතිකයන්ගේ විප්‍රතිපත්තිය දක්වන්නට,(දිට්ඨෙ සුතෙ,) යනාදීගාථාවන් වදාළසේක.

10. දිට්ඨෙ, දුටුකාරණයන්ද; සුතෙ, අසනලදකාරණයන්ද; සීලවතෙ, ශීලව්‍රතයන්ද; මුතෙවා, ආඝ්‍රාණාදීකාරණයන්ද යන; එතෙචනිස්සාය, මෙකී දෘෂ්ටිධර්මයන් ඇසුරුකොට; විමාන

11. යෙනෙව බාලොති පරං දහාති
තෙනාතුමානං කුසලොති චාහ
සයමත්තනා සො කුසලො වදානො
අඤ්ඤං විමානෙති තදෙව පාවා.

12. අතිසාරදිට්ඨියා සො සමත්තො
මානෙන මත්තො පරිපුණ්ණමානී
සයමෙව සාමං මනසාභිසිත්තො.
දිට්ඨී හි සා තස්ස තථා සමත්තා

---

දසසී, ශුද්ධභාවසංඛ්‍යාත අසම්මානය දක්නාසුලූවූ; පුද්ගල තෙම; විනිච්ඡයෙ, දෘෂ්ටිවිනිශ්චයෙහි; ඨත්වා, සිට; පහස්සමානො, සතුටුවූවෙක්ව; පරෙ, අන්‍යතැනැත්තෝ; බාලො හීනයෙක් යයිද; අකුසලො ඉතිච, අපණ්ඩිතයෙක්යයිද; ආහ, මෙසේ කියාමය.

දුටුකාරණයන්ද ඇසූකාරණයන්ද ශිලව්‍රතයන්ද ආඝ්‍රාණාදීතුන් කාරණයන්ද යන මෙකී කාරණයන් ඇසුරුකොට ශුද්ධභාව සංඛ්‍යාත අසම්මානය දක්නාසුලු පුද්ගලතෙමේ දෘෂ්ටිවිනිශ්චයෙහි පිහිටා හටගත් සතුටුඇත්තෙක්ව අන්තැනැත්තා හීනයෙක් යයිද අපණ්ඩිතයෙක්යයිද කියාමය.

11. යෙනඑව, යම් කරුණකින්ම; පරං, අනිකා; බාලො ඉති, හීනයායයි; දහාති, අදහාද; තෙන, ඒ හෙතුවෙන්, ආතුමානං, තමන්; කුසලොඉති, පණ්ඩිතයෙකැයිද; ආහ, කියයි; කුසලො, දක්ෂවූ; වදනො, ලබ්ධිය ගෙණකියන්නාවූ; සො, හෙතෙමේ; අත්තනා, තමන්ම; සයං, තමාට; විමානෙති, ගරහයි; අඤ්ඤං, අනිකකුට; තදෙවපාවා, ඒ වචනයම හෝ දෘෂ්ටියම කියයි.

යම්කාරණයකින් අනිකා හීනයායි අදහාද ඒ කාරණයෙන් තමන් පණ්ඩිතයෙකැයිද කියයි පණ්ඩිතවූ ලබ්ධියගෙණ කියන්නාවූ හෙතෙම තෙමේමතමහට ගරහයි. අනිකකුට ඒ වචනයම හෝ ඒ දෘෂ්ටියම කියයි.

12. සො, හෙතෙම; අතිසාරදිට්ඨියා, (සීමාදිය ඉක්මවා පවත්නා හෙයින්) අතිසාර සංඛ්‍යාත දෙසැට දෘෂ්ටියෙන්; සමත්තො, සම්පූර්ණවූයේ (ඉදිමුණේ) මානෙන, ඒ දෘෂ්ටිමානයෙන්; මත්තො, මත්වූයේ; පරිපුණ්ණමානී, මම සියල්ලෙන්ම සම්පූර්ණවූයෙමියි (මෙලෙස මානඇත්තේ;) සයංඑව, තෙමේම; සාමං, තමන්; මනසා, සිතින්; අභිසිත්තො, (මම පණ්ඩිතයෙක් වෙමියි) අභිෂෙකකරණ ලද්දෙක්වෙයි; සාදිට්ඨිහි, ඒ දෘෂ්ටිය වනාහි; තස්ස, ඔහුවිසින්; තථාසමත්තා, එසේ නිශ්චයකොට ගන්නාලදහෙයිනි.

13. පරස්සචෙහිවචසානිහීනො
තුමොසහාහොතිනිහීනපඤ්ඤො
අථචෙසයංවෙදගූහොතිධීරො
නකොචිබාලොසමණෙසුඅත්ථි.

14. අඤ්ඤංඉතොයාභිවදන්තිධම්මං
අපරද්ධාසුද්ධිමකෙවලීතෙ
එවංහි තිත්ථ්‍යාපුථුසොවදන්ති
සන්දිට්ඨිරාගෙනහිතෙභිරත්තා

---

ඒ පුද්ගලතෙමේ ඒ ලක්ෂණාදිය ඉක්මවා පවත්නා හෙයින් අතිසාරසංඛ්‍යාත දෙසැට දෘෂ්ටියෙන් සම්පූර්ණව ඉදිමුණේ ඒ දෘෂ්ටි මානයෙන් මත්වූයේ මම සියල්ලෙන්ම සම්පූර්ණවූයේමියි මෙලෙස මානඇත්තේ තෙමේම තමන්සිතින් මම පණ්ඩිතයෙක්වෙමියි අභිෂෙකකරණ ලද්දෙක්වෙයි. ඒ දෘෂ්ටිය වනාහි ඔහුවිසින් එසේ නිශ්චයකොටගත් හෙයින් එබඳු අදහසක් කරණලදී.

13. හි, ඒ ඒසේමැයි; චෙ, ඉදින්; පරස්ස, (දෘෂ්ටිවිනිශ්චයෙහි සිටි ඒ) අන්‍යයාගේ; වචසා, නින්දාවචනයෙන් කියනුලබණ හෙතෙම; නිහීනො, නිහීනයෙක් වෙයි; තුමො සහ, ඔහු හා හෙතෙමේත්; නිහීනපඤ්ඤො, හීනප්‍රඥාඇත්තෙක්; හොති, වෙයි; අථ, යලි; චෙ, ඉදින් (ඔහුගේ වචනය ප්‍රමාණනොවේ;) සයං, තෙමේම; වෙදගූ, වෙදයන්ගේ හෙවත් සියලු ධර්මයන්ගේ පරතෙරට පැමිණියෙක් වේද; ධීරො, ප්‍රාඥයෙක්වේද; (එසේකල්හි); සමණෙසු ශ්‍රමණයන් අතර, බාලො, අඥවූ; කොචි කිසිවෙක්; න අත්ථි, නොමැත.

ඒ එසේමය. ඉදින් දෘෂ්ටිනිශ්චයෙහි සිටි ඒ අන්‍යයාගේ නින්දාවචනයෙන්කියනුලබණ හෙතෙම හීනයෙක් වෙයි. හෙතෙමේත් ඒ කියන්නා සමගම හීන පැණැත්තෙක් වෙයි. නැවත ඉදින් ඔහුගේ කීම ප්‍රමාණනොවෙයි. තෙමේම වෙදයන්ගේ හෙවත් සියලුධර්මයන්ගේ පරතෙරට පැමිණියෙක් වේද. ප්‍රාඥයෙක් වේද එසේකල්හි ශ්‍රමණයන්අතුරෙහිවූ අඥවූකිසිවෙක්නොමැත්තේමය.

14. යෙ, යම් තීර්ථකයෝ; ඉතො, මෙයින්; අඤ්ඤං, අන්‍යවූ; ධම්මං, දෘෂ්ටියක්; අභිවදන්ති, කියද්ද; අපරද්ධා, ශුද්ධිමාර්ගය වරදවාගත්; අකෙවලීතෙ, සියල්ලෙන් පරිපූර්ණනොවූ; තිත්ථ්‍යා, තීර්ථකයෝ; හි, යම් හෙයකින්; එවං, මෙසේ; පුථුං, අනුගුඩිය; පුථුසො, බොහෝසෙයින්; වදන්ති, කියත්; තුමක්තිසාදයත්; හි, යම්හෙයකින්; තෙ, ඒ තීර්ථකයෝ; සන්දිට්ඨිරාගෙන, ස්වකීයදෘෂ්ටිරාගයෙන්; අභිරත්තා, විශෙෂයෙන් ඇලුනෝය;

15. ඉධෙවසුද්ධිංඉතිවාදියන්ති
නාඤ්ඤෙසුධම්මෙසුවිසුද්ධිමාහු
එවම්පිතිත්ථ්‍යාපුථුසොනිවිට්ඨා
සකායනෙතත්‍ථදළ්හංවදානා
16. සකායනෙවාපිදළ්හංවදානො
කමෙත්‍ථබාලොතිපරංදහෙය්‍ය
සයමෙවසොමෙධකංආවහෙය්‍ය
පරංවදංබාලමසුද්ධිධම්මං

---

යම් තීර්ථකයෝ මෙසින් අන්‍යවූ දෘෂ්ටියක් කියද්ද ශුද්ධි මාර්ගයවරදවාගත් සියල්ලෙන් පරිපූර්ණනොවූ ඒ තීර්ථකයෝ යම් හෙයකින් මෙසේ අශුද්ධිය බොහෝසෙයින් කියත් කුමක් නිසාද යත් යම්හෙයකින් ඒ තීර්ථකයෝ ස්වකීය දෘෂ්ටිරාගයෙන් විශේෂයෙන් ඇලුනෝය. එහෙයිනි.

15. ඉධෙව, මෙහිම; සුද්ධිංඉති, සුද්ධිය ඇතැයි; වදන්ති, ස්වකීය ලබ්ධියෙහි ඇලුනාහු කියත්; අඤ්ඤෙසු, අන්‍යවූ; ධම්මෙසු, ධර්මයන්හි; විසුද්ධිං, විශේෂශුද්ධිය; නආහු, නොකියත්; එවම්පි, මෙසේත්; සකායනෙ, ස්වකීය මාර්ගයෙහි; නිවිට්ඨා, පිවිසියාවූ; තිත්ථ්‍යා, තීර්ථකයෝ; තත්‍ථ, ඒ දෘෂ්ටිමාර්ගයෙහිලා; දළ්හං, දැඩි කොට; පුථුසො, බොහෝසෙයින්; වදනා, මෙයම ඇත්තයි සෙස්ස හිස්යයි වාදකෙරෙත්.

මෙහිම අශුද්ධිය ඇතැයි ස්වකීය ලබ්ධියෙහි ඇලුනාහු කියත් අන්‍යවූ ධර්මයන්හි විශේෂශුද්ධිය නොකියත්මෙසේම ස්වකීයමාර්ගයෙහි පිවිසියාවූ තීර්ථකයෝ ඒ දෘෂ්ටි මාර්ගයෙහිලා දැඩිකොට බොහෝසෙයින් මෙයම ඇත්තයයි සෙස්සහිස්යයි වාදකෙරෙත්.

16. සකායනෙ, සංක්‍ෂෙපවශයෙන් ශාස්වත උච්ඡෙද සඞ්ඛ්‍යාත වූද විස්තරවශයෙන් නාස්තික ඊශ්වර කාරණ නියති ආදී භෙදඇති ස්වකීය දෘෂ්ටිමාර්ගයෙහි; දළ්හං, දැඩිකොට වදනොඅපි, වාදකරන්නේම; එත්‍ථ, මේ දෘෂ්ටි මාර්ගයෙහිලා; කංපරං, කවර අනිකකු; බාලොඉති, හීනයයි; දහෙය්‍ය, කරුණු සහිතව දකින්නේද; සො එවැනි පුද්ගලතෙමේ; සයං එව, තෙමේම; පරං, අනිකාව; බාලං, හීනයා; අසුද්ධ ධම්මං, අපිරිසිදු ස්වභාව ඇත්තායයි, වදං, කියමින්; සයංඑව තෙමේම; මෙධකං, කලහ; ආවහෙය්‍ය, වඩන්නේය.

17. විනිච්ඡයෙ ඨත්වා සයං පමාය
උද්ධං සො ලොකස්මිං විවාදමෙති
හිත්වාන සබ්බානි විනිච්ඡයානි
න මෙධගං කුරුතෙ ජන්තු ලොකෙ.

---

සංක්ෂෙපවශයෙන් ශාස්වත උච්ඡෙද සඞ්ඛ්‍යාත වූද විස්තර වශයෙන් නාස්තික- ඊශ්වර- කාරණ- නියති ආදී භෙදඇති ස්වකීය දෘෂ්ටිමාර්ගයෙහිලා වාදකරන්නෝම මෙම දෘෂ්ටිමාර්ගයෙහි ලා කවර අනිකෙක් හීනයායයි කරුණු සහිතව දක්නන්නේද එවැනි පුද්ගලයෙතෙම අනිකාව හීනයායයි අපිරිසිදු ස්වභාව ඇත්තායයි කියමින් තෙමේම කලහවඩන්නේය කුමක් හෙයින්ද යත් ඔහුගේමතයේ හැටියට සියල් ලෝම පණ්ඩිතයෝ වෙත්. නොපිළිවෙතට පිළිපන්නෝවෙත්. එහෙයිනි.

17. සො, එබඳු පුද්ගලතෙම; ලොකස්මිං, ලොකයෙහි; විනිච්ඡයෙ, දෘෂ්ටියෙහි; ඨත්වා, සිට; සයංපමාය, ශාස්තෲවරුදීන් තමාට උපමාකිරීමෙන්; උද්ධං, මත්තෙහි; විවාදං, බොහෝසෙයින් වාදයට; එති, එයි; ලොකෙ, ලොකයෙහි; ජන්තු, සත්ත්වතෙම; සබ්බානි විනිච්ඡයානි, සියලුම තෘෂ්ණාදෘෂ්ටිවිනිශ්චයන්; හිත්වාන, හැර; මෙධගං, කලහය; න කුරුතෙ, නොකරේයයි වදලේය.

එබඳුපුද්ගලතෙමේ ලොකයෙහි ලබ්ධියේසිටශාස්තෲවරුදීන් තමාටඋපමාකිරිමෙන් මත්තෙහි බොහෝසෙයින් විවාදයට පැමිණෙයිලොකයෙහි සත්ත්වතෙම සියලුම තෘෂ්ණාදෘෂ්ටිවිනිශ්චයන් හැරකලහය නොකෙරේයයි නිර්මිත බුදුන්ට පිළිතුරු වශයෙන් වදලසේක, මෙසේ රහත් කුළුගන්වමින් මේ චූලව්‍යූහ සූත්‍රය නිමවා වදාළකල්හි කොටිලක්ෂයක් දෙවියෝ රහත්වූහ. ඉතිරි මාර්ගත්‍රයට පැමිණි දෙවියෝ සඞ්ඛ්‍යාරහිතවූහ.

චූලව්‍යූහසූත්‍රව්‍යාඛ්‍යානය සමාප්තයි.

# විනක්චරිත දෙවියන් සඳහා වදල
# මහාව්‍යූහ සූත්‍රය.

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.

1. යෙකෙචිමෙ දිට්ඨී පරිබ්බසානා
ඉදමෙව සච්චන්ති විවාදියන්ති
සබ්බෙපිතෙ නින්දමන්වානයන්ති
අථොපසංසම්පි ලභන්ති තත්‍ථ.

2. අප්පංහි එතං නඅලං සමාය
දුවෙවිවාදස්ස ඵලානි බෲමි
එවම්පි දිස්වා න විවාදයෙථ
ඛෙමාභි පස්සං අවිවාද භූමිං.

1. දිට්ඨිපරිබ්බසානා, (ස්වකීය ස්වකීය ලබ්ධියෙහි) ගැලී වාසයකරන්නාවූ; යෙකෙචි ඉමෙ, යම්කිසි මේ තීර්ථකයෝ; ඉදං එව, මේ අපගේ ලබ්ධියම; සච්චංඉති, සත්‍යයයි; විවාදියන්ති, විශේෂයෙන් වාදකෙරෙද්ද; තෙසබ්බෙව, ඒ සියලු දෘෂ්ටිගතිකයෝම; නින්දං, නින්දාව; අන්වානයන්ති, නැවත නැවත තමන් වෙතට පමුණුවද්ද; අථො, නොහොත්; තත්‍ථ, ඒ විවාදයෙහිලා; පසංසම්පි, කිසිකලෙක්හි ප්‍රශංසාවද, ලභන්ති, ලබද්දැයි; (පුළුවුත් යේක.)

තම්තමන් පිළිබඳ දෘෂ්ටියෙහි නිමග්නව වාසයකරන්නාවූ යම් මේ දෘෂ්ටිගතිකයෝ මේ අපගේ ලබ්ධියම සැබෑයයි ප්‍රකාශ කෙරෙමින් විශේෂයෙන් වාදකෙරෙද්ද ඒ සියලුම දෘෂ්ටිගතිකයෝ නින්දාව නැවත නැවත තමන්වෙත පමුණුවද්ද නොහොත් ඒ විවාදයෙහිලා ප්‍රශංසාවක් ලබද්දැයි නිමිත බුදුන් විසින් විචාරණලදී.

2. එතං, මේ ප්‍රශංසා සඞ්ඛ්‍යාත වාදඵලය; අප්පංහි, ඉතා ස්වල්පවන්නේමය; සමාය, (රාගද්වෙෂාදීන්ගේ) ව්‍යපශමය පිණිස; නඅලං, සමර්ථ නොවන්නේය; විවාදස්ස, විවාදයාගේ; දුවෙඵලානි, (නින්දා ප්‍රශංසා හෝ ජය පරාජයාදිය හෝ යන) ඵලයන් දෙදෙනෙක් බෲමි, (මම) කියමි; එවංඅපි, මෙසේත්; දිස්වා, (විවාදඵල

3. යාකාචිමා සම්මුතියො පුථුජ්ජා
සබ්බාව එතා න උපෙති විද්වා
අනූපයො සො උපයං කිමෙය්‍ය
දිට්ඨෙ සුතෙ ඛන්ති මකුබ්බමානො.

4. සීලුත්තමා සඤ්ඤමෙනාහු සුද්ධිං
වතං සමාදාය උපට්ඨිතාසෙ
ඉධෙව සික්ඛෙම අථස්ස සුද්ධිං
භවූපනීතා කුසලාවදානා.

---

යෙහි විපාක) දැක; අවිවාදභූමිං, විවාදභූමියක් නොවන නිර්වාණය; ඛෙමං, නිර්භයයයි; අභිපස්සං, මොනවට බලමින්; නවිවාදියෙථ, විවාද නොකරන්නේය.

මේ ප්‍රශංසා සඞ්ඛ්‍යාත විවාදඵලය ඉතා සවල්ප වන්නේය විශෙෂවාදයාගේ නින්දා ප්‍රශංසා හෝ ජය පරාජයාදිය හෝ යන ඵලයන් දෙදෙනෙක් මම කියමි. මෙසේත් විවාදඵලයෙහි ආදීනවය දැක විවාදභූමියක් නොවන නිර්වාණය නිර්භයයයි මොනවට බලමින් විවාද නොකරන්නේය.

3. පුථුජ්ජා, පෘථග්ජනයන්ගෙන් උපන්නාවූ; යාකාචි, යම් කිසි; ඉමාසම්මුතියො, මේ දෘෂ්ටීහු වෙද්ද; සබ්බාවඑතා, එකී සියලුම දෘෂ්ටීන්ට, විද්වා, පණ්ඩිතතෙම; නඋපෙති, නොපැමිණෙයි; දිට්ඨෙ, දෘෂ්ටිශුද්ධියෙහිද; සුතෙ, ශ්‍රැතශුද්ධියෙහිද; ඛන්තිං, ප්‍රෙමය; අකුබ්බමානො, නොකරන්නාවූ; අනූපයො, රූපාදී පස්කම්රස රහිතවූ; සො, හෙතෙම; උපයං, (කරුපැමිණිය යුතුය යන අර්ථයෙන්) උපය නම්වූ රූපාදීන් අතුරෙන් එකම ධර්මයකටත්; කිංඑය්‍ය, කිම පැමිණෙන්නේද; (නොපැමිණෙන්නේ මැයි.)

පුහුදුන් කෙරෙන් උපන්නාවූ; යම්කිසි මේ දෘෂ්ටීහු වෙද්ද මෙකී සියලු දෘෂ්ටීන්ට පණ්ඩිතතෙම නොපැමිණෙයි; දෘෂ්ටිශුද්ධීන්හිද ප්‍රෙමය නොකරන්නාවූ රූපාදී පස්කම්රස රහිතවූ හෙතෙමකරු පැමිණියයුතුය යන අර්ථයෙන් උපයනම්වූ රූපාදීන් අතුරෙන් එකම ධර්මයකටවත් කිමපැමිණෙන්නේද, නොපැමිණෙන්නේමය.

4. සීලුත්තමා, සීලයම උතුම්කොට සලකන (ඇතැම් භවත්හු; සඤ්ඤමෙන, සංයම මාත්‍රයෙන්; (සුද්ධිං, සත්වයාගේ) ශුද්ධිය; ආහු, කියත්; වතං, හස්තිව්‍රතාදිය; සමාදාය, සමාදන්ව; උපට්ඨි

5. සචෙ චුතො සීලවතතො හොති
සවෙධතී කම්මං විරාධ යිත්වා
සජ්ජප්පතී පත්ථයතීධ සුද්ධිං
සත්ථාව හීනො පවසං ඝරම්හා.

6. සීලබ්බතංවාපි පහාය සබ්බං
කම්මඤ්ච සාවජ්ජා නවජ්ජමෙතං
සුද්ධිං අසුද්ධින්ති අපත්ථයානො
විරතො චරෙ සන්තිමනුග්ගහාය.

---

තාසෙ, දෘෂ්ටිග්‍රහණයෙහි ගැලීසිටියාහු; අථ, යලි; අසසුද්ධිං, මේ අපගේ ශාස්තෘහුගේ ශුද්ධියයයි; ඉධඑව, මේ දෘෂ්ටියෙහිම; සිකෙකම, හික්මෙමුයි; භවූපනීතා, භවයට බැසගත්තාමවූ; කුසලාවදනා, අපි දක්‍ෂයෝවමුයි මෙසේ වාද ඇත්තාහු කියත්.

සීලය උතුම්කොට සලකන ඇතැම් පින්වත්හු කායසංයමාදියෙන් සත්වයාගේ ශුද්ධියවේයයි කියත්, කසතී ගොආදී ව්‍රත සමාදන්ව දෘෂ්ටිග්‍රහණයෙහි නිමග්නව සිටියාහු මේ දෘෂ්ටියෙහිම ලා මේ සත්වයාගේ ශුද්ධියවන්නේය එහෙයින් මෙහිම හික්මෙමුයි භවයට බැසගත්තාවූවෝම අපි දක්‍ෂයෝවමුයි මෙසේ වාද ඇත්තාහු කියත්.

5 චෙ, ඉදින්; සීලවතතො, සීලයෙන් හා වතින්; චුතොහොති, ගිලිහුණේවේද; සො, හෙතෙම; කම්මං, (ඒ ශීලව්‍රතාදී) කර්මය හෝ පුණ්‍යාභිසංස්කාර කර්මය හෝ; විරාධයිත්වා, වරදවා; (හෙවත් නසා) වෙධති, කම්පාවෙයි; සො, හෙතෙම; ඉධ, මේ ශීලව්‍රතය නිමිත්තකරගෙණ; ජප්පති, විපිළිසරකියයි; පත්ථයති, පතයි; කුමක්මෙන්දයත්, ඝරම්හා, ගෘහයෙන් පිටත්වයන් සොක් තෙම; පවසං, ගැලක් සමග යනුයේ; සත්ථා, ඒ ගැලෙන්; අවහීනො, පසුවූයේ (යම්සේ ඒ නික්මගිය ගෘහය හෝ ඉදිරිවූ සාර්ථය ප්‍රාර්ථනාකරන්නේද එමෙනි.)

ඉදින් ශීලව්‍රතයෙන් ගිලිහුණේවේද හෙතෙම ඒ ශීලව්‍රතාදී කර්මය හෝ පුණ්‍යාභිසංස්කාරාදී කර්මය වරදවා නොහොත් නසා කම්පාවෙයි; හෙතෙම මේ ශීලව්‍රතය කාරණකොටගෙණ විපිළිසරකියයි. ඒ පිරිහීගිය ශීලව්‍රතයත් ප්‍රාර්ථනාකරයි, කුමක්මෙන්දයත්, ගෘහයෙන් පිටත්ව යන්නෙක්තෙම සාර්ථයක් පසු පසු යන්නේ ඒ සාර්ථයෙන පසුවූයේ යම්සේ ඒ නික්මගිය ගෙය හෝ ඉදිරිවූ සාර්ථය ප්‍රාර්ථනාකරන්නේද එමෙනි.

6. සබ්බං, සියලු; සීලබ්බතං, සීලය හා වතද; පහාය, (ශ්‍රොතාපත්ති මාර්ගයෙන්) හැර; අපි, නැවත; සාවජ්ජානවජ්ජං, සදොස්වූද; නිදොස්වූද, කම්මං, (සියලු අකුසලවූද ලෞකික කුසල්වූද)

7. තමූපනිස්සාය ජිගුච්ඡිතංවා
අථවාපි දිට්ඨංවසුතං මුතංවා
උද්ධංසරාසුද්ධි මනුත්ථුනන්ති
අවීතතණ්හාසෙ භවාභවෙසු.

8. පජ්ජයමානස්ස හිජප්පිතානි
සංවෙදිතඤ්චා පිපකප්පිතෙසු
චුතූපපාතො ඉධ යස්ස නත්ථි
සකෙන වෙධෙය්‍ය කුහිඤ්චිජප්පෙ.

---

කම්මය; (ඉතිරිමගින් හැර;) එතං සුද්ධිං, (පඤ්චකාමගුණාදී ප්‍රභෙද ඇති) ඒ ශුද්ධියද; අසුද්ධිං, (අකුසලාදී භෙදඇති) අශුද්ධියද; ඉති අපජ්ජයානො, මෙසේ නොපතන්නාවූ (ආය්‍ය්‍යශ්‍රාවකතෙම); සන්තිං, නිර්වාණය; අනුග්ගහාය, ගන්නා පිණිස; විරතො, ශුද්ධියෙන් හා අශුද්ධියෙන් වෙන්වූයෙක්ව; චරෙ, හැසිරෙන්නේය.

සියලුම ශීලව්‍රතය ශ්‍රොතාපත්ති මාර්ගයෙන් හැර නැවත සදොස්වූද නිදොස්වූද, සියලු අකුශලවූද ලෞකික කුශලවූද කර්මය ඉතිරිමගින් හැර පඤ්චකාම ගුණාදී භෙදඇති ඒ ශුද්ධියද; අකුසලාදී භෙදඇති අශුද්ධියද මෙසේ නොපතන්නාවූ ආය්‍ය්‍ය ශ්‍රාවකතෙම ශාන්ත නිර්වාණය තමාවෙත ඇදගන්නා පිණිස ශුද්ධියෙන් හා අශුද්ධියෙන් වෙන්වූයෙක්ව හැසිරෙන්නේය.

7. භවාභවෙසු, කුදු මහත් භවයන්හි; අවීතතණ්හාසෙ, පහනොවූ තෘෂ්ණා ඇති මහණබමුණෝ; ජිගුච්ඡිතං, සුධීන් විසින් පිළිකුල්කරණලද; තංවා, ඒ ශීලව්‍රතය හෝ; උපනිස්සාය, ඇසුරුකොට; අථවා, නොහොත්; දිට්ඨංවා අපි, දිට්ඨ සුද්ධිආදීන් අතුරෙන් එකක් හෝ; සුතං, ශ්‍රැතශුද්ධි ආදීන් අතුරෙන් එකක් හෝ; මුතංවා, මුතශුද්ධිආදීන් අතුරෙන් එකක් හෝ ඇසුරුකොට; උද්ධංසරා, අග්‍රියදෘෂ්ටිමාත්‍රයෙන් උද්ඝොෂාරීව; සුද්ධිං, සුද්ධිය; අනුත්ථුනන්ති; කියත්.

කුදු මහත් භවයන්හි පහනොවූ තෘෂ්ණා ඇති මහණ බමුණෝ පණ්ඩිතයන් විසින් පිළිකුල්කරණලද ඒ ශීලව්‍රතය හෝ ඇසුරුකොට නොහොත් දිට්ඨසුද්ධිආදීන් අතුරෙන් එකක් හෝ ශ්‍රැතශුද්ධිආදීන් අතුරෙන් එකක් හෝ මුතසුද්ධීන් අතුරෙන් එකක් හෝ (ඝ්‍රාණවිඥානාදීයෙන් දැනගන්නාලද්දක් හෝ) ආශ්‍රයකොට අග්‍රියදෘෂ්ටිමාත්‍රයෙන් උද්ඝොෂාරීව සුද්ධිය කියත්.

8. පජ්ජයමානස්සහි, භවාභවයෙහි ඒ ඒ වස්තූන් ප්‍රාර්ථනා කරන්නාහට; ජප්පිතානි, තණ්හාවෝවෙති; අපි, යලි; පකප්පිතෙසු, (තෘෂ්ණාදෘෂ්ටියෙන්) කල්පනාකරණලද ධර්මයන්හි; සංවෙදිතඤ්ච, තෘෂ්ණාදෘෂ්ටිකයෙන්වූ ලබ්ධිඥතයද වන්නේය; ඉධ,

9. යමාහු ධම්මං පරමන්ති එකෙ
තමෙව හීනන්ති පනාහු අඤ්ඤෙ
සච්චොනුවාදො කතමො ඉමෙසං
සබ්බෙවහීමෙ කුසලාවදානා.

10. සකංහි ධම්මං පරිපුණ්ණමාහු
අඤ්ඤස්ස ධම්මං පනහීනමාහු
එවම්පි විග්ගය්හ විවාදියන්ති
සකං සකං සම්මුතිමාහු සච්චං.

---

මේ අත්බැව්හිදී; යස්ස, යමකුට; චුතූපපාතො, චුතියහා උත්පත්තිය; නත්ථි, නැත්තේද (හෙතෙම); සකෙ, සවකියවූ; ජප්පෙ, තෘෂ්ණාජනකවූ; කුහිඤ්චි, කිසිවස්තුවෙක්හි; නවෙධෙය්‍ය, කම්පානොවන්නේය.

භවාභවයෙහි ඒ ඒ වස්තූන් ප්‍රාර්ථනාකරන්නාහට තෘෂ්ණාවෝ උපදිති නැවත තෘෂ්ණාදෘෂ්ටියෙන් කල්පනාකරණලද ධර්මයන්හි තෘෂ්ණාදෘෂ්ටිතර්කයෙන්වූ ලබ්ධිඥනයද වන්නේය. මේ අත්බැව්හිදී යමකුට ච්‍යුතිඋත්පත්ති දෙක නැත්තේද හෙතෙම සවකීයවූ තෘෂ්ණාජනකවූ කිසිවස්තුවෙක්හි කම්පානොවන්නේය.

9. එකෙ, ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ; යංධම්මං, යම්ධර්මයක්; පරමංඉති, උතුම්යයි; ආහු, කියද්ද; තංඑව, ඒ ධර්මයම; අඤ්ඤෙ, අන්‍ය ශ්‍රමණ බ්‍රාහ්මණයෝ; හීනංඉතිපන, ලාමකයයිම; ආහු, කියත්; ඉමෙසං, මොවුන්ගේ; සච්චොවාදොනු, සත්‍යවූ වාදය වනාහි; කතමො, කවරෙක්ද; සබ්බඑවඉමෙ, මොවුහු සියල්ලෝම; කුසලාති, (සවකීය සවකීය වාදයෙහි) දක්ෂයෝමය; වදනා, (සවකීය සවකීය ලබ්ධිය සපිරකොට) වාදකරන්නෝමය.

ඇතැම් මහණ බමුණෝ යම් ධර්මයක් උතුම්යයි කියද්ද ඒ ධර්මයම අන් මහණ බමුණෝ ලාමකයයිම කියත් මොවුන්ගේ සත්‍යවූ වාදය වනාහි කවරක්ද මොව්හු සියල්ලෝම තම තමන්ගේ වාදයෙහි දක්ෂයෝමය තම තමන්ගේ ලබ්ධිය සපිරකොට වාදකරන්නෝමය යම්හෙයකින් මෙහි සත්‍යවූ එකමවාදයකුත් නැත්තේද එහෙයින් හුදෙක් ඔව්හු ලබ්ධිමාත්‍රයෙන් පමණක් කියත් එබැවින් ඒ කාරණය දක්වමින් සර්වඥයන් වහන්සේ (සකංහිධම්මං) යනාදී මේ විසර්ජන ගාථාව වදාළසේක.

10. සකංහිධම්මං, තමතමන් පිළිබඳවූ ලබ්ධිය; පරිපුණ්ණං, (සර්වප්‍රකාරයෙන්ම) පරිපූර්ණයයි; ආහු, කියත්; අඤ්ඤස්ස, මෙරමා; ධම්මංපන, ලබ්ධිය වනාහි; හීනං ආහු, ලාමකයයිකියත්; එවම්පි, මෙසේ කියන්නාහු; විග්ගය්හ, ලබ්ධිය දැඩිකොටගෙණ; විවාදියන්ති, විවාද කෙරෙති; සකංසකං, සවකීය සවකීය; සම්මුතිං, දෘෂ්ටිය; සච්චං, සැබවැයි; ආහු, කියත්.

11. පරස්සචෙවම්හයිතෙන හීනො
න කොචි ධම්මෙසු විසෙසි අස්ස
පුථූ හි අඤ්ඤස්ස වදන්ති ධම්මං
නිහීන තොසම්හි දළ්හං වදානා.

12. සද්ධම්මපූජාපි පනා තථෙව
යථා පසංසන්ති සකායනානි
සබ්බෙ පවාදා තථිවා භවෙය්‍යුං
සුද්ධී හි නෙසං පච්චත්තමෙව.

---

තමතමන් පිළිබඳවූ ලබ්ධිය සර්වප්‍රකාරයෙන් සම්පූර්ණ යයි කියත් අන්‍යයන්ගේ ලබ්ධියවනාහි ලාමකයයි කියත් මෙසේ කියන්නාහු ලබ්ධිය දැඩිකොටගෙණ විශෙෂයෙන් වාදකෙරෙති. සවකිය සවකිය ලබ්ධිය සත්‍යයයි කියති. මෙසේ සවකිය ලබ්ධිය පරිපූර්ණයයිද මෙරමා ලබ්ධිය හීනයයිද කියන කල්හි යම්කිසි අනිකකුව හෙළාදක්නා හෙයින් එලෙස කියන්නාත් හීනයෙක් වන්නේව භගවන්තට (පරස්සචෙ) යනාදී ගය වදාළසේක

11. චෙ, ඉදින්; පරස්ස, අන්‍යයකුට; වම්භයිතෙන, නින්දා කිරීම කරණකොටගෙණ; හීනො, ඒ නින්දාකරණ තැනැත්තා හීනයෙක් වන්නේය; ධම්මෙසු, සවභාවධර්මයන්හිලා; කොචි, කිසිවෙක්; නවිසෙසි අස්ස, ශ්‍රෙෂ්ඨනොවන්නේය; හි, ඒ එසේමැයි; පුථු, බොහෝදෙන; අඤ්ඤස්සධම්මං, අනුන්ගේ ලබ්ධිය; නිහීනතො, ලාමකවශයෙන්; වදන්ති, කියත්; සම්හි, සවකීය; ධර්මයෙහි; දළ්හං, දැඩිකොට; වදානා; වාදකරන්නෝමය.

ඉදින් අනිකකුට නින්දාකිරීම කරණකොටගෙණ ඒ නින්දාකරණ තැනැත්තේ හීනයෙක් වන්නේය. සවභාවධර්මයන්හිලා කිසිවෙක් කිසිවෙකුට අග්‍රනොවන්නේය. ඒ එසේමැයි. බොහෝදෙන අනුන්ගේ ලබ්ධිය ලාමකවශයෙන් කියත්; සවකීය ධර්මයෙහිලා ඔව්හු දැඩිකොට වාදකරන්නෝමය.

12. සකායනානි, සවකීය දෘෂ්ටිමාර්ගයන්ට; යථාපසංසන්ති, (තීර්ථකයෝ) යම්සේ පසසද්ද; තථෙව, එපරිද්දෙන්ම; සද්ධම්ම පූජාපන, ඔවුන්ගේ සවකීය ධර්මපූජාවද පවතී; සබ්බපවාදා, ඔවුන්ගේ) සියලුම ප්‍රකර්වාදයෝ;තථිවාභවෙය්‍යුං. ප්‍රමාණයෙන් යුක්තවූවෝ හෝ සපිරවූවෝ වන්නාහ; නෙසං, ඒ තීර්ථකයන් ගේ; සුද්ධිහි, සුද්ධිය වනාහි; පච්චත්තංඑව, තමතමන් කෙරෙහි පිහිටි; (ලබ්ධිග්‍රහණ මාත්‍රයම වන්නේය).

13. න බ්‍රාහ්මණස්ස පරනෙය්‍යමත්ථි
ධම්මෙසු නිච්ඡෙය්‍ය සමුග්ගහීතං
තස්මා විවාදානි උපාතිවත්තො
න හි සෙට්ඨතො පස්සති ධම්මමඤ්ඤං.

14. ජානාමි පස්සාමි තථෙව එතං
දිට්ඨියා එකෙ පච්චෙන්ති සුද්ධිං
අද්දක්ඛි චෙ කිඤ්හි තුමස්ස තෙන
අතිසිත්වා අඤ්ඤෙන වදන්ති සුද්ධිං.

---

තමතුමන්ගේ ලබ්ධිමාර්ගයට නිවචහු යම්සේ ප්‍රශංසා කෙරේද එලෙසම ඔවුන්ගේ ධර්මපූජාවද පවතී. ඔවුන්ගේ සියලුම ප්‍රකාශීවාදයෝ ප්‍රමාණයෙන් යුක්තවූවෝ හෝ සපිරවූවෝ වත් නාහ. ඒ තීර්ථකයන්ගේ ශුද්ධිය වනාහි තමතමන් කෙරෙහි පිහිට ලබ්ධිග්‍රහණමාත්‍රයම වන්නේය.

13. බ්‍රාහ්මණස්ස, (පරමාර්ථ වශයෙන් බාහිතපාපී) බ්‍රාහ්මණයාහට; පරනෙය්‍යං, (සියලු සංස්කාරයෝ අනිත්‍යයෝය යනාදී වශයෙන් මනාකොට දක්නාලදහෙයින්) අනිකකු විසින් පැමිණවියයුතුවූ ඥානයක්; නඅත්ථි, නොමැත්තේය; ධම්මෙසු, දෘෂ්ටිධර්මයන්හි; නිච්ඡෙය්‍ය, මෙයම සත්‍යයයි නිශ්චයකොට; සමුග්ගහිතං, අල්වාගන්නා ලද්දක්ද (නැත්තේය); විවාදානි, (හෙතෙම එකරුණෙන්) දෘෂ්ටිකලහයන්; උපාතිවත්තො, ඉක්මවිය; තස්මා, එහෙයින්; අඤ්ඤං, (සතිපට්ඨානාදිය හැර) අන්‍යවූ; ධම්මං, මිථ්‍යාධර්මයක්; සෙට්ඨතො, ශ්‍රේෂ්ඨවශයෙන්; නහිපස්සති, නොමදක්නේමය.

පරමාර්ථවශයෙන් බාහිතපාපී බ්‍රාහ්මණයාහට සියලු සංස්කාරයෝ අනිත්‍යයෝය යනාදී වශයෙන් මනාකොට දක්නාලද හෙයින් අනිකකු විසින් පැමිණවියයුතුවූ ඥානයක් නොමැත්තේය. දෘෂ්ටිධර්මයන්හි මෙය සත්‍යයයි නිශ්චයකොට අල්වාගන්නාලද්දක්ද නැත්තේය. හෙතෙම එකරුණෙන් දෘෂ්ටිකලහයන් ඉක්මවිය එහෙයින් සතිපට්ඨානාදිය හැර අන්‍යවූ මිථ්‍යාධර්මයක් ශ්‍රේෂ්ඨවශයෙන් නොමදක්නේමය.

14. එතං, ඒ සත්‍යය; තථාඑව, එසේම වෙනස්නොව; ජානාමි, දනිමි; පස්සාමි, දකිමියි; එකෙ, ඇතැම් මහණබමුණෝ; දිට්ඨියා, ස්වකීය ලබ්ධියෙන්; සුද්ධිං, සුද්ධියට; පච්චෙන්ති, පැමිණෙත්; (ඊට හෙතුකවරේදයත්); චෙ, ඉදින්; (අද්දක්ඛි, ඒ තීර්ථකයන් අතුරෙන් එකෙක්වත් ඒ පරසිත් දැනීම් ආදියෙන් යථා-

15. පස්සංනරෙදක්ඛීති නාමරූපං
දිස්වානවාඤස්සති තානිමෙව
කාමං බහුං පස්සතු අප්පකංවා
නහිතෙන සුද්ධිං කුසලාවදන්ති.

---

භූතාර්ථය) දුටුයේද; තුමස්ස, ඒ පුද්ගලයාගේ; තෙන, ඒ දැකීමෙන්; කිංහි, කුමක් කරණලදද; (කිම දුඃඛ පරිඥතය සිද්ධ කරණලදද නොහොත් සමුදය ප්‍රහාණාදීන් අතුරෙන් එක්තර එකක් සිද්ධකරණලදද); අතිසිත්වා, (ඒ තීර්ථකයෝ සර්වප්‍රකාර යෙන්ම) ආර්යමාර්ගය ඉක්මවා; අඤ්ඤෙන, අන් මගකින්; සුද්ධිං, ශුද්ධිය; වදන්ති, කියත්; එහෙයිනි.

ඒ සත්‍යය එසේම වෙනස්නොව දනිමි දකිමියි; ඇතැම් තීර්ථක මහණ බමුණෝ ස්වකීය දෘෂ්ටියෙන් ශුද්ධියට පැමිණෙත් ඊට හෙතුව කවරේදයත් ඉදින් ඒ තීර්ථකයන් අතුරෙන් එකෙක් වත් ඒ පරසිත්දනීම් ආදියෙන් යථාභූතාර්ථය දුටුයේද ඒ පුද්ගලයාගේ ඒ දැකීමෙන් කුමක් කරණලදද; කිමෙක්ද දුඃඛ පරිඥතය සිද්ධකරණලදද නොහොත් සමුදය ප්‍රහාණාදීන් අතුරෙන් එක්තර එකක් සිද්ධකරණලදද ඒ තීර්ථකයෝ සර්වප්‍රකාර යෙන්ම ආර්යමාර්ගය ඉක්මවා අන්මගකින් ශුද්ධිය කියති; නොහොත්, බුද්ධාදී ආර්යයෝ ඒ තීර්ථකයන් ඉක්මවා අන්පරිද්ද කින් සත්වයාගේ ශුද්ධිය කියත්.

15. නරෙ, සත්වතෙම; පස්සං, (පරචිත්තඥාණාදියෙන්) බලන්නේ; නාමරූපං, නාමරූපය; දක්ඛීති, (අනිත්‍යාදිවශයෙන්) දකින්නේද; දිස්වාන, එසේ දැක; තානිඑව, ඒ නාමරූපයන්ම; ඤස්සතිවා, (නිත්‍යවශයෙන් හෝ සැපවශයෙන් හෝ; අන්පරිද්ද කින් හෝ) දන්නේද; කාමං, එකාන්තයෙන්; බහුංවා, බොහෝ කොට හෝ; අප්පංච, ස්වල්පකොට හෝ; පස්සතු, (නාමරූපය නිත්‍යවශයෙන් හෝ සැපවශයෙන් හෝ අන්පරිද්දකින් හෝ) දකීවා; තෙන, එබඳු දර්ශනයෙන්; සුද්ධිං, ශුද්ධියක්; කුසලා, (නාම රූප විභාගයෙහි හෙවත් ස්කන්ධාදියෙහි) දක්ෂයෝ; නහිවදන්ති, නොමකියත්මය.

සත්වතෙම පරචිත්තඥානාදියෙන් බලන්නේ නාමරූපය නිත්‍යාදිවශයෙන් දකින්නේද එසේ දැක ඒ නාමරූපයන්ම නිත්‍යවශයෙන් හෝ සැපවශයෙන් හෝ අන්ආකාරයකින් හෝ දන්නේද එකාන්තයෙන් බොහෝකොට හෝ ස්වල්පකොට හෝ නාමරූපය නිත්‍යවශයෙන් හෝ සැපවශයෙන් හෝ අන්පරිද්ද කින් හෝ දකීවා එබඳු දර්ශනයෙන් ශුද්ධියක් නාමරූප විභාග යෙහි හෝ ස්කන්ධාදියෙහි දක්ෂයෝ නොකියත්මය.

16. නිවිස්සවාදීනහි සුබ්බිනයො
පකප්පිතං දිට්ඨිං පුරෙක්ඛරානො
යංනිස්සිතො තත්‍ථ සුභං වදානො
සුද්ධිං වදෙතත්‍ථ තථද්දසා සො.

17. න බ්‍රාහ්මණො කප්පමුපෙති සංඛං
නදිට්ඨිසාරී නපිඤාණබන්ධු
ඤත්වා ච සො සම්මුතියො පුථුජ්ජා
උපෙක්ඛතී උග්ගහණං තමඤ්ඤෙ.

---

16 නිවිස්සවාදී, (ඒදර්ශනයෙහුත් ශුද්ධියක් නැතිකල්හි යමෙක් එය එසේය මම දනිමි දකිමියි. ඒ දර්ශනය නිසා දෘෂ්ටියගේ ශුද්ධියට පැමිණෙන්නේ මෙයම සත්‍යයයි) ඇතුලත්ව කියන්නේ; නහිසුබ්බිනයො, හික්මවීමට පහසුවූවෙක් නොවන්නේය; පකප්පිතං, අභිසංස්කරණය කරණලද; දිට්ඨිං, දෘෂ්ටිය; පුරෙක්ඛරානො, පෙරටුකොට ඇත්තෙක්ව; යංනිස්සිතො, යම් ශාස්තෘවරයෙක්; හෝ දෘෂ්ටිමාර්ගයක් ඇසුරුකෙළේ; තත්‍ථ, ඒ සවකීය දෘෂ්ටියෙහිලා; සුභංවදානො, යහපත්ව කියනසුලුවූයේ; තත්‍ථඑව, ඒ ලබ්ධියෙහිම, සුද්ධිංවදෙ, (මම පිරිසිදුවාදඇත්තෙමි පිරිසිදු දැකුම් ඇත්තෙමියි යනාදියෙන්) ශුද්ධිය කියන්නාවූ; සො, හෙතෙම; තථද්දස, යම්සේ ඒ දෘෂ්ටිය පවතීද එසේම එය දුටුයේය

ඒ දර්ශනයෙහුත් ශුද්ධියක් නැතිකල්හි යමෙක් එය එසේය මම දනිමි දකිමියි ඒ දර්ශනය නිසා දෘෂ්ටිශුද්ධියට පැමිණෙන්නේද මෙය සත්‍යයයි ඇතුලත්ව කියන්නේද හෙතෙම හික්මවීමට පහසුවූවෙක් නොවන්නේය; අභිසංස්කරණය කරණලද ලබ්ධිය පෙරටුකොට ඇත්තෙක්ව යම් ශාස්තෘවරයෙක් හෝ දෘෂ්ටිමාර්ගයක් ඇසුරුකෙළේද ඒ සවකීය දෘෂ්ටියෙහිලා යහපත්ව කියනසුලුවූයේ ඒ ලබ්ධියෙහි මම පිරිසිදු වාදඇත්තෙමි. පිරිසිදු දැකුම්ඇත්තෙමියි යනාදියෙන් ශුද්ධිය කියන්නාවූ හෙතෙම යම්සේ ඒ දෘෂ්ටිය පවතීද ඒසේම එය දුටුයේය.

17. බ්‍රාහ්මණො, බාහිත පාපී ක්ෂීණාශ්‍රව බ්‍රාහ්මණ තෙම, සඞ්ඛාය, ප්‍රඥාචක්ෂුෂින් දැන; කප්පං, තෘෂ්ණාදෘෂ්ටි විකල්ප සඞ්ඛ්‍යාත, කල්පයට; නඋපෙති, නොපැමිණෙයි; දිට්ඨිසාරී, ලබ්ධියෙහි හැසිරෙන්නෙක්ද; න, නොවෙයි; ඤාණබන්ධු, සමාපත්තිඥානාදියෙන් නොකරණලද තෘෂ්ණාදෘෂ්ටිබන්ධන ඇති; සො,එ ක්ෂීණාශ්‍රව බ්‍රාහ්මණතෙමේ; පුථුජ්ජා, පෘථග්ජනයන් කෙරෙන් හටගත්තාවූ;

18. විස්සජ්ජ ගන්ථානි මුනීධ ලොකෙ
විවාදජාතෙසු නවග්ගසාරී
සන්තො අසන්තෙසු උපෙක්ඛකො සො
අනුග්ගහො උග්ගහණන්තිමඤ්ඤෙ

19. සබ්බාසවෙ හිත්වාන වෙ අකුබ්බං
නඡන්දගූනොපි නිවිස්සවාදී
සවිප්පමුත්තො දිට්ඨි ගතෙහිධීරො
නලිප්පති ලොකෙ අනත්තගරහී.

---

සම්මුතියො, දෘෂ්ටීන්; ඤත්වාව, දැනද; උපෙක්ඛති, උපෙක්ෂා කෙරෙයි හෙවත්, අත්හරිනුලැබේ; අඤ්ඤෙ, අන්‍යයෝ; උග්ගණ්හන්ති, ඒ දෘෂ්ටීන් උගණිත්.

බාහිත පාපී ක්ෂීණාශ්‍රව බ්‍රාහ්මණතෙම ප්‍රඥාචක්ෂුසින් දැන තෘෂ්ණාදෘෂ්ටි විතර්ක සංඛ්‍යාත කල්පයට නොපැමිණෙයි. ලබ්ධියෙහි හැසිරෙන්නෙක්ද නොවෙයි. සමාපත්තිඥානාදීයෙන් නොකරණලද තෘෂ්ණාදෘෂ්ටිබන්ධනඇති ඒ ක්ෂීණාශ්‍රව බ්‍රාහ්මණතෙම පෘථග්ජනයන් කෙරෙන් හටගත්තාවූ දෘෂ්ටීන් දැනද උපෙක්ෂා කරයි, අනහරි අන්‍ය තීර්ථකයෝ ඒ ලබ්ධීන් උගෙණගණිත්.

18. ඉධලොකෙ, මේලොකයෙහි; විවාදජාතෙසු, හටගත් විග්‍රහ වාදඇත්තවුන් අතුරෙහි; නවග්ගසාරී, කොටස් වශයෙන් නොහැසිරෙන්නාවූ; මුනි, ක්ෂීණාශ්‍රව මුනිතෙමේ; ගන්ථානි, (භවයෙන් භවය ගැටගසන අර්ථයෙන්); අභිධ්‍යාදී චතුර්විධ ග්‍රන්ථයන්; විස්සජ්ජ, හැර; අසන්තෙසු, අශාන්තයන් අතුරෙහි; සන්තො, ශාන්තවූ; සො, ඒ ක්ෂීණාශ්‍රවතෙමේ; උපෙක්ඛකො, (ඉහතකී ලබ්ධීන් විෂයෙහි) උපෙක්ෂා ඇත්තෙක්වෙයි; අනුග්ගහො, ඒ දෘෂ්ටීන් උද්ග්‍රහණයෙන් විරහිතයෙක්වෙයි; අඤ්ඤෙ, අන්‍යතීර්ථකයෝ; උග්ගණ්හන්ති, ඒ දෘෂ්ටීන් උගෙණගණිත්.

මේ ලොකයෙහි හටගත් විග්‍රහ වාදඇත්තවුන් අතුරෙහි කොටස් වශයෙන් නොහැසිරෙන්නාවූ ක්ෂීණාශ්‍රව මුනිතෙමෙ භවයෙන් භවය ගැටගසන අර්ථයෙන් ග්‍රන්ථනම්වූ අභිධ්‍යාදී චතුර්විධ ග්‍රන්ථයන් හැර නොසන්සුන්වූවන් අතර සන්සුන්වූයේ යම්කී දෘෂ්ටීන් විෂයෙහි බලාපොරොත්තු රහිතයෙක්ව එකී දෘෂ්ටීන් උගෙණීමෙන් තුරන්වූයෙක් වෙයි; අන්‍යතීර්ථකයෝ ඒ දෘෂ්ටීන් උගෙණගණිත්.

20. සසබ්බධම්මෙසු විසෙනිභූතො
යංකිඤ්චි දිට්ඨං වසුතං මුතංවා
සපන්නභාරො මුනිවිප්පයුත්තො
නකප්පියො නූපරතො නපත්ථියො.

---

19. සබ්බාසවෙ, (ඉක්මගිය රූපාදීන් අරබයා උපදනා) කෙලෙසුන්ද; හිත්වා, හැර; නවෙ, (ප්‍රත්‍යුත්පන්නරූපාදීන් පිළිබඳව උපදනා) කෙලෙසුන් සඳහා; අකුබ්බං, ඇල්මනොකරන්නාවූ; නඡන්දගූ කාමච්ඡන්දාදීන්ගේ වශයෙන් අගතියට නොගියාවූ; නොපිතිවිස්සවාදෙ, තෘෂ්ණාදෘෂ්ටීන්හි නොපිවිස වාදකරන්නාවූ; දිට්ඨිගතෙහි, දෘෂ්ටිගතිකයන් කෙරෙන්; විප්පමුත්තො, වෙසෙසින් මිදුනාවූ; අනත්තගරහී, (කලනොකල දුශ්චරිත සුචරිතයන්ගේ වශයෙන්) තමන්ට නොගරහනසුලුවූ; සොධීරෙ, ඒ පණ්ඩිතතෙම; ලොකෙ, සකන්ධාදී ලොකයෙහි; නලිප්පති, තෘෂ්ණාදීන්ගේ වශයෙන් නොඇලෙයි.

අතීත රූපාදින් නිසා උපදනා කෙලෙසුන් හැර පවත්නා කාලය පිළිබඳ රූපාදීන් නිසා උපදනා කෙලෙසුන් සඳහා ඇලය නොකරන්නාවූ ඡන්දාදින්ගේ වශයෙන් අගතියට නොගියාවූ දෘෂ්ටීන්හි නොපිවිස වාදකරන්නාවූ දෘෂ්ටිගතිකයන් කෙරෙන් විශෙෂයෙන් මිදුනාවූ කල නොකල දුශ්චරි සුචරිතයන්ගේ වශයෙන් තමන්ට නොගරහනසුලුවූ ඒ පණ්ඩිතතෙම සකන්ධාදී ලොකයෙහි තෘෂ්ණාදෘෂ්ටිවශයෙන් නොඇලෙයි.

20. සො, ඒ ක්ෂීණාශ්‍රව භික්ෂුතෙම; දිට්ඨං, දිට්ඨය; සුතං, සුතය; මුතං, මුතය; යන, යංකිඤ්චි, යම්කිසිවක්වේද; එබඳුවූ; ප්‍රභෙදඇත්තාවූ, සබ්බෙසු ධම්මෙසු, සියලු දෙසැට දෘෂ්ටි ධර්මයන්හි; විසෙනිභූතො, තෘෂ්ණාදී පහවූ සෙනාඇත්තේද; පන්නභාරො, පතිත කෙලෙස්බර ඇත්තේද; විප්පයුත්තො, කෙලෙසුන් කෙරෙන් මොනවට විශෙෂයෙන් වෙන්වූ; සොමුනි, ඒ ක්ෂීණාශ්‍රවතෙම; නකප්පියො, තෘෂ්ණාදෘෂ්ටි සඞ්ඛ්‍යාත විවිධ කල්ප නැත්තේයයිද; නූපරතො, පෘථග්ජන කල්‍යාණ ශෛක්ෂයන්මෙන් උපරතිසමඞ්ගී නොවන්නේයයිද; නපත්ථියොති, තෘෂ්ණාරහිතයෙක්යයි කියාද (භාග්‍යවතුන් වහන්සේ වදාළසේක.)

ඒ පුන්කල ආශ්‍රවයන් ඇති භික්ෂූතෙම දිට්ඨ ශ්‍රැත මුතයන්ගුද්ධීන් පිළිබඳ හෝ මඞ්ගලයන් පිළිබඳ යමක් ඇද්ද එබඳු ප්‍රභෙද වත්වූ දෙසැට දෘෂ්ටීන්හි තෘෂ්ණාදෘෂ්ටිසඞ්ඛ්‍යාත පහවූ සේනා ඇත්තේද පතිත කෙලෙස්බර ඇත්තේද කෙලෙසුන් කෙරෙන් විශෙෂයෙන් වෙන්වූ ඒ ක්ෂීණාශ්‍රව මුනිතෙමේ තෘෂ්ණාදෘෂ්ටි සඞ්ඛ්‍යාත විවිධ කල්පයන් නැත්තේක්යයිද කල්‍යාණ පෘථග්ජන ශෛක්ෂයන්මෙන් භවෝපරති රහිතයෙක්යයිද භාග්‍යවතුන් වහන්සේ නිර්මිත බුදුන්ට පිළිතුරුවශයෙන් වදාළසේක. මෙලෙස රහත්කුළගන්වා මේ සූත්‍රදෙශනාව නිමවා වදාළකල්හි කෙළලක්ෂයක් දෙවියෝ රහත්වූහ. සෝවාන්ආදි ඉතිරි මාර්ගඵලයන්ට පැමිණියවුන්ගේ සංඛ්‍යාවක් නොමැතිවිය.

මහාව්‍යූහ සූත්‍රව්‍යාඛ්‍යානය සමාප්තයි.

# ශ්‍රද්ධාචරිත දෙවියන්ට සත්ප්‍රායවූ
# තුවටක සූත්‍රය.

**නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස,**

**1. පුච්ඡාමිතං ආදිච්චබන්ධුං**
**විවෙකංසන්ති පදංචමහෙසිං**
**කථංදිස්වා නිබ්බාති භික්ඛු**
**අනුපාදියානො ලොකස්මිංකිඤ්චි,**

---

1. ආදිච්චබන්ධුං, (ගොත්‍රවශයෙන්)සූර්‍ය්‍යයාට නෑවූ; මහෙසිං, මහර්ෂිවූ; තං, ඔබවහන්සේ; පුච්ඡාමි, විචාරමි; භික්ඛු, (යොගාවචර) භික්ෂුතෙම; විවෙකං, (කායවිත්තඋපධිසඞ්ඛ්‍යාත) විවෙකත්‍රයද; සන්තිපදං, නිර්‍වාණපදයද (නොහොත්) (අධිගමූපායවූ සප්තත්‍රිංශද්බොධිපාක්ෂික ධර්‍මයද); කථංදිස්වා, කෙසේ පැවති දැකුම් ඇත්තෙක්ව; ලොකස්මිං, (ස්කන්ධාදී) ලොකයෙහි; කිඤ්චි, (රූපවෙදනාදීන් අතුරෙන්) කිසි සංස්කාරයක්; අනුපාදියානො, (කාමාදිසිව්උපාදනයෙන්) අල්වානොගත්තෙක්ව; නිබ්බාති, (සියලු කෙලෙසුන්) සන්සිඳවාද.

(සූර්‍ය්‍යතෙමේත් ගොත්‍රයෙන් ගෞතමයි, භාග්‍යවත් තෙමේත් ගොත්‍රයෙන් ගෞතමයී,) එහෙයින් සූර්‍ය්‍යයාටනෑවූ මහර්ෂිවූ ඔබඅතින් කරුණක් විචාරමි. තනිවයයි තනිවසිටි, තනිවහිඳී යනාදී කායවිවෙක ඇතිබවද, නීවරණවිතර්කවිචාරාදියෙන් වෙන්වූ බැවින් ධ්‍යානමාර්ගඵලසඞ්ඛ්‍යාත චිත්තවිවෙකයද කාමක්ලෙශ ස්කන්ධාභිසංස්කාරසඞ්ඛ්‍යාත උපධීන්ගෙන් වෙන්වූ බැවින් උපධිවිවෙකසඞ්ඛ්‍යාත නිර්‍වාණයද යන විවෙකත්‍රයද, නිර්‍වාණය නොහොත් අධිගමූපායවූ සප්තත්‍රිංශද්බොධිපාක්ෂිකවූ ධර්‍මයද කෙසේ පැවැති දැකුම්ඇත්තෙක්ව ස්කන්ධාදිලොකයෙහි රූපවෙදනාදින් අතුරෙන් කිසි සංස්කාරයක් කාමාදිසිව්උපාදනයන් විසින් අල්වානොගන්නාලද්දෙක්ව සියලු කෙලෙසුන් සන්සිඳවාද, මෙසේ නිර්මිත බුදුන් විසින් විචාරණලදකල්හි භාග්‍යවතුන්වහන්සේ යම්සේ කායවිවෙකාදිය හා නිර්‍වාණපදයද දක්නා මහණතෙමේ කෙලෙසුන්වලකාද එසේම පැවැති දැකුම් ඇත්තෙක්ව ක්ලෙශ පරිනිර්‍වාණය කෙරේයයි වදාරා ඒ

2. මූලංපපඤ්චසඞ්ඛායාති (භගවා)
මන්තාඅස්මීති සබ්බමුපරුන්ධෙ
යාකාචිතණ්හා අජ්ඣත්තං
තාසංවිනයාය සදාසතොසික්ඛෙ.

---

අපීය ප්‍රකාශකරමින් නොයෙක් අයුරින් ඒ දෙවපිරිස කෙලශ ප්‍රහාණයෙහි යොදවමින් මූලංපපඤ්චසඞ්ඛාය යන්නෙන් පටන් ගෙණ ගාථා පසක් වදාළසේක.

2. පපඤ්චසඞ්ඛාය, ප්‍රපඤ්චසඞ්ඛ්‍යාත (තෘෂ්ණාදෘෂ්ටීන්ගේ;) මූලං, අවිද්‍යාදී කෙලෙස් මූලද; අස්මීති, (සෙය්‍යස්සෙසෙය්‍යාහමස්මි) යනාදීයෙන් පැවැති නවවිධමානයද යන; සබ්බං, සියල්ල; මන්තාය, ප්‍රඥාවෙන්; උපරුන්ධෙ, නිරුද්ධකරන්නේද (නොහොත්) සන්සිඳවන්නේද; අජ්ඣත්තං, සියසතන්හි හටගන්නාවූ; යාකාචිතණ්හා, (රූපතණ්හාදිවූ) යම්කිසි තෘෂ්ණාවෝ වන්නාහුද; තාසං, ඒ තෘෂ්ණාවන්ගේ; විනයාය, දුරුකිරීමපිණිස; සතො, (සියලුකල්හි) එළඹසිටි සිහිඇත්තේ; සදා, (ප්‍රථමවයසාදී) සෑමකල්හි; සික්ඛෙ, අධිසීල, අධිචිත්ත, අධිපඤ්ඤ, සඞ්ඛ්‍යාත ත්‍රිශික්ෂාවන් පරිපූර්ණයකරන්නේය; භගවා, භාග්‍යවතුන්වහන්සේ; ඉති, නිර්මිත බුදුන්ට මෙසේ වදාළසේක.

සත්වයා ච්‍යුතිප්‍රතිසන්ධිවශයෙන් සංසාරයෙහි නැවත නැවත ප්‍රමාදකරවන හෙයින් ප්‍රපඤ්චයයි කියනලද තෘෂ්ණාදෘෂ්ටීය ගේ අවිජ්ජා අයොනිසොමනසිකාර, අස්මිමාන, අහිරික, අනොත්තප්ප, උද්ධච්චයන මූලද සෙය්‍යස්සෙසෙය්‍යාහමස්මි යනා දී නවවිධ මානයද යන සියල්ල නුවණින් දැන නිරුද්ධකරන්නේද (නොහොත්) සන්සිඳවන්නේද සියසතන්හි හටගන්නාවූ රූපතණ්හා, සද්දතණ්හා, ගන්ධතණ්හා, රසතණ්හා, ඵොට්ඨබ්බ තණ්හා, ධම්මතණ්හා යනාදී යම්කිසි තෘෂ්ණාවෝ වෙද්ද ඒ තෘෂ්ණාවන් දුරුකිරීම පිණිස එළඹසිටි සිහිඇත්තේ ප්‍රථමවයස මධ්‍යමවයස, පශ්චිමවයස, පෙරබත, පසුබත, පෙරයම, මැදුමියම අළුයමයනාදී සියලුකල්හී අධිසීල, අධිචිත්ත, අධිපඤ්ඤ සඞ්ඛ්‍යාත ත්‍රිශික්ෂාවන් සමාදන්ව පවත්වන්නේය, භාග්‍යවතුන්වහන්සේ නිර්මිතබුදුන්ට මෙසේ වදාළසේක, මෙසේ ත්‍රිශික්ෂාවෙන් යුත් දෙශනාව රහත්කුළුගන්වමින් නිමවා නැවත මානප්‍රහාණ වශයෙන් දෙශනාකරන්ට (යංකිඤ්චි) යනගය වදාළසේක.

3. යංකිඤ්චිධම්මං අභිජඤ්ඤා
අජ්ඣත්තං අථවාපිබහිද්ධා
න තෙන මානං කුබ්බෙථ
නහිසා නිබ්බුතිසතංවුත්තා.

4. සෙය්‍යොනතෙනමඤ්ඤෙය්‍ය
නීචෙය්‍යොඅථවාපිසරික්ඛො
ඵුට්ඨොඅනෙකරූපෙහි
නාතුමානං විකප්පයන්තිට්ඨෙ.

---

3. අජ්ඣත්තං, තමාපිළිබඳවූද; අථවා, නොහොත්; බහිද්ධා අපි, ආචාර්‍ය්‍ය උපාධ්‍යායාදීන් පිළිබඳවූද; යංකිඤ්චිධම්මං, උච්චාකුලීනතාදි යම් ගුණයක්; අභිජඤ්ඤා, දන්නේද; තෙන, ඒ උච්චාකුලීනතාදී ගුණය කාරණකොටගෙණ; මානං, මානය; නකුබ්බෙථ, නොකරන්නේය; (ඊටහෙතුවකාවරේද) සා, ඒ උන්නතිතොමෝ; නිබ්බුති, කෙලෙස් සන්සිඳවීමකැයි; සතං, බුද්ධාදිශාන්ත පුරුෂයන් විසින්; නහිවුත්තා, නොකියන ලද්දීමය; එහෙයිනි.

තමා පිළිබඳවූද ආචාර්‍ය්‍ය උපාධ්‍යායාදීන් පිළිබඳවූද උච්චාකුලීනතාදීවූ යම් ගුණයක් දන්නේද ඒ උච්චාකුලීනතාදිවූ ගුණය කාරණකොටගෙණ මානය නොකරන්නේය (ඊට හෙතුකවරේද) ඒ විතෙතාන්නතිතොමෝ කෙලෙස් සන්සිඳවන්නියයි බුද්ධාදිශාන්ත පුරුෂයන් විසින් නොකියනලද්දීමය, එහෙයිනි දූන් ඒ මානය නොකරණ විධිය දක්වමින් (සෙය්‍යොනතෙන) යනාදී ගාථාව වදාළසේක.

4. තෙන, ඒ මානයෙන්; සෙය්‍යො, මම ප්‍රශස්තයෙක්මියිද; නිචෙය්‍යො, මම නිචයෙක්මීයිද; අථවා, නොහොත්; සරික්ඛො අපි, සදෘශයෙක්මියිද; නමඤ්ඤෙය්‍ය, නොසිතන්නේය; අනෙකරූපෙහි (ඒ උච්චාකුලීනතාදී) නොයෙක් ගුණයෙන්; ඵුට්ඨො, ස්පර්ශකරණලද්දේ; ආතුමානං, තමා; විකප්පයං, මම උසස් කුලයෙන් නික්ම අවුත් පැවිදිවීමියනාදී ක්‍රමයෙන් තමාගැණ සිතමින්; නතිට්ඨෙ, නොසිටින්නේය.

තමා පිළිබඳවූද ආචාර්‍ය්‍ය උපාධ්‍යායාදීන් පිළිබඳවූද ඒ උච්චාකුලීනතාදීවූ ගුණයන් කාරණකොටගෙණ මම ප්‍රශස්තයෙක් වෙමි, හීනයෙක්වෙමි, සමානයෙක්වෙමි යි නොසිතන්නේය, ඒ උච්චාකුලීනතාදී ගුණයෙන් ස්පර්ශකරණලද්දේද මම උසස් කුලයකින් නික්ම අවුත් පැවිදිවීමි යනාදී නොයෙක් අයුරින්

5. අජ්ඣත්තමෙවඋපසමෙ
නාඤ්ඤතො භික්ඛු සන්තිංඑසෙය්‍ය
අජ්ඣත්තංඋපසන්තස්ස
නත්ථිඅත්තාකුතොනිරත්තංවා.

6. මජ්ඣෙයථා සමුද්දස්ස
ඌමිනජායති ඨිතොහොති
එවංඨිතො අනෙජස්ස
උස්සදං භික්ඛු නකරෙය්‍යකුහිඤ්චි .

---

තමන්ගැණ සිතමින් නොසිටින්නේය, මෙසේ මානප්‍රහාණ වශයෙන් දේශනාකොට දැන් ක්ලේශොපශමවශයෙන් දක්වනුව (අජ්ඣත්තමෙව) යනාදී ගාථාව වදාළසේක.

5. භික්ඛු, මහණතෙම; අජ්ඣත්තංඑව, තමාකෙරෙහිවූම රාගාදි සකලක්ලේශයන්; උපසමෙය්‍ය, සන්සිඳවන්නේය; අඤ්ඤතො, (සතරසතිපට්ඨානාදීන් හැර) අන්‍යොපායකින් හෝ (මිථ්‍යා ප්‍රතිපත්තියකින්); සන්තිං, නිර්වාණය; නඑසෙය්‍ය, නොසොයන්නේය; අජ්ඣත්තං, තමාතුළ පිහිටි රාගාදී ක්ලේශයන් උපසන්තස්ස, ව්‍යපශමිය කළක්ෂීණාශ්‍රවයාහට; අත්තා, ශාස්වත දෘෂ්ටියක්; නත්ථි, නැත; නිරත්තංවා, උච්ඡෙද දෘෂ්ටියක් හෝ; කුතො, කොයින්ද.

මහණතෙම තමාකෙරෙහි පිහිටියාවූ රාගාදී සකලක්ලේශයන් සන්සිඳවන්නේය. සතිපට්ඨානාදීන් හැර අන්‍යවූ උපායකින් හෝ මිථ්‍යාප්‍රතිපත්තියකින් නිර්වාණය නොසොයන්නේය තමා කෙරෙහි පිහිටි රාගාදීක්ලේශයන් සන්සිඳවූ ක්ෂීණාශ්‍රවයාහට ආත්ම දෘෂ්ටිය නැත්තේය, ඔහට උච්ඡෙදදෘෂ්ටිය කොයින්ද? දැන් සිය සිතතුළ සන්සිඳවූ කෙලෙස් ඇති ක්ෂීණාශ්‍රවයාගේ තාදිභාවය දක්වමින් (මජ්ඣෙයථා) යනාදී ගාථාව වදාළසේක.

6. සමුද්දස්ස, මහා සමුද්‍රයාගේ; මජ්ඣෙ, (උපරිමහෙට්ඨිමභාගයන් සම්බන්ධවූ) දෙමැදයොදුන් සාරදහසක් පමණතන්හි හෝ සප්තකූට පර්වතයන්ගේ) මධ්‍යයෙහි හෝ; ඌමි, රළ; යථා, යම්සේ; නජායති, නූපදීද; ඨිතොහොති, (නිශ්චලව) සිටියේවේද; එවං, එපරිද්දෙන්; අනෙජෙ, තෘෂ්ණාව සමූලොච්ඡින්න කළ හෙයින් අනෙජනම්වූ ක්ෂීණාශ්‍රවතෙම; ඨිතොඅස්ස, (ලොභාදී අෂ්ටලොකධර්මයෙන් නොසෙල්ලෙමින්) සිටියෙක්වෙයි; භික්ඛු, ඒ එබඳු ක්ෂීණාශ්‍රව මහණතෙමේ; කුහිඤ්චි, (ආධ්‍යාත්මිකබාහ්‍ය වූ) කිසිවක්කෙරෙහි; උස්සදං, රාගාදික්ලේශොත්සදය; නකරෙය්‍ය, නොකරන්නේය.

7. අකිත්තයි විවටචක්ඛු
සක්ඛිධම්මං පරිස්සයවිනයං
පටිපදං වදෙහි භද්දන්තෙ
පාතිමොක්ඛං අථවාපි සමාධිං.

---

අසූසාරදහසක් යොදුන් ගැඹුර ඇති මහාසමුද්‍රයාගේ යට හතළිස් දහසක් යොදුන් පමණ තන්හි ජලය මස්තැසුබන් කරණකොටගෙණ කැලඹෙයි. මත්තෙහි හතළිස්දහසක් යොදුන් පමණතන්හි ජලය වාතයෙන් කැලඹෙයි. එකී දෙමැද යොදුන් සාරදහසක් පමණ තන්හි පිහිටි ජලය නිශ්චලව පවතී. එහිරළනූපදී සප්තකූට පර්වතයන් අතරෙහි පිහිටි ජලයෙහිද රළ නූපදී එමෙන්ම තෘෂ්ණාරහිත ක්ෂීණාශ්‍රවතෙමේ (ලාභාලාභා) යනාදී අෂ්ටලෝක ධර්මයෙන්; අකම්පිතව නිශ්චලව සිටියෙක්වෙයි. එබදු රහත් මහණතෙමේ බාහ්‍යාභ්‍යන්තර දෙක්හිවූ කිසිවක් කෙරෙහි (රාග දෙස මෝහ මානදිට්ඨි ක්ලෙශකම්මභෙද සඞ්ඛ්‍යාතවූ) උපාදය නූපදවන්නේය රහත් කුළුගන්වමින් වදාළ මේ දේශනාව සතුටින් පිළිගණිමින් එකී රහත්හුගේ පූර්වභාග ප්‍රතිපදාව විචාරන්නාවූ නිර්මිත බුද්ධතෙමේ (අකිත්තයි) යනාදී ගාථා වදාළසේක.

7. විවටචක්ඛු, ආවරණරහිතවූ; මසැස, දිවැස, පැණැස, බුදුඇස, සමන්තැසයන පසැසින් යුත් සර්වඥයන්වහන්ස; පරිස්සයවිනයං, (ප්‍රකට ප්‍රතිච්ඡන්න) උපද්‍රව දුරුකරන්නාවූ; සක්ඛිධම්මං, (තමාවිසින්ම ප්‍රත්‍යක්ෂකරණලද)තමාප්‍රත්‍යක්ෂකොටඇති නිර්වාණධර්මය; අකිත්තයි, කීසේක;තෙ,නුඹවහන්සේට; භද්දං,(එහෙයින්) යහපතක්වේවා; අථවා, නොහොත්; තෙ, නුඹවහන්සේගේ; භද්දං, සොඳුරුවූ; පටිපදං, ප්‍රතිපත්තියද; පාතිමොක්ඛං, ප්‍රාතිමොක්ෂසංවරයද; සමාධිංඅපි, සමාධියද; වදෙහි, වදාළමැනව.

අනාවරණයවූ මසැස, දිවැස, පැණැස, බුදුඇස, සමන්තැස යන පසැසින්යුත් සර්වඥයන්වහන්ස ප්‍රකට ප්‍රතිච්ඡන්න උපද්‍රවයන් දුරුකරන්නාවූ තමා විසින් දැනගන්නාලද තමා ප්‍රත්‍යක්ෂකොටඇති නිර්වාණධර්මය කීසේක. නුඹවහන්සේට එහෙයින් යහපතක්වේවා (නොහොත්) නුඹවහන්සේගේ සොඳුරුවූ ප්‍රතිපත්තියද ප්‍රාතිමොක්ෂ සංවරයද සමාධියද වදාළමැනව. පටිපදං යන්නෙන් නිර්මිත බුදුන් විසින් මාර්ගය විචාරණලදි· අනික් පදවලින් සීලය හා සමාධිය විචාරණලදී. යම්හෙයකින් ඉන්ද්‍රිය සංවරය ශීලයට ආරක්ෂාවක්වේද ඒ පිළිවෙළින් දෙශනාකරනු

8. චක්ඛූහි නෙවලොලස්ස
ගාමකථාය ආවරයෙසොතං
රසෙසු නානුගිජ්ඣෙය්‍ය
නචමමායෙථකිඤ්චිලොකස්මිං.

---

ලබණ මේ දෙශනාව ඒ දෙවතාවන්ට සත්‍ප්‍රාය වන්නීද එහෙයින් ඉන්ද්‍රියසංවරයපවත් ප්‍රතිපදව දක්වනසේක් (චක්ඛූහි) යනාදිය වදළසේක.

8. චක්ඛූහි, (නුදුටුදෙයදක්නයුතුය යනාදීන්ගේ වශයෙන්) ඇස්කරණකොටගෙණ; නෙවලොලොඅස්ස, (රූපාරම්මණාස්වාදනයෙහි) ලොල්වූයෙක් නොවන්නේමය; ගාමකථාය, තිරශ්චීනකථාවෙන්; සොතං, කණ; ආවරෙය්‍ය, සංවරණයකරන්නේය; රසෙසු, (මූලරසාදි) රසයන්හි; නඅනුගිජ්ඣෙය්‍ය, අනුගෙධය නොකරන්නේය; ලොකස්මිං, ස්කන්ධාදිලොකයෙහි; කිඤ්චි, චක්ෂුරාදි කිසිසංස්කාරයක්; නමමායෙථ, තෘෂ්ණාමමත්වයෙන් හා දෘෂ්ටිමමත්වයෙන් නොගන්නේය.

නුදුටුදෙය දක්නයුතුය දුටුදෙය ඉක්මවියයුතුය යනාදීන්ගේ වශයෙන් ඇස්කරණකොටගෙණ රූපාරම්මණාස්වාදනයෙහි ලොල්වූවෙක් නොවන්නේය තිරශ්චීන කථා ඇසීමෙන් කණ සංවරණයකරන්නේය මූලරසාදී රසයන්හි අනුගෙධය නොකරන්නේය, ස්කන්ධාදී ලොකයෙහි චක්ෂුරාදී කශ්චිත්සංස්කාරයක් තෘෂ්ණාමමත්වයෙන් හා දෘෂ්ටිමමත්වයෙන් නොගන්නේය, නුදුටුදෙයදක්නයුතුය දුටුදෙය ඉක්මවියයුතුයයි සිතමින් අරමින් අරමටද, උයනින් උයනටද, ගමින්ගමටද තිරත්ථිකාචාරිකායෙහි හැසිරෙමින් වාසයකෙරේද ඇතුල්ගමට පිවිසියේ වීථියට පිළිපන්කල්හි අසංවෘතවඒද ඇතුන් අසුන් රථ පාබලසේනාවන් බලමින් ඒද ස්ත්‍රීපුරුෂ කුමාරකුමාරිකාදීන්ද කඩසාප්පුආදියද සිව්දිග සිව්අනුදිග උඩඇට යන දශදිශාවන්ද සංවර රහිතව බලමින් විකාරාකාරයෙන් යන්නේද මෙබඳු පුගුල්තෙම අසංවරිත චක්ඛුලොලමහණාවන්නේය, මහාසම්මතාදීහු මෙසේ මහානුභාවසම්පන්නයෝය යනාදී රාජකථාය මූලදෙවමෙසම්ලාදීහු මෙසේ මහාබලඇත්තෝය යනාදී චෞරකථාය අසවල් ඇමතියෝ දක්ෂයෝය යනාදී මහඇමතියන්පිළිබඳ කථාය අසවල් සේනාව ඇත්, අස්, රථ පාබල යන චතුරඞ්ගයෙන් හොබනේය යනාදී සේනාපිළිබඳ කථාය අසවල්කාරණා භයට හේතුවෙත් යයි යනාදී භයපිළිබඳ කථාය භාරතයුද්ධාදියෙහිදී අසවලං

විසින් අසවලා පරදවනලදැයි යනාදී යුද්ධපිළිබඳකථාය මෙබඳු
වර්ණවත්වූ ගන්ධවත්වූ රසවත්වූ ආහාරයක් අනුභවකෙළෙමු.
පැනක් පානය කෙළෙමු යනාදී අන්නපානයන් පිළිබඳකථා
දෙකය මෙබඳු කසීසළු ආදිවස්ත්‍ර පරිභොගකෙළෙමු යනාදී
වස්ත්‍රයන් පිළිබඳකථාය මෙබඳු ආස්තරණයන් අතුළ සයන
යන්පරිභොග කෙළෙමු යනාදී සයනයන් පිළිබඳ කථාය දූස
මන් යනාදියෙන් ගෙතූ මාලාදම පරිභොගකෙළෙමු යනාදී
මාලාපිළිබඳකථාය, මෙබඳු සුවඳ ආඝ්‍රාණයකෙළෙමු යනාදී ගන්ධ
කථාය, අපගේනෑයෝ සුරයෝය සමර්ථයෝය යනාදී ඥාති
කථාය, අපි පෙර විසිතුරුයානාවලින් සැරිසැරීමුයි යනාදී යාන
කථාය, අසවල් ගම්වැස්සෝ සුරයෝයදක්ෂයෝය යනාදී ග්‍රාම
කථාය, අසවල් නියම්ගම්වැස්සෝ අසවල් නගරවැස්සෝ
අසවල් ජනපදවැස්සෝ සුරයෝය සමර්ථයෝය යනාදී
නියම්ගම් නගර ජනපදයන් පිළිබඳ කථාතුනය. රූපලාවණ්‍ය
වර්ණසංස්ථානාදීන් පලවන ස්ත්‍රීන් පිළිබඳ කථාය, නන්දිමිත්‍ර
යොධයා දක්ෂයෙක්විය යනාදී සූරයන් පිළිබඳකථාය, අසවල්
වීථිය සුනිවිට්ඨය දුන්නිවිට්ඨය යනාදී වීථිපිළිබඳ කථාය, පැන්
තොටට පැමිණි දියගෙණයන්නියන් පිළිබඳ වර්ණසංස්ථාන
පලකරණ කුම්භට්ඨානකථාය, පෙර මළගිය නෑයන් පිළිබඳ
කථාය, පූර්ව පශ්චිම කථාවෙන් තොරවූ සෙසු නානාස්වභාවික
නිරර්ථක නානත්තකථාය, ලොකය කවරකු විසින් නිර්මිත
කරණලද්දේද අසවලා විසින් නිර්මිතකරණලද්දේය, ඇටසුදු
බැවින් කාකයාසුදුය, ලේ රතුබැවින් කොකා රතුය, යනාදීවූ
ලොකඛ්‍යායිකා කථාය, සගරයන් විසින් නිපදවනලද හෙයින්
සාගරයයි කියනුලැබේ. යනාදී සමුද්‍රඛ්‍යායිකාකථාය, ශාස්වත
දෘෂ්ටිපිළිබඳ කථාය, උච්ඡේදදෘෂ්ටිපිළිබඳ කථාය, අසවලාමෙසේ
ධනධාන්‍යාදියෙන් වැඩෙයි යනාදී වෘද්ධිකථාය, අසවලාගේ
වස්තුව මෙසේහානිවීය යනාදී හානිකථාය, රූපාදී පඤ්චකාම
ය පිළිබඳ කථාය, අත්තකිලමථානුයොග කථාය, යනාදීදෙතිස්
කථාව අන්ධබාල ගම්වැස්සන්ගේ කථාවහෙයින් ග්‍රාම්‍යයයිද,
නිර්වාණමාර්ගයනැර සංසාරයෙහි සත්ත්වයා සරසට ගමන්කරවන
හෙයින් තිරශ්චීනයයිද කියනුලැබේ. ඒ යැටකී ලොලස්වභාව
යන්ද මෙකී දෙතිස්කථාවන්ද බැහැරකොට වාසයකරන්නේය.
අප්පිච්ඡකථා, සන්තුට්ඨිකථා, පවිවෙකකථා, අසංසග්ගකථා, විරියා
රම්භකථා, සීලකථා, සමාධිකථා, පඤ්ඤකථා, විමුත්තිකථා,
විමුත්තිඤාණදස්සනකථා, යන දශාඛ්‍යකථාවන් කරන්නේයයි
වදළසේක.

9. ඵස්සෙන යදා ඵුට්ඨස්ස
පරිදෙවං භික්ඛු න කරෙය්‍ය
කුහිඤ්චි භවඤ්ච නාභිජප්පෙය්‍ය
භෙරවෙසු ච න සම්පවෙධෙය්‍ය.

10. අන්නානමථො පානානං
ඛාදනීයානං අථොපි වත්ථානං
ලද්ධා න සන්නිධිං කයිරා
න ච පරිත්තසෙ තානි අලභමානො.

---

9. භික්ඛු, මහණතෙම; යදා, යම්කලෙක්හි; ඵස්සෙන, චක්ෂුරොගාදිරොග ස්පර්ශයකින්; ඵුට්ඨස්ස, ස්පර්ශකරණලද්දේ වන්නේද එසේකල්හි; කුහිඤ්චි, බාහ්‍යාභ්‍යන්තරවූකිසිවක් කෙරෙහිලා; පරිදෙවං, හැඬීම; න කරෙය්‍ය, නොකරන්නේය; භවඤ්ච, (ඒ රොගස්පර්ශය සන්සිඳවීම පිණිස) කාමභවාදී භවයද; නාභිජප්පෙය්‍ය, නොපතන්නේය; භෙරවෙසු ච, (ඒ ස්පර්ශයට ප්‍රත්‍යයවූ) සිංහ ව්‍යාඝ්‍රාදී භෛරවයන් නිමිත්තකොටගෙණ; න සම්පවෙධෙය්‍ය, (බියෙන්) කම්පා නොවන්නේය.

යොගාවචරමහණතෙමේ යම්කලෙක්හි ඇස්රොගාදියකින් පෙළෙනෙක්වන්නේද එකල්හි බාහ්‍යාභ්‍යන්තරදෙස්හිවූ කිසිවක් නිමිතිකරගෙණ නොහඬන්නේය. ඒ රොග ස්පර්ශය දුරුකිරීම සඳහා කාමභවාදීභවයක්ද නොපතන්නේය. ඒ ස්පර්ශයට ප්‍රත්‍යයවූ සිංහ ව්‍යාඝ්‍රාදී භෛරවයන් නිමිතිකොටගෙණ භීතියෙන් කම්පා නොවන්නේය. පෙරකී ගාථාවලින් ඉන්ද්‍රියසංවරය දක්වා මේ ගාථාවෙන් අරණ්‍යයෙහි වසන්නහු විසින් භියයට කාරණවූ සිංහව්‍යාඝ්‍රාදීන්දුටුකහෝ ඔවුන්ගේ ශබ්දයඅසාහෝ භයෙන් කම්පා නොවියයුතුයයි දක්වාවදාළසේක.

10. අන්නානං, ආහාරඅතුරෙන් යමක්ද; අථො, යළි පානානං, (අටවැදෑරුම්) පානයන්අතුරෙන් යමක්ද; ඛාදනීයානං, (සපාකඩා) කෑයුතුදෙය අතුරෙන් යමක්ද; අථො, යළි; වත්ථානංඅපි, වස්ත්‍රඅතුරෙන් යමක්ද; ලද්ධා, දැහැමින්ලැබ; සන්නිධිං, සුරැකිව තැබීම; න කරෙය්‍ය, නොකරන්නේය; තානි, ඒ ආහාරපානාදීන්; අලභමානො, නොලබන්නේ; න පරිත්තසෙ, නොතැවෙන්නේය

11. ඣායිනපාදලොලස්ස
විරමෙකුක්කුච්චං නප්පමජ්ජෙය්‍ය
අථාසනෙසු සයනෙසු
අප්පසද්දෙසු භික්ඛුවිහරෙය්‍ය.

---

මේ ආහාරපානාදිය අතුරෙන් යම්කිසිවක් දැහැමින් ලැබ ඉවතෙහිවූ සෙනසුනෙහි වසන්නහු විසින් මෙබඳුදෙය හැමකල්හි දුකසේ ලැබියයුතුයයි සිතා ඒ දැහැමින් ලද්දෙය මතු ප්‍රයෝජනය ගැණීම සඳහා සුරැකිව නොතබන්නේය. එකී අන්නපානාදිය නොලැබුණත් ඒ සඳහා නොතැවෙන්නේය.

11. ඣායි, ධ්‍යානයෙහිඇලුනේ; පාදලොලො, (අහෙතු අකාරණයෙන් ආරාමයෙන් ආරාමයටද පිරිවෙණෙන් පිරිවෙණවද යාම්ඊම් වශයෙන්)පාදලොලත්වයෙන් යුක්තවූයෙක් නඅස්ස, නොවන්නේය; කුක්කුච්චං, අත්කුකුසද, පාකුකුසද, නොකැපෙහි කැපය යනාදි කුකුසද; විරමෙ, දුරුකරන්නේය; නප්පමජ්ජෙය්‍ය, සකස්කොට කරණුසුලුවූයේ පමානොවන්නේය; අථ, යලි; භික්ඛු, එබඳුමහණතෙම; අප්පසද්දෙසු, ස්වල්පශබ්ද ඇත්තාවූ; ආසනෙසු, අසුන්පිහිටිතැන්හිද; සයනෙසු, සයනස්ථානයන්හිද විහරෙය්‍ය, කෙලෙස්තවන වීර්‍ය්‍යයෙන් යුක්තව වාසයකරන්නේය.

ධ්‍යානයෙහි ඇලුනු තැනැත්තේ හෙතුරහිතව නිකරුණේ ආරාමයෙන් ආරාමයටද පිරිවෙණෙන් පිරිවෙණටද යාම්ඊම් වශයෙන් පාදලොලත්වයෙන් යුක්තවූයෙක් නොවන්නේය, අත් කුකුසද පාකුකුසද අකැපෙහි කැපය යන සිතිම්සඞ්ඛ්‍යාත කුකුසද දුරුකරන්නේය සකස්කොට කරණුසුලුවූනොසැහවුණු පැවතුම් ඇති බහානොතැබූ වීර්‍ය්‍යය ඇති කුශලධර්මයන්හි ප්‍රමාදනොවූ තැනැත්තේ කවද මම අසම්පූර්ණශීලරාශිය පරිපූර්ණය කෙරෙම්ද පරිපූර්ණවූවට ප්‍රඥවෙන් අනුග්‍රහකෙරෙම්දනොදන්නාලද දුඃඛ සත්‍යයෙහි දූතගන්නෙම්දැයි පමානොවන්නේය නැවත එබඳුම හණතෙම ශබ්දරහිතවූ අසුන්පිහිටිතන්හිද සයනස්ථාන පිහිටි තන්හිද කෙලෙස්තවන වීර්‍ය්‍යයෙන් යුක්තව වාසයකරන්නේය.

12. නිද්දං න බහුලීකරෙය්‍ය
ජාගරියං භජෙය්‍ය ආතාපී
තන්දිං මායං හස්සං ඛිඩ්ඩං
මෙථුනං විප්පජහෙ සවිභූසං.

13. ආථබ්බණං සුපිනං ලක්ඛණං
නො විදහෙ අථොපි නක්ඛත්තං
විරුතඤ්ච ගබ්භකරණං
තිකිච්ඡං මාමකො න සෙවෙය්‍ය.

---

12. ආතාපි, කෙලෙස් තවන වීර්‍ය්‍යයෙන් යුක්ත ශ්‍රමණ තෙමේ; නිද්දං, නිද්‍රාව; න බහුලීකරෙය්‍ය, බහුල නොකරන්නේය; ජාගරියං (දිවසභාගය සක්මණින්ද හිඳීමෙන්ද ආවරණීය ධර්මයෙන් සිත පිරිසිදු කෙරෙයි යනාදියෙන් ප්‍රකාශකරණ ලද) ජාගර්‍ය්‍යප්‍රතිපදා සංඛ්‍යාත නිදිවර්ජිතය; භජෙය්‍ය, භජනයකරන්නේය; තන්දිං, අලසකමද; මායං, කළදෙය් වසන (කායික වාචසික) වඤ්චන ක්‍රියාවද; හස්සං, (බොහෝවේලා දත්විදහා) සිනාසීමද; ඛිඩ්ඩං, (කායික වාචසික) ක්‍රීඩනයද; මෙථුනං, ග්‍රාම්‍යධර්මයද; සවිභූසං, (විභූෂණය සමග) අලඞ්කාරයද; විප්පජහෙ, විශෙෂයෙන් හරණේය.

කෙලෙස් තවන වීර්‍ය්‍යයෙන් යුක්ත ශ්‍රමණතෙම රෑ දහවල් සකොටසක්කොට පස්කොටසෙක්හි නොනිදන්නේය. දහවල් භාගයෙහි සක්මන් කරමින්ද හිඳීමෙන්ද ආවරණීය ධර්මයන්ගෙන් සිත පිරිසිදු කරන්නේය. රෑ පිළිබඳ ප්‍රථම යාමයද පශ්චිම යාමයද එසේම කෙලෙසයන් කෙරෙන් සිත පිරිසිදු කරන්නේය. මධ්‍යම යාමයෙහි දකුණු පසින් සිංහශය්‍යාව කරන්නේය. අලස කමද කළදෙස් වසන කායික වාචසික වඤ්චන ක්‍රියාවද බොහෝ වේලා දත් විදහා සිනාසීමද කායික වාචසික ක්‍රීඩනයද ග්‍රාම්‍යධර්මයද විභූෂණය සමග අලඞ්කාරයද යන (පැවිද්දන්ගේ විභූෂණය නම්: සිවුරු අලඞ්කාරකිරීමය. පත් සෙනසුන් කය පිරිකර යන මොවුන් අලඞ්කාරකිරීමයි.) මෙකී සියල්ල විශෙෂයෙන් හරණේය.

13. මාමකො, (බුදුන් දහම් සඟුන් යන රත්නත්‍රය කෙරෙහි මමත්වය ඇති බුද්ධශ්‍රාවකතෙම; ආථබ්බණං, ආථර්වණික මන්ත්‍ර ප්‍රයොගයද; සුපිනං, සුපින ශාස්ත්‍රයද; ලක්ඛණං, මණිලක්ෂණාදී ශාස්ත්‍රයද; නො විදහෙ, සමාදන්ව නොපවත්වන්නේය; අථො, යළි: නක්ඛත්තං අපි නක්ෂත්‍ර ප්‍රයොග ශාස්ත්‍රයද; විරුතඤ්ච,

14. නින්දාය නප්පවෙධෙය්‍ය
නඋණ්ණමෙය්‍ය පසංසිතො භික්ඛු
ලොභං සහමච්ඡරියෙන
කොධං පෙසුණියඤ්ච පනුදෙය්‍ය.
15. කයවික්කයෙ න තිට්ඨෙය්‍ය
උපවාදං භික්ඛු නකරෙය්‍ය කුහිඤ්චි,
ගාමෙ ච නාභිසජ්ජෙය්‍ය
ලාභකම්‍යා ජනංනලපයෙය්‍ය.

---

මෘගාදීන්ගේ හඬ දන්නා විරූත ශාස්ත්‍රයද; ගබ්භකරණං,- ගර්භ ස්ථාන කරණයද; තිකිච්ඡං, ශාලක්‍යාදි පඤ්චවිධ පිළියම්ද; නසෙවෙය්‍ය, (උද්ග්‍රහණධාරණ වශයෙන්) සෙවනය නො කරන්නේය,

බුද්ධ ධර්ම සඞ්ඝ යන රත්නත්‍රය කෙරෙහි මමත්වය ඇති බුද්ධ ශ්‍රාවකතෙම ආථර්වණික මන්ත්‍ර ප්‍රයෝගයද ස්වප්න ශාස්ත්‍රයද මණිලක්ෂණාදි ශාස්ත්‍රයද සමාදන්ව නොපවත්නේය. නැවත නක්ෂත්‍ර ප්‍රයෝග ශාස්ත්‍රයද මෘගාදීන්ගේ හඬ දන්නා විරූත ශාස්ත්‍රයද ගැප් පිහිටීම් කරණ ශාස්ත්‍රයද ශාලකිය-සල්ලකත්තිය කායතිකිච්ඡා-භූතිය-කොමාරභච්ච-රස පඤ්චප්‍රකාර වෛද්‍ය කර්මයද උද්ග්‍රහණ ධාරණ වශයෙන් සෙවනය නොකරන්නේය.

14. භික්ඛු, යොගාවචර මහණතෙම; නින්දාය, ජාතිගොත්‍රාදියෙන් සවා බණිනකල්හි; නප්පවෙධෙය්‍ය, (බියෙන්) කම්පා නොවන්නේය; පසංසිතො, (කුලගොත්‍රාදියෙන්) කීර්ති ප්‍රශංසා කරණු ලබන්නේ; නඋණ්ණමෙය්‍ය, තමා උසස්කොට නොසලකන්නේය. (ප්‍රගෘහීත ශීර්ෂ ඇත්තෙක් නොවන්නේය. මච්ඡරියෙනසහ, (ආවාස මාත්සර්‍යාදී) පඤ්චප්‍රකාර මාත්සර්‍යය සමග; ලොභං, ලොභයද; කොධං, ක්‍රොධයද; පෙසුණියඤ්ච, (ප්‍රිය කාම්‍යතාව හෙදකරණ අදහසින්) කේලාම් ගෙණයාමද, පනුදෙය්‍ය, දුරුකරන්නේය;

යොගාවචර මහණතෙම යමකු විසින් ජාතිගොත්‍රාදියෙන් සවා නින්දාකරණකල්හි බියෙන් කම්පා නොවන්නේය. කුල ගොත්‍රාදියෙන් කීර්ති පසසනු ලබන්නේ තමා උසස්කොට නොසලකන්නේය ආවාස මාත්සර්‍ය-කුලමාත්සර්‍ය-ලාභමාත්සර්‍ය-වර්ණමාත්සර්‍ය-ධර්මමාත්සර්‍ය යන පඤ්චවිධ මාත්සර්‍යයන් සමග ලොභයද ක්‍රොධයද ප්‍රිය මනාපබව බිඳින අටියෙන් කේලාම්කීමද දුරුකරන්නේය.

15. භික්ඛු, යොගාවචර මහණතෙම: කයවික්කයෙ, (පඤ්ච සහ දූහැමියන් සමග වෙළඳාම් වශයෙන් හෝ ලාභ බලාපොරොත්-

තුවෙන් පාසිවුරු ආදිය) ගණුදෙනු කිරීමෙහි; න නිවෙඨයා, යෙදී නොසිටින්නේය; කුහිඤ්චි, (තමා විෂයෙහි උපවාදකර කෙලෙසුන් නූපදවමින්) කිසි කෙලශයක් නිමිතිකොටගෙණ; උපවාදං, (මහණ බමුණන් ලවා) උපවාදයක්; න කරෙය්‍ය, නූපදවන්නේය; (නොකරවන්නේය) ගාමෙච, ගමෙහිද; නාභිසජ්ජෙය්‍ය, (ගිහින් සමග සතුටුවීම් ශොකවීමාදීයෙහි) නොඇලෙන්නේය; ලාභකාම්‍යා, ලාභකැමැති භාවයෙන්; ජනං, ජනයාට; නලපයෙය්‍ය, (තමන් නීච ස්ථානයෙහි තබා අනුන් උච්චස්ථානයෙහි තබා) කථා නොකරන්නේය;

---

යොගාවචර මහණතෙම භික්ෂු භික්ෂුණී ශ්‍රාමණෙර ශ්‍රාමණෙරී ශික්ෂ්‍යමාණා යන පසළුව සහ ධාර්මිකයන් සමග වසළුවා වශයෙන් හෝ ලාභ බලාපොරොත්තුවෙන් පාසිවුරු ආදිය ගණුදෙනු කිරීමෙහි යෙදී නොසිටින්නේය. ආධ්‍යාත්මික බාහ්‍ය යන කිසිවෙක්හි ලා මහණ බමුණන් ලවා උපවාද නොකරවන්නේය. බලාසිකවූ හෝ මජ්ඣිමවූ හෝ සුඛුමවූ හෝ කෙලෙසුන් නූපදවන්නේය දුරුකරන්නේය. එහි ඖදාරික කෙලශයෝ නම්- කාය වාචාවකො දුශ්චරිතයෝය. මධ්‍යම කෙලශයෝ නම්-කාම ව්‍යාපාද විහිංසා යන විතර්කයෝය. සියුම් කෙලෙස් නම්- ඥාතිවිතර්ක-ජනපදවිතර්ක යනාදීහුයි, ගමෙහි ගිහින් සමග සතුටුවීමට සුදුසු අවස්ථාවක් පැමිණිවිට සතුටුවීම ශොක වියයුතු අවස්ථාවක් පැමිණිවිට ශොකවීම ගමෙහි ඒ ඒ තන්හි බැඳීම යනාදිහු අභිසජ්ජන නම් වෙත්. මෙකී ගිහි සංසර්ගයන්හි පහවූ හෙධ නැත්තේ ශ්‍රෙෂ්ඨවූ ආත්මයකින් යුක්තව වාසයකරන්නේය යන අදිප්‍රායයි. ලාභාසාවෙන් ජනයාට තමන් පහත් තැන තබා අනුන් උසස් තැන තබා කථා නොකරන්නේය. ලාභාසාවෙන් කිම විප්‍රකාර වෙයි. හේ කෙසේද? තෙපි මට බොහෝ උපකාර කරන්නෝය. මම තොප නිසා චිවර පිණ්ඩපාත සෙනාසන ගිලානපච්චය භෙසජ්ජ පරික්ඛාර" යන සිව්පසය ලබමියි තමා නීචස්ථානයෙහි තබා කියයි. මම තොපට බොහෝ උපකාර ඇත්තෙක්මි. තෙපි මා කරා එළඹ බුදුන් දහම් සඟුන් යන රතනත්‍රය සරණගියෝය. සතුන්මැරිම, සොරකම්කිරීම, මිථ්‍යාචාරය, බොරුකීම, රහමෙර පානය යන පස්පවින් වැළකීයෝය. මම තොපට උදෙසීම දෙමි. පොහොය දිනය කියමි. නවතම් ඉටමි. එසේදුවත් තෙපි මට දෙස් කියා අතික් මහණ බමුණන්ට සත්කාර කෙරෙති යනාදියෙන් තමා උසස් තන්හි තබා කියයි. මෙකී මහණතෙමේ මේ විප්‍රකාරයෙන්ම ලාභාසාවෙන් ජනයාට නොකියන්නේය.

16. නවිකත්ථිතාසියා භික්ඛු
න ච වාචං පයුතං භාසෙය්‍ය
පාගබ්භියං න සික්ඛෙය්‍ය
කථං විග්ගාහිකං න කථෙය්‍ය.

---

16. භික්ඛු, යොගාවචර භික්‍ෂුතෙම; නවිකත්ථිතාසියා, ශිල ව්‍රතගොත්‍රාදියෙන් ප්‍රශංසාකරණ ලද්දෙක් නොවන්නේය; පයුතං, (චීවරාදිය හා සම්ප්‍රයුක්තවූ හෝ ඒ සඳහා) යොදනලද; වාචං, (ඇත්තවූ හෝ බොරුවූ හෝ) වචනයක්; නභාසෙය්‍ය, නොකියන්නේය; පාගබ්භියං, (අෂ්ටස්ථානයෙක්හි) කායප්‍රගල්භයෙහිද (චතුඃස්ථානයෙක්හි) වාක්ප්‍රගල්භයෙහිද (අනෙකස්ථානයෙහි) මනඃප්‍රගල්භයෙහිද; නසික්ඛෙය්‍ය, නොහැසිරෙන්නේය; විග්ගාහිකං කථං, (තෝ මේ ධර්මවිනය නොදන්නෙහිය යනාදියෙන් කියන) විවාදයට හෙතුවූ කථාවක්; නකථෙය්‍ය, නොකියන්නේය;

භාවනාවෙහි යෙදුනු මහණතෙම ශීල ව්‍රත ගොත්‍රාදීයෙන් ප්‍රශංසාකරණ ලද්දෙක් නොවන්නේය. චීවරාදිය හා සම්ප්‍රයුක්තවූ හෝ ඒ සඳහා යොදනලද ඇත්තවූ හෝ බොරුවූහෝ වචනයක් නොකියන්නේය. යටත්පිරිසෙයින් මාගේ ධර්මය අසත් නම් ඉතා යෙහෙක. අසා පහදින්නම් යෙහෙක. දැහැද ප්‍රසන්නාකාරයක් කරන්නහු නම් යෙහෙකැයි යනාදී වශයෙන් මෙයේ පැවති ධර්මදෙශනා වචන පටන්කොට ඇති ප්‍රයුක්ත වචනයක් නොකියන්නේය අෂ්ටස්ථානයෙක්හි කායප්‍රගල්භයෙහිද, චතුඃස්ථානයෙක්හි වාක් ප්‍රගල්භයෙහිද, අනෙකස්ථානයෙහි මනඃප්‍රගල්භයෙහිද නොහැසිරෙන්නේය. ඔවුනතුරෙන් අෂ්ටස්ථානයෙක්හි කාය ප්‍රගල්භය නම්: සඞ්ඝගණපුග්ගල භොජනසාලා ජන්තාඝර න්හානතිත්ථ භික්ඛාචාරමග්ග අන්තරඝර යන මෙකී ස්ථානයන්ට පිවිසෙනකල්හි කයින් නුසුදුසු පැවැත්මයි. එනම්-මෙහි ඇතැම් මහණෙක් සඟමැද අනාවට්ටනන්වාගෙණ හිඳී. පා පිට පය තබා හිඳී. එසේම ගණයා මධ්‍යයෙහිද සිව්පිරිස් රැස්වන තැනද, එසේමඉතාමහල්ලන් මධ්‍යයෙහිදහිඳී. බොජුන්හලට පැමිණිකල්හි මහල්ලන්ට ආසනය නොදෙයි. නවකයන් බැහැරකරයි. එසේම ගිනිහල් ගේදී මහල්ලන් නොවිචාරා ගිනි දල්වීමාදිය කරයි. නහන තොටෙහිදී-දහරෙ වුඩ්ඩාති පමාණං අකත්වා ආගතපටිපාටියා නහායිතබ්බං-යනාදී වත නොසලකා අවුත් මහල්ලන්ද නවකයන්ද ප්‍රතිබාහනය කරයි. භික්‍ෂාචාර

17. මොසවජ්ජෙ න නීයෙථ
සම්පජානො සඨානි න කයිරා
අථ ජීවිතෙන පඤ්ඤාය
සීලබ්බතෙන නාඤ්ඤමතිමඤ්ඤෙ.

---

මාර්ගයෙහිදී අග්‍රාදකාය අග්‍රපිණ්ඩය සඳහා මහල්ලන්ට පෙරටුව පෙරටුව බාහුවෙන් බාහුව පහරමින් යයි. ඇතුල්ගමට වදින කල්හි මහල්ලන්ට ඉතා පෙරටුව යයි. ළදරුවන් සමග කාය කිලනය කෙරෙයි. මේ ආදිය කාය ප්‍රගල්භයයි. සතර තැන වාක් ප්‍රගල්භය නම්: සඞ්ඝගණ පුග්ගල අන්තරඝරෙසු-අප්පටිරූප වාචානිච්ඡාරණං—සඞ්ඝගණ පුද්ගල අන්තරඝර යන මේ සිව් තැන්හිදී නුසුදුසු වචන පිටතු කිරීමයි. මේ සස්නෙහි ඇතැම් මහණෙක් නොවිචාරා සඟමැද දහම් දෙසයි. එසේම ගණමැද ඉතා මහලු පුගුලන් මැද නොවිචාරා දහම් දෙසයි. ඇතුල්ගමෙහිදී වනාහි-මෙනම් ඇත්තිය ගෙයි කුමක් තිබේද, කැඳ තිබේද, නැතහොත් කැයුතු දෙයක් තිබේද, බුදියයුතු දෙයක් තිබේද, කුමක් මට දෙන්නෙහිද යනාදියයි. මනඃ ප්‍රගල්භය නම් ඒ ඒ තන්හිදී සිතින්ම කාමවිතර්කාදී නුසුදුසු දෙය සිතීමයි. මෙසේ ප්‍රගල්භත්‍රයෙහි විස්තර දතයුතුයි. තෙපි ධම්විනය නොදන්නහුය යනාදියෙන් කියන විවාදයට හෙතුවූ කථාවක් නොකියන්නේය.

17. සම්පජානො, සම්‍යක් ප්‍රඥාවෙන් යුක්ත මහණතෙම; මොසවජ්ජෙ, මුසාවා කීමෙහි; න නීයෙථ, සිත නොයවන්නේය; සඨානි, නැතිගුණ පහළකරණ කපටිකම්; න කයිරා, නොකරන්නේය; අථ, යලි; ජීවිතෙන, ජීවිතයෙන්ද; පඤ්ඤාය, ප්‍රඥාවෙන්ද; සීලබ්බතෙන, ශීලයෙන් හා ව්‍රතයෙන්ද; අඤ්ඤං, අනිකකු; න අතිමඤ්ඤෙ, ඉක්මවා නොසිතන්නේය.

සම්‍යක් ප්‍රඥාවෙන් යුක්ත මහණතෙම බොරුකීමෙහි සිත නොයොදන්නේය. නැතිගුණ පහළ කිරීමෙන් කපටිකම් නොකරන්නේය. නැවත ජීවිකාවෙන් අනිකකු ඉක්මවා නොසිතන්නේය. රූක්ෂ ජීවන ඇති ඇතමෙක් ප්‍රණීත ජීවන ඇත්තකු දුක කිමෙක්ද මේතෙම සියල්ලෙන් සියල්ල අනුභව කෙරෙයි කියා ඉක්මවා සිතයි. ප්‍රණීත ජීවන ඇති ඇතමෙක් රූක්ෂ ජීවන ඇති අනිකකු දුක කිමෙක්ද මේතෙම සවල්ප පිණ්ඩපාත, සිවුරු පිඩු සෙනසුන් ගිලනුන්ට පසවූ බෙහෙත් යනාදීන් සොලබන්නෙකැයි ඉක්මවා සිතයි. යැවකි මහණ තෙම මෙසේ ජීවිතයෙන් ඉක්මවා නොසිතයි. ඇතමෙක් ප්‍රඥා සම්පන්නවූයේ විචාල ඩිචාල පැන විසඳයි. ඔහට මෙබඳු අද

18. සුත්වා රුසිතො බහුං වාචං
සමණානං වා පුථුවචනානං
ඵරුසෙන තෙන පතිවජ්ජා
නහිසන්තො පටිසෙනි කරොන්ති.

19. එතඤ්ච ධම්ම මඤ්ඤාය
විචිනං භික්ඛු සදා සතොසිකෙඛ
සන්තීති නිබ්බුතිං ඤත්වා
සාසනෙ ගොතමස්ස නප්ප මජ්ජෙය්‍ය.

---

හසක් වෙයි. මම ප්‍රඥසම්පන්නයෙක් වෙමි. අන්‍යවූ මොව්හු එතාගී ප්‍රඥසම්පන්නයෝ නොවෙති. මෙසේ ප්‍රඥවෙන් අතිකකු ඉක්මවා නොසිතයි. ඇතමෙක් සමාධි සිල්ඇත්තේ වෙයි. ඔහට මෙබඳු අදහසක් වෙයි. මම ශීලසම්පන්නයෙක්මි. මේ අන්‍ය භික්ෂූහු දුශ්ශීලයෝය. පාපස්වභාව ඇත්තෝය. මෙසේ ශීල යෙන් අතිකකු ඉක්මවා නොසිතයි. ඇතමෙක් ව්‍රත සම්පන්න වූයේ ආරණ්‍යක-පිණ්ඩපාතික-පාංශුකූලික වශයෙන් සමාදන්වූ ව්‍රත ඇති ඔහට මෙසේ සිතෙයි. මම ව්‍රතසම්පන්නයෙක් වෙමි, මේ භික්ෂූහු ව්‍රතසම්පන්නයෝ නොවෙතියි. වතින් අනුන් ඉක්මවා සිතයි. යැඩකි මහණතෙමේ මෙසේ වතින්ද අනුන් ඉක්මවා නොසිතයි.

18. රුසිතො, අන්‍යයන් විසින් දූෂනය කරණලද්දේ; පුථු වචනානං, බොහෝ ආක්‍රෝශ වචන කියන්නාවූ; සමණානං වා, ශ්‍රමණයන්ගේ හෝ ක්ෂත්‍රියාදී අන්‍යයන්ගේ; බහුං වාචං, බොහෝ වූ අනිටුවචන; සුත්වා, අසා; ඵරුසෙන, රළුවචනයෙන්; තෙ, ඔවුන්ට; නපතිවජ්ජා, පිළිවදන් නොකියන්නේය; කුමක්හෙයින් දයත්; සන්තො, රාගාදී කෙලෙසුන් සන්සිඳවූ සත්පුරුෂයෝ; පටිසෙනිං; ප්‍රතිපක්ෂතාවක්; නහිකරොන්ති, නොකෙරෙත්මය; එහෙයිනි—

අන්‍යයන් විසින් ගැරහීමෙන් දූෂනය කරණලද්දේ බොහෝ දෙයින් ආක්‍රොශ වචන කියන්නාවූ ඒ මහණ බමුණන්ගේ හෝ ක්ෂත්‍රියාදී අන්‍යයන්ගේ බොහෝවූ අනිටු වචන අසා ඒ ගිහිකල වුන්ට රළුවචනයෙන් පිළිවදන් නොකියන්නේය කුමක්නිසාද යත්? රාගාදී කෙලෙස් සන්සිඳවූ බුද්ධාදි සත්පුරුෂයෝ ප්‍රති විරුද්ධතාවක් නොකරත්. එහෙයිනි—.

19. සතො, සමෘති සම්පන්නවූ; භික්ඛු, මහණතෙම; විචිනං, නිර්වාණ ධර්මය සොයන්නේ; එතඤ්ච ධම්මං, යථොක්ත මේ සියලුම

20. අභිභූ සො අනභිභූතො
සක්ඛි ධම්මං අනීතිහමද්දසී.
තස්මා හි තස්ස භගවතො සාසනෙ
අප්පමත්තො සදා නමස්ස මනුසික්ඛෙ—ඉති භගවා—

---

ධර්මය; අද්දසය, දුන; සදා, සැමකල්හි; සික්ඛෙ, ත්‍රිශික්ෂාවෙහි හික්මෙන්නේය; නිබ්බුතිං, රාගාදීන්ගේ නිවීමක් (නිර්වාණයක්) සන්තිති, ඇතැයි; සුත්වා, දූත; ගොතමස්ස, ගෞතම බුදුන්ගේ; සාසනෙ, සස්නෙහි (හෙවත්) අනුශාසනයෙහි; නප්පමජ්ජෙය්‍ය; පමාතොවන්නේය—

සිහිඇති මහණතෙමේ මෙසේ ප්‍රතිපත්තියද ශීලයන් සම්පූර්ණය කළබවද, ඉන්ද්‍රියයන්හි වැසූ දොර ඇතිබවද, බොජුනෙහි පමණ දත්බවද, ජාගරියානුයොගයද, සතිසම්පජඤ්ඤයද, සතර සතිපට්ඨානයන්ද, සතර සම්‍යක්ප්‍රධානයන්ද, සතරසෘද්ධිපාදයන්ද, පඤ්චෙන්ද්‍රියයන්ද, පඤ්චබලයන්ද, සප්තබොධ්‍යඞ්ගයන්ද, ආය්‍ය්‍යාෂ්ටාඞ්ගික මාර්ගයද, නිර්වාණයද, නිර්වාණගාමිනී ප්‍රතිපදාවද යන ධර්මයන් දූත සියලු සංස්කාරයෝ නිත්‍ය නොවෙති. සියලු සංස්කාරයෝ දුක්වෙති. සියලු සංස්කාරයෝ ආත්ම නොවෙති. මේ දුකයි. මේ දුක් ඉපැත්මයි. මේ දුක් නැතිකිරීමයි. මේ දුක් නිරුද්ධයට යන ප්‍රතිපදාවයයි ප්‍රකට නොකෙරමින් රාගාදීන්ගේ නිවීමක් ඇතැයි දූත ගෞතම බුදුන්ගේ සස්නෙහි පමානොවන් නේය.

20. සො, ඒ ගෞතම සර්වඥතෙම; අභිභූ, (කෙලෙස් උපතර් කරුණු රහිතහෙයින් රූපශබ්දාදීන්) අභිභවනයකළයේක්ම
අනභිභූතො, සියලු කෙලෙසුන් විසින් නොමඩනා ලද්දේමය;
අනීතිහං, උපදෙස පරම්පරාවෙන් විතර්කණය නොකරනලද;
සක්ඛිධම්මං, (තමා විසින් ප්‍රත්‍යක්ෂකළ) ධර්මය; අද්දසී, දුටුසේක;
තස්මා හි, එහෙයින්ම; තස්ස භගවතො, ඒ ගෞතම බුදුන්ගේ;
සාසනෙ, සස්නෙහි; අප්පමත්තො, ප්‍රමාද නොවූයේ; සදා, සියලු
කල්හි; නමස්සං, ඒ බුදුන්ට නමස්කාර කරමින්; අනුසික්ඛෙ,
ත්‍රිශික්ෂාවන්හි හික්මෙන්නේය; භගවා, භාග්‍යවතුන් වහන්සේ;
ඉති, මෙසේ පැන විසදීමෙන් දෙශනාව නිමකළසේක.

ඒ ගෞතමසර්වඥතෙමේ කෙලෙශොත්පත්ති රහිතහෙයින් රූපශබ්දාදිය අභිභවනය කළයේක්ම ඒ කෙලෙශයන් විසින් නොමඩනා ලද්දේමය. උපදෙස පරම්පරාවෙන් විතර්කණය නොකරණලද තමා ප්‍රත්‍යක්ෂකොට ඇති ධර්මය දුටුසේක. එහෙයින්

ඒ ගෞතම බුදුන්ගේ අනුශාසනයෙහි නොපමාවූයෝ සියලුසත්හු ඒ බුදුන්ට නමස්කාර කරමින් ත්‍රිශික්ෂාවන්ට අනුව හික්මෙත්තේය. භාග්‍යවතුන් වහන්සේ මෙසේ පැහැ විසඳීමෙන් මේ තුවටකසූත්‍රය නිමවා වදාළසේක.

මේ සූත්‍රයෙහි චක්ඛූහි නෙව ලොලො යනාදි ගාථාවලින් ඉන්ද්‍රියසංවරයද, අන්නානමථෝ පානානං යනාදියෙන් සන්නිධි ප්‍රතික්ෂෙප මුඛයෙන් ප්‍රත්‍යයසන්නිශ්‍රිත ශීලයද, මෙථුනමෝස වජ්ජපෙසුණියං යනාදී ගාථාවන්ගෙන් ප්‍රාතිමොක්ෂ සංවරශීලයද, ආථබ්බණං සුපිනං ලක්ඛණං යනාදී ගාථාවන්ගෙන් ආජීවපාරිශුද්ධිශීලයද, ඣායීඅස්ස යනාදි ගාථාවෙන් සමාධියද, විවිත්තං භික්ඛු යනාදී කයින් ප්‍රඥාවද, සදන්තෙතා සිඛෙක යනාදි ගාථාවෙන් නැවත සංක්ෂේප වශයෙන් ත්‍රිශික්ෂාවද, අථාසනෙ නසුසයනෙසු අප්ප සද්දස්ස භික්ඛුවිහරෙය්‍ය නිද්දං න බහුලීකරෙය්‍ය යනාදී ගාථාවලින් ශීල, සමාධි, ප්‍රඥා යන මොවුන්ට උපකාර අපකාර සඞ්ඛ්‍යාත කාරණවිනොදනයන්ද වදාළසේක. මෙසේ භාග්‍යවතුන්වහන්සේ නිර්මිත බුදුන්ට සම්පූර්ණ ප්‍රතිපත්තිය වදාරා රහත් කුළුගන්වා දෙසනාව නිමකළසේක. දෙශනාවසානයෙහි කෙළලක්ෂයක් දෙවියෝ රහත්වූහ. සෝවාන් ආදී මාර්ගඵලයන්ට පැමිණිය වුන්ගේ ගණනක් නොමැතිවිය.

## තුවටකසූත්‍ර ව්‍යාඛ්‍යානය සමාප්තයි.

# බුද්ධචරිත දෙවියන් සඳහා වදාළ

# පුරාභේද සූත්‍රය.

**නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.**

1. කථංදස්සී කථංසීලො උපසන්තොති වුච්චති
තං මෙ ගොතම පබ්‍රෑහි පුච්ඡිතො උත්තමං නරං.

1. ගොතම, ගෞතමයාණන්ස; කථංදස්සී, කෙසේ දක්නාසුලුවූ; කථංසීලො, කෙසේ සිල්ඇත්තාවූ; පුගුල්තෙම; උපසන්තොතිති, කෙලෙස් සංසිඳීමෙන් සන්සුන් සිත් ඇත්තෙකැයි; වුච්චති, කියනුලැබේද; පුච්ඡිතො, මෙකරුණෙහිලා මවිසින් විචාරණලද නුබවහන්සේ; උත්තමං, උතුම්වූ; තංනරං, ඒ පුගුලා; මෙ, මට; පබ්‍රෑහි, වදාළ මැනව.

ගොත්‍රයෙන් ගෞතමයාණන් වහන්ස කෙසේ දක්නාසුලුවූ කෙසේ සිලඇත්තාවූ පුද්ගලතෙම කෙලෙස් සන්සිඳවීමෙන් සන්සුන් සිත් ඇත්තෙකැයි නුබ විසින් කියනුලැබේද මෙකරුණෙහිලා මවිසින් විචාරණලද නුඹවහන්සේ උතුම්වූ ඒ පුගුලා මට වදාළ මැනව. නිර්මිත බුදුන් විසින් මේ ගාථාවෙහි, කථංදස්සී කථංසීලො, උපසන්තො, යන පදත්‍රයෙන් අධිපඤ්ඤා, අධිසීල, අධිචිත්ත යන ත්‍රිශික්ෂාවෙන් සමන්විත පුද්ගලයාගේ ආකාරය විචාලකල්හි විසඳන සර්වඥයන් වහන්සේ ස්වරූපයෙන් අධිප්‍රඥදීන් නොවිසඳ අධිප්‍රඥ ප්‍රභාවාදියෙන් ඒ කෙලෙසයන්ගේ සන්සිඳීමෙන් උපශාන්තයයි කියනුලැබේයයි වදාරා නානාප්‍රකාර දෙවියන්ගේ අදහසට අනුලෝම්පදිද්දෙන් ඔවුන්ගේ ව්‍යපශම යම ප්‍රකාශකරමින්, වීතතණ්හා යනාදී ගාථාවන් වදාළසේක. එහි ආදීම අෂ්ටගාථාවන්ගේ සම්බන්ධය තංබ්‍රෑමි උපසන්තො, යන මේ ගාථාපාදය සැමග දතයුතුයි. එයින් අන්‍යවූ ගාථාවන්ගේ සම්බන්ධය සොවසන්තොතිවුච්චති, යන මේ පශ්චිම පාදය හා දතයුතුයි.

2. වීතතණ්හො පුරාභෙදා (ති භගවා) පුබ්බමන්තමනිස්සිතො,
වෙමජ්ඣෙ නුපසංඛෙය්‍යො තස්ස නත්ථි පුරක්ඛතං.

3. අක්කොධනො අසන්තාසී අවිකත්ථී අකුක්කුචො,
මන්තභාණී අනුද්ධතො සවෙ වාචායතො මුනි.

---

2. පුරාභෙදා, යමෙක් ශරීරභෙදයෙන් පළමුකොටම; වීත තණ්හා, ප්‍රහීණවූ තෘෂ්ණා ඇත්තේද; පුබ්බංඅන්තං, (අතීතකාලා දී භෙදඇති) පූර්වාන්තය; අනිස්සිතො, තෘෂ්ණාදෘෂ්ටි වශයෙන් ඇසුරුනොකළේද; වෙමජ්ඣෙ, පවත්නා කාලයෙහිද (රත්තො) යනාදී ක්‍රමයෙන්; නුපසංඛෙය්‍යො, තෘෂ්ණාදෘෂ්ටි වශයෙන් ඇලුනෙකැයි නොගිණියයුත්තේද; තස්ස, ඒ රහත් පුගුලාහට; පුරක්ඛතං, (අතීත වර්තමාන යන කාලවන පිළිබඳ තෘෂ්ණා දෘෂ්ටීන්ගේ පෙරටුකිරීමක් නැති බැවින් අනාගත කාලය පිණිස තෘෂ්ණාදෘෂ්ටීන්ගේ) පෙරටුකිරීමක්; නත්ථි, නැද්ද; (හෙතෙම ශාන්ත සිත් ඇත්තෙකැයි කියනුලැබේ.) භගවා, භාග්‍යවතුන් වහන්සේ, ඉති, මෙසේ වදාළසේක.

යමෙක් මරණින් පළමුකොටම ප්‍රහීණකරණලද තෘෂ්ණා ඇත්තේද අතීතාදී භෙදඇති පූර්වාන්තය හෙවත් ඉකුත්කාලය තෘෂ්ණාදෘෂ්ටි වශයෙන් ඇසුරුනොකළේද පවත්නා කාලයෙහි රත්තො යනාදී ක්‍රමයෙන් තෘෂ්ණාදෘෂ්ටි වශයෙන් ඇලුනෙකැයි නොගිණියයුත්තේද ඒ රහත් පුගුලාහට අතීත වර්තමාන යන කාලවන පිළිබඳ තෘෂ්ණාදෘෂ්ටීන්ගේ පෙරටුකිරීමක් නැතිබැවින් අනාගත කාලය පිළිබඳ තෘෂ්ණාදෘෂ්ටීන්ගේ පෙරටුකිරීමක්නැද්ද හෙතෙම සන්සුන් සිත් ඇත්තෙකැයි කියනුලැබේ. භාග්‍යවතුන් වහන්සේ වදාළසේක.

3. අක්කොධනො, ක්‍රොධනැත්තාවූ; අසන්තාසී, ඒ ඒ අලාභයෙන් නොතැවෙනසුලුවූ; අවිකත්ථී, ශීලාදියෙන් තමා උසස් කොට නොකියනසුලුවූ; අකුක්කුචො, හස්තකුක්කුච්චාදිය විරහිත වූ, මන්තභාණී, නුවණින විමසාගෙණ වචන කියනසුළුවූ; අනුද්ධතො, නොසන්සුන්කමින් තොරවූ; සො මුනි, එබඳු මහණතෙම; වෙ, ඉදින්; වාචායතො, වචනයෙන් සංයතවූයේ, නොහොත් සිව් දෙස් විරහිත වචන කියන්නේවේද; හෙතෙම සන්සුන් සිත් ඇත්තෙකැයි කියනුලැබේ, භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.

ක්‍රොධනැත්තාවූ ඒ ඒ දෙය නොලැබීමෙන් නොතැවෙනසුලු වූ ශීලාදී ගුණධර්මවලින් තමන් උසස්නොකරණසුලුවූ හස්තකෞ ක්‍රත්‍යාදියෙන් තොරවූ නුවණින් විමසාගෙණ වචන කියනසුලුවූ

4. නිරාසත්ති අනාගතෙ අතීතං නානුසොචති
විවෙකදස්සී ඵස්සෙසු දිට්ඨීසු ච න නීයති.

5. පතිලීනො අකුහකො අපිහාලු අමච්ඡරී
අප්පගබ්භො අජෙගුච්ඡො පෙසුණෙය්‍යෙ ච නොයුතො.

---

නොසන්සුන් කමින් තොරවූ ඒ මහණතෙම ඉඳින් වචනයෙන් සංයතවූයේ නොහොත් සිව්දොස් විරහිත වචන කියන්නේවේද ඒ ශ්‍රමණතෙම සන්සුන් සිත් ඇත්තෙකැයි භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.

4. අනාගතෙ, නොපැමිණි ආත්මභාවය කෙරෙහි; නිරාසත්ති, තෘෂ්ණාරහිතද; අතීතං අනු, ඉකුත්වූ ආත්මභාවය අරබයා; න සොචති, ශෝක නොකෙරේද; ඵස්සෙසු, පවත්නාවූ චක්ෂුස්පර්ශාදීන්හි; විවෙකදස්සී, ආත්මභාවාදී විවේකයද දක්නාසුලුවේද; දිට්ඨීසු ච, දෙසැට දෘෂ්ටීන් අතුරෙන් කිසි දෘෂ්ටියකට; න නීයති, නොපමුණුවනු ලැබේ.

අනාගත ආත්මභාවය කෙරෙහි පහවූ තෘෂ්ණා ඇත්තේද අතීත ආත්මභාවය අරබයා ශෝක නොකරන්නේද ප්‍රත්‍යුත්පන්න චක්ෂුඃස්පර්ශාදීන්හි ආත්මභාවාදි විවෙකය දක්නාසුලුවේද දෙසැට දෘෂ්ටීන් අතුරෙන් කිසි දෘෂ්ටියකට නොපමුණුවනුලැබේද; මතු ගය හා සම්බන්ධයි.

5. පතිලීනො, රාගාදීන් ප්‍රහීණකළ බැවින් එයින් පහවූයේද; අකුහකො, ත්‍රිවිධ කුහනවතින් ලොකයා විස්මපත් නොකරවන්නේද; අපිහාලු, ප්‍රාර්ථනාතෘෂ්ණාවෙන් විරහිතයෙක්වේද; අමච්ඡරී, පඤ්චවිධමාත්සර්යයෙන් තොරවිද; අප්පගබ්භො, කායප්‍රගල්භාදියෙන් තොරවිද; අජෙගුච්ඡො, ශීලාදියෙන් පරිපූර්ණ හෙයින් පිළිකුල් නොකටයුත්තේද; පෙසුණෙය්‍යෙ ච, විප්‍රකාරයකින් උපසංහරණය කටයුතුවූ පෛශුන්‍යකර්මයෙහි; නොයුතො, නොයෙදුනෙක්විද; හෙතෙම සන්සුන සිත් ඇත්තෙකැයි භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.

රාගාදීන් ප්‍රහීණකළ බැවින් ඒ රාගාදීන්කෙරෙන් පහවූයේද තුන් කොහොන්වතින් ලොකයා විස්මපත් නොකෙරේද ප්‍රාර්ථනා තෘෂ්ණාවෙන් විරහිතයෙක්වේද ආවාසමාත්සර්යාදී පඤ්චප්‍රකාර මාත්සර්යයෙන් තොරවිද කායප්‍රගල්භාදියෙන් තොරවූයෙක්විද ශීලාදියෙන් සම්පූර්ණහෙයින් පිළිකුල් නොකටයුත්තෙක්වේද මෙතැනින් අසා ඔවුන්ගේ බිඳීම පිණිස එතනට ගොස් කියන්නේවේද එතැනින් අසා මොවුන්ගේ බිඳීම පිණිස මෙතැනට අවුත් කියන්නේවේද යනාදී විප්‍රකාර පෛශුන්‍යකර්මයෙහි නොයෙදුනෙක්වේද හෙතෙම සන්සුන් සිත් ඇත්තෙකැයි භාග්‍යවතුන් වහන්සේ නිර්මිතබුදුන්ට වදාළසේක.

6 සාතියෙසු අනස්සාවී අතිමානෙ ච නොයුතො
සණ්හො ච පටිභානවා න සද්ධො න විරජ්ජති.

7 ලාභකම්‍යා න සික්ඛති අලාභෙ ච න කුප්පති,
අවිරුද්ධො ච තණ්හාය රසෙසු නානුගිජ්ඣති.

---

6. සාතියෙසු, සැපයට හිතයයි සම්මත හෙයින් සාතියයයි කියනලද පඤ්චකාමගුණයන්හි; අනස්සාවී, තෘෂ්ණා සැඵව යෙන් විරහිතයෙක් වීද; අතිමානෙච, අධිකමානයෙහිද; නොයුතො, නොයෙදුනේද; සණ්හොච, මෘදුකායකර්මාදියෙන් සමන්නාගතද; නසද්ධො, (තමන් විසින් අවබොධකරනලද ගුණ ධර්මය අනිකකුගේ කථාවෙන්) නොඅදහාද; නවිරජ්ජති, රාග ක්ෂය කිරීමෙන් නොඇලුනකු බැවින් දූන් රාගයෙන්) ඇලෙනු නොලැබේද හෙතෙම සන්සිඳුනෙකැයි කියනු ලැබේ.

සැපයට හිතයයි සම්මත හෙයින් සාතයයි කියනලද පඤ්ච කාමගුණයන්හි තෘෂ්ණාසැඵවයෙන් විරහිතයෙක්වේද අධික මානයෙහි නොයෙදුනේද මෘදුකාය කර්මාදියෙන් සමන්නාගත ද පර්‍යාප්ති ප්‍රතිපත්ත්‍යධිගම ප්‍රතිභානයන් ගෙන් සමන්විතද තමන් විසින් ප්‍රතිවෙධකළ අභීත්ගුණය අනුන්ගේ කථාවෙන් නොඅදහා රාගක්ෂය කිරීමෙන් නොඇලුනකු බැවින් දූන් රාග යෙන් ඇලෙනු නොලැබේද හෙතෙම සන්සිඳුනු සිත් ඇත්තෙ කැයි කියනු ලැබේ.

7. ලාභකාම්‍යා, ලාභකැමැත්තෙන්; නසික්ඛති, සූත්‍රාන්තාදිය නූගණීද; අලාභෙ, චීවරාදිය නොලැබීමෙහිලා; නකුප්පති, නොකිපේද; අවිරුද්ධො, (විරොධාභාවයෙන්) අවිරුද්ධයෙක්ව; රසෙසු, මූලරසාදීන්හි; තණ්හාය, තෘෂ්ණාවෙන්; නානුගිජ්ඣති, රගබවයට නොපැමිණේද; හෙතෙම ශාන්තයයි කියනු ලැබේ.

ලාභ කැමැත්තෙන් සූත්‍රාන්තාදිය නූගණීද චීවරාදීය නො ලැබීමෙහිලා නොකිපේද විරොධාභාවයෙන් අවිරුද්ධයෙක්ව මූල රසාදීන්හි තෘෂ්ණාවෙන් ගෙධබවයට නොපැමිණේද හෙතෙම සන්සුන් සිත් ඇත්තෙකැයි කියනුලැබේ.

8 උපෙඛකො සදාසතො නලොකෙමඤ්ඤතෙ සමං,
නවිසෙසීන නීචෙය්‍යො තස්සනො සන්ති උස්සදා.

9 යස්සනිස්සයතා නත්‍ථි ඤත්වා ධම්මං අනිස්සිතො,
භවාය විභවාය වා තණ්හා යස්ස න විජ්ජති.

---

8. සදා, සැමකල්හි; උපෙඛකො, ෂඩඞ්ගොපෙක්ෂාවෙන් යමෙක් යුක්තද; සතො, (කායානුපස්සනාදී) ස්මෘතියෙන් යුක්තද ලොකෙ, ලොකයෙහි වසන්නන්; සමං, තමාහා සමකොට; න මඤ්ඤතෙ, නොසිතාද; නවිසෙසී; තමා වෙනස්කොට (නොහොත්) උසස්කොට නොසිතාද; නනීචෙය්‍යො, තමා පහත්කොට නො සිතාද; තස්ස, ඔහට; උස්සද; රාගාදී කෙලෙශොත්සදයෝ; නො සන්ති, නොමැත්තැහුය; හෙතෙම සන්සුන් සිත් ඇත්තෙකැයි කියනු ලැබේ.

හැමකල්හි යමෙක් ෂඩඞ්ගොපෙක්ෂාවෙන් යුක්තද කායානුපස්සනාදී සිහියෙන් යුක්තද ලෝවැස්සන් තමා හා සමානකොට නොසිතාද තමා වෙනස්කොට නොහොත් උසස්කොට නොසිතාද තමා පහත්කොට නොසිතාද ඔහට රාගාදී කෙලෙශොත්සදයෝ නොමැත්තාහ හෙතෙම සන්සුන් සිත් ඇත්තෙකැයි කියනු ලැබේ.

9. යස්ස, යමෙක්හට; නිස්සයා, තෘෂ්ණාදෘෂ්ටි නිශ්‍රයෝ; නත්‍ථි, නැත්තාහුද; හෙතෙම; ධම්මං, ධර්මය; ඤත්වා, (අනිත්‍යාදී ආකාරයෙන්) දැන; අනිස්සිතො, මෙසේ තෘෂ්ණාදෘෂ්ටින් ඇසුරු නොකොළේද; යස්ස, යමකුට; භවාය, ශාශ්වතය පිණිසද; විභවාය වා, උච්ඡේදය පිණිසද උපදනා; තණ්හා, තෘෂ්ණාව; නවිජ්ජති, විද්‍යමාන නොවේද; හෙතෙම සන්සුන් සිත් ඇත්තෙකැයි කියනුලැබේ.

යමෙක්හට තෘෂ්ණාදෘෂ්ටි නිශ්‍රයෝ නැත්තාහුද හෙතෙම යම්කිසි සමුදය ධර්මයක් ඇද්ද ඒ සියල්ලම නිරොධ ධර්මයයි මාර්ගඥානයෙන් අනිත්‍යාදී ආකාරයෙන්දැන එසේ ඒ තෘෂ්ණාදෘෂ්ටින් ඇසුරු නොකෙළේද යමකුට ශාශ්වතය පිණිසද උච්ඡේදය පිණිසද පවත්නා තෘෂ්ණාව අවිද්‍යමානද හෙතෙම ශාන්තසිත් ඇත්තෙකැයි කියනු ලැබේ.

10. තමහං බ්‍රෑමි උපසන්තොති කාමෙසු අනපෙක්ඛිනං
ගන්ථා තස්ස න විජ්ජන්ති අතාරි සො විසත්තිකං.

11. න තස්ස පුත්තා පසවො ඛෙත්තං වත්ථුං න විජ්ජති
අත්තං වාපි නිරත්තං වා න තස්මිං උපලබ්භති.

12. යෙන නං වජ්ජු පුථුජ්ජනා අථො සමණ බ්‍රාහ්මණා
තං තස්ස අපුරෙක්ඛතං තස්මා වාදෙසු නෙජති

---

10. කාමෙසු, නානාප්‍රකාර කාමයන්හි; අනපෙක්ඛිනං, බලාපොරොත්තු රහිතවූ; තං, එබඳු පුද්ගලයා; උපසන්තො ඉති, කෙලෙස් සන්සිඳවූයෙකැයි; බ්‍රෑමි, මම කියමි; තස්ස, ඔහට; ගන්ථා, අභිජ්ඣා ව්‍යාපාද සීලබ්බත පරාමාස, ඉදං සච්චාභිනිවෙස යන චතුර්විධ ග්‍රන්ථයෝ; නවිජ්ජන්ති, අවිද්‍යමානවෙත්; සො, හෙතෙම; විසත්තිකං, විසත්තිකා සඞ්ඛ්‍යාත මහා තෘෂ්ණාව; අතාරි, තරණයකෙළේය.

නොයෙක් අයුරු කාමයන්හි බලාපොරොත්තු රහිතවූ එබඳු පුගුලා කෙලෙස් සන්සිඳවූයෙකැයි මම කියමි. එසේ කෙලෙස් සිඳවූ පුගුලාට අභිජ්ඣා ව්‍යාපාද සීලබ්බතපරමාස ඉදං සච්චාභිනිවෙස යන චතුර්විධ ග්‍රන්ථයෝ අවිද්‍යමානවෙත්. හෙතෙම විසත්තිකා සඞ්ඛ්‍යා මහාතෘෂ්ණාව තෘෂ්ණෝත්තරණ කෙළේය, දැන් ඒ සන්සුන් පුගුලාවම පසසමින් භාග්‍යවතුන් වහන්සේ නතස්ස පුත්තා, යනාදිය වදාළසේක.

11. තස්ස, එකී පුද්ගලයාහට; පුත්තා, අතිජාතාදී සිව්වැදෑරුම් පුත්‍රයෝ; න නැත්තාහ; පසවො, ගවමහිෂාදීහුද නැත්තාහ; ඛෙත්තං, කෙතක් හෝ; වත්ථුං, වත්තක්; නවිජ්ජති, අවිද්‍යමානවෙයි. තස්මිං, ඔහු කෙරෙහි; අත්තං වා, ආත්මය හෝ; අපි, යලි; නිරත්තං වා, අනාත්මය හෝ; නඋපලබ්භති, නොලැබෙයි.

එකී පුද්ගලයාහට අඹජාත අනුජාත අතිජාත යන තෙවැදෑරුම් පුතුන් හා භාර්‍යාවෝ නැත්තාහ. ගවමහිෂ සූකර කුක්කුටාදී සත්ත්වයෝද නැත්තාහුය. කෙතෙක් හෝ වත්තක්ද නැත්තේය. ඒ පුද්ගලයා කෙරෙහි ආත්මයක් හෝ අනාත්මයක් නොලැබෙයි.

12. යෙන, රාගාදීයම් වරදක් හෙතුකොටගෙණ; පුථුජ්ජනා, දෙව්මිනිසුන් සහිත සියලු පෘථග්ජනයෝද; (මේසස්නෙන් පිටත්හිවූ මහණ බමුණෝද; නං ඔහට; වජ්ජු රාගයෙන් රත්වූයෙක; ද්වෙෂයෙන් දූෂිතවූයෙකැයි) කියන්නාහුද; තං, ඒ රාගාදිවරද; තස්ස, ඒ රහත්හුවිසින්; අපුරෙක්ඛතං, පෙරටු නොකරණලද්දේය; තස්මා, එකාරණෙන්; වාදෙසු, නින්දාවචනයන් කියනකල්හි; නඑජති, කම්පානොවෙයි.;

13. වීතගෙධොඅමච්ඡරීන උස්සෙසුවදතෙමුනි
නසමෙසුනඔමෙසු කප්පංනෙතිඅකප්පියො

14. යස්සලොකෙසකංනත්ථි අසතාචනසොචති
ධම්මෙසුචනගච්ඡති සවෙසන්තොතිවුච්චති.

---

රාගාදී යම් වරදක් හෙතුකොටගෙණ දෙව්මිනිසුන් සහිතවූ සියලු පෘථග්ජනයෝද මේ සස්නෙහි පිටත්හිවූ මහණ බමුණෝද ශුභනකී තිකෙල්ශී පුද්ගලයාට රාගයෙන් රත්වූවෙක ද්වෙෂයෙන්, දූෂිතවූවෙකැයි කියන්නාහුද ඒ රාගාදී වරද ඒ අහිත්හු විසින් පෙරවූ නොකරනලද්දේය. එකරුණෙන් නිඤ්වචන කියන කල්හි කම්පා නොවෙයි.

13. වීතගෙධො, පහවූ තෘෂ්ණා ඇති; අමච්ඡරී, මසුරුමල රහිතවූ; මුනි, අශෛක්ෂ මුනි තෙමේ; උස්සෙසු; විශිෂ්ටයන් අතුරෙහි තමන් ඇතුළත් කොට මම විශිෂ්ටවෙමියි අතිමානවශයෙන් නවදති, නොකියාද; සමෙසු, සමවූවන් අතුරෙහි තමන් ඇතුළත් කොට න, නොකියාද; ඔමෙසු, හීනවූවන් අතුරෙ තමන් ඇතුලත් කොට; න, නොකියාද; අකප්පියො, ප්‍රහීණකළ තෘෂ්ණා දෘෂ්ටිකල්ප ඇත්තේත්; කප්පං, තෘෂ්ණාදෘෂ්ටිසංඛ්‍යාත විප්‍රකාර කල්පයට; නඑති, නොඒද;

පහවූ තෘෂ්ණා ඇති මසුරුමල රහිතවූ අශෛක්ෂමුනි තෙමේ විශිෂ්ටයන් අතුරෙහි තමන්ඇතුළත්කොට මම විශිෂ්ටවෙමියි අභිමාන වශයෙන් නොකියාද සමවූවන් අතුරෙහි තමන් ඇතුළත් කොට මම සමවෙමියි නොකියාද හීනවූවන් අතුරෙහි තමන් ඇතුළත්කොට මම හීනවෙමියි නොකියාද ප්‍රහීණකළ තෘෂ්ණා දෘෂ්ටිකල්ප ඇත්තේත් තෘෂ්ණාදෘෂ්ටි සංඛ්‍යාත විප්‍රකාර කල්පයට නොඒද.

14. යස්ස, යම් ක්ෂීණාශ්‍රවයකුට; ලොකෙ, ස්කන්ධාදි ලොක යෙහි; සකං, මෙය මාගේයයි ගන්නාලද්දක්; නත්ථි, නැත්තේද; අසතා අවිද්‍යමාන දෙයක් නිමිතිකොටගෙණ; නසොචති, ශොක නොකෙරේද; ධම්මෙසු, සියලු ධර්මයන් විෂයෙහි; නගච්ඡති, (ඡන්දාදී වශයෙන්) නොයේද; සො, එබඳු තරෙතතම තෙම; වෙ, ඒකාන්තයෙන්; සන්තොති, සන්සුන් සිත් ඇත්තෙකැයි; වුච්චති ඉති, කියනුලැබෙයි.

යම් අහීත් පුද්ගලයෙකුට රූපාදී ස්කන්ධලොකයෙහි මෙය මාගේයයි ගන්නාලද්දක් නැත්තේද අවිද්‍යමාන දෙයක් නිමිති කොටගෙණ ශොකනොකෙරේද සියලු ධර්මයන් විෂයෙහි ඡන්දාදී වශයෙන් නොයේද එබඳු තරෙතතම තෙම ඒකාන්තයෙන් සන් සුන් සිත් ඇත්තෙකැයි කියනුලැබේයයි මෙසේ රහත් කුළු ගන්වා මේ පුරාභෙද සූත්‍රය නිමවා වදාළසේක.

මෙසේ කථංදසසී කථංසීලො, සතාදී ගථාවෙන් නිර්මිත බුදුන් විසින් විචාරණලද අධිශීල, අධිචිත්ත, අධිප්‍රඥයෙන් සම්පන්නාගත ශාන්තපුද්ගලයාගේ සවභාව සජීඥයන් වහන්සේ තෙලෙස්ගයකින් විසඳුවදුලුසේක. මේ දෙශනාකෙලවර කෙල ලක්ෂයක් දෙවියෝ රහත්වූහ. සෝවාන් ආදී මාගීඵලවලට පත් වූවන්ගේ ගණනක් නොමැත්තේය.

පුරාභෙද සූත්‍රව්‍යාඛ්‍යානය සමාප්තයි.

---

# ශුද්ධිපත්‍රය.

| පිට. | පෙල. | අශුද්ධ. | ශුද්ධ. |
|---|---|---|---|
| 49 | 35 | මිරුණ | මරුණ |
| ,, | 36 | අසසත | මිසසත |
| 55 | 28 | කද්රිශං | කදරියං |
| 57 | 27 | පතනනාවු | පතන්නාවූ |
| 60 | 15 | මනාෂකටා | මනාකොට |
| 61 | 21 | ලොග | ලොභ |
| 62 | 20 | කෙරෙත | කෙරෙත් |
| 63 | 2 | විවටා | විවටං |
| 70 | 21 | චක්‍ෂුඃසපශී | චක්‍ෂුරදී සපශී |
| 72 | 18 | දකුම්හති | දකිම්මැයි |
| 73 | 2 | පවජාම් | පුවජාම |
| 76 | 2 | බ්‍යුහ | ව්‍යුහ |
| ,, | 29 | කතමෙ | කතමොනු |
| 77 | 1 | ජතං | ජතං |
| ,, | 18 | ජාතං | ජාතං |
| 78 | 23 | අත්‍යාශ | අත්‍යශා |
| 85 | 16 | තිඤ්දං | තිඤ්දං |
| 86 | 6 | උපටඨිතොසෙ | උපටඨිතාසෙ |

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු